
# අපේ හාමුදුරුවෝ

## (පනස් වසරක චරිතාපදානය)



# අපේ හාමුදුරුවෝ
## (පනස් වසරක චරිතාපදානය)

"ඉපදීම දුකක්, ජරාවට පත්වීම දුකක්,
ලෙඩවීම දුකක්, මරණයට පත්වීම දුකක්,
අප්‍රිය අය සමග එක්වීම දුකක්, ප්‍රිය වූ
අයගෙන් වෙන්වීම දුකක්, යමක් කැමති
වේ ද එය නොලැබේ නම් එය ද දුකක්,
කෙටියෙන් කියතොත් මේ උපාදානස්කන්ධ
පහ ම දුකක්."

-තථාගත බුදුරජාණන් වහන්සේ-

ප්‍රකාශනය
සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානය
2329, මිල්බෝන් පාර, එඩ්මන්ටන්, ඇල්බටා, කැනඩාව.
දුරකථනය - 780-6 41-9795
ඊමේල් - samatha.vipassana@gmail.com
වෙබ් අඩවිය-www.samathavipassana.org

පනස් වසරක ස්වයංලිඛිත චරිතාපදානය

© සියලු හිමිකම් කර්තෘ හිමියන් සතුය
2010 වසර

පූජ්‍ය තල්ගස්වැවේ සීලානන්ද ස්වාමීන් වහන්සේ
සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානය
2329, මිල්බෝන් පාර,
එඩ්මන්ටන් ඇල්බටා,
කැනඩාව

මුද්‍රණය
යු එස් ලංකා මුද්‍රණාලය
අංක 78 පිරිවෙණ පාර,
රත්මලාන.

# පිදුම

**අපේ හාමුදුරුවන් වහන්සේ මෙලොවට බිහි කොට ආදරයෙන් හදා වඩාගත් ආදරණීය මෑණියන්ට හා පියාණන්ටත් හොඳ නරක කියා දී යහ මගට යොමු කළ සියලු ගුරු උතුමන්ටත් මේ චරිතාපදානය පූජෝපහාරයක් වේවා !**

••••••

# පින් පෙරටුව ස්තුතියි

(1). මෙම චරිතාපදානය මුද්‍රණය කිරීම ගැන මතක් කළ සැණින් ඉතා සතුටින් හා සුභද සිතින් මේ සඳහා අවශ්‍ය මුද්‍රණ වියදම භාරගෙන එම මුද්‍රණ වියදම දැරූ අප සහෝදර රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙන් විහාරාධිපති ගරු මඩපාත ධම්මසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේට අපි ප්‍රථමයෙන් ම පින් පෙරටුව ස්තුතිය පුදමු.

(2). දෙවනුව මෙම චරිතාපදානය ඉතා මැනවින් කලට වේලාවට මුද්‍රණය කර දුන් රත්මලාන, පිරිවෙණ පාරේ, අංක 78 දරණ, ස්ථානයේ යු.එස්. මුද්‍රණාලයාධිපති අපේ උපුල් කුලසිංහ මල්ලීට පින් පෙරටුව ස්තුතියි .

(3). තෙවනුව මෙම චරිතාපදානය ඉතා ඕනෑකමින් කියවා සෝදුපත් බලා විසම තැන් සම හා සුමට කොට දුන් අප හා සොයුරු පෙමින් මිතු දම් සුරකින කලණ මිතුරු ජයසේන ගුණවර්ධන මහතාට පින් පෙරටුව ස්තුතියි.

(4). අවසන් වශයෙන් මෙම චරිතාපදානය සකස් කිරීම සඳහා විවිධාකාරයෙන් උදවු උපකාර කළ සැමටත් අපේ හාමුදුරුවන් වහන්සේ පැවිදි වූ දා සිට අද දක්වාම උන්වහන්සේට චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන සිව් පසයෙන් උපස්ථාන කළ හා උපස්ථාන කරන සියලු ම දෙනාටත් විශේෂයෙන් ම අපේ හාමුදුරුවන් වහන්සේගේ පනස් වැනි ජන්ම දිනය නිමිත්තෙන් 2010 වර්ෂයේ අගෝස්තු මස 7-8 සහ 9 යන දිනවල පැවැත්වූ විවිධ පින්කම් වලට සහභාගී වූ ද සහයෝගය දැක්වූද සැමටත් මෙසේ පින් පෙරටුව ස්තුති කරමු.

සැමට ම පින් පෙරටුව ස්තුතියි බුදුසරණයි !

## සියලු සත්වයෝ ම සුවපත් වෙත්වා !

# අපේ හාමුදුරුවෝ
## (පනස් වසරක චරිතාපදානය)

අපේ හාමුදුරුවෝ ඉපදුණේ අදත් ලංකාවේ ඉතාමත් ම දුෂ්කර ප්‍රදේශයක් ලෙස සැලකෙන පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණමඩුව ජන්ද කොට්ඨාසයට අයත් තල්ගස්වැව නමැති පුංචි ගමේ ය. ඒ 1960 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා ය.

ඉපදීම දුකක් බව මුලින් ම ලොවට පෙන්වා දෙන ලද්දේ අපගේ අසහාය ශාස්තෘන් වහන්සේ වන තථාගත අමාමෑණී වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසිනි. වරක් අන්‍යාගමික පූජකවරයෙකු දුක කියන්නේ කුමක්ද සැප කියන්නේ කුමක්දැයි සාරිපුත්‍ර මහ රහතන් වහන්සේ ගෙන් ඇසූවිට උන්වහන්සේ පිළිතුරු දුන්නේ "පින්වත් මිත්‍රය, ඉපදීම දුකයි. නො ඉපදීම සැපයි" (අභිනිබ්බත්තියා ආවුසො දුක්ඛා අනභිනිබ්බත්ති සුඛා) යනුවෙනි.

මේ මිනිස් දිවිය යනු, අනමත අග්‍රයක් හෙවත්, ආරම්භයක් ගැන කිසිම අවබෝධයක් නැතිව, අවිද්‍යා අන්ධකාරයෙන් වැසී, තණ්හා බැම්මෙන් බැඳී, සැරිසරන සසර ගමනේ දී ඔබ අප හමුවෙන තවත් එක් නවාතැන් පොළක් පමණී. "පින්වත් මහණෙනි, අවිජ්ජාවෙන් වැසී තණ්හාවෙන් බැඳී සසර සැරිසරන මේ සත්ත්වයාගේ සංසාරයේ පූර්ව කෝටිය හෙවත් ආරම්භය ප්‍රකට නොවේ. ඔබ විසින් දීර්ඝ කාලයක් තිස්සේ දුක් විඳින ලදී" (අනමතග්ගෝ අයං භික්ඛවේ සංසාරෝ පුබ්බා කෝටි න පඤ්ඤායති අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හා සංයෝජනානං සන්ධාවතං සංසරතං. දීඝරත්තං වො භික්ඛවෙ දුක්ඛං පච්චනුභූතං) යනු ඒ පිළිබඳ සම්බුද්ධ දේශනයයි.

ඉපදීම යනු කුමක් දැයි පෙන්වා දෙන අපගේ තථාගත ලොවුතුරා සම්මා සම්බුදු පියාණන් වහන්සේ එය පැහැදිලි කරන්නේ ඉපදීම යනු ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායවල කිසියම් ඉපදීමක් ඇද්ද, හටගැනීමක් ඇද්ද, මව් කුසකට බැස ගැනීමක් ඇද්ද, ඉපදවීමක් ඇද්ද, ස්කන්ධයන්ගේ පහළවීමක් ඇද්ද, ආයතනයන්ගේ ලැබීමක් ඇද්ද, එය ඉපදීම බවය.

භාග්‍යවත් වූ අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ අපට පෙන්වා දෙන පරිදි, මුල් සූත්‍ර දේශනාවලට අනුව, කිසියම් දරුවෙකුගේ පිළිසිඳ ගැනීමකට නම් කරුණු තුනක් සම්පූර්ණ විය යුතුය.

1. මවගේ හා පියාගේ ලිංගික සම්බන්ධතාව
2. මවගේ ඍතුභාවය හෙවත් පිවිතුරු බව
3. ගන්ධබ්බගේ පැමිණීම හෙවත් විඤ්ඤාණයේ එළඹීමත්ය.

(මෙය හුදෙක් විඤ්ඤාණයේ එළඹීම පමණක් නොව සුඛුම වූ රූප ද සහිතව, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, යන පහ ම බව තේරුම් ගන්න. නාම රූපවලින් තොරව විඤ්ඤාණයක පැවැත්මක් ගැන බුදු දහමෙහි ඉගැන්වීමක් නැත).

සංයුත්ත නිකායේ යක්ඛ සංයුත්තයේ ඉන්දික සූත්‍රයට අනුව වරක් තථාගත සම්මා සම්බුදු පියාණන් වහන්සේ ඉන්ද්‍රකූට පර්වතයේ වැඩ සිටිද්දී ඉන්දික නම් වූ එක්තරා යක්ෂයෙක් මෙසේ ඇසී ය. ''ඔබ වහන්සේ මේ රූපය, ජීවය හෙවත් ආත්මය විදියට සලකන්නේ නැහැ. එහෙම නම් මේ රූපය, මේ සිරුර, හැදෙන්නේ කොහොම ද?''

එවිට අපගේ භාග්‍යවත් වූ බුදුපියාණෝ පැහැදිලි කළේ, ''මුලින් ම කලලය ඇතිවේ. (පඨමං කලලං), කලලය ඇති වී අබ්බුද තත්වයට පත්වෙයි (කලලාහොති අබ්බුදං), අබ්බුද අවස්ථාවෙන් පේසි තත්වයට හෙවත් මස් පෙත්තක් බවට පත්වෙයි (අබ්බුදා ජායතෙ පේසි), පේසිය ඝන බවට පත්වෙයි (පේසි නිබ්බත්තති ඝනො), ඝන වූ ඒ මස් පෙත්තෙන් ඉන්ද්‍රියයන් සඳහා ප්‍රශාඛා ඇතිවෙයි (ඝනා පසාඛා ජායන්ති),එසේම කෙස්, ලොම්, නිය ද ඇති වෙයි (කේසා ලෝමා නඛා පි ච). ඔහුගේ මව ආහාර පානාදී යම් දෙයක් අනුභව කරන්නේ ද ඒවායින් මව් කුසට ගිය ඒ නර තෙමේ යැපෙයි (යඤ්චස්ස භුඤ්ජතෙ මාතා අන්නං පානඤ්ච භෝජනං තෙන සො තත්ථ යාපෙති මාතා කුච්ජිගතො නරො) යනුවෙනි.

බුදු දහමෙහි නියම අභිධර්මය හෙවත් ගැඹුරු ධර්මය ලෙස සැලකිය හැකි පටිච්චසමුප්පාද ධර්මයට අනුව නම්, ඉපදීම යනු දුක් ගොඩක් ඇතිවීමකි. ඒ බව අපගේ තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේ ''ඒව මේ තස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති'' යනුවෙන් ඉතාමත් ලස්සනට, පැහැදිලිව ම, නිවැරදි වචනවලින් පෙන්වා දුන්හ. ඉපදීම ඇති වෙන්නේ භවයක් ඇතිවිටය (භව පච්චයා ජාති).

ඉතින් අපේ හාමුදුරුවන්ටත් එදා, අගෝස්තු 9 වැනිදා, ඒ සිදුවූයේ මිනිස් දරුවෙකු ලෙස මෙලොවට මේ දුක් ගොඩක් අරගෙන පැමිණීමටය. දුක් ගොඩක ඉපදීම එසේ සිදුවිය.

මේ භවයේ ඔබ අප හමුවීම අහඹු සිදුවීමක් නොව පෙර පින් බෙලෙන් වූවකි. යම් මවකට හොඳ ගුණවත් දරුවෙකු ලැබෙන්නේත්, යම් දරුවෙකුට හොඳ ගුණවත් මවක ලැබෙන්නේත්, පෙර පින් බෙලෙන්මයි. මිනිසා මවනු ලබන දෙවිවරු මවු පියවරුය. මවට පියාට දෙවියන් වහන්සේ යැයි

කීම හෝ බ්‍රහ්මයා යැයි කීම අනුචිත නොවේ. මවත් පියාත් දෙදෙනා ම බ්‍රහ්මයාට සම කළේ අපගේ සම්මා සම්බුදු අමාමෑණියන් වහන්සේ විසින්ම ය, තිලෝගුරු බුදුපියාණන් වහන්සේ විසින්මය. ඔබ-අප, සසර සැරි සරන සියලු දෙනා ම, අපගේ නෑදෑයෝ යැයි සැලකීම බුදු වදනට කිසිසේත් පටහැනි නැත. අපට ඥාති නොවන කෙනෙක් මේ මිහිපිට නැත.

සසර ගමන ඉතා ම භයානක දෙයකි. අපි සැවො ම අක්මුල් නොදැන යන ගමනකි මේ සසර ගමන. ඉපදෙනවා මැරෙනවා, මැරෙනවා ඉපදෙනවා. සංසාර චක්‍රය යනු මෙයයි. වරක් බුදුරජාණන් වහන්සේ සැවැත ජේතවනාරාමයේ වැඩ වසද්දී භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කරමින් දේශනා කළේ "පින්වත් මහණෙනි, මේ සංසාර ගමන ආරම්භයක් නොපෙනෙන දෙයකි. මුලක් නොපෙනෙන දෙයකි. තණ්හාවෙන් බැඳෙමින් අවිද්‍යාවෙන් වැසෙමින් සත්වයා සසර සැරිසරයි. පින්වත් මහණෙනි, හිතන්න කිසියම් පුරුෂයෙකු මේ මුළු දඹදිව ම තියෙන ගස්, වැල්, තණ, අතු, ඉති රිකිලි, සියල්ලම අඟල් හතරේ හතරේ කෑලිවලට කපලා එකට ගොඩක් ගහනවා කියලා. ඊට පස්සේ ඒ ගොඩේ තියෙන සියලුම අඟල් හතරේ කෑලි එක එක අරගෙන මේ මගේ අම්මා, මේ මගේ අම්මගේ අම්මා, මේ මගේ අම්මගේ අම්මගේ අම්මා ආදී වශයෙන් කියමින් ඒවා එකින් එක බිම තියනවා කියලා, ඒ සියලුම කෑලි ගණන නම් ඉවර වෙවි, ඒත් මේ සංසාරේ ඇවිදින මිනිසාගේ මවුවරුන්ගේ හා කිරි අම්මාවරුන්ගේ හෙවත් ආච්චි අම්මාවරුන්ගේ ගණන නම් නිම කළ නොහැකිය. එයට හේතුව කුමක්ද? පින්වත් මහණෙනි, මේ සංසාරය ආරම්භයක් නොපෙනෙන දෙයක් වීමයි. මේ සසර සැරි සරන සත්වයාගේ මුලක් නොපෙනෙයි. තණ්හාවෙන් බැඳෙමින් අවිද්‍යාවෙන් වැසෙමින් සසර සැරිසරයි. පින්වත් මහණෙනි, ඔබ බොහෝ කාලයක් තිස්සේ සසර සැරි සරමින් අප්‍රමාණ දුක් විඳ ඇත.

මැරි මැරී මිනී කනතු පුරවා ඇත. දැන් ඔය ඇති. සියලු සංස්කාරයන් කෙරෙහි අවබෝධයෙන් ම කල කිරීමට කාලයයි මේ. ඒ සියලු සංස්කාරයන්ගෙන් දැන් ඉවත් වීමට සුදුසු කාලයයි මේ. සංස්කාරයන්ගෙන් නිදහස් වීමට කාලයයි මේ.'' යනුවෙනි.

තණ්හා ආශා වළලු කරේ ලා භවයෙන් භවයට සැරි සරමින් අප සැවොම ආවේ ඔය විදියට ම නේද? තවත් අවස්ථාවක බුදුහු වේපුල්ල පර්වතය පෙන්වමින් දේශනා කළේ සසර සැරි සරන අප විවිධ භවවල දී විවිධ සත්වයන් වෙලා ඉපදුණ අවස්ථාවල අපට ලැබුණ කයේ ඇට කටු ටික එකතු කළා නම්, මේ වේපුල්ල පර්වතයකට වඩා උසට ගොඩක් ගහන්න තිබුණා කියලයි. මෙවන් අක්මුල් නැති ගමනක යන අප හැම පැත්තෙන් ම අසරණයි. මේ නිසයි අපට සරණ, පිහිට, අවශ්‍ය වෙන්නේ. නැත ලොවේ මට වෙනත් සරණක් සරණ සම්බුදු පියා පමණයි. නැත ලොවේ මට වෙනත් සරණක් සරණ සදහම් අමා පමණයි. නැත ලොවේ මට වෙනත් සරණක් සරණ මහසඟ රුවන පමණයි (නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං, නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං, නත්ථි මේ සරණං අඤ්ඤං සංඝෝ මේ සරණං වරං).

<u>මවුපියෝ, නිවස හා පරිසරය</u>

පාරම්පරික ගොවි මහත්මයෙක් වූ අපේ හාමුදුරුවන් වහන්සේගේ පියා ගොවිකම ප්‍රදර්ශනය කළේ කථාවෙන් නොව ක්‍රියාවෙනි. දිවා රෑ වෙහෙසවී තම දරුවන් හය දෙනා හදා වඩා ගැනීමට සිය දයාබර මෑණියන් සහ පියාණන් දැරූ අපමණ වෙහෙස දන්නෝ අන් සැමදෙනාට ම වඩා ඒ දෙදෙනා ම පමණි. පියා කරුණාරත්න හේරත් මුදියන්සේලාගේ රංහාමි ය. මව කරුණාරත්න හේරත් මුදියන්සේලාගේ සිට්ටම්මා ය. මවගේ පරපුරෙන් හා පියාගේ පරපුරෙන් මේ අයට දායාද වී තිබුණේ

බෞද්ධ ජීවන ප්‍රතිපදාව සහ ධර්මිෂ්ඨ වූ ගොවිතැනයි. දැහැමි දිවිය බෞද්ධ දිවියයි. බෞද්ධ දිවිය දැහැමි දිවියයි. දැහැමි දිවිය හැමවිටම හැම තැනම උතුම්ය.

ආණමඩුව නගරයේ සිට නවගත්තේගම දක්වා දිවෙන මහා මාර්ගයේ සැතපුම් තුනකට පමණ එහායින් පිහිටි උන්වහන්සේ උපන් ගම තල්ගස්වැවයි. එම ගම තල්ගස්වැව යැයි ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ ගමෙහි වැව සමීපයේම තල්ගස් බහුලව ඇති බැවිනි. අදත් තල්ගස් වැටක්ම එහි දක්නට ලැබේ. ගමේ හැම දෙනෙක්ම පාහේ තල්ගස්වලින් ප්‍රයෝජන ගන්නෝය. තල්ගස් සහ වැව නිසා ම ඒ ගම 'තල්ගස්වැව' විය.

තල්ගහ, පොල්ගහ මෙන්ම අපේ සාමාන්‍ය ජනතාවට ඉතාමත් ම ප්‍රයෝජනවත් ගසකි. තල්ගහේ ගෙඩි හටහත් විට එය ළපටි කාලයේදී හැම දෙනාටම ඉතා ම රසවත් බීමක් ලෙස පානය කිරීමට හැකියාව ලැබේ. විශේෂයෙන් ප්‍රමාණවත් ජල පහසුකම් නැති අධික රස්නයෙන් මෙන්ම විවිධ දුෂ්කරතාවලින් ද යුත් ප්‍රදේශයක් වන මෙම ප්‍රදේශයේ ජනතාවට සිය දාහය හෙවත් පිපාසාව සංසිඳවා ගැනීමට මෙය ඉතාමත්ම හොඳ සුවදායක මෙන්ම ගුණදායක පානයකි. තල්ගෙඩි මෝරන කාලයට ඉතාමත්ම සුවඳයි. තල්ගෙඩි මෝරා බිමට වැටෙන විට කවුරුත් තල්ගෙඩි ඇහිඳින්නේ තල් කිරි හදා ගැනීමටයි. තල්කිරි කහපාට ඉතා සිසිල් පානයකි. එය මුළුගත ම සිසිල් කරයි. උදේ පාන්දර ම තල්ගහ ළගට දුවන දරුවෝ තල් ගෙඩි ඇහිඳින්නේ ඉතාමත් සතුටිනි. තල්ගහට අධිපති දෙවියෙක් ගැන මහාවංශයේත් සඳහන් වේ.

තල්කිරි හදන්නේ තල් ගෙඩිය මදක් ගිනි අගුරු ගොඩේ තබා රත් කිරීමෙන් අනතුරුවය. ඒ එහි ඇති කිසියම් මත් ගතියක් නැති කිරීමටය. ඇසට ප්‍රිය ජනක වූ තල්කිරි ඉතාමත්ම

ගුණදායක පානයකි. තල් කිරි පමණකුත් නොව තල් ගසේ කොළ වලින් ද විවිධ ප්‍රයෝජන ඇත. තල් ගහේ කොළවලින් විවිධාකාරයෙන් මලු, පෙට්ටි, වට්ටි, පැදුරු, මාගල්, පසුම්බි ආදීය වියන කාන්තාවෝ ඒවා අලෙවි කර කිසියම් ආදායමක් ද උපයා ගන්නා අතර, තම නිවසේ පරිහරණයට ද මේවා යොදා ගනිති. ඈත අතීතයේ පටන්ම තල්ගහ දුප්පත් ජනතාවගේ පිපාසාවන් සංසිඳවූ අතර ඔවුන්ගේ ආර්ථිකය සකසා ගැනීමටත් මහත් සේ උපකාර වී ඇති ගසකි.

අපේ හාමුදුරුවෝ උපන් නිවස වරිච්චි බිත්ති බැඳ හුණු පිරියම් කොට පොල් අතු සෙවිලි කරන ලද පුංචි නිවසකි. ධනයෙන් හා දේපලවලින් පොහොසත් නොවූ මෙම පවුල පිවිතුරු හදවතින් නම් ඉතාමත් ම පොහොසත් පවුලක් විය. ගමේ කාගෙත් සිත් දිනාගත් මේ පවුල එහි පාරම්පරික බෞද්ධ පවුලකි.

ගමේ ආරච්චි මහතා අපේ හාමුදුරුවන් වහන්සේගේ කිරි අත්තා හෙවත් සීයා විය. උන්වහන්සේගේ පියා එකල ගමේ වෙල් විදාන මහතා විය. ගමේ කොයි කාගෙත් සිත් දිනාගෙන ධර්මානුකූල ජීවිතයක් ගතකිරීමට උත්සාහ කළ මෙම පවුල සරළ ජීවිතයක් ගත කළ දැහැමි ගැමි පවුලකි.

උන්වහන්සේගේ පවුලේ සහෝදරයන් දෙදෙනෙක් වූ අතර සහෝදරියන් තිදෙනෙක් විය. අපේ හාමුදුරුවෝ පවුලේ පස්වැනියාය. මේ සහෝදර සහෝදරියන්ට ඉතාමත් සමගියෙන් දිවිගෙවීමට අවශ්‍ය පසුබිම සකස් කළේ විශේෂයෙන් ම උන්වහන්සේගේ මෑණියන්ය.

උන්වහන්සේ හැදුණ වැඩුණ පරිසරය ඉතාමත් සිත්කලු ස්වභාවික පරිසරයකි. සිය නිවස පිහිටි වත්ත පුරා සුදු අරලිය,

කොප්පරා මල්, නිල් කටරොලු, සුදු කටරොලු, සුදු සිංහමුඛ, නිල් සිංහමුඛ, හෙන්දිරික්කා, වතුසුද්ද, මිනීමල්, සමන්, ගැට පිච්ච, ඉද්ද, බෝලිද්ද, සුදු වදමල් හා රතු වදමල් ආදී විවිධාකාරයේ මල් ජාති මෙන් ම අඹ, පේර, ඇඹිල්ල, දෙළුම්, දොඩම්, ගස්ලබු, ලාවුළු, දිවුල්, කටු අනෝදා, මැටි අනෝදා, වැලි අනෝදා, කෑලිය, එරමිණිය, කරඹ, වැනි විවිධ පළතුරු වර්ගවලින්ද යුක්ත විය. ගමේ ළමයින් නිතර නිතර එක්වී විවිධ වූ සෙල්ලම් කරමින් ඉතාමත් ලස්සන සුන්දර ළමා කාලයක් ගත කළේය.

මෙම ගමේ ජීවත් වෙන වැඩි දෙනෙක් ගොවියෝ වූහ. ගමට අයත් වැව් දෙකකි. ඒ තල්ගස්වැව සහ වැටියගෙදර වැවයි. මෙම වැව් දෙකම යටතේ ගොවියෝ ගොවිතැන් කරති. ගමේ හැම කෙනෙක් ම පාහේ හේන් ගොවිතැන ද කරති. කෙසේ වුව ද එදා එම ගම මෙම වර්තමානයේ දියුණු යැයි සලකන ආකාරයෙන් භෞතික වශයෙන් නම් එතරම් දියුණුවක් තිබූ ගමක් නොවී ය. ගමට අවශ්‍ය විදුලි බලය වත් එකල තිබුණේ නැත. එදා මෙම ගමට අවශ්‍ය කරන මූලිකම අවශ්‍යතාවයක් ලෙස සැලකෙන ජල පහසුව ද නොතිබුණ අතර එය මෙම ප්‍රදේශවාසී බොහෝ ගම්මාන වලට තිබුණ ප්‍රධානම ප්‍රශ්නයක් විය. මෙම ප්‍රදේශයේ ජනතාව හැම විටම රජයෙන් ඉල්ලා සිටියේ ජල පහසුකමයි. සෑම මැතිවරණයකින් ම පත්වෙන ප්‍රදේශයේ මන්ත්‍රීතුමාගෙන් ඔවුන් ඉල්ලා සිටින්නේ ගොවිතැන් කර ගැනීමට ජල පහසුකම් ලබා දෙන ලෙසටය. ඔවුන් එදා නිතර පැවසුවේ මෙම ප්‍රදේශයේ ජනතාවට ජල පහසුකම සලසන්නේ නම් රජයේ රැකියා කිසිවක් ඔවුන්ට අවශ්‍ය නැති බවයි. මොන තරම් අපහසුකම් තිබුණත් දුෂ්කරතා තිබුණත් ගමේ බොහෝ දෙනා සුහදව ජීවත් වූහ.

අපේ හාමුදුරුවෝ අද මතක් කරන පරිදි එදා ගමේ බොහෝ දෙනෙක් ඉතාම සතුටින් කාලය ගත කළහ. මෙම ගමේ

වාසය කළ වැසියෝ  අහිංසක බෞද්ධ ගම් වැසියෝ වූහ. ඔවුන්ගේ විශේෂත්වය වූයේ සැම විටම පාහේ සුහදත්වයෙන් එකිනෙකාගේ දුක සැප බෙදා ගෙන ජීවත්වීමය. මෙම ගමෙහි එදා නිවෙස් විසිපහක් පමණ වූ අතර මුළු ගමේම වැසියෝ දෙසියයක් වත් නොසිටියහ.

වර්ෂයේ  වෙනත් මාසවලට වඩා මුළු ගම ම අසිරිමත් වූයේ අස්වනු නෙළන කාලයට සහ අලුත් අවුරුදු කාලයටයි. ගමම එකතුවී කුඹුරු වල සමගියෙන් එකට වැඩ කරන හැටි, කයියට ගොයම් සිටුවන හැටි, ගොයම් කපන හැටි, කොළ පාගන හැටි, මෙන්ම අලුත් අවුරුදු දවස්වලට ගමම අවුරුද්දට සැරසෙන හැටි, කොහාගේ නාදයෙන් මුළු ගමම අවදිවෙද්දී, එරබදු මල් පිපී ගස් රතුපාටින් බැබළෙද්දී, ගමේ දරුවන් එක්වී කැවුම් කොකිස් රස බල බල සෙල්ලම් කරපු හැටි, ඔංචිල්ලා පැදපු හැටි, රබන් හඬින් ගමම අවදිවෙද්දී, මවුපියන්ට බුලත් හුරුළු දී වැඳපු හැටි, පන්සල් ගිය හැටි, ගමම එකතුවී ගමේ සංහිදේ කිරිබත්වල රස බැලු හැටි, අලුත් අවුරුද්ද අවසානයට හිස තෙල් ගාගෙන කුඹුක් ගෙඩිය වගේ පිරුණු වැවට පැනල නාපු හැටි, අපේ හාමුදුරුවන් වහන්සේට තාමත් මතකයේ ඇත. ගැමි සුවඳ, ගැමි දිවිය, සුන්දරය. ඒ සුන්දරත්වය නොදුටු දිවිය නියගෙට අසුවුණු කෙසෙල් ගහක්  වගෙයි.

අක්කර පහක් පමණ විශාල වූ අපේ හාමුදුරුවන් වහන්සේ ඉපදුණ ගෙදර වත්තේ දකුණු පැත්තෙහි අක්කරයක් පමණ වපසරියක කුඹුරකි. නිතරම එම නිවසෙහි වී, කුරක්කන්, අබ, මෙනේරි, බඩඉරිඟු, මෑ, මුං, කවුපි වැනි ධාන්‍ය වර්ග තිබුණි. දිවා රෑ වෙහෙසවී හේනේ කුඹුරේ වැඩ කළ අම්මා සහ තාත්තා දෙදෙනාම වෙහෙස දැරුවේ යහපත් වූ ගුණ ගරුක  දරු පිරිසක් හදාගැනීමට ය. ඒ සඳහා නිවසෙහි දිනපතා උදේ සවස මල්පහන් පූජා කිරීම, දෙමාපියන්ට වන්දනා කිරීම,

අනිවාර්යයෙන් කළ යුතු දේ බවට පත්වී තිබුණි. මේ නිසාම සහෝදර සහෝදරියන් අතර ද සුහදත්වය වර්ධනය විය.

ගෙදරට අවශ්‍ය සහල් එන්නේ බිස්සෙනි. එහෙත් එම බිස්ස පිරෙන්නේ කෙසේදැයි යන්න එදා ඒ පුංචි සිතට එතරම් වැටහුණේ නැත. විශේෂයෙන්ම උන්වහන්සේගේ අම්මත් තාත්තාත් දිවා රෑ වෙහෙසවී හේනේ කුඹුරේ දහඩිය හෙළමින් දැහැමිව හරිහම්බ කරන දේවල් තමයි ඒ. වසරේ දවස් තුන්සිය හැටපහෙන් බොහෝ දිනවල උන්වහන්සේගේ නිවසෙහි වී බිස්ස සහ කුරක්කන් බිස්ස පිරී තිබුණි. උන්වහන්සේ අද මතක් කරන ආකාරයට එකල තම නිවසට ගමේ කඩෙන් මිල දී ගත්තේ භූමි තෙල්, සබන්, කරවල, පරිප්පු ආදී දෙයක් පමණි. සෙසු අවශ්‍ය සහල් හා එළවළු ආදී සියල්ලක් ම එම නිවසෙහි තිබුණි.

## මූලික අධ්‍යාපනය

පුංචි දවස්වල විමල් කියන නමින් කථා කළ සැණින් අම්මා වෙත හෝ තාත්තා වෙත කීකරුව දිවගෙන ගියේ අම්මා හා තාත්තා කෙරෙහි පුංචිම දවස්වල පටන් තිබුණ අසීමිත සෙනෙහස, ආදරය, නිසයි. විමල්ගේ මූලික අධ්‍යාපනයට මග සැලසුණේ තල්ගස්වැව රජයේ විද්‍යාලයෙනි. නිවසේ සිට පාසලට සැතපුම් කාලකට වඩා නැත. මෙම පාසලේ දරුවන්ට නම් මෙම පාසල එදා මහ විදුහලක් වුවද උළු සෙවිලි කළ තරමක විශාල ශාලාවකින් හා පොල් අතු සෙවිලි කළ තවත් කුඩා ශාලාවකින් පුංචි බුදුමැදුරකින් හා ගුරු නිවාසයකින් ද යුත් එම විදුහල එතරම් විශාල විදුහලක් නොවීය. අද තල්ගස්වැව විමලරත්න කුමාරගම විද්‍යාලයය නමින් නම් කර ඇත්තේ එම විද්‍යාලයයි. විමලරත්න කුමාරගම යනු අප රටේ ස්වභාව ධර්මය සමග ජීවත් වු සුවිශේෂ කවියෙකි. හෙතෙම අලියා වැටුණ වැව හෙවත් ආණමඩුව ඇසුරු කරමින් පුත්තලම්

දිස්ත්‍රික්කයේ ආදායම් නිලධාරි වශයෙන් කටයුතු කළ අතර හෙතෙම විමල්ගේ සීයාගේ සමීපතම මිත්‍රයෙක් විය. ඔහුගේ පෑන් තුඩින් ලියවුණ දහසක් පද වැල් වලට තේමාවන් වූයේ මෙම ආණමඩුව සුන්දර පරිසරයයි. විමල් මෙම විදුහලට ඇතුළත් වූ මුල් කාලයේ එහි විදුහල්පති වුයේ පෙරේරා මහතාය. එකල විද්‍යාලයේ සිටි උප ගුරුවරුන්ගෙන් විමල්ගේ සිත වඩාත් සමීප වුයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වූ ඇහැළේපොල මහත්මියට සහ සිංහල භාෂාව ඉගැන්වූ හේරත් මහත්මයාටත්ය.

විමල්ගේ පාසල් දිවිය ද රසවත් බවින් අනූන එකකි. පාසල් වියේ දී සෙසු ශිෂ්‍යයන් අතර මෙන්ම ඇදුරු මඬුල්ලෙහි ද සෙනෙහස දිනාගෙන හැදුන වැඩුන දරුවෙකි විමල්. පුංචි දවස්වල පටන්ම විමල්ගේ වඩාත් කැමති විෂයය වුයේ ඉංග්‍රීසි භාෂාවය. ඇහැළේපොල ගුරුතුමියගේ ඉංග්‍රීසි පංතිය විමල්ගේ සිත් ගත් කාල පරිච්ඡේදය වු අතර හෙතෙම නිතර නිතර ඉංග්‍රීසි කවි කට පාඩම් කරමින් සිටියේය.

<u>දහම් පාසල හා පන්සල</u>

ගමේ දහම් පාසල තිබුණේ ද ගමේ පාසල වන මෙම තල්ගස්වැව රජයේ විද්‍යාලයයේය. දහම් පාසල විමල්ගේ දිවිය අර්ථවත් කිරීමට පදනම වැටුණු තෝතැන්නයි. දහම් පාසල නිසා විමල්ට ගමේ පන්සලේ හාමුදුරුවන් වහන්සේගේ ඇසුර ලබාගැනීමට හැකියාව ලැබුණි. ඒ අනුව හිතේ ශ්‍රද්ධාව ජනිතව තථාගත ලොවුතුරා බුදුපියාණන් වහන්සේ විසින් වරක් "සද්ධාජාතෝ උපසංකමති, උපසංකමන්තෝ පයුරුපාසති, පයුරුපාසන්තෝ සෝතං ඕදහති..." යනාදී වශයෙන් දේශනා කළ ආකාරයෙන් ශ්‍රද්ධාව ඇතිවිට ගුරුවරයෙකු කරා එළඹෙයි. එළඹුණ විට ඇප උප සත්කාරාදිය කරමින් සේවනය කරයි,

ඇසුරු කරයි. සේවනය කරනවිට, ඇසුරු කරන විට, කන් යොමුකරයි. කන් යොමුකර ඇහුන්කන් දෙයි. මේ අනුව විමල්ටත් පුංචි දවස්වලම පෙර කළ පින් මතුවී ටිකෙන් ටික ගිහි ආකල්ප ඉවත් වී පාසල් දිවියෙන් පන්සල් දිවියට මග පෑදුණි.

ගමේ විහාරස්ථානය වූයේ ලබුගල පුරාණ රජමහා විහාරස්ථානයයි. මෙම විහාරස්ථානයට ලබුගල යන නම ලැබී ඇත්තේ එහි ඇති විශාල ගල් පර්වතය මුදුනෙහි තිබී රත්තරන් ලබුගෙඩි දෙකක් නිධානයකින් සොයා ගැනීමෙන් පසුව බව කියති. එම නිධානය තිබුණ තැන ලබු දෙකක් තිබුණ බවට අදටත් සලකුණු ඇත. එම විහාරස්ථානය දේවානම් පියතිස්ස මහ රජුගේ දවස පටන් පැවත එන්නක් බව ඉතිහාසයෙන් කියවේ. මෙම විහාරස්ථානයේ එකල විහාරාධිපති හිමිපාණන් වූවෝ පූජ්‍යපාද ගරු මහමිතව සෝමානන්ද ලොකුහාමුදුරුවන් වහන්සේය. සෝමානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ සතර පේරුවේ දායක දායිකාවන්ගේ සිත් දිනාගෙන ඉතාම හොඳින් විහාරස්ථානය දියුණු කරගනිමින් ගුණවත්ව පැවිදි දිවිය ගත කළ සුවිශේෂ හිමිනමක් වූහ.

උන්වහන්සේගේ අප්‍රතිහත ධෛර්‍යයත් නොපසුබස්නා උත්සාහයත් තිර අධිෂ්ඨානය හා නිවැරදි මග පෙන්වීමත් නිසාම ඉතා පැරණිව  කැඩී බිඳී ගොස් තිබුණ එම විහාරස්ථානය අලුත් වැඩියා කොට එම පුරාණ විහාරස්ථානයට අත්‍යවශ්‍යව තිබුණ විශාල ධර්ම ශාලාවක්, විහාර මන්දිරය හා බෝධීන්වහන්සේ වැඳ පුදාගැනීමට යන මාවතේ පඩිපෙළත් සකස් කරගැනීමට දායක දායිකාවන්ට අවස්ථාව ලැබුණි. උන්වහන්සේගේ කාලය මෙම ලබුගල පුරාණ රජමහා විහාරස්ථානයේ ස්වර්ණමය යුගය ලෙස සැලකීම ඉතාමත් නිවැරදිය.

තල්ගස්වැව විද්‍යාලයයේ පැවති දහම් පාසලට සෑම ඉරුදිනකම පයින්ම වැඩම කරන ගරු සෝමානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ විමල්ගේ නිවස ඉදිරියෙන් වැඩම කරන්නේ මොන මොහොතේ දැයි බලා සිටින විමල් සෝමානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ සමගම දහම් පාසලට යාම සිරිතක් කරගෙන තිබුණි. එයටද විශේෂ හේතුවක් තිබුණි. ඒ ගරු ලොකු හාමුදුරුවන් වහන්සේගේ ඇසුර ප්‍රිය කිරීමයි.

මෙම දහම් පාසලේ නම ශ්‍රී රාහුල දහම් පාසලය. සෑම ඉරුදිනකම මෙසේ ලොකු හාමුදුරුවන් වහන්සේ සමගම ලොකුහාමුදුරුවන් වහන්සේගේ කුඩේ යටින් දහම් පාසලට යෑමට පුරුදු වී සිටියේ විශේෂයෙන්ම ලොකුහාමුදුරුවන් වහන්සේ කියා දෙන කතා අසා දැන ගැනීමටය. මේ අයුරින් නිවසේ සිට පාසල දක්වා යන අතර මග විවිධ ප්‍රශ්න ඇසීමේ පුරුද්දක් ද විමල්ගේ විය. එසේම ලොකු හාමුදුරුවන් වහන්සේ සමග ඒ ඒ දවසේ කාලගුණය සම්බන්ධව ඔට්ටු ඇල්ලීම ද පුරුද්දක් විය.

මේ වනවිට විමල්ගේ වයස අවුරුදු නවයකි. එදා දහම් පාසලට ගියේ ඉගෙන ගැනීමටම නොව බොහෝ සෙයින්ම අනිත් ළමයින් සමග සෙල්ලම් කිරීමට සහ පන්සලේ ලොකු හාමුදුරුවන් වහන්සේ සමග කුඩේ යටින් යමින් ඔට්ටු අල්ලා ජයග්‍රහණය කිරීමේ ආශාවෙනි. මෙසේ ඔට්ටු අල්ලා ජයග්‍රහණය කරන මුදල්වලින් පාසල ඉදිරියේම ඇති කිරියා මුදලාලිගේ කඩෙන් සීනිබෝල ගෙන පංතියේ සියලුම දෙනා සමග බෙදා හදා ගෙන කෑම විමල්ගේ සිරිත විය.

දහම් පාසල නිමවී අව් කාෂ්ටේ ආපසු පන්සලට වඩින ලොකු හාමුදුරුවන් වහන්සේ සමගම විමල් ද ගෙදරට එයි. ඒ එන අතර ද ලොකු හාමුදුරුවන් වහන්සේගේ කුඩේ යටින්

එන්නේ විවිධ වාද විවාදයන් ද කරමින්ය. වරෙක ලොකු හාමුදුරුවන් වහන්සේ "විමලෝ හා හොඳයි අද වහිනවද නැද්ද?" කියා අසති. එවිට ඔහු ලොකු තාරකා ශාස්ත්‍රඥයෙක් වගේ, තාරකා විද්‍යාඥයෙක් වගේ, දැන උගත් කෙනෙකු වගේ, අහස දෙස බලමින් ම්...ම්...ම්...අද නම් වහිනවා හෝ අද නම් වහින්නෙ නෑ කියා කියන්නේ ඒ පුංචි සිතට එදා වැටහුණු ආකාරයටය. ඉතින් ඒක තමයි ඔට්ටුව. "වහිනවද? නැද්ද?". බොහෝවිට ඔට්ටුව අල්ලන්නේ ශත දහයකටය. නමුත් එහි විශේෂත්වය වූයේ මේ ඔට්ටුවෙන් දිනපතාම ජයග්‍රහණය කරන්නා විමල්ම වීමය. ඔට්ටුව දිනුවත් පැරදුණත් විමල්ටත් යාළුවන්ටත් සීනි බෝල කෑමට ශත දහයක් ලැබුණා. එදා ශත දහයට සීනි බෝල (නාරම්පෙති), පහළොවක් විස්සක් පමණ ලැබුණා. විමල් කඩේට දුවලා සීනි බෝල ගෙනල්ලා හැම දෙනා ම සමග බෙදා ගෙන කෑවා. ලොකු හාමුදුරුවන්ටත් දුන්නා. ඒත් කවදාවත් ලොකු හාමුදුරුවෝ නම් ඒ සීනිබෝල වැළඳුවේ නැහැ. ඒවත් ආපසු ලැබුණේ විමල් ඇතුළු සිසු දරුවන්ටමය.

අව්වේ, වැස්සේ, පින්නේ එහා මෙහා දුව පනිමින් ගමේ වෙල් යායේ, වැව් කණ්ඩියේ, තාවල්ලේ, ඇළේ, දොළේ, කැලේ, පිළේ, සෙල්ලම් කළ විමල් ළමයින් සමග අඹ, දම්, දිවුල්, පේර, කජු, පලු, වීර, කොතලහිඹුටු, නාරං, දොඩම් ආදියේ රස සොයමින් පුංචි දවස්වල ගමේ සම වයස්කයන් සමග විවිධ කෙළි සෙල්ලම් කළේය. නිතරම සාමකාමී ජීවිතයක් ගතකළ හෙතෙම සෑම පොහෝ දිනකම අම්මා සහ කිරි අම්මා ද සමග ගමේ පන්සලට යාම පුරුද්දක් කරගෙන තිබිණි.

# පාසලෙන් පන්සලට

පාසල් දිවියට ආයුබෝවන් කියූ විමල් පන්සල් දිවිය ආරම්භ කළේ 1970 වසරේ දී ය. විමල්ගේ නිවසේ සිට

පන්සලට සැතපුම් බාගයක් පමණ ඇත. ඒ ලබුගල පුරාණ රජමහා විහාරස්ථානයයි. පුංචි කාලයේ පටන් ම විමල්ගේ අම්මා ත් කිරි අම්මා ත් දෙදෙනාම හතර පෝයට ම සිල්සමාදන් වෙන්නට පන්සල් ගියා. විමල් ද අම්මාත් කිරි අම්මාත් සමග සතර පෝයට ම පන්සල් ගියේ සිල් සමාදන් වීමට හෝ දහම් ඉගෙන ගන්නට ම තිබුණ ආශාව නිසා නොව විශේෂයෙන් ම පන්සලේ සිටිය සම වයසේ පොඩි හාමුදුරුවරුන් සහ අනිත් ළමයින් සමග සෙල්ලම් කිරීමටත් ලොකු හාමුදුරුවන් වහන්සේ රේඩියෝ හදන විට ඒ දෙස බලාගෙන සිටීමටත් තිබුණ ආශාව නිසාය. ලොකු හාමුදුරුවන් වහන්සේ රේඩියෝ හදන විට ඒ දෙස බලා සිටිමින් විමල් අසීමිත සතුටක් තෘප්තියක් ලැබීය.

මෙසේ රේඩියෝ හදනවිට බලා සිටිද්දී ලොකු හාමුදුරුවන් වහන්සේ ''විමල් මේක අල්ල ගන්න'' ''මේක දෙන්න '' කියමින් ට්‍රාන්සිස්ටරයක් හෝ වයරයක් වැනි දෙයක් අල්ලා ගැනීමට කියා පුංචි සහයෝගයක් ලබා ගනියි. විමල් එය එදා කළේ ඉමහත් ආශාවෙනි. එය ම විමල්ගේ රේඩියෝ හැදීමට තිබුණ ආශාව ද වැඩි කරන්නක් විය. පසුකාලීනව විමල් පෝය දිනවල පමණක් නොව වෙනත් සමහර දිනවල ද රේඩියෝ හැදීමේ ආශාව නිසාම පන්සලට ගියේය.

දිනක් පන්සලට ගිය විමල් ආපසු ගෙදර පැමිණියේ නැත. එදා වැසි දිනයකි. කුඩයක් ද රැගෙන පන්සලට ගිය ඔහු ඉන්පසු පන්සලේම නතර විය. පසු දිනෙක විමල්ගේ තාත්තා අත එම කුඩය ගෙදරට එවී ය. එක් දිනක් ලොකු හාමුදුරුවන් වහන්සේ විමල්ගේ පියා හමු වූ අවස්ථාවක ''කෝ විමල්'' කියා අසද්දී සිය පියා පිළිතුරු දී තිබුණේ ''අනේ මන්දා අපේ හාමුදුරුවනේ ඔන්න රේඩියෝ හදන්න යනවා කියලා පන්සලට ගියා මොනවා කරගනියි ද මන්දා'' කියාය. මෙසේ දිනෙන් දිනම පාසල් දිවිය අතහරිමින් පන්සල් දිවියට පුරුදු වූ විමල් තවත්

ශිෂ්‍යයන් පස් දෙනෙකු සමග පන්සලේ කටයුතු කරමින් ජීවත්වන්නට විය.

තල්ගස්වැව විදුහලේ එදා තිබුණ පරිසරය අද පරිසරයට වඩා ඉතාමත් පියකරු විය. එදා මුළු පරිසරයම පියකරුබවට පත්ව තිබුණේ පාසලේ වැට දිගටම ලස්සනට රෝස පාට මල් වර්ගයකින් සැරසී තිබීමත්, පාසලට ඇතුළුවෙන තැන සිට ම මහා විශාල මාර ගස් කීපයක් තිබීම නිසා නිතරම මාර මල් හා මාර පළු ආදිය තිබීම, මෙන්ම පාසල් වත්තේ ද විවිධ ගහ කොළ ද තිබුණ නිසාය. ගුරු නිවාසය පිටුපස තිබුණ විශාල අඹගස්, මයිල ගස්, අනෝදා ගස්, පේර ගස්, ලාවුළු ගස් ආදිය නිසා පාසල් වත්ත නිතරම පිරුණු ගතියක් තිබුණි. ඒත් අද ඒවා කිසිවක් නැත. ඒ සියල්ලම අනිත්‍ය ස්වභාවයට පත්වී ඇත.

ඒ 1970 වසරයි. මෙකල තල්ගස්වැව විද්‍යාලයයේ ලොකු මහත්මයා ලෙස හෙවත් විදුහල්පති ලෙස කටයුතු කළේ වෙනන්සියස් මහතාය. වෙනන්සියස් මහතා ක්‍රිස්තු භක්තිකයෙකි. සෑම ඉරු දිනකම ආණමඩුව පල්ලියේ දේව මෙහෙයට සහභාගීවෙන මෙම පවුලේ අය තම ආගම ඉතා හොඳින් ඇදහූ අය වූහ. සිය ආගම ඉතා හොඳින් අදහන අතරම වෙනන්සියස් මහතාත් සිය පවුලේ හැම දෙනාමත් ලබුගල පුරාණ විහාරස්ථානයේ එකල වැඩසිටි විහාරාධිපති හිමියන් වූ මහමිතව සෝමානන්ද හිමියන් සමග ද ඉතා සුහද ඇසුරක් තිබුණි. මෙම පවුල පාසලේත් පන්සලේත් හැම දෙනාගේම හොඳහිත දිනාගනිමින් ජීවත් විය.

විමල් පාසල් යන කාලයේ ඔහුගේ ඉතාමත් ම සමීප මිත්‍රයා වුයේ මෙම වෙනන්සියස් මහතාගේ පුතණුවන් වූ සුසිල්ය. විමල් සුසිල් ගේ අඹයාළුවා වීම නිසාත් විමල්ගේ විවිධ

දක්ෂතා නිසාත් වෙනන්සියස් ලොකු මහත්මයාත් එම බිරිඳත් සුසිල්ගේ වැඩිමහල් සහෝදරියන් දෙදෙනාත් ඇතුළු පවුලේ සියල්ලෝම විමල්ට ඉතාම ආදරයෙන් සැලකූහ. අවසානයේ විමල් පාසලෙන් අස්වී ගියත් වෙනන්සියස් ලොකු මහතා බොහෝ කාලයක් යනතෙක් ම පාසලේ නාම ලේඛනයෙන් විමල්ගේ නම ඉවත් කළේ ද නැත.

මෙසේ කාලය කෙමෙන් ගතවී ගියේ විමල් පන්සලේ විවිධ කටයුතු වල නිරත වෙමින් දෛනිකව පන්සලේ කළයුතු වතාවත් ආදිය කරමින් පැවිදි වීම සඳහා අවශ්‍ය මූලික දේ ඉගෙන කියාගනිමින් සිටින අතරය. විමල්ට පුංචි දවස්වල සිටිම හැම දෙනාම පාහේ ආදරය දැක්වූයේ ය. මෙය සමහර අයට කිසියම් ඊර්ෂ්‍යාවක් ඇති කර ගැනීමට ද හේතුවක් විය. ඒ අනුව මෙම ශිෂ්‍යයන් අතර ද යම් යම් ප්‍රශ්න, පුංචි පුංචි ගැටුම්, හැලහැප්පිලි කම් ද ඇති විය. ඒ හැම විටම කම්පා නොවී කිසිවෙකුට වෛර නොකර සිටීමට විමල්ට කාරුණිකව අවවාද කළේ විමල්ගේ ආදරණීය මෑණියන්ය. ඇය පින්වන්තියකි. මහත් ශ්‍රද්ධාවක් ඇති සද්ධාණවන්තියකි. ගුණයෙන් අනූන පින්බර මෑණි කෙනෙකි.

# අමිත්‍රයන් හඳුනා ගැනීම

පොත පත ඉගෙන ගනිමින් දක්ෂ ලෙස වැඩ කරද්දී කාගෙත් ආදරය, සෙනෙහස, විමල්ට ලැබෙද්දී සෙසු අයට ඊර්ෂ්‍යාවක් ඇති විය. ඒ අනුව ඔවුන් විවිධාකාරයෙන් නම් ගම් හදමින් විමල්ට දෝෂාරෝපණ කළත්, විවිධ ඇනුම් බැණුම් ආවත් විමල්ට සිය මෑණියන්ගේ උපදෙස් නිසාම සිත හදාගැනීමට හැකි විය. විවිධ අය විවිධ දේ කියා තමන්ට චෝදනා එල්ල කරද්දී ඔහු කළේ ඇඬීම පමණි. ඒ සියලු චෝදනා දෝෂාරෝපණ ආදියට හේතු වුයේ එම ශිෂ්‍යයන්

විමල් කෙරෙහි ඇති කරගෙන තිබුණ විවිධාකර වූ සැක සංකාවන්ය. මෙය විමල්ට මිත්‍රයන් ලෙසින් සිටි සමහර අමිත්‍රයන් ද පුංචි කාලයේදීම හඳුනාගැනීමට අවස්ථාවක් ලැබින. 1970 වර්ෂයේ පන්සලට පැමිණි විමල් වර්ෂයක පමණ කාලයක් තුළ සාමණේර වරයෙකු විසින් දැන ඉගෙන ගත යුතු වත්පිළිවෙත් දැනගත් අතර සාමණේර දිවියට අවශ්‍ය මූලික බණ දහම් ද ගුණ දහම් ද ඉගෙන ගත්තේය. වදන් කවි පොත, ගණදෙවි හැල්ල, සකස්කඩය, නාමාෂ්ට ශතකය, නවරත්නය, ව්‍යාසකාරය, හිතෝපදේශය, බාලාදර්ශය ආදී සංස්කෘත මූලික ශතක පොත් ඔහු කටපාඩම් කළේය. සේඛියාව, දින චරියාව, මෙන්ම ධම්මපදය, පිරුවාණා පොත් වහන්සේ, වැනි බුදුවදන් ද ඔහු කටපාඩම් කළේ ඉතා දක්ෂ අයුරිනි, මහත් ඕනෑ කමකිනි.

1971 වර්ෂ මුළු රටම කලබලයට පත් කළ සමයක් විය. ඒ ජනතා විමුක්ති පෙරමුණ අවිය සවිය කරගනිමින් බලයට පැමිණීමට තැත් කළ මුල් ම අවස්ථාවයි. රට ම බිය ගැන්වූ අවස්ථාවයි. සියල්ල වෙනස් වෙන බව, ඇති වෙන සෑම දෙයක් ම නැති වෙන බව, අපට පෙන්වා දුන්නේ අපගේ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ය. කාලය කෙමෙන් ගෙවී ගියා. විවිධ පරිවර්තන රාශියක් ඇති වුණා. දේශපාලනික වශයෙන් විවිධ වෙනස් කම් රාශියක් ඇති වුණා. රටම වෙනස් වුණා.

1972 මැයි මාසය එළඹුණි. එදා 1948 දී ලංකාවට ලැබුණ නිදහස තවදුරටත් අර්ථවත් කරමින් මැයි මාසේ 22 වැනිදා සිට මෙපමණ කලක් ලංකා හෝ සිලෝන් නමින් හැඳින්වූ ලංකාව "ශ්‍රී ලංකාව" යනුවෙන් නම් කරන්නටත්, නව ව්‍යවස්ථාවක් සම්පාදනය කරන්නටත්, නව රාජ්‍ය ලාංඡනයක් සකස් කරන්නටත්, රජය සූදානම් වෙන බව දැනගන්නට ලැබුණ විමල්ගේ ගුරුදේවයන් වහන්සේ වූ පූජ්‍ය මහම්තව සෝමානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ එදිනම එම නැකතට ම විමල් ද

පැවිදි කිරීමට තීරණය කළහ. ඒ අනුව සියල්ල සූදානම් විය. දෙමව්පියන්ගේ ද අවසරය ලබාගත් විමල්ට සිය ඥාති මිත්‍රයන් හා මහා සංඝරත්නය අභියසදී එදින එනම් 1972 මැයි මස 22 වැනි දින පැවිද්ද ලබාදුන්හ.

එදින පටන් විමල් යන නම ඉවත්වී - තල්ගස්වැවේ සීලානන්ද හිමි- යන නම ව්‍යවහාරයට පත් විය. "සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්ඡිකරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජෙථ මං භන්තේ" ( ස්වාමීනි සියලු දුක්වලින් නිදහස් වීම පිණිස, නිර්වාණ ධර්මය සාක්‍ෂාත් කරගැනීම පිණිස, මේ සිවුර ගෙන මාව පැවිදි කරන්න) යනුවෙන් එදා සිය උපාධ්‍යායයන් වහන්සේගෙන් ඉල්ලා සිටිමින් පැවිද්ද ලබා ගත්තත් ඇත්තෙන්ම මේ පුංචි හාමුදුරුවන්ට එදා සියලු දුක් නැති කිරීම ගැනවත් නිර්වාණ ධර්මය අවබෝධ කර ගැනීම ගැනවත් කිසියම් අවබෝධයක් තිබුණේ නැත. එම පැවිද්ද සාම්ප්‍රදායිකව කරන ලද්දක් විය. ගත පැවිදි කිරීමකි. අමාරු දේ සිත පැවිදි කිරීමයි.

මෙසේ ඉතාම පුංචි දවස් වල පැවිදි කිරීම ගැන විවිධ අය විවිධාකාර මත ඉදිරිපත් කරන බව අපි දනිමු. සමහර උදවිය මෙය නුසුදුසු බව ප්‍රකාශ කරන අතර තවත් සමහරෙක් කියන්නේ පුංචි දවස්වල පැවිදි කිරීම ඉතාමත් හොඳ බවයි.මේ සඳහා ඉදිරිපත් කරන කරුණු ද සාධාරණය. විශේෂයෙන්ම පැවිදි දිවියට අවශ්‍ය ශික්‍ෂණය ලබාගැනීමේ දී නම් පුංචි දවස්වලම යම් කෙනෙකුට පැවිදි වෙන්නට හැකි නම් එය ඉතා සුදුසුය. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනයට අනුව වයස අවුරුදු 7 ක් වු පසු පැවිද්දට සුදුසුයි. රාහුල, සෝපාක, සංකිච්ච වැනි අය සම්බුද්ධ ශාසනයේ පැවිදි වුයේ වයස අවුරුදු හතක් වැනි ළා බාල අවදියේදී ම ය. එක් අවස්ථාවක බුදුපියාණන් දේශනා කොට වදාළේ කපුටෙකු එළවා ගැනීමට තරම් හැකියාවක් ඇත්නම් හෙතෙම මහණ කිරීමට සුදුසු බවය.

කුඩා අවදියේ දී ම පැවිදිවීම නිසා පැවිද්දාට අවශ්‍යවන ගුණ ධර්ම වඩා ගැනීමටත් ශික්ෂණය ලබාගැනීමටත් කාලය හා ශාරීරික පහසුතාවය ද ඉඩ සලසයි. පැවිදි සමාජයේ වයසට ගොස් පැවිදි වෙන අය හඳුන්වන්නේ බුඩ්ඩ පබ්බජිත යන නමිනි. එසේ වයසට ගොස් පැවිදි වෙන බොහෝ දෙනෙකුගේ තියෙන ගිහි ආකල්ප වෙනස් කරගැනීමට සමහර අයට බොහෝ කාලයක් ගතවෙයි. උදාහරණයක් ලෙස වයසට ගොස් පැවිදි වෙන අය නිතරම කතා කරන්නට කැමැත්ත පළ කරන අතර ඒ කතාවල මාතෘකාවට කොහෙන් හෝ පැටලි පැටලී එන්නේ තමන්ගේ ගිහි ගෙදර දේවල්ය. සමහරවිට තමන්ගේ දරුවන්ගේ තොරතුරුය. එසේ නැතහොත් තමන් ගිහි කල කළ කී දේවල්ය.

කෙසේ වුව ද යම් කෙනෙකු පැවිදි වීම හෝ උපැවිදි වීම යන දෙකම එතරම් ලොකු දේවල් නොවෙයි. එතරම් අපහසු දේවල් නොවේ. පැවිදි වීමත් උපැවිදි වීමත් දෙක ම ලෙහෙසියෙන් පහසුවෙන් කළ හැකිය. එහෙත් අපහසු දෙය වන්නේ ලබාගත් පැවිද්ද ඒ ආකාරයෙන්ම ආරක්‍ෂා කරගැනීමට උත්සුක වීමය. අපගේ බුදුරජාණන් වහන්සේ පැවිද්දන්ට දේශනා කළේ" ඉතා කුඩා වැරැද්දෙහි ද භය දකිමින් වාසය කරන්න" (අනුමත්තේසු වජ්ජේසු භය දස්සාවී) යනුවෙනි.

යම් කෙනෙකුට මේ භවයේ දී පැවිදි වීමට අවස්ථාවක් ලැබෙන්නේ අනිවාර්‍යයෙන්ම පෙර භවයේ දී කරන ලද මහා පිනක විපාකයක් වශයෙන් යැයි කීම ධර්මානුකූලය. හැම කෙනෙකුගේම පැවිදි වීමට සිත යොමුවන්නේත් නැත. එසේම පැවිදි වීමෙන් පසු හැම කෙනෙකුටම එම පැවිදි දිවිය සාර්ථක අන්දමින් පවත්වාගෙන යාමට, පින් වැඩෙන ආකාරයෙන් පවත්වාගෙන යාමට, අවස්ථාවක් ලැබෙන්නේත් නැත.

කෙසේ හෝ පැවිදි වීමේ බලවත් ආශාවක් තිබුණ මේ පුංචි දරුවා, විමල්, පැවිද්දෙන් අනතුරුව ඉතාම සතුටින් හා

ශ්‍රද්ධාවෙන් යුතුව සිය අලුත් ජීවිතය ආරම්භ කළේ ය.

එදා පැවිදි වීමෙන් අනතුරුව සිය මාපියන් සහ පවුලේ සමීපතම ඥාති පිරිසත් සමග ජායාරූපයක් ගැනීම සඳහා උන්වහන්සේ සාමාන්‍ය පුටුවක වාඩි වුවද උන්වහන්සේගේ දෙපාවත් බිම ගැවුනේ නැත. ඒත් "දහර වුවත් යම් භික්ෂුවක් මේ බුදුසසුනේ මැනවින් කටයුතු කරයි නම්, හෙතෙම වලාකුළෙන් නික්මුණු චන්ද්‍රයාසේ ලෝකය බබළයි" (යො හවේ දහරෝ භික්ඛු යුඤ්ජති බුද්ධ ශාසනේ සො ඉමං ලෝකං පභාසෙති අබ්භාමුත්තෝව චන්දිමා ) යනු සම්මා සම්බුද්ධ දේශනයයි. මේ පැවිදි වූ දා ගත් එම ජායාරූපයයි. ඒ වයසස අවුරුදු 11 හේ දී ය.



අපේ හාමුදුරුවෝ පැවිදි වූ දා
( සිය මව සහ පියාත් මවගේ පියා සහ පියාගේ මවත් මෙහි වෙති. )

අපේ තල්ගස්වැවේ සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේගේ පැවිදි වීමට අම්මා තාත්තා දෙදෙනාම කැමැත්ත පළ කළ ද පවුලේ සමහර සමීපතම ඥාතීන් ම  කැමැති වුයේ නැත. එයට ප්‍රධානම හේතුව වුයේ පවුලේත් එම ගමේත් සමහර අය පැවිදි වී සිට  පසුව උපැවිදි වී නිවසට පැමිණ සිටීම ය. උපැවිදිවීම යනු සිවුරු හැර යාමයි. ලංකාවේ අපේ ගම්බද බොහෝ දෙනෙක් සලකන්නේ කිසියම් දරුවෙකු පැවිදි වුවහොත් එම පින පවුලේ කීපදෙනෙකුට පමණක් නොව සතර වර්ගයක්ම නිවන් දකින පිනක් ලෙසටය. සතර වර්ගය යනු මවගේ මවගේ පාර්ශ්වය, මවගේ පියාගේ පාර්ශ්වය හා පියාගේ මවගේ පාර්ශ්වය, පියාගේ පියාගේ පාර්ශ්වය යන හතර වර්ගයයි. මේ අනුව පැවිදිවීම ඉතාමත්ම උතුම් පින්කමකි.

වරක් බුදුපියාණන් වහන්සේම දේශනා කළේ ''පබ්බජ්ජා භික්ඛවෙ සප්පුරිස පඤ්ඤත්තං පණ්ඩිත පඤ්ඤත්තං'' යනුවෙන් '' මහණෙනි පැවිද්ද වනාහී සත්පුරුෂයන් විසින් පණ්ඩිතයන් විසින් අනුමත කළ දෙයකි'' යනුවෙනි.

යම් කෙනෙක් උපැවිදි වීම යනු සමස්ත සමාජයෙන්ම බැහැර කිරීමට හෝ අගෞරවයට පත් කිරීමට හෝ නොසලකා හැරීමට හෝ  හේතුවක් නොවිය යුතුය. බුදුදහමට අනුව පැවිදි වෙන හැම කෙනෙකුම දිවි ඇතිතාක් පැවිදි බව ආරක්ෂාකර ගනිමින් පැවිද්දේම සිටිය යුතුය යනුවෙන් නියමයක් නැත. කිසියම් කෙනෙකුට පැවිද්දෙහි සිටිමින් පැවිදි දිවිය ගත කිරීමට අපහසු නම් උපැවිදි වී ගිහි ජීවිතයක් ගත කිරීමට බුදුදහමින් බාධාවක් නැත. එය වැරැද්දක් ද නොවේ. වැරැද්දක් වන්නේ යම් කෙනෙකු පැවිදි දිවියෙහි ම සිටිමින් වැරදි වැඩ කරමින් පැවිද්ද කෙලෙසන අන්දමින් කටයුතු කිරීමය.

ශ්‍රී ලංකාවේ කිසියම් කෙනෙකු පැවිදි වී සිට උපැවිදිවූ විගස ඔහුට හෝ ඇයට සමාජයෙන් නින්දා අපහාස උපහාස වලට ලක්වීමට සිදුවේ. එහෙත් එය තායිලන්තය හා බුරුමය වැනි අප වැනි ම වූ ථේරවාද වෙනත් රටවල නම් එය විශේෂ සුදුසුකමක් සේ සලකති. එසේ සලකන්නේ එයින් විශේෂ ශික්ෂණයක් ලැබීම නිසාය.

එම ථේරවාදී රටවල සෑම තරුණයෙකුම පාහේ තරුණ කාලයේ දී පැවිදි විය යුතුය. එය ජීවිතයට අවශ්‍ය කරන විශේෂ ශික්ෂණයකි. කෙනෙකු විවාහ දිවියට ඇතුළත් වීමේදී පැවිදි වී සිට උපැවිදි වුයේ නම් එය විශේෂත්වයක් සේ සලකති. එයට හේතුව වන්නේ පැවිද්ද ලබාගත් කෙනෙකු තුළ ඇතිවෙන ධර්මානුකූල වූ ශික්ෂණයයි. හික්මීමයි. නොහික්මුණ අයගෙන් පිරි සමාජයක් තුළ මෙවැනි බෞද්ධ ශික්ෂණයක් සෑම තරුණයෙකුටම තිබිය යුතුය. පැවිදි ගිහි සෑම කෙනෙකුට ම ශික්ෂණය අවශ්‍යම දෙයකි. වරක් අපගේ තථාගත බුදුපියාණන් වහන්සේ ම ඇසින් සංවර වීම යහපත්, කණින් සංවර වීම යහපත්, නාසයෙන් සංවර වීම යහපත්, දිවෙන් සංවරවීම යහපත්, කයින් සංවර වීම යහපත්, වචනයෙන් සංවරවීම යහපත්, මනසින් සංවර වීම යහපත්, සෑම තැනම සංවරවීම යහපත්ය. මෙසේ යහපත් වූ තැනැත්තා, භික්ෂුව, සියලු දුක් නැති කරන්නේ යැයි දේශනා කොට වදාළහ.

අද සමාජයේ තරුණ තරුණියන්ට විශේෂයෙන් ම නොලැබෙන අත්දැකීම් රාශියක් ලබාගැනීමට විශේෂයෙන්ම කෙටිකාලයකට හෝ පැවිද්ද මහත් සේ උපකාරී වේ. එහෙත් පැවිදි විය යුත්තේ උපැවිදිවීමේ අපේක්ෂාවෙන් හෝ ගිහි ජීවිතය ගත කිරීමට අවශ්‍ය ශික්ෂණය ලබා ගැනීමට හෝ නොව සසර දුක තේරුම් ගෙන සසර දුකින් නිදහස්වීමෙන් වහ වහාම නිවන් සුව අවබෝධ කරගැනීමටය. පැවිදි වී සිට යම් කෙනෙකු

උපැවිදි වන්නේ නම් ඔහුගේ පිරිහීම වැළැක්විය නොහැකිය. කෙටි කාලයකට පැවිද්දක් ලබාගන්නවා යන්න මුල් බුදුසමයේ ඇති දෙයක් නොවේ. බුදුපියාණන් වහන්සේගේ පුත්‍රයන් වශයෙන් මේ ශාසනයට ඇතුළත් වෙන අය බුදු දහම මැනවින් හදාරන්නේ නම් භාවනාවෙහි යෙදෙන්නේ නම් උපැවිදි වීමට ඇති ඉඩ කඩ අතිශයින්ම සීමා සහිත වේ. සසර බිය වටහා ගැනීමට යම් කෙනෙකුට හැකිවන්නේ නම් ඔහු නැවතත් ගිහි ගෙයට යන්නේ නැත.

වරක් බුදුරජාණන් වහන්සේ ම දේශනා කළේ යම් කෙනෙකු පැවිදි වී සිට උපැවිදි වුවහොත් ඒ තැනැත්තා හැම අතින්ම පිරිහෙන බවය. ඔබ දන්නා හඳුනන යම් යම් සිවුරු හළ අය ගැන ටිකක් සිතා බැලුවොත් මේ කරුණ ගැන ඔබටම අනේ අපගේ තථාගත ලොවුතුරා සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ බුද්ධ වචනය කොයි තරම් නම් නිවැරදි ද කියා වටහා ගැනීමට අපහසු නොවනු ඇත. පිරිහෙන විට ඒ තැනැත්තා පිරිහෙන්නේ එක පැත්තකින් නොවෙයි හැම පැත්තෙන්මයි. කොයි තරම් ලොකු තනතුරු දැරුවත් ජීවිතයේ අවසන් කාලයේ දී හෝ ඔහු පිරිහීමට පත්වේ. ජීවිතය ගැන නිවැරදි අවබෝධයක් අපට අවශ්‍ය වෙන්නේ මෙන්න මේ නිසයි නේද?

මේ පිළිබඳව අපගේ තථාගත සම්මා සම්බුදු පියාණන් වහන්සේ විසින් සංයුත්ත නිකායේ මග්ග සංයුත්තයේ ගංගා සූත්‍රයෙන් දේශනා කළ දේශනයක් මෙහි දී ගෙන හැර දැක්වීම බොහෝ දෙනාට උපකාරීවේ යැයි සිතමු.

වරක් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා අමතා මෙසේ වදාළහ. ''පින්වත් මහණෙනි මේ ගංගා නම් ගඟ නැඹුරුවෙලා තියෙන්නේ, හැරිලා තියෙන්නේ, නැමිලා

තියෙන්නේ, බරවෙලා තියෙන්නේ, නැගෙනහිර දිසාවටයි. ඉතින් හිතන්න විශාල ජනකායක් උදලු, කුඩ, ආදිය අරගෙන එනවා මේ ගඟ බටහිර දිසාවට හරවන්න කියලා. පින්වත් මහණෙනි, මේ ගැන මොකද හිතන්නේ! මේ ගඟ බටහිරට හරවනවා කියන එක කරන්න පුළුවන් දෙයක් ද?'' ''ස්වාමිනි මෙය කළ නොහැකි දෙයක්'' යැයි භික්ෂුන් වහන්සේලා පිළිතුරු දුන්හ. එයට හේතුව වශයෙන් කියා සිටියේ ගංගා නම් ගඟ නැගෙනහිරට ම හැරිලා නැගෙනහිරට ම නැමිලා තියෙන නිසා බවය.

එහි දී බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා දේශනා කළේ ''පින්වත් මහණෙනි අන්න ඒ ආකාරයෙන්ම යම් භික්ෂුවක් ආයෂ්‍ර අෂ්ඨාංගික මාර්ගය වඩන්නේ නම් පුහුණු කරන්නේ නම් ඔහුට රජ්ජුරුවෝ කිවත්, කිසියම් මැති ඇමති කෙනෙක් කීවත්, යාළු මිත්‍රයන් කීවත්, නෑදෑයන් කීවත්, මොන තරම් ධනයක් ලැබෙනවා කීවත්, 'මොනවද ඔය කරන්නේ ඔය සිවුරක් දරාගෙන හිස මුඩු කරගෙන පාත්‍රයක් අරගෙන ඔය සිවුර පැත්තකින් තියලා එන්න. සිවුරු ඇරලා මේ ධනය පරිභෝග කරන්න ජීවිතය සතුටින් ගත කරන්න, ගිහි ගෙයි ඉදගෙන පින් කරගන්න' කියලා. ඒ භික්ෂුව පැවිද්ද අත හැරලා ගිහි බවට පත්වෙන්නේ නම් නෑ. එය කිසිසේත් ම වෙන්නේ නැහැ. පින්වත් මහණෙනි එයට හේතුව වෙන්නේ බොහෝ කාලයක් හෙතෙම සිත පුහුණු කර ඇත්තේ, සිත නැඹුරු කර ඇත්තේ, සිත නමා ඇත්තේ, විවේකයට නිෂ්කාමී බවට වන නිසයි. මෙසේ මෙය කිසිසේත් නොවිය හැකි දෙයකි'' යනුවෙනි.

එහෙත් අවාසනාවක මහත අද අපේ රටේ බොහෝ දෙනෙකු හදාගෙන තියෙන මේ බුදුරජාණන් වහන්සේ කිසිසේත්ම දේශනා නොකළ ග්‍රන්ථ ධුර හා විදර්ශනා ධුර කතාවක් නිසා බොහෝ විහාරස්ථානවල පැවිදි වෙන බොහෝ දෙනෙකුට අසන්නට කියවන්නට මෙන්ම පුහුණුවෙන්නට

ලැබෙන්නේත් ආයඝී අෂ්ඨාංගික මාර්ගය ගැන හෝ සීල සමාධි පඤ්ඤා ගැන නොවෙයි. වෙනත් විවිධාකාරවූ සමහර විට භික්ෂුත්වයට කිසිසේත්ම අදාළ නොවන දේවල්ය. මේ නිසයි බොහෝ භික්ෂූන් වහන්සේලාට භික්ෂුත්වය එපාවෙන්නේ. එසේම බොහෝ භික්ෂූන් වහන්සේලා සිවුරු හැර යන්නේත් මේ නිසාම කියලා තමයි අපට නම් හිතෙන්නේ. භික්ෂු ජීවිතයට අත්‍යවශ්‍ය දේ ගුණ දහම් සහ බණ දහම් ඉගෙන ගැනීමයි.

යම් කෙනෙකු පැවිදි දිවිය සාර්ථක කරගැනීමට නම් හෙතෙම ඉතා හොඳින් බණ දහම් ඉගෙන කියා ගත යුතු අතර විශේෂයෙන්ම භාවනාව ප්‍රගුණ කර ගනිමින් ගුණ දහම් ද වැඩි දියුණු කරගත යුතුමය. මේ කරුණ ගැන ඉතා හොඳින් දැනගෙන සිටි අපේ සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේගේ ගුරු තුමාගෙන් උන්වහන්සේට මෙය උපදේශයක් වශයෙන්ම ලැබී තිබුණු දෙයකි. "පැවිදි දිවිය සාර්ථක කරගැනීමට නම් ඉතාම හොඳින් ඉගෙන ගත යුතුය." යන්න උන්වහන්සේ අවධාරණය කළහ.

සිය ගුරුදේවයන් වහන්සේගෙන් සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේට ලැබී තිබුණ මෙම ශ්‍රේෂ්ඨ උපදේශය උන්වහන්සේට නිතර නිතර සිතේ රැව් දෙන්නට වු අතර සිය ගුරු දේවයන් වහන්සේට ද මෙම කාරණය සිත තුළ රැව් දෙන්නට විය. ඒ අනුව සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේගේ ගුරු හිමියන් සීලානන්ද පොඩිහාමුදුරුවන් වහන්සේව කිසියම් පිරිවෙණකට ඇතුළත් කිරීමට අදහස් කොට තිබුණි. එහෙත් ඒ ගැන සිතන සිතන හැම අවස්ථාවකම එයට බාධාවන් දෙකක් ඇතිවී එය අතපසු වී ගියේය. ඒ බාධාවන් දෙකයි මේ.

1. ආර්ථික දුෂ්කරතාව, (ඒ වනවිට කුඩා හිමිවරුන් හතර නමක් පිරිවෙන්වලට ඇතුළත් කිරීමට සිදුවී තිබුණි.)

**2.** පිරිවෙණට ඇතුළත් කිරීමෙන් කුඩා ස්වාමීන් වහන්සේලා නරක් වේය යන බිය.

මේ අනුව ලොකුහාමුදුරුවන් වහන්සේ තම ශිෂ්‍ය හිමිවරුන්ට අවශ්‍ය පොත පත කියවීම පන්සලේදී ම සිදු කරන්නට අදහස් කළ අතර සීලානන්ද පොඩිහාමුදුරුවන් වහන්සේ ඇතුළු ශිෂ්‍යයන්ට පන්සලේදී ම අධ්‍යාපනය ලබා දුන්හ. පන්සලේ විවිධ සංවර්ධන කටයුතු, සතර පේරුවේ දායක දායිකාවන් දහස් ගණනකගේ විවිධ ආගමික, සාමාජික මෙන්ම අධ්‍යාපනික කටයුතු ගැන ද සොයා බලා විවිධාකාරයෙන් උදවු උපකාර කරන අතරම සීලානන්ද පොඩි හාමුදුරුවන්ගේ ගුරුදේවයන් වහන්සේ මෙම වගකීම ද ඉටුකිරීමට තීරණය කරගනිමින් තම ශිෂ්‍යයන්ට පාලි, සංස්කෘත, සිංහල ආදී භාෂා ශාස්ත්‍ර පිළිබඳව දැනුම ලබාදීමට උත්සුක විය. එහෙත් මෙය කිසියම් ආකාරයක අවිධිමත් අධ්‍යාපනයකි. පිළිගත් විධිමත් අධ්‍යාපනයක් ලැබෙන්නේ පිරිවෙණ ඇසුරින් බව කාගේත් පිළිගැනීම විය.

මෙසේ දවසින් දවස, සතියෙන් සතිය, මාසෙන් මාසය, මෙන්ම වසරින් වසර ද කාලය ගෙවී ගියා. මේ ආකාරයට පැවිදි වීමෙන් අවුරුදු පහක් පමණ කාලයක් ගත විය. එහෙත් ක්‍රමවත් අධ්‍යාපනයක් ලබාගැනීමට අවශ්‍ය පසුබිමක් සීලානන්ද හිමියන්ට නොලැබුණි. එසේ වුවද පන්සලේ දී භික්ෂුවකට අවශ්‍ය මූලික අධ්‍යාපනය වශයෙන් සැලකෙන පිරිත්කීම, ධර්මදේශනා වලට පුහුණුවීම, ඉහත සඳහන් කළ පාළි හා සංස්කෘත ශතක පොත් ආදිය වනපොත් කිරීම ද සිදු කළේය.

මේ කාලය වනවිට අපේ සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේගේ ආධ්‍යාත්මික ජීවිතයට මහත් පිටිවහලක් මහත් උපකාරයක් ලැබී තිබුණි. ඒ සිය ගුරුදේවයන් වහන්සේගේ

පියාණන්ය. උන්වහන්සේගේ මව මියගොස් නිසා මෙකල පියාණන් ද ජීවත් වූයේ පන්සලේ තම පුතණුවන් ළගය . මෙම පියා ඉතාමත්ම ආදරයෙන් ගෞරවයෙන් යුතුව අපේ සීලානන්ද පොඩි හාමුදුරුවන්ට කරුණු කියා දෙමින් බුදුන් වදාළ ධර්මයට අනුව භික්ෂු ජීවිතය ගත කළ යුතු ආකාරය කියා දුන් අතර නිබඳවම නිරතුරුවම එතුමා සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේත් සමග මළු පෙත්මං ඇමදීම, මල් ආසන පිරිසිදු කිරීම, මල් පහන් පුජා කිරීම, පිරිත් කීම, බුද්ධ වන්දනා කිරීම, ආදී වූ වන්දන මානනාදී පුණ්‍ය කටයුතු සිදු කළේය. එම පියාණන්ගෙන් ලැබුණ එම උපදෙස් සහ මග පෙන්වීම සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේගේ ජීවිතයට ඉමහත් ආලෝකයක් විය.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ තම ජීවිතයේ තමන්ට විවිධාකාරයෙන් උදව් උපකාර කළ අය අමතක කළේ නැත. අමතක කරන්නේ ද නැත. උන්වහන්සේගේ දියුණුවට අභිවෘද්ධියට මෙන්ම බැබළීමටත් එයම හේතුවක් වී ඇතැයි සිතේ. අපි දන්නා පරිදි මෙසේ පුංචි දවස්වල සෙල්ලම් වයසේ දී උන්වහන්සේට ගුණ දහම් කියා දුන් ඒ පියාණන්ගේ ගුණ සිහිකරමින් උන්වහන්සේ මේ වර්ෂයේ (2010) ජනවාරි මාසයේ දී ලංකාවට වැඩම කොට එම පියාණන්ගේ උපන් ගමේ දී, එනම් නිකවැරටිය මහමිතව දී, විශේෂ පින්කම් මාලාවක් පවත්වා එතුමාට විශේෂයෙන්ම පින් අනුමෝදන් කළහ.

කාලය මෙසේ ගෙවී යද්දී දිනෙන් දින පසුවු සීලානන්ද පොඩි හාමුදුරුවන්ගේ පිරිවෙන් අධ්‍යාපනය නොලැබීමට මූලිකම හේතුව වූයේ සිය ගුරුදේවයන් වහන්සේගේ නොසැලකිල්ල හෝ වෙනත් දෙයක් නොව ආර්ථික වශයෙන් සිය මාපියන්ටත් ගුරුවරයාටත් එදා තිබුණ දුළිදුභාවයම බව මෙහිදී අවධාරණයෙන් කිවයුතුව ඇත. එය මෙම

විහාරස්ථානයට හෝ මෙම පවුලට පමණක් නොව මුළු ප්‍රදේශයටම තිබුණ ආර්ථික අපහසුතාවයි. ''බුලත් පයියට හෙණ ගැහුවොත් හුණු කිල්ලෝටය ගැන හොයන්න දෙයක් නැහැ'' කියලා කතාවක් ඔබත් අහලා ඇති නේද?

ආණමඩුව ලබුගල පුරාණ රජමහා විහාරස්ථානයේ මේ ආකාරයෙන් වසර පහක් පමණ කාලයක් ගත කළ අපේ සීලානන්ද පොඩිහාමුදුරුවන් වහන්සේට ජීවිතයේ විවිධ අත්දැකීම් රාශියක් ලැබීමට අවස්ථාව සැලසුණි. විවිධ කරදර බාධක දුෂ්කරතා ඇතිවිය. ඒ අතර නිකරුණේ බොරු චෝදනා අපහාස උපහාස වලටද අසුකිරීමට සමහරෙක් මාන බලමින් සිටිය ද ඒ කිසිවකින් සිය ජිවන ගමන් මග වෙනස් කිරීමට හෝ චරිතයට කැළලක් ඇති කිරීමට කිසිවෙකුටත් නොහැකි විය.

යම් කෙනෙකුගේ පිරිසිදු බව හෝ අපිරිසිදු බව වෙනත් කෙනෙකුට ඇති කළ හැකි දෙයක් නොව තම තමන් විසින් ම ඇති කර ගන්නා දෙයකි. ''සුද්ධි අසුද්ධි පච්චත්තං න අඤ්ඤො අඤ්ඤං විසොධයේ'' යනු අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ දේශනයයි. යම් කෙනෙකු උන්වහන්සේට බැන්නොත්, ගැහුවොත්, එදා අපේ සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේ කළේ ඒ තැනැත්තා සමග රණ්ඩුවීම හෝ එකට එක කිරීම නොව ලබුගල නමින්ම ප්‍රසිද්ධියට පත් එම පන්සලේ ඇති මහ ගල් පර්වතයට නැග එහි ගසක් යටට වී සිතේ තියෙන දුක නැතිවෙන තෙක් ඇඬීමය. සිතේ තියෙන දුක නැති කර ගැනීමට එදා ඇඬීම ම උන්වහන්සේට බෙහෙතක් විය.

විශේෂයෙන්ම එකල සෑම මාසයක ම තුන්වැනි දින සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේගේ නිවසින් අම්මා දානය සකස් කරගෙන එන දවස විය. එදිනට අම්මා එනතුරු

මග බලාගෙන සිටින සීලානන්ද පුංචි හාමුදුරුවෝ අම්මා දැකගන්නටත් හිතේ ඇතිවී තිබුණ විවිධ දුක් කරදර කියා ගන්නටත් ඉතාමත් ම ආශාවෙන් සිටියේ ය. සිය මෑණියෝ ඉතා නුවණැති උපාසිකාවකි. කොපමණ දුක් කරදර පැමිණිය ද ඒවා ඉවසා දරා ගැනීමේ මහා පුදුම ශක්තියක් හැකියාවක් එතුමියට තිබුණි. ජීවිතයේ විවිධ අත්දැකීම් තිබූ ඇය එදා සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේට සිය පැවිදි ජීවිතයේ පැමිණි විවිධ දුක් කම්කටොලුවලටත් පිහිට වූයේ විවිධ පැති ගැන සිතමින් කිසිම කෙනෙකුට අයහපතක් නොවෙන ආකාරයෙනි. සැමවිටම ඇය උපදෙස් ලබාදුන්නේ මහත් ඉවසීමකිනි. ජීවිතයේ විවිධ දුක් කරදර කම්කටොලුවලට මුහුණු දෙමින් ඒවා තේරුම් ගනිමින් ඉවසීමෙන් යුතුව විඳ දරාගෙන සිටින ඇයට ඉවසීම ඉතා හොඳින් ඇත. වරක් බුදුපියාණන් වහන්සේ දේශනා කළේ "ඛන්ති පරමං තපො තිතික්ඛා" යනුවෙන් හොඳම තපස, භාවනාව, ඉවසීම බවයි.

සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේ එදා සමහර අවස්ථාවල සිය මෑණියන් සමග කතා කරමින් සිට තමන්ට තව දුරටත් මේවා ඉවසා දරාගෙන සිවුරෙහි සිටිය නොහැකි යැයි කියා තමන් සිවුරු හැරදමා නිවසට එන්නේ යැයි කී අවස්ථා ද විය. ඒ සෑම අවස්ථාවකදී ම සීලානන්ද පොඩි හාමුදුරුවන්ට කරුණු පහදා දෙමින් ජීවිතය පිළිබඳව විවිධ උපදෙස් ලබාදුන්නේ සිය පින්බර මෑණියන්මය. මේ අනුව අපේ හාමුදුරුවන් වහන්සේ විසින් අද ඇමෙරිකාව කැනඩාව වැනි භෞතික වශයෙන් ලෝකයේ දියුණුම රටවල් ලෙස සැලකෙන රටවල් මුල් කරගෙන බුදුදහමේ සුවඳ සොයන විවිධ ක්ෂේත්‍රවල සිටින විවිධ දැනුම් මට්ටම් වල සිටින අපරදිග වැසියන්ටත් ඒ රටවල සිටින ශ්‍රී ලාංකිකයන්ටත් සිදුකරනු ලබන මෙම ලෝක ශාසනික වූ විවිධ සේවාවන් සියල්ල සිදුකිරීමට අවශ්‍ය මූලික පසුබිම සකස් කරගැනීමේදී එදා ශක්තිය ධෛර්‍යය මෙන්ම

නුවණ ලබා දෙමින් උන්වහන්සේට මහත්සේ උපකාරී වී ඇත්තේ සිය දයාබර මෑණියන්ම බව අපට පැහැදිලි කරුණකි. එම මෑණියන් එදා නිවැරදි ධර්මයෙහි පිහිටා සිට ම කටයුතු කළ හෙයින්ම අද අපිත් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ඇසුර ලැබීමටත් උන්වහන්සේගෙන් බණ පදයක්වත් ඇසීමටත් වාසනාවන්තයෝ වී සිටිමු. එහෙත් සමාජයේ බොහෝ මෑණිවරුන්ගෙන් අද සිදුවන්නේ මෙය නොවේ. දරුවෙක් පැවිදි කරන මෑණිවරුත් අද ඉතාමත්ම අඩු අතර පැවිදි වී සිටින දරුවන්ටත් ඒ පැවිද්ද නිසි අයුරුන් ධර්මයට විනයට අනුව සකස් කරගැනීමට අනුබල දෙන මව්වරුන් මෙන්ම පියවරුන් ද අද නම් සමාජයේ ඉතා විරළය.

## අලුත් විහාරස්ථානයක වාසයට පැමිණීම
### (පරමාකන්ද රජමහා විහාරය -ආණමඩුව)

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණමඩුව පරමාකන්ද පුරාණ රජමහා විහාරය මේ ප්‍රදේශයේ ඇති විශාලම සහ පැරණිම විහාරස්ථානයයි. විහාරස්ථානය අසල පිහිටි තෝනිගල සෙල්ලිපියට අනුව මෙම විහාරස්ථානය දේවානම්පිය තිස්ස මහරජුගේ නියමයෙන් ගාමිණී අභය නම් ඇමතියෙකු විසින් කරවා පුජාකරන ලද විහාරස්ථානයක් බව කියවේ. ඒ බව එහි ඇති "පරුමක අභයපුත... දෙවනපි මහරජ ගමිනි අභය නියතෙ" යන වදන්වලින් පැහැදිලි වෙයි. මෙම තෝනිගල යනු ද "ලතෝනි ගලයි." මෙය විජය රජු විසින් කුවේණිය පළවා හළ අවස්ථාවේ දී ඇය ලතෝනි දුන් හෙවත් මොර ගගා ඇඬුව ස්ථානය යැයි කියති. විජය කුමරු ලංකාවට ගොඩබට තම්මැන්නාව ද පිහිටා ඇත්තේ මෙම පුත්තලම් දිස්ත්‍රික්කයේ ය.

මෙම පරමාකන්ද පුරාණ රජමහා විහාරස්ථානයට

අයත් විහාරස්ථාන හතකි. ලබුගල පුරාණ රජමහා විහාරය ඒවායින් එකකි. පරමාකන්ද රජමහා විහාරස්ථානයේ මේ දිනවල වැඩසිටියෝ ගරු තට්ටෑවේ පඤ්ඤානන්ද ලොකුහාමුදුරුවන් වහන්සේය. ආණමඩුව ශ්‍රී ආනන්දාරාමයේ වැඩ සිටියේ මහමිතව ශ්‍රී විමලඤාණ නායක හාමුදුරුවන් වහන්සේය. මෙම හිමිවරු දෙදෙනාම එකම ගුරුවරයෙකුගේ එනම් මාවතගම අත්ථදස්සී නායක ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍යයන් දෙදෙනෙකි. මේ කාලය වනවිට පරමාකන්ද රජමහා විහාරස්ථානයෙහි වැඩ වාසය කරමින් සිටි පඤ්ඤානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ මෙන් ම ආණමඩුවේ පිහිටි ශ්‍රී ආනන්දාරාමයේ වැඩ වාසය කරමින් සිටි මහමිතව විමලඤාණ නාහිමියන් වහන්සේ යන මෙම පැවිදි සහෝදරයන් දෙදෙනා අතර පරමාකන්ද විහාරස්ථානයේ අයිතිය සම්බන්ධයෙන් නඩුවක් තිබුණි. මෙහිදී මෙම නඩුවට හේතුව ගැන හා එහි පසුබිම ගැන යමක් ප්‍රකාශ කරන්නේ එය අපේ හාමුදුරුවන් වහන්සේගේ, සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ, ජීවිතයට කෙළින්ම බලපෑ සිද්ධියක් වීම නිසාය. එබැවින් ඒ ගැන කතා කිරීම කෙළින් ම අදාළය.

පරමාකන්ද රජමහා විහාරස්ථානයෙහි වැඩ වාසය කළ ගරු තට්ටෑවේ පඤ්ඤානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ සාඩම්බරයෙන් එහි විහාරාධිපති ලෙස කටයුතු කළහ. පරමාකන්ද රජමහා විහාරස්ථානය මෙම විහාර ගණයේ මුල් විහාරස්ථානය විය. සියම් මහා නිකායේ සම්ප්‍රදායට අනුව කිසියම් ගුරුවරයෙකුගේ අභාවයෙන් පසුව ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට අනුව මුල් පන්සල අයිති විය යුත්තේ එම ගුරුවරයාගේ ප්‍රධාන ශිෂ්‍යයාටය. ඒ අනුව අපවත් වී වදාළ මාවතගම ශ්‍රී අත්ථදස්සී නාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යයන් දෙදෙනෙක් වු අතර එම දෙදෙනාගෙන් ප්‍රධාන ශිෂ්‍යයා වුයේ මහමිතව විමලඤාණ නාහිමිපාණන් වහන්සේය. එබැවින් එම

පරමාකන්ද පුරාණ රජමහා විහාරස්ථානයේ නියම අයිතිය හිමි වියයුතුව තිබුණේ මෙම මහමිතව විමලඥාණ නාහිමියන්ට ය. එහෙත් එය එසේ සිදු නොවීම ශාසනික පරිහානියකට මග පෑදීමක් විය. ලාභ සත්කාරවල ගිජුවීම ගිහි පැවිදි කාටත් විශාලතම හානියකි.

වරක් බුදුපියාණන් වහන්සේ දේශනා කොට වදාළේ "පින්වත් මහණෙනි, ධර්මයට දායාද කරුවන් වෙන්න. ආමිසයට දායාද කරුවන් වෙන්න එපා" යනුවෙනි. එසේම සංයුත්ත නිකායේ ලාභ සත්කාර සංයුත්තයට අනුව බුදුපියාණන් වහන්සේ දේශනා කළේ ලාභ සත්කාර හරිම භයානක බවය. දරුණු බවය, කටුක බවය.

එහිදි සම්මා සම්බුදුරජාණන් වහන්සේ අපට දේශනා කළේ "ලාභසත්කාරවල ගිජුවෙන්නා හරියට ඇමක් ගිලගත් මාළුවෙකු වගේය" යනුවෙනි. මාළුවා ඇම ගිලගත් පසු බිලීවැද්දාට අවශ්‍ය ආකාරයෙන් කටයුතු කළ හැකිය. තවදුරටත් ලාභ සත්කාර වල භයානක බව සහ තුච්ජ බව පෙන්වා දෙන බුදුපියාණෝ " පින්වත් මහණෙනි ලාභ සත්කාර වල ගිජුවෙන්නා හොඳට බඩ පිරෙන්න අසූචි කාලා තවත් අසූචි ගොඩක් තමා ඉදිරියේ තබාගෙන මහා ආඩම්බරයෙන් බලා සිටින පණුවෙක් වැනිය" යැයි ද දේශනා කොට වදාළහ. ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා හරිම භයානකයි. එය හෙණයක් යැයි ද වදාළේ බුදුපියාණන් වහන්සේමය.

වරක් මහමිතව විමලඥාණ නාහිමිපාණන් වහන්සේ ආණමඩුව ශ්‍රී ආනන්දාරාමයේ විහාර මන්දිරය හැදීම සඳහා අවශ්‍ය පරාල ඉරා ගැනීමට සුදුසු කොටයක් ඉල්ලා ගැනීම සඳහා පරමාකන්ද රජමහා විහාරස්ථානයට ගිය අවස්ථාවේ දී එහි වැඩ සිටි තට්ටෑවේ පඤ්ඤානන්ද හිමියෝ "අංශ කඩයේ

දමාගෙන යන්න තරම්වත් ලී කෑල්ලක් දෙන්නේ නෑ" යනුවෙන් ප්‍රකාශයක් කිරීම මෙම නඩුවට මූලික හේතුව වු අතර පසුව මෙම නඩුකීම එම මුළු සඟ පරපුරේම පරිහාණියට, විනාශයට හේතුවිය. මේ නිසාම එම සංඝ පරපුර කැඩී බිඳී ගිය අතර අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ගේ ගුරු හිමියන්ටත් සීලානන්ද හිමියන් ඇතුළු ශිෂ්‍ය හිමිවරුන් කීපදෙනෙකුටත් යන එන මං නැති තත්වයකට පත්වන්නට සිදුවිය.

වසර ගණනාවක් තිස්සේම මේ දෙදෙනා වහන්සේලා ශාසනික බුදලයකට නඩු කිව්ව අතර අවසානයේදී මහනුවර මල්වතු මහාවිහාරයෙන් පවා එකල වැඩසිටි සිරිමල්වත්තේ ආනන්දාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ ද වැඩම කරවා ගෙන මෙම නඩුවට සාක්ෂි දුන්හ. මෙම නඩුව සඳහා මහමිතව විමලඥාණ නාහිමියන්ගේ සහයෝගයට හිටියේ තම වැඩිමහල් ශිෂ්‍යයාවු නිකවැවේ චන්ද්‍රජෝති හිමියන්ගේ ශිෂ්‍ය අපේ සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේගේ ගුරුවරයාණන් ද වු මහමිතව සෝමානන්ද හිමියන්ය. මෙහිදී සෝමානන්ද ස්වාමීන් වහන්සේට මෙම කටයුත්ත සඳහා නිරත විමට සිදුවූයේ සිය ගුරුදේවයන් වු නිකවැවේ චන්ද්‍රජෝති හිමියන් මේ වනවිටත් උපැවිදි වී සිටි බැවිනි. යම් කිසි කෙනෙකුට කිසියම් කර්මයක් ගෙවන්න තියෙනවා නම්, විපාක විඳින්න තියෙනවානම් එය වැළැක්විය නොහැකි බව සම්බුද්ධ දේශනයයි.

කෙසේ හෝ මේ අනුව සෝමානන්ද හිමිපාණන් වහන්සේට මෙම නඩුව සඳහා අවශ්‍ය සියල්ල සම්පාදනය කිරීමට සිදුවිය. මහමිතව විමලඥාණ නාහිමි පාණන් වහන්සේ මේ වනවිටත් වයසට පත්ව අබල දුබලව ගොස් සිටි බැවින් සෝමානන්ද හිමියන්ට ඒ සියලු කටයුතු සොයා බලා සිදුකිරීමට සිදුවිය. මෙසේ වසර ගණනාවක් තිස්සේ කියන ලද මෙම

නඩුවෙන් පසුව තට්ටෑවේ පඤ්ඤානන්ද හිමියන්ට පරමාකන්ද විහාරස්ථානයට අයත් එකම විහාරස්ථානයක්වත් හිමි නොවී යද්දී, එදා උසාවියේ දී විනිසුරුතුමා ඉදිරිපිට දී සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේගේ ගුරුවරයා වූ මෙම මහමිතව සෝමානන්ද හිමියෝ නැගී සිට "මේ තට්ටෑවේ පඤ්ඤානන්ද හාමුදුරුවන් වහන්සේත් ශිෂ්‍යයන් කීපදෙනෙක් සිටින හාමුදුරුවන් වහන්සේ නමක්. ඒ නිසා උන්වහන්සේට පාරට යන්න බැහැ. පරමාකන්ද රජමහා විහාරස්ථානයට අයිති අපේ විහාරස්ථාන හතක් තියෙනවා. ඒවායින් ආණමඩුව ශ්‍රී ආනන්දාරාමය උන් වහන්සේට ලබාදීමට අපි කැමතියි" යැයි කීහ.

ඒ අවස්ථාවේදී මහමිතව විමලඤාණ නාහිමියෝ එයට එකඟ නොවී ඉතා නොදියුණු විහාරස්ථානයක් වූ මානික්කන්කන්ද නැමති විහාරස්ථානය තට්ටෑවේ පඤ්ඤානන්ද හිමියන්ට දීමට කැමැත්ත පළ කළ ද සෝමානන්ද හිමියන්ගේ කැමැත්ත පරිදි ආණමඩුව ශ්‍රී ආනන්දාරාමය පැවරීමට තීරණය කළේය. එහිදී විනිසුරු තුමා ඒ ප්‍රකාශය කළේ කවුදැයි අසා දැනගෙන එහි ඇති වැදගත්කම හා සාධාරණ බව තේරුම් ගෙන ආණමඩුව ශ්‍රී ආනන්දාරාමය තට්ටෑවේ පඤ්ඤානන්ද හිමියන්ට පැවරූ අතර පරමාකන්ද රජමහා විහාරස්ථානයේ අයිතිය මහමිතව විමලඤාණ නාහිමියන්ට පැවරුවේ ය.

මෙසේ සහෝදරයන් දෙදෙනා පන්සල් දෙක මාරුකර ගත්හ. මෙහිදී ආණමඩුව ආනන්දාරාමයේ මෙතෙක් කලක් වැඩ සිටි මහමිතව විමලඤාණ නාහිමියන් තම බෑණා කෙනෙක් වූ මහමිතව ජිනානන්ද කුඩා හිමියන්ද සමග පරමාකන්ද විහාරස්ථානයේ වාසය සඳහා වැඩම කළහ. තට්ටෑවේ පඤ්ඤානන්ද හිමියන් තමන්ගේ ශිෂ්‍ය පිරිස ද සමග ආණමඩුව ආනන්දාරාමයට වැඩම කළහ. මෙම කටයුතු සඳහා ද

මහමිතව විමලඥාණ නාහිමියන්ට සම්පූර්ණ සහයෝගය ලබා දුන්නේ අපේ සීලානන්ද පොඩිහාමුදුරුවන් වහන්සේගේ ගුරුවරයා වූ මහමිතව සෝමානන්ද හිමියන් විසිනි.

මෙසේ මහමිතව විමලඥාණ නාහිමිපාණෝ සිය බෑණා කෙනෙකු වූ මහමිතව පිනානන්ද හිමියන් සමග වසර එක හමාරක් පමණ ජීවත් වූහ. මෙම කාලය පරමාකන්ද රජමහා විහාරස්ථානයේ අන්ධකාරම යුගය යැයි කිවහැකිය. විහාරස්ථානයේ සියලු ම දේ දවසින් දවස ම විනාශ විය. විවිධ අය විහාරස්ථානයට පැමිණ විහාරස්ථානයේ ඇති සියලු දේ සිය නිවෙස්වලට ගෙන ගිය අතර විහාරස්ථානයේ ගහක ගෙඩියක් පවා නොතිබුණි. විහාර ගෙයක මලක් පහනක් පූජා කිරීමට කෙනෙකු නොවී ය. විහාරස්ථානයේ සියලු ම භාණ්ඩ විනාශ විය. කිසිම පොල් ගහක ගෙඩියක්වත් නොතිබුණ අතර පොල්ගස්වල අතු කපා කොට පැටවීම සඳහා ගෙනත් සිටි අලින්ට දීමෙන් විහාරස්ථානයේ සියලුම පොල් ගස් විනාශ වී ගොස් තිබුණි.

මේ වනවිට දායක දායිකාවන් කිසිවෙක් විහාරස්ථානයට පැමිණීම සම්පූර්ණයෙන්ම නතර කර තිබුණි. විහාරස්ථානයට සම්බන්ධ අක්කර සිය ගණනක තිබුණ කැලයේ වටිනා ගස් සියල්ල ම පාහේ කපා දමා සියලු ලී, කොට, අදිය කපා විකුණා සම්පූර්ණයෙන් ම විහාරස්ථානය සතු දේපළ විනාශ කර තිබුණි. අවසානයට පසු කළෙක ආණමඩුව මන්ත්‍රී වරයා බවට පත් වූ අශෝක වඩිගමංගාව මහතා ඇතුළු තරුණයන් පිරිසක් ද ප්‍රසිද්ධ වෙළඳ ව්‍යාපාරිකයෙක්ව සිටි රාජකරුණා මහතා වැනි පිරිසක් ද එක්ව භික්ෂු ආකල්ප නැති ශාසනයට මහා නිගාවක් කළ ඒ චීවරධාරියා සිවුරු හරවා යවා විහාරස්ථානය පිරිසිදු කළේ ය.

ඉන් පසු එම විහාරස්ථානයට වගකිවයුතු හිමි නමක් නැති විය. මේ අවස්ථාවේ මහමිතව විමලඥාණ නාහිමියෝ ලබුගල පුරාණ විහාරස්ථානයේ වැඩ සිටි සීලානන්ද පොඩිහාමුදුරුවන් වහන්සේගේ ගුරුවරයා වු මහමිතව සෝමානන්ද හිමියන් වෙත ගොස් අඬ අඬා සියලු තොරතුරු කියා පරමාකන්ද රජමහා විහාරස්ථානයට පැමිණ එම විහාරස්ථානය බාරගන්නා ලෙසත් මිය යන තුරු තමන් වහන්සේ ද බලාගන්නා ලෙසත් ඉල්ලා සිටියහ.

ඒ අනුව මහමිතව සෝමානන්ද හිමියෝ එම ඉල්ලීම පිළිගෙන තම ශිෂ්‍ය පිරිස ද සමග හයදෙනෙක් පරමාකන්ද රජමහා විහාරස්ථානයට පදිංචිය සඳහා යාමට තීරණය කළහ. අපේ සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේ ද ඒ අනුව සිය ගුරුවරයා සමග පරමාකන්ද රජමහා විහාරස්ථානයට වාසය සඳහා 1978 ජනවාරි මස 21 වැනි දින පැමිණියේය. මෙය ඇත්තෙන්ම සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේට ජීවිතයේ අලුත් අත්දැකීමක් ලබා දුන් විශේෂ අවස්ථාවක් විය.

මෙම පිරිස එම පරමාකන්ද පුරාණ රජමහා විහාරස්ථානයේ පදිංචියට පැමිණෙද්දී දායක දායිකාවන් කිසිවෙක් එහි නොඑන නිසාත්, දන් වේලක්වත් නොලැබෙන නිසාත් ලබුගල පුරාණ රජමහා විහාරස්ථානයේ සිට පැමිණෙද්දී පිඟන් හයක්, පැදුරු හයක්, කොට්ට හයක්, හාල් සේරු දහයක් පමණ සහ පොල් ගෙඩි පහළොවක් වැනි අත්‍යවශ්‍ය දේවල් ද රැගෙන ආවේ ය.

මේ වනවිටත් විහාරස්ථානයේ දියුණුව සලසා ගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කරගැනීමේ අපේක්ෂාවෙන් සිටි දායක දායිකා පිරිසක් විහාරස්ථානයට පැමිණ සිටියේය. ඒ අනුව සෝමානන්ද ලොකුහාමුදුරුවන් වහන්සේ විසින් එම පිරිස

රැස්කරවා විහාරස්ථානයේ කටයුතු කරගෙන යාමට පොරොන්දු වී එම විහාරස්ථානය භාරගත්හ. එහෙත් මෙසේ භාරගත්තේ ඇත්තෙන්ම විහාරස්ථානයක් නොව විහාරස්ථානයක් යන නමක් පමණි.

ලබුගල පුරාණ විහාරස්ථානයේ සිට ගෙනෙන ලද හාල් පොල් තුන පහ ටික ඉවරවෙන තෙක් උයාගෙන දානය වැළඳූ උන්වහන්සේලා මාස තුනක් පමණ යනතෙක් ම දිනපතා ම උදේ සිට සවස දක්වා විහාරස්ථානය එළි පෙහෙළි කිරීම් හෙවත් පිරිසිදු කිරීම් කටයුතු ම කළහ. මෙසේ විහාරස්ථානය එළි පෙහෙළි කිරීමට ගොස් සීලානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේගේ ගුරුවරයාණන් වූ සෝමානන්ද හිමියන්ගේ කකුල ද කැඩුණි. අවුරුද්දක් පමණ එයට බෙහෙත් කරන්නට සිදුවිය. එහෙත් එය පෙර මෙන් ප්‍රකෘති තත්වයටම පත්වූයේ නැත.

මෙසේ මෙම පිරිස විවිධ කරදර බාධක මැඩ ගනිමින් ගෙනා හාල් පොල් ආදිය ඉවර වෙනතෙක් ඒවා අනුභව කළහ. ඉන් අනතුරුව කරකියා ගැනීමට කිසිවක් නොවූ අතර අවට හේන්වලින් මඤ්ඤොක්කා ගෙනත් පන්සලේ ගස්වල තිබූ කොච්චි කඩා ලුණු මිරිස් හදාගෙන දිනපතා ම පාහේ මාස ගණනාවක් යන තෙක්ම හීල් දායනටත් දහවල් දානයටත් වැළඳුවේ ලුණු මිරිස් සහ මඤ්ඤොක්කා යැයි කීම සමහර විට පිළිගැනීමටත් අපහසු දෙයකි. නමුත් එය එසේ සිදුවූ බව දන්නෝ දනිති.

මේ දිනවල ලබුගල පුරාණ විහාරස්ථානය සමීපයේ පදිංචි ජේම්ස් මහතා, පියදාස මහතා, සහ මැරංගොඩ පීටර් බාස් උන්නැහේ වැනි අය අපේ හාමුදුරුවන් වහන්සේලාගේ සහයෝගයට සිටිමින් දුක සැප බෙදාගත්හ. අපේ හාමුදුරුවෝ, සීලානන්ද හාමුදුරුවෝ, මේ සියලු දුක් කරදර විඳ දරා ගනිමින්

පැවිදි දිවිය ආරක්ෂාකර ගත් කෙනෙකි.

අපේ හාමුදුරුවන් වහන්සේ වසර එකොළහේදී පැවිද්ද ලබාගත්තත් ජීවිතයේ යම් කෙනෙකු විසින් කළ යුතු වූ සී සෑම, වැපිරීම, නියර කෙටීම, වී ඉසීම, ගොයම් සිටුවීම, ගොයම් කැපීම, කොළ ඇදීම, කොළ එළීම, කොළ පෑගීම, බැත හැලීම, වී මැනීම, ගල් කැඩීම, යකඩ තැලීම, ලිං කෙටීම, හේන් කෙටීම, හේන් ගිනි ලෑම, කුරක්කන්, අබ, මුං,තල, ආදිය ඉසීම, කැපීම, ආදී සියලුම දේ කරමින් ජීවිත අත්දැකීම් රාශියක් ලබාගෙන ඇති කෙනෙක් වෙති.

මෙසේ ටිකෙන් ටික විහාරස්ථානය එළි පෙහෙළි වෙද්දී දායක දායිකාවන් ද විහාරස්ථානයට පැමිණ දන් පැන් දීමට පටන් ගත් අතර විහාරස්ථානය නැවතත් විහාරස්ථානයක් ලෙසින් බැබළෙන්නට විය. මෙම විහාරස්ථානය මෙම තත්ත්වයට ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාටත් සම්බුද්ධ ශාසනයටත් හිතවත් බොහෝ අය දැරූ වෙහෙස මහන්සිය අපමණයි.

මේ අයුරින් කාලය ගත වී 1977 වර්ෂය උදාවිය. මෙම වකවානුව වනවිට මහම්තව විමලඤාණ නාහිමියෝ පරමාකන්ද විහාරස්ථානයේ වැඩ සිටි අපේ සීලානන්ද පොඩිහාමුදුරුවන් වහන්සේ වැනි ශිෂ්‍ය හිමිවරුන්ගෙන් ඇප උප සත්කාර සම්මාන ලබා ගනිමින් වැඩ සිටියහ. මෙකල විමලඤාණ නාහිමියන් සමගත් මහම්තව සෝමානන්ද හිමියන් සමගත් ඤාති සම්බන්ධයක් ඇති මොන්නැකුලමේ විමලානන්ද නාහිමියන් වැඩසිටියේ ගල්කුලිය ළිහිණිගිරි පුරාණ රජමහා විහාරස්ථානයේය. රාජවන්නි කුමාරවන්නි දෙපළාතේ උපප්‍රධාන සංඝනායක තනතුර දැරූ උන්වහන්සේ ප්‍රදේශයේ කාගෙත් හිත් දිනාගෙන වැඩසිටි නායක හාමුදුරුවන් වහන්සේ නමකි.

කොණ්ඩදෙණියේ පරම්පරාවෙන් පැවත ගෙන එන පාරම්පරික වෙදකම මෙන්ම නිර්භීත ගති ඇතිව වැඩසිටි උන්වහන්සේ විශේෂයෙන් ම ප්‍රසිද්ධියට පත්ව සිටියේ ධර්මදේශනා, පිරිත් දේශනා හා විවිධ ගුරුකම් මෙන් ම ජ්‍යෝතිෂය වැනි කටයුතු වලටය.

මෙම නාහිමියෝ විටින් විට පරමාකන්ද රජමහා විහාරස්ථානයට පැමිණෙන සිරිතක් විය. ඒ අනුව දිනෙන් දින එහි පැමිණෙන විට මහමිතව සෝමානන්ද හිමියෝ මෙම මොන්නැකුලමේ විමලානන්ද නාහිමිපාණන් වහන්සේ සමග ද සාකච්ජාකොට අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේත් සිය සහෝදර මාමුණාගම සද්ධානන්ද හාමුදුරුවන් වහන්සේ සහ ගල්කුලියේ විමලානන්ද නාහිමියන්ගේම ශිෂ්‍යයෙක්ව සිටි විල්පොත ධම්මානන්ද හාමුදුරුවන් වහන්සේත් යන තුන් නමම ක්‍රමානුකූල වු විධිමත් අධ්‍යාපනයක් ලබාදීම සඳහා පිරිවෙණකට ඇතුළත් කළයුතු බවට තීරණය කළහ. සාකච්ජා වට කීපයකින් පසුව සීලානන්ද හිමියන්ගේ දෙමාපියන්ටත් සද්ධානන්ද හිමියන්ගේ මාපියන්ටත් මේ කරුණ දන්වා මෙම ස්වාමීන් වහන්සේලා දෙනම ම පිරිවෙණට භාරදීම සඳහා කැඳවා ගෙන ගියෝය.

ඒ අනුව අපේ සීලානන්ද හාමුදුරුවෝ ජීවිතයේ ප්‍රථම වතාවට පිරිවෙණකට ඇතුළත් වූහ. ඒ සඳලංකාවේ ශාස්ත්‍රෝදය විශ්ව විද්‍යාල පිරිවෙණටය. මුලින්ම පිරිවෙණකට ඇතුළත් වූයේ 1977 මැයි මාසේ 22 වැනි දිනය. (1972 මැයි මස 22 වෙනි දින පැවිදි වු උන්වහන්සේ 1977 මැයි මස 22 වෙනි දින පිරිවෙණට ඇතුළත් විය). මේ අනුව ක්‍රමවත් හෙවත් විධිමත් අධ්‍යාපනයක් ලැබීම සඳහා පිරිවෙණකට ඇතුළත් වෙන විට අපේ හාමුදුරුවන් වහන්සේගේ, සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ වයස අවුරුදු 17 කි.

# සඳලංකාවේ ශාස්ත්‍රෝදය මහ පිරිවෙණ

ලංකාව තුළ තියෙන තවත් ලංකාවක් කියා සමහර අය කතා කරන මේ සඳලංකාවට යාමට අවස්ථාව ලැබීම අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ජීවිතයේ තවත් ඉදිරි පිම්මකි. ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ආරම්භ වුයේ සඳලංකාවෙනි. එහි නියමුවා වුයේ වින්සන්ට් සුහසිංහ මහත්මයාය. අදටත් සඳලංකාවේ රෝහල, සිනමා ශාලාව, ආදී ආයතන සමහරක් පවතින්නේ සමුපකාර ක්‍රමයටය. එය ලංකාව පුරා ව්‍යාප්ත වු සාර්ථක පරිපාලන ක්‍රමයකි. මේ තුළින් මහජනාතාවට විශේෂ සේවාවන් රාශියක් ම සිදුවුව ද පසුකාලීනව රටේ අනෙත් පළාත්වල පැවැති එම සමුපකාර ක්‍රමය අසාර්ථක වූයේය. එයට ප්‍රධානතම හේතුව වූයේ නිලධාරීන්ගේ ඇති දුෂණයන් යැයි කීම අනුචිත නොවේ.

හැම දෙනාටම සමසේ උපකාරයක් බවට පත්ව තිබුණ එම සම උපකාරය විනාශ වීමත් සමග නැවතත් සාමාන්‍ය ජනතාවට විවිධාකාරයෙන් බර පැටවෙන ක්‍රමයක්ම බිහිවූයේ ජනතාවගේම අවාසනාවට මෙනි. කෙසේ වුව ද සමුපකාරය කියන විටම සඳලංකාවත් සඳලංකාව කියනවිටම සමුපකාරය යන්නත් මතකයට නැගෙන්නේ එදා ඒ මානව හිතවාදීත්වයෙන් අනුන වු තවත් යුග පුරුෂයෙකු විසින් ආරම්භ කෙරුණු ශ්‍රේෂ්ඨ ක්‍රියාදාමය නිසාය. සඳලංකාව ශ්‍රී ලංකාව තුළත් වෙනත් රටවලත් ප්‍රසිද්ධියට පත්වීමට තවත් සුවිශේෂ හේතුවක් විය. ඒ සඳලංකාවේ ශාස්ත්‍රෝදය මහ පිරිවෙණයි.

සඳලංකාවේ ශාස්ත්‍රෝදය මහ පිරිවෙණ ආරම්භ කළේ අපවත්වී වදාළ ගෞරවාර්හ වරාදළ ශ්‍රී රතනපාලාභිධාන නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේය. මෙම පිරිවෙණ ලංකාවේ ඉතාමත් සුප්‍රසිද්ධ පිරිවෙන් විහාරස්ථානයකි.

පිරිවෙන් විශ්ව විද්‍යාලයය නමින් ද කලක් ප්‍රසිද්ධියට පත්ව පැවති අතර මෙහි එකල විශ්ව විද්‍යාල ප්‍රවේශ පංති හා බාහිර උපාධි පංති පවා තිබුණි. පාලි, සංස්කෘත සිංහල යන භාෂාත්‍රයට විශේෂ ස්ථානයක් ලබාදෙමින් ඉතා දක්‍ෂ ආචාර්‍ය මණ්ඩලයක් යටතේ පන්ති පැවැත්වීම මෙහි ප්‍රසිද්ධියට හේතුවිය. මෙය එකල කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිබූ පිරිවෙන් අතර ප්‍රමුඛ පෙළේ ලා සැලකූ පිරිවෙණකි.

මේ කාලය වනවිට මෙම පිරිවෙණෙහි අධ්‍යක්‍ෂ තනතුරු දරණ ලද්දේ ගරු වැලිහිඳ වනරතන ලොකු හාමුදුරුවන් වහන්සේ විසිනි. එවකට මෙම පිරිවෙණහි පරිවේණාධිපතිව වැඩ සිටියේ ගරු ඊරියගොල්ලේ අභයතිස්සාභිධාන වයඹ පළාතේ ප්‍රධාන සංඝ නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේය. උගත් වියත් මහා පඬිවරුන් රාශියක් රටට, ලොවට, බිහි කළ මෙම සඳලංකාවේ ශාස්ත්‍රෝදය මහ පිරිවෙණ එකල වයඹ පළාතට ම ආලෝකයක් විය.

සෑම භික්‍ෂුවකටම ධර්ම විනය පිළිබඳව දැනීම අත්‍යවශ්‍යමය. ඒ සඳහා හොඳ ගුරු ඇසුරක් අවශ්‍යය. මේ නිසාම සාමණේර හිමිවරුන්ට පිරිවෙන් අධ්‍යාපනයක් ලබාදීම සිරිතය. අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ද ඒ අනුව මෙම පිරිවෙණට ඇතුළත්ව ඉතාම හොඳින් පිරිවෙනේ අධ්‍යාපන කටයුතු කරගෙන ගියද වරින් වර එළඹුණ විවිධ අපහසුතා දුෂ්කරතා නිසා පිරිවෙන් ජීවිතයේ විවිධ හැල හැප්පිලි කම් වලට ද මුහුණ දීමට සිදුවිය. එහෙත් උන් වහන්සේ තම අධ්‍යාපන කටයුතු අඩාල කර නොගෙන ඒ සියලුම ජීවන ගැටළු වලට දැඩි ආත්ම ශක්තියත් අධිෂ්ඨානයත් පෙරටුව මුහුණ දුන්හ. ජීවිතය යනු එළඹෙන සියලු බාධක වලට, ප්‍රශ්නවලට මුහුණ දීම බව උන්වහන්සේ තේරුම් ගෙන තිබුණි.

මෙහිදී විශේෂයෙන් ම මෙම පිරිවෙණට ඇතුළත් වූ දවසේ පටන්ම උන්වහන්සේට මහෝපකාරී වු හිමිවරු දෙනමක් ගැන උන්වහන්සේ ගෞරවයෙන් හා සොයුරු පෙමින් යුක්තව පින් පෙරටුව අදත් සිහිපත් කරති. ඒ හිමිවරු දෙදෙනා නම් ගරු කොස්වත්තේ සුමනතිස්ස හිමියෝත් ගරු යකඩපත ධම්මරතන හිමියෝත්ය. මේ හිමිවරු දෙදෙනාම අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ අධ්‍යාපනික කටයුතු සාර්ථක කරගැනීම සඳහා විවිධාකාරයෙන් සහයෝගය දැක්වූහ.

1977 වර්ෂය ලංකාවේ ඉරණම වෙනස් වු කාල පරිච්ඡේදයක් විය. ඒ එම වර්ෂයේ මහා මැතිවරණය පැවැත්වීමෙන් පසු මුළු රටම එක්සත් ජාතික පක්‍ෂයට භාර ගැනීමෙන් නිදහසින් පසු ඉතිහාසයේ නොවු විරූ අන්දමින් භෞතික අතින් රට දියුණු වුවත් ආධ්‍යාත්මික අතින් එන්න එන්නම පිරිහීමට පත්වීමය. විවෘත ආර්ථිකයක් හඳුන්වාදීමෙන් පසු මිනිස් ගුණදම් විනාශ විය. සමාජය උඩු යටිකුරු විය. අදත් මේ රටේ ඇති සමාජ සෝදාපාළුවට මුල එයයි.

1977 ජුලි මාසය වනවිට මෙතෙක් පරමාකන්ද විහාරස්ථානයේ වැඩ සිටිමින් ඇප උපසත්කාර සම්මාන ලබමින් සිටි මහමිතව විමලඥාණ නාහිමියන් විසින් ද මහා පෙරළියක් සිදු කරනලදී. මේ වනවිට වයස අවුරුදු හැත්තෑවක් අසුවක් පමණ වු උන්වහන්සේ දිනක් ආණමඩුව නගරයට වැඩම කළ අවස්ථාවක සිහි මදකමකින් දෝ වසර ගණනාවක් තිස්සේ නඩු කියා පරාද කළ තම සොහොයුරු තට්ටෑවේ පඤ්ඤානන්ද හිමියන් වැඩ සිටින ආණමඩුව ආනන්දාරාමයට වැඩියහ. එහිදී උන්වහන්සේට ඉතා හොඳින් සැලකූ එම විහාරාධිපති හිමියන් ඇතුළු පිරිස මහමිතව විමලඥාණ නාහිමියන් ලවාම පරමාකන්ද රජමහා

විහාරස්ථානය ඇතුළු සියලුම විහාරස්ථානවල අයිතිය ඔප්පුවකින් ලියා තමන්ට පවරා ගත්තේය. මේ ධර්මයද? මේ...

ඒ අනුව එදා පටන් පරමාකන්ද පුරාණ රජමහා විහාරස්ථානයේ වැඩ සිටි අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ගුරුවරයා වූ එසේම තට්ටෑවේ පඤ්ඤානන්ද හිමියන් එදා අධිකරණය ඉදිරියේදී එකම පන්සලකටවත් අයිතියක් නැතිව මහ මගට බැසීමට සිදුවුණ අවස්ථාවේ දී විනිසුරු ඉදිරියේ කථා කොට එම හිමියන්ට ආණමඩුව ශ්‍රී ආනන්දාරාමය ලබා දුන් මහමිතව සෝමානන්ද හිමියන්ට එකම පන්සලකවත් අයිතියක් නැතිවිය. සමාජය මෙතරම් කුරිරුද? දහම් බව අපි සොයන්නේ කාගෙන්ද?, දැනගන්නේ කාගෙන්ද? බුදුදහමේ රස්නයවත් වැදිලා තියෙනවද මේ අයට, නේද?.

වරක් මෙම මහමිතව සෝමානන්ද හිමියන්ට ද මෙසේම මෙම විහාරස්ථාන සියල්ලම ඔප්පුවක් මගින් ලියා පවරා දීමට මෙම මහමිතව විමලඤාණ හිමියන්ම මෙයට වසර කීපයකට පෙර කතා කළද එම අවස්ථාවේදී සෝමානන්ද හිමියෝ පැහැදිලිවම ප්‍රකාශ කළේ ''නායක හාමුදුරුවනේ මේවා සාංඝික දේපල, මේවාට අපි නිකම් ඔප්පු ලියා ලියා පවරා ගැනීම අවශ්‍ය නැහැ. අනික අපේ නායක හාමුදුරුවන්ගෙන් පස්සේ මේවා ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවේ හැටියට අයිති වෙන්නේත් මටනේ ඒ නිසා ඔප්පු ලියන්නේ මොකටද?'' කියලයි.

දැන් අපේ සීලානන්ද හාමුදුරුවෝ සඳලංකාව ශාස්ත්‍රෝදය මහ පිරිවෙනේ අටවැනි වසරේ අධ්‍යාපනය ලබන ශිෂ්‍යයෙකි. අගෝස්තු මාසයේ මැද දිනක සීලානන්ද හිමියෝ සිය සොයුරු සද්ධානන්ද හිමියන්ද සමග පන්සලට ගියවිට සිය ගුරුවරයාණන් වූ සෝමානන්ද හිමියෝ දෙදෙනාටම කථා කොට ''මෙන්න ආණමඩුවෙන් ලිවුමක් ඇවිල්ලා අපි

ඔක්කෝටම පන්සලෙන් වහාම අස්වෙන්න කියලා" යැයි කීහ. ආණමඩුවේ ආනන්දාරාමයේ එවකට වැඩසිටි තට්ටෑවේ පඤ්ඤානන්ද හිමියන් විසින් එවා තිබුණ එම ලිපියෙන් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ගුරුවරයාණන් වහන්සේ වන සෝමානන්ද හිමියන් ඇතුළු සිය ශිෂ්‍ය පිරිසට 1977 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර වහාම පන්සලෙන් අස්වී එම පංසල තමන්ට භාරදෙන ලෙස දන්වා තිබිණි. කළ ගුණ සැලකීම අපි හොයන්නේ කාගෙන්ද? කළගුණ සැලකීම මේකද? මිනිස්කම අපි හොයන්නේ කාගෙන්ද? අනෙකක් තබා දැන් ඉතින් මේ ඉතිහාසයවත් දන්නේ කීයෙන් කීදෙනෙක්ද? මේ ඉතිහාසය මේ ප්‍රදේශවාසීන් විසින් විශේෂයෙන්ම දැනගත යුතුය. මිනිසුන් අතර නොමිනිසුන් ද ජීවත්වෙන බව මෙසේ හඳුනාගත යුතුය.

මේ අනුව මහමිතව සෝමානන්ද හිමියෝ ඉතාමත් හිත්වේදනාවට හා සංඝ සමාජය කෙරෙහි මහත් කලකිරීමට ද පත්වූහ. කළ යුත්තේ කුමක්දැයි විවිධාකාරයෙන් සිතන්නට විය. සිත් වේදනාවේ උපරිම තළයට පත්විය. "මම මේ පුංචි සාමණේර පැටවුනුත් සමග යන්නේ කොහාටද? මම මොකක්ද කරන්නේ " කියා කියා කල්පනා කර කර දවස් ගණන් ගත කරන්නට විය. අවසානයේදී තීරණයකට එළඹුණි. විහාරස්ථානයේ දායක සභාව රැස්කොට තමන්ට සිදුවී ඇති දෙය (වඳින්න ගිය දේවාලය ඉහේ කඩා වැටීම) සියලු තොරතුරු සහිතව දායක සභාවට දන්වා මෙවන් අසත් පුරුෂ සමාජයක නොසිට පිටවී යා යුතු යැයි කියා තීරණය කළේය.

ඒ අනුව මහමිතව ගරු සෝමානන්ද හිමියෝ සිවුරු හැරයාමට තීරණය කරගත් අතර ඊට පෙර අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේටත් මාමුණාගම සද්ධානන්ද හාමුදුරුවන්

වහන්සේටත් විශේෂ උපදේශයක් ලබා දීමට සිතුවේය. එබැවින් පිරිවෙණේ අධ්‍යාපනය ලබමින් සිටි සිය ශිෂ්‍ය හිමිවරු දෙදෙනාට විහාරස්ථානයට පැමිණෙන ලෙස දන්වා යැවීය.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ගුරුවරයා මුළු ප්‍රදේශයේම ජනතාවගේත් මහා සංඝරත්නයේත් හොඳ හිත දිනාගෙන ඉතා ප්‍රසිද්ධියට පත්ව ශාසනාරක්‍ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී ධූරය ද හොබවමින් විවිධ ආගමික සාමාජික හා ශාස්ත්‍රීය කටයුතු රාශියක් සිදුකරමින් විවිධ අයට උදව් උපකාර කරමින් තම පැවිදි ජීවිතයද ඉතා හොඳින් ගත කළ කෙනෙකි. උන්වහන්සේට වෙනත් අවශ්‍යතාවයක් නිසා කිසිම ආකාරයකින් සිවුරු හැර යාමට නම් අවශ්‍ය වුයේ නැත. එසේ උන්වහන්සේට වෙනත් අවශ්‍යතාවයක් මත සිවුරු හැර යාමට සිතුවේ නම් උන්වහන්සේ සිවුරු හැරයාමට තීරණය කරණු ලබන්නේ අවුරුදු හතළිහක් ඉක්ම ගිය මේ අවස්ථාවේ නොව තරුණ වියේදීම බව කුඩා දරුවෙකුට වුවද තේරුම් ගැනීමට අපහසු යැයි නොසිතමි.

බුදුගුණ දැනගෙන සිටි ගුණ සම්පන්න වු පියෙකුගේ සහ ආදරණීය මවකගේ පින්වත් වු ගුණවත් වු පුතෙක්, බුදු පුතෙක්. සමාජයෙන් එන විවිධ මානසික පීඩනයන් හමුවේ තවදුරටත් තමාට සමාජයට මුහුණ දීමට ඇති අපහසුතාවය නිසා මෙසේ හොරරහසේ නොව සියලු දායක දායිකාවන් ඉදිරියේ මේ සියලු කරුණු පැහැදිලි කොට සමුගන්නට සුදානම් විය.

මෙසේ සිය ගුරුවරයා සිවුරු හැර දමා යාමට සුදානම් වෙන බව අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේටත් සද්ධානන්ද හාමුදුරුවන් වහන්සේටත් ආරංචි විය. ඒ අනුව දෙදෙනාම මෙම පණිවිඩය අනුව පිරිවෙණේ සිට පන්සලට එනම් පරමාකන්ද රජමහා විහාරයට වැඩම කළහ. පන්සලට

පැමිණි සීලානන්ද හාමුදුරුවෝ එදිනම සිය නිවසට ගොස් අම්මා තාත්තා ඇතුළු සැමටම කියා සිටියේ සිය ගුරුවරයා සිවුරු හැර යන්නට සූදානම් වෙන බවත් සාමණේර භික්ෂුවකට ගුරුවරයා නැති වීම ගිහි දරුවෙකුට දෙමාපියන් නැතිව යාම වැනි දෙයක් බවත් එම නිසා තමන්ට ද ගුරුවරයා ගත් මග ගනිමින් සිවුරු හැර දමා නිවසට එන්නට සිදුවෙන බවත් ය.

මේ අවස්ථාවේදී අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ මෑණියෝත් සහෝදර සහෝදරියෝත් කරකියා ගැනීමට කිසිත් නැතිවම අසරණ තත්ත්වයෙන් කඳුළු සලමින් සිටි අතර පියාණන් වහන්සේ සෝකී මුහුණින් යුත්තව සුසුමක් හෙළා ප්‍රකාශ කළේ "හා... කමක් නෑ මට දරුවෝ වැඩි නෑ. ඉන්ඩ බැරිනම් මොකක් කරන්ඩද? එන එක තමයි තියෙන්නේ" යනුවෙනි. ගහට ගහේ ගෙඩි බර නෑ.

සීලානන්ද හිමියෝ හිසෙහි මහා බරක් ඇතිව එදින ආපසු පන්සලට පැමිණ මෙම කාරණය සිය ගුරුවරයාණන් වූ සෝමානන්ද හිමියන්ගේ පියා මගින් සෝමානන්ද හිමියන්ට දැන ගැනීමට සැලැස්විය. එදින රාත්‍රියේ ගිලන්පස ගැනීමෙන් අනතුරුව සෝමානන්ද හිමියෝ සිය සිසුන් දෙදෙනාම කැඳවා, "මේ තත්ත්වය යටතේ තවදුරටත් මට මේ සමාජයේ ඉන්න බැහැ. ඒකයි මම සිවුරු හැර යන්න තීරණය කළේ. ඒ නිසා ම ඉතින් ඔය අයත් ඒ පාරෙම යන්න ලෑස්ති වෙන්න එපා. මම කොහේ හිටියත් කමක් නෑ. ඔය දෙන්නා සිවුරු අරින්නේ නැතිව හොඳට ඉගෙන ගන්ඩ ඕනෑ. ඒකයි මගේ ඉල්ලීම" යැයි කීය.

ඉතින් මේ අවවාදයෙන් "සිවුරු අරින්නේ නැතිව හොඳට ඉගෙන ගන්න ඕනෑ" කියපු ටික අපේ සීලානන්ද හිමියන්ගේ හදවතේ තදින් ම කාවැදුණි. උන්වහන්සේගේ ජීවිතයේ ඉදිරි ගමනට අතිශයින්ම උපකාරී වූයේ තම ගුරුවරයා විසින් කරන

ලද මෙම ප්‍රකාශයයි. මේ අනුව උන්වහන්සේ දැඩි ආත්ම විශ්වාසයකින් හා තිර අදිටනකින් යුතුව තම අධ්‍යාපන කටයුතුවල නිරත වූ අතර උන්වහන්සේගේ ජීවිතයේ සාර්ථකත්වයට ප්‍රධාන තම හේතුවක් වුයේ මේ තම ගුරුවරයාගේ ප්‍රකාශය හෙවත් ඉල්ලීම බව උන්වහන්සේ සිහිපත් කරති.

කෙසේ හෝ පුංචි කාලේ පටන් ම අපේ සීලානන්ද හිමියන් ගැන සොයා බැලූ, දුකට සැපට ළඟින් හිටිය, ඉතාම ආදරයෙන් හොඳ නරක කියා දෙමින් උන්වහන්සේව නිවැරදි මාර්ගයට යොමු කිරීම සඳහා අපමණ වෙහෙස දැරූ, සිය ගුරුතුමා හෙවත් මහම්තව සෝමානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ 1978 ඔක්තෝබර් මාසයේදී ගල්කුලිය රජමහා විහාරස්ථානයේදී විහාරාධිපති ගරු මොන්නෑකුලමේ විමලානන්දාභිධාන නායක මාහිමිපාණන් වහන්සේගෙන් අවසර ගෙන සිවුරු අත් හළේ ය. සිය ගුරුතුමාගෙන් වෙන්වීම නිසා පියේහි විප්පයෝගය දැඩි ලෙසින් ම දැණුන ද අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ එය ජීවිතයේ තවත් විශේෂ අත්දැකීමක් ලෙස ගනිමින් සිත දැඩි කරගත්තේය, හදාගත්තේය. "චිත්තං දන්තං සුඛාවහං" (දමනය කළ සිත සැප ගෙන දෙයි) යනු බුදුවදනයි. ලෝකයේ සියලුම සතුන්ට හදාගන්න, සංවර කර ගන්න, දියුණු කරගන්න අමාරුම දෙය සිතයි. සිත සංවර කරගත්ත, හදාගත්ත, හැම දෙනාටම හැම කෙනාටම ඇතිවෙන්නේ සැනසීමයි. සැනසුමට මග බුදුදහමයි.

සිය ගුරුතුමා ද සිවුරු හැර ගොස් ගිහියෙක් වශයෙන් සිටිය ද තමන්ගේ ම දරුවන් මෙන් සැලකූ ආදරණීය ශිෂ්‍යයන් දැක බලා ගැනීමට විටින් විට ගල්කුලිය විහාරස්ථානයට පැමිණියේ ය. අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ මෙම ගුරුතුමා මෙසේ සිවුරු හැර දමා යන්නට පෙර සීලානන්ද

හාමුදුරුවන් වහන්සේත් සද්ධානන්ද හාමුදුරුවන් වහන්සේත් යන දෙදෙනාම උන්වහන්සේගේ ඤාති හිමිනමක් වන ගල්කුලියේ ළිහිණිගිරි රජමහා විහාරස්ථානයේ අධිපති ගරු මොන්නැකුලමේ විමලානන්ද නායක හිමිපාණන් වහන්සේට ශිෂ්‍යයන් වශයෙන් පැවරුවේය. එබැවින් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේත් සද්ධානන්ද හාමුදුරුවන් වහන්සේත් සිය ගුරුවරයා උපැවිදි වූ දා පටන් මෙම ගල්කුලියේ ළිහිණිගිරි රජමහා විහාරාධිපති ගෞරවාර්හ මොන්නැකුලමේ විමලානන්දාභිධාන නාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යයන් බවට පත්වූහ.

යම් කෙනෙක් ගිහි කෙනෙක් වුවද පැවිදි කෙනෙක් වුවද අවශ්‍ය වෙන්නේ ගුණවත් බවයි. ගුණෙන් උතුම් ජීවිත හැමදාමත් සැනසිලිදායක ජීවිතමයි. ජීවිතේ තමන් තමන්ට බරක් නොවී අන් අයට ද බරක් නොවී ජීවත් වීම ම ශ්‍රේෂ්ඨයි.

මේ ආකාරයෙන් 1978 වර්ෂය අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට ඉතාම සංවේගදායක මෙන් ම කරදර කම්කටොලු වැඩි වර්ෂයක් වුණා. 1979 වර්ෂයත් ගෙවී ගොස් 1980 ට ලැබුවේ තවත් ජීවිතයේ අලුත් පිටුවක් පෙරළමින්ය. මෙම වර්ෂය වනවිට අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ඉගෙනීම ලබමින් සිටියේ සඳලංකාවේ ශාස්ත්‍රෝදය මහ පිරිවෙණේ අටවෙනි ශ්‍රේණියේ බව ඉහතදී සඳහන් කළෙමු. මේ ශ්‍රී ලංකාවේ අලුත් විභාගයක් ආරම්භ කළ වර්ෂයකි. ඒ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ නව නිර්දේශයයි. මෙම විභාගයට පෙනී සිටීමට සීලානන්ද හිමියන්ගේ පංතියේ සිටි ශිෂ්‍ය හිමිවරු කවුරුත් උනන්දුවක් දැක්වූහ. ඒ අනුව සීලානන්ද හිමියන් ද මෙම විභාගය සඳහා පෙනීසිටීමට කැමැත්ත පළ කළේ ය.

එහෙත් මෙම විභාගයට අනිවාර්යයෙන් ම ගත යුතු විෂයයන් දෙකක් විය. එනම් ගණිතය සහ විද්‍යාවයි. අපේ සීලානන්ද හිමියන්ට මෙම විෂයයන් දෙක පිළිබඳව කිසිම දැනුමක් මේ වනවිට තිබුණේ නැත. විභාගයට පෙනී සිටීමට කතා කරද්දීත් සැප්තැම්බර් මාසයත් ගතවී අවසානයි. ඔක්තෝබර් මස 10 වෙනි දිනට පෙර ඉල්ලුම් පත්‍ර දමන්නත් ඕනෙ. විභාගය පැවැත්වෙන්නේ දෙසැම්බර් මාසයේදීය.

විභාගය සඳහා ඉල්ලුම් පත්‍ර දැමීමට සූදානම් වෙද්දී විද්‍යා හා ගණිතය විෂයයන් මෙයට පෙර කෙසේවත් ඉගෙන ගෙන නැති අයට විභාගයට ඉල්ලුම් පත්‍ර දැමීමට නොහැකි බව පරිවෙණාධිපති හිමියෝ තදින් ම කියා සිටියේ ය. ඒ අනුව පන්තියේ සිටි අනිකුත් හිමිවරුන්ට එම විෂයයන් පිළිබඳව තරමක් දැනුම තිබුණ බැවින් විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් පත්‍ර  දැමීමට පරිවේණාධිපති හිමියන්ගෙන් බාධාවක් නොවීය. එහෙත් සීලානන්ද හිමියන්ට එය බාධාවක් විය. මෙසේ පරිවෙණාධිපති හිමියන්ගේ අකැමැත්තට හේතුව වූයේ ශිෂ්‍යයන් විභාගයෙන් අසමත් වීම පිරිවෙණෙහි හොඳ නමට කැළලක් වීමය. ජීවිතයේ තීරණාත්මක අවස්ථාවක් වන මෙම විභාගයට කෙසේ හෝ පෙනී සිටීමට සීලානන්ද හිමියන්ට අවශ්‍ය විය.

ඒ අනුව සීලානන්ද හිමියන් ඒ අවස්ථාවේ නාහිමියන්ට දැඩි ආත්ම විශ්වාසයක් ඇතිව ම ප්‍රකාශ කළේ තමන්ට විභාගයට පෙනී සිටීමට අවසර දෙන ලෙසය. එවිට පරිවෙණාධිපති හිමියන් ද සීලානන්ද හිමියන්ගේ පසුගිය කාලය තිස්සේ තිබුණ අධ්‍යාපන  ප්‍රගති වාර්තාවලට අනුව තීරණයක් ගනිමින් "හා... කමක් නෑ සීලානන්ද හැම වාරයක ම පංතියේ පළමුවෙනියනේ. ඒ නිසා අපි විශ්වාස කරනවා සමත් වෙයි කියලා. හොඳයි එහෙනම් ඉල්ලුම් පත්‍ර දමන්න" යැයි කීවේ ය.

මෙසේ සීලානන්ද හිමියෝ තමන් සමග එකට ඉගෙන ගත් යාලේගොඩ අනුරුද්ධ, මාකුරේ මංගල, නක්කාවත්තේ සුමේධ, කොස්වත්තේ සුමනසිරි, කළුගමුවේ සෝභිත ආදී හිමිවරුන් සමග විභාගයට ඉල්ලුම් කර මාස තුනක් වැනි ඉතා සුළු කාලයකින් දිවා රෑ වෙහෙස වී පාඩම් කොට ඉතා හොඳින් විභාගය සමත් වූහ. එය අපේ සීලානන්ද හිමියන්ගේ ජීවිතයේ ප්‍රථම වරට රජයේ විභාගයකට මුහුණ දුන් අවස්ථාවය. මේ නිසා ම මෙය ජීවිතයේ තීරණාත්මක විභාගයක් විය. මෙසේ මෙම ජයග්‍රහණයෙන් තව තවත් ධෛර්යට පත් උන්වහන්සේ අනතුරුව 1981 අප්‍රේල් මාසය වෙද්දී ලංකාවේ මුල්ම වරට පැවැත්වූ මූලික පිරිවෙන් අවසාන විභාගයට ද පෙනී සිටිමින් එයින් ද ඉතා හොඳින් උසස් ලෙසින් ම සාමාර්ථය ලබාගත්හ.

මේ අයුරින් දින සති මාස ගණනින් කාලය ගෙවී යද්දී අපේ සීලානන්ද හාමුදුරුවන්ට උන්වහන්සේගේ අධ්‍යාපන කටයුතු තවදුරටත් හොඳින් කරගෙන යාම සඳහා හෙවත් උසස් අධ්‍යාපනය සඳහා කොළඹට යාමට හැකියාවක් තිබුණොත් මැනවියැයි සිතා සිටින විට තවත් උන්වහන්සේගේ හිතවත් මෙන්ම එයිටත් වඩා සීලානන්ද හිමියන්ගේ පියාගේ හිතවත් හිමිනමක් වු ආණමඩුව මහඋස්වැව ශ්‍රී මහින්දාරාමාධිපතිව වැඩ සිටි ගරු පණ්ඩිත කහටවිල ජිනරතන ස්වාමින් වහන්සේ හමුවීමට අවස්ථාව සැලසුණි. මේ කාලය වනවිට උන්වහන්සේ මහනුවර ප්‍රදේශයේ වැළඩ විද්‍යාතිලක පිරිවෙණේ පරිවෙණාධිපති හිමියන් ලෙස සේවය කළහ.

ඒ අනුව උන්වහන්සේගේ මග පෙන්වීම අනුව අපේ සීලානන්ද හාමුදුරුවෝ තම අධ්‍යාපන කටයුතු තව තවත් හොඳින් කරගැනීමේ පරමාර්ථයෙන් 1981 මැයි මාසේ 22 වැනි දින, සඳලංකාව පිරිවෙණේ ජීවත්වෙන කාලය පුරාම තමන් වහන්සේත් සමග ඉතාමත්ම සමීපයෙන් කල්‍යාණ මිත්‍රයෙකු

වශයෙන් සිටි තුම්මුදුනේ රතනසිරි හිමියන්ද සමග රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන් විහාරස්ථානයට පැමිණියහ.

## රත්මලානේ
## පරම ධම්ම චේතිය මහ පිරිවෙණ

රත්මලානේ පරම ධම්ම චේතිය මහ පිරිවෙණ 1840 දී වලාණේ ශ්‍රී සිද්ධාර්ථ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ආරම්භ කරන ලද ශ්‍රී ලංකාවේ පිහිටි සුවිශේෂ විද්‍යාස්ථානයකි. පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන මිෂනරි වරුන්ගෙන් විනාශ වී ගිය බෞද්ධ අධ්‍යාපන ක්‍රමය නැවතත් නගා සිටුවීම සඳහා එවකට වැඩ සිටි වළාණේ ශ්‍රී සිද්ධාර්ථ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් විශාල මෙහෙයක්, යුග මෙහෙවරක් ඉටුවිය.

විශේෂයෙන්ම 19 වැනි සියවසේ දී බොදු බලය තහවුරු කරමින් බෞද්ධ අධ්‍යාපනයේ පුනරුදයක් ඇති කරමින්, බෞද්ධ ප්‍රබෝධයක් ඇති කරමින්, උන්වහන්සේ විසින් දහම් චෛත්‍යයක් ගොඩ නගන්නාක් මෙන් මෙම "උතුම් දහම් චෛත්‍යය" යන අරුත ඇති පරම ධම්ම චේතිය පිරිවෙණ ආරම්භ කරන ලද්දේ ඉතාම කුඩා කුටියකිනි.

වලාණේ ශ්‍රී සිද්ධාර්ථ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ එවකට පැල්මඩුල්ලේ තිබූ රූපාරුණ පිරිවෙණෙන් ගාල්ලේ මේධංකර මහා ස්වාමීන් වහන්සේ යටතේ අධ්‍යාපනය ලබා දොන් ලේකම් රාළහාමි, දොන් පිලිප් ද සිල්වා, ඇපා අප්පුහාමි, වැනි ශ්‍රද්ධාසම්පන්න ආගම මාමක බෞද්ධ නායකයන් පිරිසක් විසින් කරන ලද ආරාධනයකට අනුව වස් විසීම සඳහා රත්මලානට වැඩම කොට මෙම පිරිවෙණ ආරම්භ කළහ.

අනතුරුව උන්වහන්සේගේ සෙවණේ හැදුණු වැඩුණු ශිෂ්‍යයන් දෙදෙනෙක් වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ **1873** දී කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය මහ පිරිවෙණ ද රත්මලානේ ධම්මාරාම මහා මාහිමියෝ **1875** දී පැලියගොඩ විද්‍යාලංකාර මහ පිරිවෙණ ද ආරම්භ කළහ. අද ලංකාව පුරා පැතිර ඇති පිරිවෙන් සියල්ලම පාහේ මෙම පිරිවෙන් වල ශාඛා ප්‍රශාඛාවන් ය.

දෙස් විදෙස් හි සුපතල කීර්තියක් ඇති රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණෙන් පසුකාලීනව බිහිවූ ශ්‍රේෂ්ඨතම පඬිරුවන ලෙස සැලකෙන්නේ ගරු සූරියගොඩ සුමංගල ස්වාමීන් වහන්සේය. උඩරට සුපතල කීර්තියක් දැරූ ගරු විදුරුපොල පියතිස්ස නාහිමිපාණන් වහන්සේ ද රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙන් විදු පියසෙන් බිහිවූ තවත් ශ්‍රේෂ්ඨ සඟ රුවනකි. තව ද ලංකාවේ මුල්ම පුවත් පත ලෙස සැලකෙන "ලක්මිණි පහන" පුවත් පතේ කතෘ තුමා වූ ධර්මරත්න පඬිතුමා, බටුවන්තුඩාවේ පඬිතුමා වැනි උතුමන් ද රාශියක් බිහිවූයේ මෙම රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන් විදු පියසෙනි. රත්මලාන කියනවාත් සමගම බොහෝ දෙනෙකුට පරම ධම්ම චේතිය පිරිවෙණ යන්න ද සිතට නැගෙන්නේ එම පින් බිමෙන් ලංකාවට පමණක් නොව ලෝකයටත් සිදුවී ඇති විවිධ සේවාවන් නිසා ය. බිහිවී ඇති ශ්‍රේෂ්ඨ පඬිවරුන් නිසා ය.

අපේ හාමුදුරුවන් වහන්සේ, සීලානන්ද හාමුදුරුවන් වහන්සේ, මෙම පිරිවෙණට ඇතුළත් වන කාලය වනවිට මෙම පිරිවෙන් විහාරස්ථානයේ ස්වර්ණමය යුගයයි. ඒ "මාපලගම විපුලසාර යුගයයි." ගරුතර මාපලගම විපුලසාර මාහිමිපාණෝ කලාවෙන් ලංකාව පමණක් නොව ලොවම අවදිකළ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමකි. කලාශූරී සම්මානයෙන් පුද ලද උන්වහන්සේගේ නම ලංකාවේ හැම

කෙනෙක් ම පාහේ දන්නා නමකි. මේ යුගයේ පිරිවෙන් විහාරස්ථානයේ භෞතික වශයෙන් ද ආධ්‍යාත්මික වශයෙන් ද විශාල දියුණුවක් දක්නට ලැබුණි. පිරිවෙන් විහාරස්ථානයේම කොටසක ගුරු අභ්‍යාස විද්‍යාලයක්, භාවනා මධ්‍යස්ථානයක් සහ ප්‍රදේශවාසීන්ට නොමිලේ බෙහෙත් ලබාගැනීම සඳහා විශේෂ වූ වෛද්‍ය මධ්‍යස්ථානයක් ද උන්වහන්සේගේ මාර්ගෝපදේශකත්වය මත පවත්වාගෙන ගියේ ය.

පිරිවෙන් විහාරස්ථානයට කලක සිට පැවති විශාල අඩුපාඩුවක් වූ ඉඩකඩ සහිත ක්‍රමවත් දාන ශාලාව සහිත නේවාසිකාගාරයක්, ගුරු සිසු දෙපිරිසටම අවශ්‍ය තවත් නේවාසික පහසුකම් ආදිය ද සකස් කරමින් උන්වහන්සේ පරම ධම්ම චේතිය පිරිවෙණට විශාල සේවයක් සිදු කළහ.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ පරම ධම්ම චේතිය පිරිවෙණෙහි අධ්‍යාපන කටයුතු සඳහා ඇතුළත් වූයේ මෙම කාලයේ දී ය. මෙකල පරිවෙණාධිපති පදවිය ඉසිලුවෝ ගරු ආඳාවල දේවසිරි පණ්ඩිත ස්වාමීන් වහන්සේය. සීලානන්ද හාමුදුරුවන් වහන්සේ එදා මුල් වරට පිරිවෙණට පැමිණි දා ධාරාණිපාත වර්ෂාවක් ඇදහැළී පිරිවෙණට එන මාර්ගයම යටවී තිබුණි. උන්වහන්සේත් තුම්මුදුනේ රතනසිරි හාමුදුරුවන් වහන්සේත් බසයෙන් බැස පිරිවෙණ පාර අසල තිබුණ බාබර් සාප්පුවකට ගොඩ වැදී වැස්ස තුරල් වෙනතුරු බලා සිට සෙමෙන් සෙමෙන් පිරිවෙණ වෙතට පැමිණ පිරිවෙන් විහාරස්ථානයේ තොරණ අසලින් ම වම්පැත්තට තිබූ අඩි පාරෙන් මුලින්ම ගොඩ වැදුණේ පිරිවෙණට නොව පිරිවෙන් අභ්‍යාස විද්‍යාලයටය. පසුව මෙම පිරිවෙනේ ජීවත් වූ කාලය තුළ, වසර විස්සක් පමණ, උන්වහන්සේ වැඩිම කාලයක් ජීවත් වූයේ ද මෙම අභ්‍යාස විද්‍යාලයයට අයත් ගොඩනැගිල්ලේමය.

මුලින්ම පිරිවෙන් අභ්‍යාස විද්‍යාලයයට ගොඩ වැදුණු උන්වහන්සේට දන්නා අදුනන හිමිවරු කීපනමක්ම හමුවූහ. උන්වහන්සේලාගේ මග පෙන්වීම අනුව පිරිවෙණට පැමිණි උන්වහන්සේ අංක 4 කාමරයේ නවාතැන් ගත්හ. මේ නුහුරු නුපුරුදු පරිසරයේ දින සති මාස ගෙවෙද්දී ගරු ආඳාවල දේවසිරි පරිවේණාධිපති හිමිපාණන් වහන්සේ, ගරු වෙපතඉර හේමාලෝක හිමිපාණන් වහන්සේ වැනි ගරු ගුරුහිමිවරුන්ගෙන්ද සොයුරු ශිෂ්‍ය හිමිවරුන්ගෙන්ද සීලානන්ද හිමියන්ට ලැබුණ සෙනෙහස උදාරය. එදා එම ශිෂ්‍ය හිමිවරු අතර මාපලගම අභයවංශ, ගොඩගම සුමනරතන, මැදගොඩ ආනන්ද, කැගල්ලේ පඤ්ඤාවාස, කෙසෙල්හේනාවේ නන්දසාර යන හිමිවරු ළඟින්ම සිටි අය වූහ.

පරිවෙණාධිපති ආඳාවල දේවසිරි හිමියන් විසින් පසුදිනම අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ පරිවෙණාධ්‍යක්ෂ මාපලගම විපුලසාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට හඳුන්වා දෙන ලදහ. ඉන් පසු සීලානන්ද හිමියන්ට තම නිවහන ලෙස ලැබුණේ අංක 11 කාමරයයි (එදා උන්වහන්සේට මෙය තේරුම් නොගියද පසුකාලීනව සිත දියුණු කරද්දී තේරුම් ගිය ආකාරයට මේ අපේ සීලානන්ද හිමියන්ගේ ජය අංකයකි. උන්වහන්සේට ඒ ඒ කායජීයෙහි ලා ජය අංක හතරක් විය ඒ 8, 9, 11. සහ 22 ය.(මෙසේ දක්වන ලද මෙම අංක කිසිවක් උන්වහන්සේ ජ්‍යෝතිෂ්ශාස්ත්‍රඥයෙකුගෙන් හෝ වෙනත් කිසිම කෙනෙකුගෙන් හෝ දැනගත් ඒවා නොව උන්වහන්සේගේම හිතට දැනුණ එමෙන්ම විවිධ අවස්ථාවල ප්‍රත්‍යක්ෂ වූ අංකයන්ය). මෙම කාමරයේ තවත් ශිෂ්‍ය හිමිවරු දෙනමක් වූහ. ඒ අඹගහගම පඤ්ඤාජෝති සහ අඹන්පොල පඤ්ඤානන්ද යන හිමිවරුය.

මේ දෙදෙනා සමග ඉතාම සුහදව සිටි සීලානන්ද

හාමුදුරුවන් වහන්සේට දින කීපයක් ඇතුළතම  මෙම පිරිවෙණේ සිටි හැම දෙනාම පාහේ සමීපතම අය බවට පත්වූහ. ඒ අය අතර ඉහත නම් සඳහන් කළ හිමිවරුන්ට අමතරව වැලිවිටියේ මේධානන්ද, තැරැලේ වනරතන, දියබෙදුමේ ඤාණවිමල, තිබ්බොටුවාවේ රාහුල, තිබ්බොටුවාවේ සෝභිත, සෑගල විමලබුද්ධි, බෙල්ලන්විල පේමරතන, හක්මණ සෝරත ආදී හිමිවරුද වූහ. ගොඩගම සුමනරතන හිමියෝ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ විහාර පරපුරේ පැවිදි සහෝදර හිමිනමකි. ගරු පණ්ඩිත කහටවිල පිනරතන මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යයෙකි. උන්වහන්සේ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ  ගැන මේ කාලයේ දී විශේෂයෙන්  සොයා බලා විවිධාකාරයෙන් උදවු  උපකාර කළහ.

රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණට පැමිණ සීලානන්ද හාමුදුරුවෝ ඉගෙනීම ආරම්භ කළේ ප්‍රාරම්භ පන්තියෙනි. එනම් ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයෙනි. උන්වහන්සේට මේ කාලය වනවිට මෙම පිරිවෙණෙහි අදාළ ප්‍රාචීන පංතියක් තිබුණද උන්වහන්සේ කැමති වූයේ හුදකලාව සිටිමින් පාඩම් කොට විභාගයට පෙනී සිටීමටය.  ඒ අනුව උන්වහන්සේ කෙසේ හෝ මාස තුනක් (මැයි-අගෝස්තු) ඇතුළත සියලුම පොත් පත් පාඩම් කරමින් අවශ්‍ය දැනුම ලබාගෙන විභාගයට පෙනීසිට එම  විභාගයෙන් ද උසස් ලෙස සමත් වූහ.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ මීළඟ ඉලක්කය වූයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ හෙවත් විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයයි. මෙම විභාගය තීරණාත්මක විභාගයකි. මේ සඳහා දිනපතා පන්තිවලට සහභාගී වූ උන්වහන්සේ ඉතා මහන්සි වී පාඩම් කළහ. උන්වහන්සේ සමගම මෙම විභාගයට තවත් හිමිවරු කීපදෙනෙක් සූදානම්

වූහ. වර්ෂ දෙකකින් ලිවිය යුතු මෙම විභාගයටද උන්වහන්සේ එක් වර්ෂයක් ඇතුළත පාඩම් කරමින් 1982 අගෝස්තු මාසයේ දී ආත්ම විශ්වාසයෙන් යුතුව අධිෂ්ඨාන පූර්වකව පෙනී සිටියහ. විභාගයට පිළිතුරු සැපයූ ආකාරයට අනුව තමන් සමත් වෙන බව දැනගෙනම සිටියද උන්වහන්සේට එම විභාගයේ ප්‍රතිඵල අපේක්ෂාවෙන් මාස කීපයක් සිටිය යුතු විය.

ඒ අනුව සිය විභාගයෙන් අනතුරුව අපේ සීලානන්ද හාමුදුරුවෝ සෙසු ශිෂ්‍යයන් විසින් මෙම පිරිවෙණෙහි "ශ්‍රී සම්භාරතී" මහා ශිෂ්‍ය සංගමයේ සභාපති වරයා වශයෙන් පත්කර ගන්නා ලදහ. 1983/84 වර්ෂයේ ශ්‍රී සම්භාරතී මහා ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා වශයෙන් සිටි කාලය තුළ සීලානන්ද හිමියෝ ශිෂ්‍ය සංගමයේ අභිවෘද්ධියටත් ශිෂ්‍යයන්ගේ ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමටත් විවිධ වැඩසටහන් කීපයක්ම ක්‍රියාත්මක කළහ. මේ අතර රටේ සුප්‍රසිද්ධ දේශකයන් ගෙන්වා දේශන මාලාවක් පැවැත්වීම ද ආරම්භ කළේය.

මෙම දේශන මාලාව ආරම්භ කරමින් මුල් ම දේශනය පැවැත්වූයේ සමාජ විද්‍යාව පිළිබඳව මහාචාර්යවරයාණන් කෙනෙකු වූ නන්දසේන රත්නපාලයන් විසිනි. එදා හරියටම සීලානන්ද හිමියන්ගේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් වු දිනයයි. දේශනය පැවැත්වීමට සුළු මොහොතකට පෙර සීලානන්ද හිමියන්ගේ විභාග ප්‍රතිඵල ලැබුණි. උන්වහන්සේ ඉතා ඉහළින් සමත් වී තිබුණි. ඒ උන්වහන්සේගේ ජීවිතයේ ප්‍රීතිමත්ම දවසකි. තවත් අමතක නොවන සුවිශේෂ වූ දවසකි. ඒ 1983 පෙබරවාරි මස 27 වෙනිදාය. මේ අනුව සීලානන්ද හිමියන්ගේ ජීවිතයේ තවත් ඉදිරි පියවරකට අවශ්‍ය මූලික පසුබිම සැකසුණි. ඒ විශ්ව විද්‍යාල අධ්‍යාපනයට මග පෑදීමය.

විශ්ව විද්‍යාලයට යෑමට සුදුසුකම තිබුණත් පැවිදි දිවියට අවශ්‍ය ම තවත් සුදුසුකමක් උන්වහන්සේට තිබුණේ නැත. ඒ උපසම්පදාවයි. උපසම්පදාවක් නැති භික්ෂුව නියම භික්ෂුවක හෙවත් සම්පූර්ණ භික්ෂුවක වශයෙන් පිළිගන්නේ නැත. ඒ අනුව උපසම්පදාවීමේ අවශ්‍යතාව ද දැනුණි. මේ නිසා උන්වහන්සේ තම පැවිදි ජීවිතයේ උතුම්ම අවස්ථාව ලෙස සැලකෙන උපසම්පදාව ලබාගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කරගත්හ.

සියම් මහා නිකායේ උපසම්පදා සිද්ධ වෙන්නේ සෑම වසරකම මැයි මාසේ හෙවත් වෙසක් මාසයත් පොසොන් මාසයත් අතරය. එනම් වෙසක් පුන් පොහෝ දින සිට පොසොන් පුන් පොහෝ දින දක්වා පමණි. මෙම උපසම්පදාව ලබාගැනීම සඳහා විශේෂ සූදානම් වීමක් අවශ්‍යමය. මෙම සූදානම් වීම පැති දෙකකින් අවශ්‍යය. අවශ්‍ය කරන භෞතික දේ හෙවත් උපකරණ, පිරිකර ආදිය සකස් කරගැනීම එක පැත්තකි. අනිත් පැත්ත අවශ්‍ය කරන බණ දහම් සියල්ල කට පාඩම් කරගැනීම ය. ඒ අනුව අපේ සීලානන්ද හාමුදුරුවෝ මේ සියල්ල සම්පාදනය කර ගනිමින් සිය මාපියන් හා ගරු ගුරුදේවයන් වහන්සේගෙන්ද එවකට වැඩසිටි සිය ජ්‍යෙෂ්ඨ පැවිදි සහෝදර හිමියන් වූ කදුරුකෝට්ටේ සෝමරතන හිමියන්ගෙන් ද තොරතුරු විමසා සියලු දෙනාගේම සහයෝගයෙන් හා සහභාගීත්වයෙන් 1984 මැයි මස 27 වැනි දින මහනුවර මල්වතු මහා විහාරයේදී උපසම්පදාව ලබාගැනීමට කටයුතු සූදානම් කරගත්හ.

## උපසම්පදාව

උපසම්පදා යන වචනයේ අර්ථය වන්නේ ඇතුළට පැමිණවීම හෙවත් අභ්‍යන්තරයට ගැනීම යන්නය. යම් භික්ෂුවක්

උපසම්පදා වීමත් සමගම ශාසනයේ අභ්‍යන්තරයට පත් කෙනෙක් බවට පත්වේ. එතැන් පටන් උන්වහන්සේ ශාසනික වශයෙන් භික්ෂූන් වහන්සේලා අතර සිදුකෙරෙන උපෝසථ කර්ම, උක්ඛෙපනීය කර්ම, පබ්බාජනීය කර්ම, පටිසාරණීය කර්ම ආදී වූ සියලුම විනය කර්මවලට සම්බන්ධ වීමට සුදුස්සෙක් බවට පත්වෙති. මෙසේ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ද උපසම්පදාවට අවශ්‍ය ගුණ දහම් ඇතිකර ගනිමින් බණදහම් සියල්ල ද පාඩම් කරගනිමින් අධිශීල ශික්ෂා සංඛ්‍යාත උපසම්පදාපේක්ෂකයෙක් බවට පත්වූහ.

මේ අනුව එදා උන්වහන්සේ 1984 මැයි මස 27 වැනි දින උදෑසනම ආණමඩුවෙන් පිටත්ව මහනුවරට ගොස් වැඩ විහාරස්ථානයේ නතර වී සිට මහනාහිමිවරුන් සහ කාරක සභික නාහිමිපාණන් වහන්සේලා බැහැදැකීමෙන් අනතුරුව මහනුවර මල්වතු මහා විහාරීය උපෝසථ පුෂ්පාරාම මහා සීමා මාලකයේදී ගරු රඹුක්වැල්ලේ ශ්‍රී ධම්මරක්ඛිත නාහිමියන්ගේ කර්මවාගාචාර්යත්වයෙන් හා ගරු මැණික්දිවෙල ශ්‍රී සිද්ධාර්ථ රතනපාල පේමරතන අනු නාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් විමලකීර්ති ශ්‍රී සුමන පණ්ඩිත සිරිමල්වත්තේ ආනන්දාභිධාන මහා නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ විංශද්වර්ගික මහා සංඝරත්නය අභියස දී අධිශීල ශික්ෂා සංඛ්‍යාත උපසම්පදාව ලබාගත්හ.

අප ඉහත දී දැනගත් පරිදි අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ආචාර්යවරයාණන් වහන්සේ වූ ගරු මහමිතව සෝමානන්ද හිමිපාණෝ මේ වනවිට උපැවිදි වී සිටි නිසා මෙම උපසම්පදා අවස්ථාවේදී උන්වහන්සේගේ ආචාර්ය වරයාණන් බවට පත්වුයේ ගරු මහමිතව සෝමානන්ද හිමියන්ගේ බාප්පා කෙනෙකු වූ ආණමඩුව ගල්කුලිය ලිහිණිගිරි රජමහා

විහාරාධිපති ගෞරවාර්හ මොන්නැකුලමේ ශ්‍රී විමලානන්ද නායක හිමිපාණන් වහන්සේය. ඒ අනුව මෙතැන් පටන් අපේ සීලානන්ද හිමියන්ගේ ගුරුවරයාණන් වූවෝ ගරු මොන්නැකුලමේ ශ්‍රී විමලානන්දාභිධාන රාජවන්නි කුමාරවන්නි දෙපළාතේ උප ප්‍රධාන සංඝනායක මාහිමිපාණන් වහන්සේය.

ඉහත දී අප කෙටියෙන් සඳහන් කළ පරිදි මොන්නැකුලමේ ගරු විමලානන්ද නායක මාහිමිපාණන් වහන්සේ ද මෙම ආණමඩුව ප්‍රදේශයේ ඉතා කීර්තිමත් මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමකි. උන්වහන්සේ කීමෙහි බිණීමෙහි දක්ෂ මහා යතිවරයාණන් වහන්සේ නමක් වූ අතර භික්ෂූන් වහන්සේ කෙනෙකුට තිබිය යුතු නිර්භීත භාවය, අවංක භාවය, අවශ්‍ය අවස්ථාවේදී පිහිටවීම මෙන්ම අකම්පා්‍යභාවය යන උතුම් ගුණ රාශියක් තිබූ මහා සත්පුරුෂයාණන් වහන්සේ නමකි. උන්වහන්සේ විශේෂයෙන්ම පැරණි වෙදකම හා කොණ්ඩදෙනියේ පරම්පරානුගත ගුරුකම් ශාස්ත්‍ර ද මැනවින් හදාරා පුහුණු වී සිටි ධර්ම දේශනා වලට හා පිරිත් දේශනයට විශේෂ හැකියාවක් තිබූ ප්‍රදේශවාසීන්ගේ ගෞරවාදරයට පාත්‍රව සිටි හිමිනමකි.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ උපසම්පදාව ලත් දිනයේම උන්වහන්සේත් සමගම සිය පැවිදි සහෝදර මාමුණාගම සද්ධානන්ද හිමියෝ උපසම්පදාව ලබාගත් අතර උන්වහන්සේත් මොන්නැකුලමේ ශ්‍රී විමලානන්ද නාහිමියන්ගේම ශිෂ්‍යයෙකු වශයෙන් උපසම්පදා වූහ. මෙහිදී අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ පළමුව උපසම්පදා කළ බැවින් සීලානන්ද හාමුදුරුවෝ ගරු මොන්නැකුලමේ විමලානන්ද නාහිමි පාණන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය රත්නය බවට පත්වූහ. මාමුණාගම සද්ධානන්ද හාමුදුරුවන් වහන්සේ දෙවෙනි ශිෂ්‍ය රත්නය බවට පත්වූහ. මෙම දෙදෙනා

වහන්සේම මහමිතව සෝමානන්ද හිමියන්ගේ ශිෂ්‍ය හිමිවරු දෙදෙනාය. එකම දවසේ පැවිද්ද නොලැබුවද දෙදෙනාම හැදුණේ වැඩුණේ එකටය. මේ දෙදෙනා වහන්සේ ගිහියන් වශයෙන් ද සහෝදරයෝය.

## රත්මලානේ දහම් පාසල හා ශ්‍රී සිද්ධාර්ථ තරුණ සමාජය

උපසම්පදාවෙන් අනතුරුව නැවතත් රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණෙහි සේවය කරමින් වැඩ සිටි සීලානන්ද හාමුදුරුවන් වහන්සේ දිනෙන් දින තම අධ්‍යාපන හා අධ්‍යයන කටයුතු ඉතා හොඳින් සිදුකරගත් අතර තම අධ්‍යාත්මික සංවර්ධනය සඳහා ද අවශ්‍ය සීලමය හා භාවනාමය කටයුතු වල නිරත වූහ. සිල්වත්කම තමන්ගේ නමටම ගැළපෙන පරිදි අත්‍යවශ්‍යම දෙයක් සේ සැලකූ උන්වහන්සේ සීලයෙහි පිහිටා භාවනාව කළේ වෙනත් කිසිවෙක් සතුටු කිරීමට නොව තමන්ටම සතුටු විය හැකි බැවිනි. ''සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤො චිත්තං පඤ්ඤං ච භාවයං'' යන බුදුවදන මැනවින් තේරුම් ගත් උන්වහන්සේ නිතර නිතර සිල් ආවර්ජනය කරමින් භාවනා කරන්නට පටන් ගත්තේය.

රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන් විහාරස්ථානය මුල් කරගෙන උන්වහන්සේ ආගමික සාමාජික හා ශාස්ත්‍රීය මෙන් ම ජාතික වශයෙන්ද වැදගත් විවිධ සේවාවන් සිදුකරමින් සැමටම සිය යුතුකම් ඉටු කිරීමට උත්සුක වූහ.

මෙම සේවාවන් අතර විශේෂයෙන් ම උන්වහන්සේගේ සිත වඩාත් යොමු වූයේ ප්‍රදේශවාසී දරුවන්ට අවශ්‍ය දහම් අධ්‍යාපනය ලබා දීමටය. මේ සඳහා උන්වහන්සේ විශේෂ

කැපවීමකින් දහම් පාසලේ කටයුතු ඉතා ලස්සනට කරගෙන ගිය අතර ඒ සඳහා උන්වහන්සේට එකල එහි ආචාර්ය මණ්ඩලය වශයෙන් සේවය කළ බුද්දම සීවලී, වරකාපිටියේ සෝමරංසි, අඹගහගම පඤ්ඤාජෝති, අඹන්පොල පඤ්ඤානන්ද, හක්මණ සෝරත, තිබ්බොටුවාවේ රාහුල, තිබ්බොටුවාවේ සෝභිත යන හිමිවරුන්ගෙන් මෙන්ම ගුණපාල තිලකරත්න මහතා, වීරසුන්දර මහතා, ගුණසේකර මහතා, සීලදාස සොයිසා මහතා, නවරත්න මහතා, ස්වර්ණා ගුණසේකර මහත්මිය, වංශා වීරසිංහ මහත්මිය, වංසවතී මහත්මිය, පද්මා කාරියවසම් මහත්මිය, සංගීතා මධුපානී මෙනෙවිය, අයිරා තාබ්‍රේව් මෙනෙවිය, ලාලනී කුමාරසිංහ මෙනෙවිය, සමරාංගී තාබ්‍රේව් මෙනෙවිය, ලක්මිණී වනිගරත්න මෙනෙවිය, බුද්ධිකා ලාලනී පෙරේරා මෙනෙවිය, කුමුදුණී විමුක්තිකා කාරියවසම් මෙනෙවිය, හිමාලී ජයවර්ධන මෙනෙවිය, මනෝරි හංවැල්ල මෙනෙවිය, අනෝමා පෙරේරා මෙනෙවිය, ලලනිකා හංවැල්ල මෙනෙවිය, අමිලා ධර්මසේන මෙනෙවිය, තමාරා විතානගේ මෙනෙවිය, සංජීවනී රණවීර මෙනෙවිය, නයනා රණවීර මෙනෙවිය, චන්ද්‍රානී කොස්තා මහත්මිය, දමයන්ති මහත්මිය, තිස්ස ලියනගේ මහතා, අනුරුද්ධ වන්නිආරච්චි මහතා, ප්‍රියන්ත ලාල් මහතා, ප්‍රියංකර මහතා ආදී ආචාර්ය මණ්ඩලයේ හැම දෙනාගෙන් ම ඉතා හොඳ සහයෝගයක් ලැබුණි. මෙකල මෙම දහම් පාසලේ සියලු කටයුතු සාර්ථක කරගැනීමට ප්‍රධාන තම හේතුව වූයේ එම ආචාය්‍ය මණ්ඩලයේ සුහදත්වය හා නොමද සහයෝගයයි.

වසර දහයකට වැඩි කාලයක් උන්වහන්සේ මෙම දහම් පාසලේ කනිෂ්ඨ අංශයේ සහ ජ්‍යෙෂ්ඨ අංශයෙත් සේවය කල අතර වසර අටක් පමණ කාලයක් තිස්සේ කනිෂ්ඨ අංශයේ විදුහල් පති වශයෙන් සේවය කළහ. මෙම කාලය තුළ උන්වහන්සේට මෙම දහම් පාසලේ සියලු කටයුතු මැනවින්

කරගෙන යාම සඳහා තරුණ ආචාර්ය මණ්ඩලයේ සහයෝගය නොමදව ලැබුණි. විශේෂයෙන්ම වෙනත් කුදු මහත් කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය දැක්වූ තරුණ කැල ද උන්වහන්සේගේ මතකයෙන් ඈත් නොවුයේය.

එම පිරිස අතර සිටි කවදත් උන්වහන්සේට ආදරයෙන් ගෞරවයෙන් සලකමින් උපකාරවත් වූ උපුල් ශාන්ත කුලසිංහ මහතා (අද මේ පොත මුද්‍රණය කරන මුද්‍රණාලයේ අයිතිකරු), චන්ද්‍රදාස පතිරණ මහතා, දේවක ශ්‍රී තාබ්‍රෙව් මහතා, කෝලිත මුදලිගේ මහතා, අජිත් කුමාර මහතා, රුවන් ගෝමස් මහතා, ප්‍රසන්න මාලිංග මහතා, සුනිල් අජිත් මහතා, ධම්ම නයන මහතා, දයා නිලේන්ද්‍ර මහතා, සමන් පෙරේරා මහතා, ජයවීර මහතා, ප්‍රභා මනුරත්න මෙනෙවිය, දිලුම්කා රත්නායක මෙනෙවිය සහ චම්පිකා රුද්‍රිගු මෙනෙවිය වැනි අයගේ ද නොමද සහයෝගය ලැබුණි.

දහම් පාසල මෙන්ම දහම් පාසල අතහැර සමාජයට එක්වෙන තරුණ කැල ගැනද උන්වහන්සේ දනුවත් ව සිටි අතර එම තරුණ කැලටද කිසියම් සේවාවක් පන්සල හරහා සිදුවිය යුතුබව උන්වහන්සේ තේරුම් ගෙන සිටියහ. ඒ අනුව පංසලෙන් තරුණ කැලට ගුණ දහම් කියා දීමටත් ඒවා ප්‍රායෝගික කිරීමටත් අවස්ථාවක් උදාකර ගැනීමේ අපේක්ෂාවෙන් උන්වහන්සේ " ශ්‍රී සිද්ධාර්ථ තරුණ සමාජය" නමින් තරුණ සමාජයක් ආරම්භ කළහ. ප්‍රදේශයේ තරුණ පිරිස මෙම තරුණ සමාජයට එක් රැස්විය. ඒ අනුව තරුණ තරුණියන් අතර මෙම තරුණ සමාජය ගැන කිසියම් පැහැදීමක් ඇති වූයේ ඒ තුළින් ජාති, ආගම්, කුල ආදි කිසිදු භේදයකින් තොරව සියලු දෙනාට එහි සාමාජිකත්වය ලැබුණ නිසාය. එසේම ප්‍රදේශයේ බෞද්ධ අබෞද්ධ දුප්පත් පවුල්වලට මේ මගින් විශේෂ සේවාවක් සිදුවුණ නිසාය.

මෙසේ මෙම ශ්‍රී සිද්ධාර්ථ තරුණ සමාජය මගින් උන්වහන්සේගේ අනුශාසනා පරිදි විවිධ සේවාවන් කිරීමට අවස්ථාව සැලසුණි. ඒ අතර විශේෂයෙන්ම කළුබෝවිල රෝහලේ වාට්ටු පිරිසිදු කරදීම, ප්‍රදේශයේ අසරණ පවුල් වලට හා දරුවන්ට පිහිට වීම, විහාරස්ථානයේ පැවැත්වූ සති පිරිත සංවිධානය කිරීම ආදී විවිධ පින්කම් සංවිධානය කිරීම, විහාරස්ථානයේ සිදු කෙරුණ විශේෂ උත්සවවලට පූර්ණ සහයෝගය ලබාදීම, තරුණ තරුණියන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීමට විශේෂ ඉංග්‍රීසි පංතියක් පැවැත්වීම, වැනි අභිවෘද්ධිදායක කායජීයන් රාශියකට නායකත්වය හා සහයෝගය දැක්වීමට අවස්ථාව ලැබීම උන්වහන්සේට ඉමහත් සතුටට හේතුවක් වූ බව උන්වහන්සේ අදත් සිහිපත් කරන්නේ ඉමහත් සතුටිනි. මේ සියලු කටයුතු සඳහා උන්වහන්සේට පරම ධම්ම චේතිය පිරිවෙන් විහාරාධිපතිව වැඩ සිට අපවත් වී වදාළ ගරු මාපලගම විපුලසාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අවසරය ලැබුණේ සහයෝගය ලැබුණේ උන්වහන්සේ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ කෙරෙහි තිබු විශ්වාසය හා හිතවත් භාවය නිසාය.

රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට ජීවින ගමනේ තෝතැන්නක් බවට වූයේ ගරු මාපලගම විපුලසාර මහා ස්වාමීන්ද්‍රන් වහන්සේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ කෙරෙහි තැබූ කිසියම් විශ්වාසයක් නිසාමය. අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ජීවිතයේ ඉතාමත්ම තීරණාත්මක අවස්ථාවක අසත්‍යය රජයමින් සත්‍යය සැගවී යන මොහොතක පවා ගරු මාපලගම විපුලසාර හිමිපාණෝ අසත්‍යය අසත්‍යය වශයෙන් අසාසිට සත්‍යයට වැජඹෙන්නට අවස්ථාව සලසා දුන්හ. ඒ සීලානන්ද හිමියන් කෙරෙහි උන්වහන්සේ තබා තිබු විශ්වාසයයි. සත්‍යය සැමවිටම ජයගනියි. බොරුව නොවේ.

අපේ සීලානන්ද හාමුදුරුවෝ මේ රත්මලාන ප්‍රදේශයේ ඇති සෑම විහාරස්ථානයකම පාහේ ධර්ම දේශනා පවත්වා ඇත. විහාරස්ථානයට සම්බන්ධ දායක දායිකාවන්ගේ ආගමික කටයුතු ඉතා ඕනෑකමින් කළහ. භික්ෂූන්වහන්සේගෙන් ඉටුවිය යුතු එම ආගමික සේවාවලදී උන්වහන්සේ ඒ ඒ කාලවල විහාරස්ථානයේ දාන සංවිධායක වශයෙන් කටයුතු කළ ස්වාමීන් වහන්සේලාගේ සහයෝගය ඇතිව එම කටයුතු සාර්ථකව ඉටු කරදීමට ඇප කැප වූහ.

මෙසේ කාලය ගෙවී ගියා දින සති මාස ගණනින් . 1984 වර්ෂයේ ඔක්තෝබර් මාසයත් ගෙවී යද්දී අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට විශ්ව විද්‍යාලයට ඇතුළු වීමේ දිනය එළඹිණ. ඒ 1984 ඔක්තෝබර් මස 29 වැනි දාය.

## විශ්ව විද්‍යාල ජීවිතය (කැලණිය )

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ සිය විශ්ව විද්‍යාල ජීවිතය ආරම්භ කළේ කැලණිය විශ්ව විද්‍යාලයෙනි. කැලණිය විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ඉතිහාසයේ සුවිශේෂ විශ්ව විද්‍යාලයකි. මෙය අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේත් අධ්‍යාපනය ලබා ගත් රත්මලානේ පරම ධම්ම චේතිය මහා පිරිවෙණින්ම මෙයට වර්ෂ 170 කට පමණ පෙර අධ්‍යාපනය ලබාගත් ගෞරවාර්හ රත්මලානේ ධම්මාරාම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් කැලණිය පැලියගොඩ සුවිශේෂ වූ පුණ්‍ය භූමියක ආරම්භ කරන ලද විද්‍යාලංකාර මහ පිරිවෙණ විශ්ව විද්‍යාල මට්ටමට උසස් වීම නිසා ලක් ජනතාවට ලැබුණ තවත් ශ්‍රේෂ්ඨ දායාදයකි.

කැලණිය විද්‍යාලංකාර මහ පිරිවෙණ කැලණිය විශ්ව විද්‍යාලය නමින් ද මාලිගාකන්දේ විද්‍යෝදය මහ පිරිවෙණ

ගංගොඩවිල විදෙන්දය විශ්ව විද්‍යාලය නමින් ද නම් කරන ලද්දේ විශේෂයෙන් ම ලංකාවේ ඇත දුප්පත් අසරණ අහිංසක දෙමාපියන්ගේ දරුවන්ට ඇහිරී තිබුණ විශ්ව විද්‍යාල වරම ලබාදීමට ය. අද ලංකාවේ ජීවත්වෙ න සමහර උදවිය මෙහි විවිධ වැරදි පැති දකින නමුත් මේ සඳහා පුරෝගාමී වූ අයගේ අභිලාශය වූයේ විශේෂයෙන් ම භික්‍ෂූන් වහන්සේලාටත්, ලක්වැසි සුදුසුකම්ලත් සියලුම ශිෂ්‍යයන්ටත්, විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ලබාදීමට ය. කෙසේ වුවද මේ මගින් සිදුවී ඇති යහපත අද අපි දකිමු. මෙම විශ්ව විද්‍යාල නොතිබූ කාලේ විශ්ව විද්‍යාල වරම ලැබී තිබුණේ ශ්‍රී ලංකාවේ නාගරිකව ජීවත්වූ මිළ මුදල් බහුල සමාජයේ උසස් යැයි හඳාගත්ත, සම්මත කරගත්ත, එක්තරා මට්ටමක දරුවන්ට පමණි.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ විශ්ව විද්‍යාලයට ඇතුළත් වුයේ 1984 ඔක්තෝබර් මස 29 වැනි දිනය. විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමෙන් පසුව ද උන්වහන්සේ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබන කාලය මුළුල්ලේම නතර වී සිටියේද රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන් විහාරස්ථානයේමය. මෙසේ රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණ උන්වහන්සේගේ ජය භූමිය බවට පත්වූයේ ගරු මාපලගම විපුලසාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ කෙරෙහි තැබූ විශ්වාසය මෙන්ම දැක්වූ දයාව අනුකම්පාව හා මෙත් සිත නිසාය.

විශ්ව විද්‍යාලයට සමත් වෙන ශිෂ්‍යයන්ට මෙම පිරිවෙන් විහාරස්ථානයේ නවාතැන් ගැනීමට මෙයට පෙර අවසර තිබුණේ නැත. එහෙත් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට විශ්ව විද්‍යාලයට සමත් වීමෙන් අනතුරුව නවාතැන් ගැනීමට සුදුසු තැනක් සොයා ගැනීමේදී සිය ප්‍රතිපත්ති ආරක්‍ෂාකර ගනිමින් ජීවත් වීමට සුදුසු ස්ථානයක් සොයා ගැනීම ඉතා

අපහසු කායඝියක් විය. ඒ අනුව උන්වහන්සේ ගරු මාපලගම විපුලසාර ලොකු හාමුදුරුවන් වහන්සේට මේ බව මතක් කළ මොහොතේ ගරු විපුලසාර නාහිමිපාණන් වහන්සේ ප්‍රකාශ කළේ " විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මෙහෙ ඉන්ඩ අවසර දෙන්නේ නෑ. ඒත් තමුන්නාන්සෙට පුළුවන් කාලයක් මෙහි ඉන්ඩ අවසර තියෙනවා." කියලයි. ඒ අනුව සීලානන්ද හාමුදුරුවෝ රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන් විහාරස්ථානයේම නතර වී එහි ගුරුවරයෙකු වශයෙන් ද සේවය කරමින් විහාරස්ථානයේ දායක දායිකාවන්ගේ කටයුතු සහ දහම්පාසලේ කටයුතුත් සොයා බලා විශේෂ සේවයක් සිදුකරමින් තම අධ්‍යාපනික හා ආධ්‍යාත්මික දියුණුව ද සලසා ගත්තේ සිහියෙන් හෙවත් සතියෙන් යුතුව ගුණ නුවණ දියුණු කරගත් නිසාමය.

විශේෂයෙන්ම අපේ හාමුදුරුවන් වහන්සේට, සීලානන්ද හාමුදුරුවන් වහන්සේට, මෙකල සුහදත්වයෙන්, සමීපත්වයෙන් මෙන්ම සහෝදරත්වයෙන් කටයුතු කළ තවත් සුවිශේෂ තැනැත්තෙක් මෙකල රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණහි සිටියේය. එකල හෙතෙම කොළඹ හුණුපිටියේ ගංගාරාම පිරිවෙන් විහාරස්ථානයේ අධ්‍යාපනය ලබමින් සිටියද රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණට පැමිණෙන හැම අවස්ථාවකමත් එහි ගත කරන කාලය තුළත් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට සහෝදරත්වයෙන් සැලකූ අතර විවිධ අවස්ථාවල සමහර දිනවල උන්වහන්සේලා දෙනමම ප්‍රිය කරන ග්‍රීන් ටී වළඳමින් රාත්‍රී පහන් වෙන තෙක් ද එක්ව සුහදව බණ දහම් මෙන්ම ගුණ දහම් ගැනත් ජීවිතය හා අනාගත විවිධ අපේක්‍ෂා මෙන්ම විවිධ සැලසුම් ගැනත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළහ. එදා ඒ අපේ හාමුදුරුවන් වහන්සේ සමග සහෝදරත්වයෙන් සිටි සුවිශේෂ තැනැත්තා හෙවත් පුද්ගලයා වෙනත් කිසිවෙක් නොව අද රත්මලාණේ පරම ධම්ම

චේතිය පිරිවෙන් විහාරස්ථානයේ විහාරාධිපතිව වැඩ සිටින ගරු මඩපාත ධම්මසාර මහා ස්වාමීන්දුයන් වහන්සේය.

අදත් උන්වහන්සේලා දෙදෙනා අතර ඇත්තේ එදා මෙන්ම සුහද සබඳතාවයකි. සහෝදරත්වයකි. ධම්මසාර හිමියෝ සහජ දක්ෂතා, කුසලතා රාශියකින් සපිරි ඍජු බවත් අවංක බවත් පෙරටු කරගත් නිබඳවම ව්‍යාජත්වය පිටුදකින නිහතමානී චරිතයකින් හෙබි යුක්තිය වෙනුවෙන් අභීතව නැගී සිටින සීලානන්ද හිමියන්ගේ ජීවිතයේ උන්වහන්සේට හමුවූ තවත් සුවිශේෂ හිමිනමක් බව සඳහන් කරයි.

අපේ හාමුදුරුවෝ, සීලානන්ද හාමුදුරුවෝ කැලණිය විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් ශිෂ්‍ය අංක එච්/එස්එස්/84/35 4 යටතේ වසර හතරක් අධ්‍යාපනය ලබාගත්හ. උන්වහන්සේ බොද්ධ දර්ශනය, ජපන් භාෂාව සහ පුරාවිද්‍යාව මුල්වසරේ හදාළහ. විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා ප්‍රධාන විෂයය වශයෙන් බෞද්ධ දර්ශනය ද උප විෂයය වශයෙන් ජපන් භාෂාව ද තෝරාගත්හ.

එදා උන්වහන්සේ බෞද්ධ දර්ශනය විෂයය තම ප්‍රධාන විෂයය ලෙස තෝරාගත්තේ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ නිර්මල ධර්මය කුමක්ද යන්න සොයා ගැනීමට තිබූ බලවත් කැමැත්ත නිසාමය. උන්වහන්සේට මේ පිළිබඳව වඩාත් කැමත්තක් ඇති වූයේ මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න වැනි මහාචාර්ය වරයෙකු හමුවීම නිසාය. මෙම මහාචාර්ය වරයා බෞද්ධ දර්ශනය ඉගැන්වීමේදී එය ආදර්ශයෙන්ම පෙන්වීමටත් උත්සුක වූ ශ්‍රී ලංකාවේ විසූ සුවිශේෂී පුද්ගලයෙකි.

දිනක් දේශනයක් පවත්වන අතර දේශන ශාලාවෙන් පිටත ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් අතර ගැටුමකි. (මෙවැනි ගැටුම්

නවක ශිෂ්‍යයන්ගේ පැමිණීමත් සමග අභ්‍යන්තර දේශපාලන පක්ෂ අතර ඇති අසමාන කම් නිසාත් අලුත ළගා වූ නැවේ තිබූ ලස්සන ලස්සන මල් තෝරාගැනීමේ දී තමන්ට ලස්සන මල් නැති වෙන විට ඇති වෙන ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය නිසාත්, විශ්ව විද්‍යාලය තුළ දක්නට ලැබේ). මෙසේ දෙපිරිසක් අතර ගැටුමක් පවතිද්දී සිය දේශනයට සවන් දී සිටි බොහෝ පැවිදි ගිහි ශිෂ්‍යයෝ නැගී සිටිමින් ශාලාවෙන් පිටත සිදුවෙන ගැටුම නැරඹීමට පටන් ගත්තෝය. මේ පිරිස දෙස නිහඬව ටික වේලාවක් බලාසිටි මහාචාර්යවරයා සිය ගැඹුරු කට හඬ අවදිකරමින් " හා. . . දැන් බැලුවද?... ඇද්ද?. . . මේ ඉගෙන ගන්නේ බෞද්ධ දර්ශනයයි. ඔය එක එකා, එක එකී ගහගන්නවා. කොටා ගන්නවා. ඉස්පිරිතාලෙට අරගෙන යනවා. එහෙම නැත්තම් මරාගන්නවා. එතනින් ඒක ඉවරයි. ඕවට කලබල වෙන්නෑ බෞද්ධ දර්ශනය ඉගෙන ගන්න අය. ඕවා ඔහොම තමයි ඇතිවෙනවා නැතිවෙනවා. ඕවට කලබල විය යුතු නෑ" යැයි කීවේය. මෙම මහාචාර්ය වරයා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ බෞද්ධ දර්ශනය පිළිබඳව සිටි ප්‍රථම මහාචාර්ය වරයාය. ඔහුගේ හදිසි අභාවය මුළු මහත් ශිෂ්‍ය පරපුරටම සිදු වූ බලවත් පාඩුවකි.

මෙසේ විශ්ව විද්‍යාලයේ ප්‍රථම වසර සතුටින් ගෙවී යද්දී 1984 වර්ෂය ගෙවී ගියා. 1985 වර්ෂයේ ප්‍රථම භාගයත් ගතවී ගිය විට අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ විශ්ව විද්‍යාල ජීවිතයේ ප්‍රථම වර්ෂාවසාන පරීක්ෂණයට මුහුණ දීමේ දවස දිනෙන් දිනම ළංවෙමින් තිබිණ. සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ඉතාමත් හොඳින් විශ්ව විද්‍යාල අධ්‍යාපන කටයුතු කරගෙන යමින් සිටි නිසා දැඩි අධිෂ්ඨානයක් මෙන්ම විභාගය සාර්ථකව සමත් කරගැනීමට හැකිවේවි යන හිතේ හොඳ විශ්වාසයක්ද උන්වහන්සේ තුළ තිබිණ. එහෙත් විභාග දිනය දිනෙන් දිනම කිට්ටු වෙද්දී ජීවිතයේ තමන් නොසිතූ ලෙසින්

සංවේගාත්මකම අත්දැකීමක් ලබන්නට උන්වහන්සේට සිදුවුණේය.

ඒ අපගේ තථාගත ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ "අචින්තිතම්පි භවති චින්තිතම්පි විනස්සති" යන බුදුවදන සනාථ කරමින් තමන්ගේ ජීවිතයේ පුංචි ම දවස්වල පටන් ඉතා ම ආදරයෙන් සෑම දෙයක්ම සොයා බලා දිවා රෑ වෙහෙසෙමින් ආදරයෙන් තමන් හදා වඩාගත්ත තමන්ගේ ආදරණීය පියාණන් පරලෝ සැපත් වීමය. ලොව අපි සැමදෙනාටම ඇත්තේ එකම එක මවකි. එකම එක පියෙකි. ඒ දෙදෙනා නැතිදාට තවත් කෙනෙකුට හදවතින්ම අම්මා කියා අමතන්න හෝ තාත්තා කියා අමතන්න අපට ඉඩක් නැහැ. මවුපියෝ අපේ ජීවිතයේ උල්පතයි. අද අපි මේ ස්ථානයේ මේ ලෙසින් සිටින්නේ අපේ අම්මා නිසයි. අපේ තාත්තා නිසයි නේද?

වරක් අපගේ බුදුපියාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා අමතමින් මෙසේ වදාළහ. "පින්වත් මහණෙනි මේ ලෝකේ තැනැත්තෝ දෙදෙනෙක් සිටිනවා, ඒ දෙදෙනාට ප්‍රති උපකාර කරලා දැන් නම් ඇති කියා අවසන් කරන්න බැහැ. ඒ දෙදෙනා නම් මව සහ පියාත් ය." ( ද්වින්නාහං භික්ඛවෙ න සුප්පතිකාරං වදාමි. මාතුච්ච පිතුච්ච) යනු බුදුපියාණන් වහන්සේගේ ඒ බුද්ධ වචනයයි. තව දුරටත් මේ කරුණ පැහැදිලි කළ බුදුපියාණන් ප්‍රකාශ කළේ "පින්වත් මහණෙනි වසර සියයක් ජීවත් වෙන යම් දරුවෙක් තමන්ගේ මෑණියෝ එක උර හිසක තබාගෙන පියාණෝ අනිත් උරහිසේ තබාගෙන වසර සියය සම්පූර්ණ වෙනතෙක් ම ඒ දෙදෙනාට කෑම බීම සපයාදීම ආදිය මෙන්ම වැසිකිළි කැසිකිළි යාම් පවා කරමින් සිටින අතර ඒවා පිරිසිදුකරමින් උරහිසේම තබාගෙන සැලකුවද ඒ මවට පියාට එම දරුවා විසින් ගෙවිය යුතු ණය ගෙවා අවසන් කළ නොහැකිය. එහෙත් සිය මව හෝ පියා මිත්‍යාදෘෂ්ටියේ පිහිටා

සිටින්නේ නම් ඒ මිත්‍යාදෘෂ්ටියෙන් මුදවා සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටුවිය හැකි නම් එම දරුවාට ඒ ණයින් නිදහස් විය හැකිය" යනුවෙනි. තමන්ගේ මව දන්දීමට අකැමැති නම් දන්දීමට පුරුදු කරන්න. සිල් රැකීමට අකැමැති නම් සිල් රැකීමට පුරුදු කරවන්න. භාවනා කිරීමට අකැමැති නම් භාවනාවට හුරු කරන්න, පුරුදු කරන්න. මෙසේ දෙමාපියන් සම්‍යක් දර්ශනයට හුරුකිරීම දරුවන්ට ලැබෙන මහා පිනකි. එහෙත් අපේ හාමුදුරුවන් වහන්සේගේ මවත් පියාත් දෙදෙනාම බුදුදහම තේරුම් ගෙන සිටි අය බව ඉහත දී අපි සඳහන් කළෙමු. දැහැමි බොදු දිවිය ඔවුන්ට හුරු වුයේ පරම්පරාවෙන්මය.

අපේ හාමුදුරුවන් වහන්සේගේ ආදරණීය පියාණන් පරලෝ සැපත් වුයේ 1985 සැප්තැම්බර් මස 21 වෙනි දිනය. ඒ හරියටම විශ්ව විද්‍යාලයේ ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණයට දින දෙකකට පෙරය. පියාණන් පරලෝ සැපත් වූයේ යැයි පණිවිඩය ලද සැණින්ම උන්වහන්සේ කොළඹ රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණේ සිට ආණමඩුව තල්ගස්වැවේ පිහිටි සිය නිවසට වැඩම කළහ. එහිදී උන්වහන්සේ සිය සහෝදර සහෝදරියන් ඉදිරියේ මෑණියන්ටත් කියා සිටියේ. "අම්මේ මේ අවස්ථාවට අපි හොඳින් මුහුණ දිය යුතුයි. මගේ පියාණන් පරලෝ සැපත්වීම මට සිදුවු විශාලතම පාඩුවක්, සංවේගයක්. ඒක එක පැත්තක්. ඒත් මට මගේ විශ්ව විද්‍යාලයේ විභාගය අනිද්දා. එක පාඩුවක් සිදුවුවිට තවත් පාඩුවක් සිද්ධ කරගැනීම බෞද්ධ පිළිවෙත නෙවෙයි. අපේ බුදුහාමුදුරුවෝ අපට දේශනා කරලා තියෙන්නේ යම් විරෝධයක් එනවිට එය නිරෝධයක් කරගන්නා පිළිවෙලයි. ඒ අපණ්ණක ප්‍රතිපදාවයි. අපේ පියාට ජීවත්ව සිටින අවස්ථාවේ අපෙන් කෙරෙන්න තිබුණ යුතුකම් අපි ඉටු කළා. දැන් අපේ අවසන් යුතුකමත් අම්මා කියන ආකාරයෙන් ආගමික කටයුතු කරලා හෙටම මේ කටයුතු අවසන් කරන්න ඕනේ. අනිද්දා උදේම මම විභාගයට

පෙනී සිටින්නත් ඕනේ.” කියලයි.

මේ අනුව තම ආදරණීය මෑණියන් වහන්සේගේ උපදෙස් ලබාගනිමින් පියාණන්ගේ අවසන් කටයුතු ඉතාම ලස්සනට එහෙත් චාම්ව සිදුකොට පසුදා විශ්ව විද්‍යාලයට ගොස් ප්‍රථම ශාස්ත්‍රපරීක්ෂණයට ද පෙනීසිටි උන්වහන්සේ එයින්ද විශේෂ සාමාර්ථයක් ලබාගත්තේය.

පියාගේ වියෝව නිසා උන්වහන්සේ එදා එම ශාස්ත්‍රපරීක්ෂණයට පෙනී නොසිටියේ නම් උන්වහන්සේට සිදුවිය හැකිව තිබූ පාඩු කීපයකි. එනම් තමන් වහන්සේට ලැබෙමින් තිබුණ මහපොළ උසස් අධ්‍යාපන කුසලතා ශිෂ්‍යත්වය අහෝසිවීම, තවත් වසරක් වැඩිපුර විශ්ව විද්‍යාල අධ්‍යාපනයට කැපකිරීමට සිදුවීම සහ තමන් වහන්සේ බලාපොරොත්තු වූ ආකාරයට විශේෂවේදී උපාධියකට යාමට අවස්ථාව නැතිවී යාම යන මේවාය.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ විශ්ව විද්‍යාල ජීවිතයේ දී උන්වහන්සේ ළඟින්ම ඇසුරු කළ අය අතර මහලදූවේ නන්දරතන, කුරුණෑව ධම්මරතන, මාරගමුවේ සීලානන්ද, අත්තුඩාවේ හේමසිරි, නාගොඩ ධම්මික, පුඹ්බිලියේ මෛත්‍රී, තුන්නාණේ සුජීව, වැනි හිමිවරු වූහ. මෙම කාලය රටේ අභ්‍යන්තර කැරලි තිබුණ කාලයකි. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ 1971 වසරේ මෙන් තවත් කැරැල්ලකට සූදානම් වෙන අවස්ථාව විය. විශ්ව විද්‍යාල තුළ නිතරම වර්ජන. හැමදාමත් විවිධ ආකාරයේ විරෝධතා රැළි. තැන තැන යමින් විවිධ සටන් පාඨ කියමින් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් රාජ්‍ය විරෝධී සටන්වල. මෙම නිරර්ථක සටන් පාඨ හා විරෝධතාවල හරසුන් බව දුටු සීලානන්ද හිමියෝ තමා සමග නිතරම එකට සිටි තවත් හිමිවරු කීපදෙනෙක් සමග මෙම

විරෝධතා වලින් බැහැරව සිටියහ. මේ හිමිවරු මෙම හරසුන් දේ ගැන ඉවෙන් මෙන් දැන සිටියෝය. එබැවින් සටන් පාඨ හෝ විරෝධතා රැලි මෙම හිමිවරුන්ගේ විශ්ව විද්‍යාල ජීවිතයේ කොටසක් නොවීය. එහෙත් කිසිවෙකු සමග අමනාපයක් ද විරුද්ධත්වයක් ද උන්වහන්සේලාට තිබුණේ නැත.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට විශ්ව විද්‍යාලය තුළ ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් පෙරමුණ ගෙන ක්ෂේත්‍රයේ කටයුතු කරන්නට යැයි ආරාධනා ලැබුණ අවස්ථා ද තිබුණි. එහෙත් උන්වහන්සේ අද වගේම එදත් හරසුන් දේ කලින්ම දැන, දැක, කිසිවෙකුත් සමග අමනාපයකුත් ඇති නොකරගෙන එවායින් ඉවත් වුහ. එදා උන්වහන්සේට පෙරමුණට එන්න යැයි කියමින් පක්ෂ දේශපාලනය කළ සමහර හිමිවරුන්ගේ සහ තරුණ තරුණියන්ගේ ජීවිත නොබෝ කලකින්ම එනම් 1988/89 වෙද්දී රටේ තැන් තැන් වල ටයර් මත ගිනි ඇවිලෙමින් තිබුණ බව දැනගන්නට ලැබුණි. ධර්මය නොදත්කම එයට මූලිකම හේතුව විය. යම් ශිෂ්‍යයෙක් බෞද්ධ දර්ශනය හෙවත් බුදුන් වදාළ නියම ධර්මය හදාළ යුත්තේ මේ නිසයි. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ ධර්මයට වඩා කෙලෙස් හරිත වූ බල තණ්හාවෙන් යුක්තවූ බටහිර දර්ශන පෙරටුකරගත් පුද්ගලයන්ගේ දර්ශන වාද ඔස්සේ ගිය හැමදෙනාටම සිදුවූයේ ජීවිතය නිස්සාරත්වයෙන් නිශ්ඵලත්වයෙන් අවසන් කිරීමටය. කෙලෙස් ඇති හැම කෙනෙකුම බල තණ්හාවෙන් මුසපත් වීම වැළැක්විම අතිශයින්ම අපහසු දෙයකි.

අපේ සීලානන්ද හිමියෝ විශ්ව විද්‍යාලයයේ අධ්‍යාපනය හදාළ කාලය තුළ වුවද තමාගේ ඇසුරට ලැබුණ හැමදෙනා සමගින්ම හැම කෙනා සමගින්ම මිත්‍රත්වයෙන්, සුහදතාවයෙන් සිටි අතර උන්වහන්සේ තමන් දැන් විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක්

යැයි සිතමින් ආඩම්බරයෙන් උදම් වී තමා  මෙතෙක් කලක් පුරුදු පුහුණු කරමින් සිටි භාවනාව,  නිර්මාංස ආහාරය, අරුණෝට පළමුව නැගීටීම, වැනි තම ජීවන ප්‍රතිපත්ති එකක්වත් අත්හළේ නැත.

1988/89 ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතාමත්ම භයානක යුගයක් විය. රට පුරාම මහා භීෂණයක් ඇතිවූ යුගයක් විය. මෙකල විශේෂයෙන්ම විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ ජීවිත අනාරක්‍ෂිතවිය. ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ සෑම කෙනෙකුම පාහේ වැරදිකරුවන් බවට පත්කොට දුටු තැන මරා දමන තත්වයක් එළඹිණි. මේ කාලය වනවිට අපේ සීලානන්ද හිමියන් සමග එකට සිටිය බොහෝ දෙනෙකු මරා දමා තිබුණි. අපේ සීලානන්ද හිමියන් ගත කළ පිවිතුරු ජීවිතය නිසා කිසිවෙකුටත් උන්වහන්සේට ඒ අයුරින් චෝදනා කිරීමට නොහැකි විය. මේ කාලය වනවිට දිනපතාම විශ්වවිද්‍යාල සිසුන් පැහැරගෙන ගොස් විවිධ දඬුවම් පමුණුවන බවත් සමහරුන් මරා දමන බවත් විවිධ ප්‍රවෘත්ති මගින් දැනගන්නට ලැබුණ අතර සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ඒ කිසිවකට සම්බන්ධ නොවූ නිසා සිත සැනසිල්ලේ භාවනා කරමින් රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙන් විහාරස්ථානයේ ඇති භාවනා මන්දිරයෙන් උපරිම ප්‍රයෝජන ලබාගත්හ.

රටේ විවිධාකාරයෙන් භීෂණය රජ කළ මෙම භීෂණ සමය තුළ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ නිෂ්ඵල දෙයට සිත යොමු නොකොට තම සිත දමනය කිරීමේ වැඩපිළිවෙලක් සකස් කරගැනීමටත් තම ඉංග්‍රීසි හා ජපන් භාෂා දැනුම වර්ධනය කරගැනීමටත් කාලය ගත කළහ. ඒ සඳහා උන්වහන්සේ ඇක්වයිනස් කොලීජියට ඇතුළත්ව එහි ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ඩිප්ලෝමාවක් ලබාගත්හ. එසේම උන්වහන්සේ  ජනසන්නිවේදන හා සමාජ සංවර්ධන අභ්‍යාස

ආයතනයෙන් ජනසන්නිවේදනය ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කරමින් සහතික ලබාගත්හ. තවද උන්වහන්සේ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජනමාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සහතික පත් ලබාගත්හ. මෙයට අමතරව උන්වහන්සේ තවත් බුද්ධ ධර්මය ඩිප්ලෝමා, ජපන් භාෂාව ඩිප්ලෝමා, බයිබල් අධ්‍යාපන ඩිප්ලෝමා වැනි ඩිප්ලෝමා පාඨමාලා කීපයක්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා සම්පූර්ණකර සහතික පත්‍ර ලබාගනිමින් සිය දක්ෂතා කුසලතා තව තවත් ඔප්නංවා ගත්හ. විවිධ අවහිර බාධක මෙන්ම සමහර පැවිදි ගිහි අයගේ අධෛර්යමත් කිරීම් හා නිග්‍රහයන් ද මධ්‍යයේ වුව ද මෙසේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙම ඩිප්ලෝමා විභාග සමත්වීම සහ උපාධි ලබාගැනීම උන්වහන්සේගේ ඉදිරිගමනට මහත් උපකාරයක් මෙන්ම ආලෝකයක් ද විය.

මෙසේ රට තුළ පැන නැගී එම කලබලකාරී පරිසරය මගහැරී ගියේ 1990 වසර වනවිටය. ඒ අනුව 1990 වසර වනවිට අපේ හාමුදුරුවෝ විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කරමින් දෙවෙනි පෙළ ඉහළ සාමාර්ථයකින් විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය ලබාගත්හ.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන කාලය තුළම අපේ හාමුදුරුවන් වහන්සේ රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙණෙහි ඉංග්‍රීසි උප ගුරුවරයෙකු වශයෙන් සේවය කිරීම සඳහා තෝරාපත් කරගත්හ. ඒ අනුව උන්වහන්සේ ඉතා සතුටින් එහි සේවය කළහ.

මෙයට සමගාමීව උන්වහන්සේ රත්මලාන පරම ධම්ම චේතිය පරිවෙණානුබද්ධ ශ්‍රී සිද්ධාර්ථ දහම් පාසලේ ද ගුරුවරයෙකු වශයෙන් හා උප ප්‍රධානාචාර්ය්‍ය වරයා වශයෙන්ද වසර දහයක් පමණ කාලයක් තිස්සේ සේවය කළහ. තවද මෙම අවදියේම

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ගල්කිස්ස වටරප්පල පාරේ ධර්මායතනයේ ගරු දිවියාගහ යසස්සී නාහිමිපාණන් වහන්සේ විසින් ආරම්භ කරන ලද මුල්ම ඉංග්‍රීසි දහම් පාසලේ ද වසර පහක් පමණ කාලයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අභිධර්මය උගන්වමින් එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උසස් සාමාර්ථ ලබාගැනීම සඳහා මහෝපකාරී වූහ.

අපේ හාමුදුරුවෝ රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණෙහි ඉංග්‍රීසි උපගුරුවරයෙකු වශයෙන් සේවය කිරීම සඳහා එම ගුරුවෘත්තියට බැඳුණේ 1989 ජූනි මස 01 වැනිදාය. විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් කොට සිටි සීලානන්ද හිමියන්ට රජයේ පාසලකට ගුරුපත්වීමක් ලැබුණ ද උන්වහන්සේ රජයේ පාසලකට යෑමෙන් තමන් වහන්සේගේ භික්ෂු ආකල්ප වලට ඇතිවිය හැකි පිරිහීම් සලකා උන්වහන්සේ කැමැත්ත පළ කළේ එම පරම ධම්ම චේතිය පිරිවෙණෙහිම උපාධිධාරී ස්ථිර ගුරුවරයෙකු වශයෙන් සේවය කිරීමටය. ඒ අනුව උන්වහන්සේ 2000 වසරේ ජනවාරි මස 01 වැනි දින දක්වාම එම පිරිවෙණෙහි උපාධිධාරී ගුරුවරයෙකු වශයෙන් සේවය කළහ. මෙහිදී උන්වහන්සේ පාලි, සංස්කෘත, සිංහල, ඉංග්‍රීසි, බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, ආදී විෂයයන් කීපයක්ම ඉගැන්වූ අතර අමතර විෂයයක් වශයෙන් ජපන් භාෂාව ද ඉගැන්වූහ.

1991 වසර සීලානන්ද හිමියන්ගේ ජීවිතයේ තවත් සුවිශේෂ වර්ෂයක් විය. මේ වර්ෂයේදී සීලානන්ද හිමියෝ තථාගත බුදුරජාණන් වහන්සේගේ උත්පත්තිය, බුදුවීම, ප්‍රථම ධර්ම දේශනය පැවැත්වීම, සහ පරිනිර්වාණය සිදුවූ ස්ථානය ද යන සුවිශේෂ පූජනීය ස්ථාන හතර දැක බලා වැඳ පුදා ගැනීමට දඹදිවට වැඩම කළහ. තමන් වහන්සේට මෙම ගමනේදී විශේෂයෙන්ම පිඹුරේ සමිත හිමියන් සහ වැලිවිටියේ

මේධානන්ද හිමියන් විශේෂයෙන් උපකාරී වූ බව පින් පෙරටුව සිහි පත් කරති. මේ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ජීවිතයේ ප්‍රථම විදේශ සංචාරයයි.

1992 වසරේ අප්‍රේල් මස 1 වැනි දින සිට 15 වැනි දින දක්වා මාතර කැකුණදුර ඇල්ලකන්ද ආරණ්‍ය සේනාසනයට ගොස් එහි භාවනානුයෝගීව වැඩසිටි අපේ හාමුදුරුවන් වහන්සේ ජීවිතයේ ප්‍රථම වතාවට එසේ දින ගණනාවක් එකදිගට භාවනා කරමින් විශේෂ අත්දැකීම් ලබාගත්හ. එයින් පසු උන්වහන්සේගේ ජීවිතයේ විශේෂ පරිවර්තනයක් ඇතිවිය. නිතරම භාවනාවට සිත යොමු කරමින් කටයුතු කළ අතර රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණෙහි භාවනා මධ්‍යස්ථානයට ගොස් යෝගාවචර අමරසිරි හිමියන් ද සමග නිතර නිතර ධර්ම සාකච්ඡා පවත්වමින් තව තවත් ධර්මඥානය සහ භාවනාව පිළිබඳව අත්දැකීම් දියුණු තියුණු කරගත් හ. එසේම බුදුරජාණන් වහන්සේ විසින් වදාළ සූත්‍රදේශනාම නිතර නිතර පරිහරණය කරන්නට පටන් ගත්හ. උන්වහන්සේ විශේෂයෙන්ම සූත්‍රදේශනා හැදෑරීමට උත්සුක වූ අතර අභිධර්මය සහ අටුවා ටීකා මෙන්ම පසුකාලීනව විවිධ උගතුන් විසින් ලියන ලද විවිධ පොත පත හැදෑරීම ටිකෙන් ටිකම අඩු කළහ, අත් හළහ.

සීලානන්ද හිමියෝ මෙසේ ඉඩ ලැබෙන ලැබෙන හැම අවස්ථාවලම රටේ විවිධ පළාත් වලට ගොස් භාවනා මධ්‍යස්ථාන, ආරණ්‍යසේනාසන, ඇසුරු කරමින් භාවනා ගුරුවරුන් සමග සාකච්ඡා කරමින් තම අත්දැකීම් වර්ධනය කරගත්හ. ඒ අනුව හොරණ ප්‍රදේශයේ තලගල භාවනා මධ්‍යස්ථානය, දෙකඳුවල භාවනා මධ්‍යස්ථානය, මතුගම කළුගල ආරණ්‍ය සේනාසනය, අම්බලන්ගොඩ ගල්දුව ආරණ්‍ය සේනාසනය, කුරුණෑගල බඹරකැලේ ආරණ්‍ය සේනාසනය,

මාතලේ හෙට්ටිපොල වටගල ආරණ්‍ය සේනාසනය, හික්කඩුවේ පොල්ගස්දුව ආරණ්‍ය සේනාසනය, ආදී ස්ථානවල සති ගණන් මාස ගණන් භාවනානුයෝගීව වැඩ සිටියහ. මේ අවස්ථාවලදී උන්වහන්සේට ගරු මාතර ශ්‍රී ඥානාරාම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ, කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මහා ස්වාමීන් වහන්සේ, ගරු නාඋයනේ අරියධම්ම මහා ස්වාමීන් වහන්සේ, විදියගොඩ පේමරතන නායක මහා ස්වාමීන් වහන්සේ, පැලෑදේ සුසීල ස්වාමීන් වහන්සේ, මොරගොල්ලේ සුධම්ම ස්වාමීන් වහන්සේ, ආදී භාවනා ගුරුවරුන් කීප පොළකින්ම අවශ්‍ය භාවනා උපදෙස් ලබා ගැනීමට හැකියාව ලැබුණි. එසේ ම උන්වහන්සේලා සමග ධර්මානුධර්ම ප්‍රතිපත්ති ගැන ද විශේෂ සාකච්ඡා ඇති කරගැනීමට ද අවස්ථාව ලැබීම අපේ හාමුදුරුවන් වහන්සේගේ ජීවිතයට ලොකුම භාග්‍යයක් විය.

1992 වර්ෂය වනවිට සීලානන්ද හාමුදුරුවන් වහන්සේ කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබාගැනීම සඳහා "මෝක්ෂය පිළිබඳව බෞද්ධ සංකල්පය" පැහැදිලි කරමින් නිබන්ධයක් ඉදිරිපත් කළහ. ඒ අනුව උන්වහන්සේට සම්මාන සහිතව එම ශාස්ත්‍රපති උපාධිය පිරිනමන ලදි.

අනතුරුව උන්වහන්සේ 1992 වසරේ බුරුමයට ගොස් භාවනාව ඉගෙන ගැනීමට අදහස් කළහ. ඒ අනුව තමන් වහන්සේ සමග එකට ශාස්ත්‍රපති උපාධිය හදාරමින් සිටි බුරුම ජාතික කම්මයි ධම්මසාමි හිමියන් ද සමග බුරුමයට යාමට තීරණය කළහ. මෙම ගමනේ දී ම තායිලන්තයටත් යාමට තීරණය විය. ඒ අනුව වීසා ලබාගැනීමට ගියද අවශ්‍ය අවස්ථාව වනවිට බුරුම වීසා නොලැබුණි. බුරුමයේ පවතින දැඩි නීති රීති නිසා එය ප්‍රමාද විය. එබැවින් සීලානන්ද හිමියෝ කම්මයි ධම්මසාමි හිමියන් ද සමග 1992 අප්‍රේල් මස 18 වැනි

දින තායිලන්තයට වැඩම කොට තායිලන්තයේ චෙන්මයි නගරයේ වට් තපෝදාරාම් භාවනා මධ්‍යස්ථානයේ සිට සති තුනක් පමණ සමථ විපස්සනා භාවනාව පුහුණු වූහ.

තායිලන්ත සංචාරයේදී උන්වහන්සේට විශේෂයෙන්ම අවශ්‍ය වූයේ භාවනා මධ්‍යස්ථානවලට වැඩම කිරීමය. මෙහි දී උන්වහන්සේ බැංකොක් නගරයේ මෙන්ම චෙන්මයි, චෙන්රයි, වැනි නගර වල පිහිටි භාවනා මධ්‍යස්ථානවලට වැඩම කරමින් විවිධ භික්ෂූන් වහන්සේලා හමුවූ අතර උන්වහන්සේලා සමග ධර්ම සාකච්ඡා පවත්වමින් භාවනාව පිළිබඳව මෙන්ම තායිලන්ත බුදුදහම පිළිබඳවත් එම පරිසරය පිළිබඳවත් විශේෂ දැනුමක් හා අත්දැකීම් ද ලබාගත්හ.

පිරිවෙන් ජීවිතයේ ඇති විවිධ බාධක දකිමින් භාවනාවේ ඇති අගය දනිමින් හා දකිමින් සිටි අපේ හාමුදුරුවන් වහන්සේ ඉඩ ලැබෙන ලැබෙන හැම අවස්ථාවලම රටේ විවිධ පළාත්වල භාවනා මධ්‍යස්ථානවලට ගොස් තව තවත් භාවනා කළහ. විශේෂයෙන්ම උන්වහන්සේ නිතර නිතර හික්කඩුවේ දොඩන්දුවේ පිහිටි පොල්ගස්දුව ආරණ්‍ය සේනාසනය සහ තලගල භාවනා මධ්‍යස්ථානයත් කුරුණෑගල බඹරගල ආරණ්‍ය සේනාසනයත් ඇසුරු කරමින් තම භාවනා කුසලතා දියුණු තියුණු කරගත්හ.

උන්වහන්සේ 1993 දෙසැම්බර් මස 5 වෙනි දින සිට 20 වෙනි දින දක්වා කුරුණෑගල බඹරගල භාවනා මධ්‍යස්ථානයේ භාවනා කරමින් වැඩ සිටි අතර එය උන්වහන්සේගේ ජීවිතයේ හොඳින්ම භාවනා අත්දැකීම් ලැබූ අවස්ථාව විය. එහිදී ගරු පැලෑදේ සුසීල හිමිපාණන් වහන්සේගේ උපදෙස් මත භාවනා කළහ. ජීවිතයේ කිසිම දිනක නොලද ආශ්වාදයකින් යුතුව මේ කාලය ගත විය. එහෙත් නැවතත් නගරයට පැමිණ විවිධ

කටයුතු වල යෙදෙන්නට සිදුවිය. දිනපතා භාවනාව කරමින් සෑම ප්‍රශ්නයකදීම නොසැලී සිටින්නට මනස සකස් වී තිබුණි. නිතරම වර්තමානයේ ජීවත් වෙමින් සිහිනුවණින් යුතුව කාලය ගත කිරීමට හැකියාව තිබූ අතර සැහැල්ලු මනසකින් ජීවත්වූහ.

දැන් නිතර නිතර උන්වහන්සේගේ මනසට නැගෙන්නේ තමා ආරණ්‍යගත විය යුතුය යන්නය. මේ අනුව සීලානන්ද හාමුදුරුවෝ සිය නිවසට ගොස් මේ බව මෑණියන්ට මතක් කළ ද මෑණියන් එතරම්ම කැමැත්තක් නැති බව පෙනුණි. එයට හේතුව මෑණියන්ට නැවත කවදාකවත්ම උන්වහන්සේ දැක ගැනීමට අවස්ථාවක් නොලැබෙයැයි සිතීමය. එහෙත් පසුව මෑණියෝ මේ සඳහා උන්වහන්සේට අනුමැතිය දුන්හ.

උන්වහන්සේම එකළ ප්‍රකාශ කළ පිරිදි උන්වහන්සේට වනගත වී භාවනා කරන්නට බාධක හෙවත් බැම් දෙකක් විය. එකක් සිය මෑණියන් වහන්සේය. අනික සිය ගුරුදේවයන් වහන්සේය. සිය ගුරුදේවයන් වහන්සේ ලෙස ගෞරවයෙන් සලකාගෙන සිටි ගරු මොන්නෑකුලමේ විමලානන්ද නාහිමියෝ මේ වනවිට වයෝවෘද්ධව සිටි බැවින් උන්වහන්සේ මේ සඳහා කෙසේවත් සතුට පළ කළේ නැත. සීලානන්ද හාමුදුරුවෝ මෙම කරුණ මැනවින් තේරුම් ගනිමින් සිය මෑණියන් වහන්සේටත් ගරු ගුරු දේවයන් වහන්සේටත් තම යුතුකම් ඉටු කිරීම අත්‍යවශ්‍ය කරුණක් සේ සලකා එම වනගත ජීවිතයට පිවිසීම ටික කලකට කල් දැම්හ.

මෙසේ සිටින අතර **1994. 04 . 06** වැනි දින සිංගප්පූරුවේ ශ්‍රී ලංකාරාමයේ දායක පිංවතුන් පිරිසක් පැමිණ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට විශේෂ ආරාධනයක් කළහ. එනම් සිංගප්පූරුවේ බෞද්ධ ධර්ම දූත සේවය සඳහා වැඩම කරන ලෙසටය. එහෙත් උන්වහන්සේ

එකහෙළාම මෙම ආරාධනය පිළිගත්තේ නැත. ප්‍රතික්ෂේප කළේ ද නැත. ඒ තමන්ගේ නිදහසට එය බාධාවක් වේය යන අදහස ඇති වූ බැවිනි. දැන් උන්වහන්සේට උභතෝකෝටික ප්‍රශ්නයකි. ලෝකේ දියුණුම රටක්වන සිංගප්පූරුවට යනවාද? එසේ නැතිනම් විවිධ දුෂ්කරතාවලින් සපිරි අරණ්‍යයකට යනවාද? යන්න ඒ උභතෝකෝටික ප්‍රශ්නයයි.

මෙම පිරිස උන්වහන්සේට සිංගප්පූරුවේ ලංකාරාම විහාරස්ථානය භාරගෙන එහි කටයුතු කරන්න යැයි ආරාධනා කළහ. සිංගප්පූරුවේ සියල්ල යැපෙන්නේ මුදල් මතය. වැඩි දෙනෙකුට අවශ්‍ය වන්නේ මුදල්මය. තමන් මේ මුදල් හබේට වැටෙනවාද නැද්ද? යන්න උන්වහන්සේට තිබුණ ඊළඟ ප්‍රශ්නයයි. එම පිරිස සීලානන්ද හිමියන්ගේ සුදුසු කම් සොයා බලා මෙසේ පැමිණි අතර උන්වහන්සේට වීසා ලබා දීමට ඒ අවස්ථාවේම උන්වහන්සේගේ ගමන් බලපත්‍රය ද ඉල්ලා සිටියේය. එහිදී සීලානන්ද හාමුදුරුවෝ එකපාරටම කැමැති වුයේ නැත. කරුණු දෙකක් පිළිබඳව උන්වහන්සේගේ සිත වේගයෙන් දෝලනය වන්නට විය. එනම්:

1. මුදල් පසු පස හඹායන බොහෝ දෙනා අතරට ගොස් කටයුතු කිරීමේ දී තමන්ටත් නොදැනුවත්වම ධර්මයෙන් ඉවත්වීමට සිදුවේ ද?

2. මුදල් ශක්තිය මත යැපෙන සමාජයක් තුළ ධර්ම ශක්තිය ඉස්මතු කරන්නේ කෙසේ ද? යන කරුණු දෙකය.

කෙසේ හෝ අවසානයේ දී ථෙරවාදී බුදුදහමේ ධර්ම ශක්තිය ගොඩ නැගීම සඳහා ලොවට ආදර්ශයක් දීම සඳහා මෙම ආරාධනය පිළිගැනීම සුදුසු යැයි තීරණය කළහ. ඒ විශේෂයෙන්ම මුදල් පසු පස හඹායන දහසක් දෙනාහට ධර්මය

පෙන්වා දිය යුතු බැවිනි. ඒ අනුව තමා එහි පැමිණීමට කැමැති බව ප්‍රකාශ කළහ. එවිට එම පිරිස ද සතුටු වී උන්වහන්සේට අවශ්‍ය වන්නේ මොනවාදැයි විමසීය. උන්වහන්සේ ප්‍රකාශ කළේ මෙසේය. ''මහත්මයා මට නිදහස්ව ඉන්න පුංචි කාමරයක් හා ත්‍රිපිටක පොත් ටික ලබා දෙන්න. දානය, සිවුරු පිරිකර, ගිලන්පස, බේත් හේත්, ගැන අමුතුවෙන් කියන්න ඕනේ නෑනේ '' කියලයි.

එය අසා එම පිරිස විමතියට පත්ව මෙසේ කීය. ''අපේ හාමුදුරුවනේ අපි තවත් හාමුදුරුනමකගෙන් මේ ගැන ඇහැව්වා. උන්වහන්සේ වැඩම වනවානම් අපෙන් මොනවද අවශ්‍ය කියලා අපි ඇහැව්වා. උන් වහන්සේ අපට එකපාරටම කීවේ, ''මට කාර් එකක් අවශ්‍යයි. ටෙලිපෝනයක් සහ වායු සමනය කළ කාමරයක් අවශ්‍යයි කියලයි.'' එවිට සීලානන්ද හිමියෝ පැහැදිලි කළේ පුද්ගල විවිධතාවයයි. දෙන්නෙක් එක වගේ නැහැ. පුද්ගලයා හිත හදන හැටියටයි අවශ්‍යතා ඇතිවෙන්නේත් නැතිවෙන්නේත්. ඒ ඒ පුද්ගල අවශ්‍යතා වෙනස් බව උන් වහන්සේ ''නානත්ත කායා නානත්ත සඤ්ඤා'' යැයි පාලි පාඨයක් ද ගෙන හැර පාමින් ඒ ඒ කයවල ඒ ඒ සඤ්ඤා ඇති බව පැහැදිලි කර දුන්හ.

කෙසේ වුවද මෙම පිරිස සමග සාකච්ඡා කොට අවසන් වුයේ සීලානන්ද හිමියන් විසින් ද යෝජනා හතක් ඉදිරිපත් කරමිනි. උන්වහන්සේ පැහැදිලිවම කියා සිටියේ ''සිංගප්පූරු ඩොලර් වලට මම එන්නේ නැහැ. මට අවශ්‍ය ඔය ස්ථානයෙන් ලෝකෙට ධර්මය බෙදා දීමයි. ඒ සඳහා මම යෝජනා කීපයක් ලියා එවනවා. ඔය අය එකතු වෙලා ඒවා ගැන සාකච්ඡා කරන්න. ඒවාට කැමති නම් පමණක් මට ඔය අය දැනුම් දෙන්න. එසේ නැත්නම් මට ලියන්න අවශ්‍ය වෙන්නෙත් නැහැ'' කියලයි. අනතුරුව උන්වහන්සේ එම යෝජනා සකස් කොට දින

**කීපයකින් යවන ලද නමුත් ඒවාට එම දායක පින්වතුන් කැමති වුයේ නැත. එමනිසා නැවත එම දායක සභාවෙන් ලිපියක් ද උන්වහන්සේට ලැබුණේ නැත. එදා සීලානන්ද හිමියන් විසින් සිංගප්පුරුවේ ශ්‍රී ලංකාරාම දායක සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා මෙසේය.**

1. The monk who resides as the caretaker should be given full responsibility to make any decisions independently, according to the Dhamma, for the benefit of the temple and the many.

2. All other resident monks and guest monks should follow the common rules that have been adopted by the board of management.

3. All problems regarding resident laymen and guest laymen and laywomen should be solved after a discussion between the devotees and the Chief monk. **Suggestion:** a separate place should be allocated to them within the premises.

4. The Dayaka sabhawa should represent all classes and/or races of people, and whatever activities conducted at the temple should be patronized by the Dayaka sabhawa.

   Suggestion: **Form three committees:**
   1. One for the welfare of Sri Lankan employees.
   2. One to organize religious, social, cultural and educational activities at the temple.
   3. One for the welfare of resident monks, laymen and visitors

5. Priority should be given to practical Buddhism. The chief

monk is solely responsible for organizing and conducting ceremonies, sermons, and other programs with the assistance of the resident monks and the Dayaka sabhawa.

6. No outsiders should be given permission to conduct any affairs within the premises without the full consent of the chief monk and the committee of management.

7. Disciplinary actions should be taken against any one who violates the adopted rules and regulations for the benefit of the temple.

එදා උන්වහන්සේ හමුවීමට පැමිණි පිරිසම ප්‍රකාශ කළේ "අනේ අපේ හාමුදුරුවනේ ඔබ වහන්සේ මේ කොන්දේසි ඉදිරිපත් කර කර ඉන්නවා. වෙන හාමුදුරුවරුන්ට නම් මේ ගැන කියන්නත් ඉස්සරලා හා... හා... මම එන්නම් කියලා ඔය මොනවාවත් නැතිව එනවා" කියලයි. ඉතින් ඒක එහෙම තමයි.

කෙසේ හෝ එදා ධර්ම ශක්තිය මුල්විය. උන්වහන්සේ මුදල් පසුපස හඹා නොගිය බැවින් ධර්මයට අනුව සිතන්නට අවස්ථාව සැලසුණි. ඒ නිසාම උන්වහන්සේට සිය දහම් ජීවිතය තවදුරටත් සතුටින් ගත කිරීමට අවකාශ ලැබුණි. උන්වහන්සේ සිංගප්පුරු ඩොලර්වලට යටවූයේ නැත. උන්වහන්සේට අවංකව ම එදා ඇති වූයේ ලංකාවේ ඇති ථේරවාද බුද්ධ ධර්මය රජයන බුදුදහම සහ භාවනාව මුල් කරගත් ථේරවාද බෞද්ධ මධ්‍යස්ථානයක් සිංගප්පූරුවේ ඇති කිරීමටය. එහෙත් එයට අවස්ථාවක් නොවීය.

මීළඟට අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ජීවිතයේ නිතර නිතර සිත සිතා සිටිය පැත්ත. ඒ වනගත වීමේ අභිලාෂයයි. මේ වනවිට උන්වහන්සේ විටින් විට වනගත වී

භාවනාව ප්‍රගුණ කරගනිමින් විවිධ අත්දැකීම් ද ලබා තිබුණි. මේ අනුව උන්වහන්සේගේ ආරණ්‍ය ගතව ජීවත්වීමේ අභිලාෂය දිනෙන් දින ලියලන්නට විය.

නිතර වන සෙනසුන්වල අගය ගැන සිතන්නට විය. භාවනා මධ්‍යස්ථාන වලට ගොස් විවිධ අත්දැකීම් ලබා ගැනීමට උත්සුක විය. වර්ෂයේ වාරාවසානයේදී නිවාඩුව ලැබුණ හැම අවස්ථාවකම පාහේ උන්වහන්සේ හික්කඩුවේ පොල්ගස්දූව ආරණ්‍ය සේනාසනයට හෝ කුරුණෑගල බඹරගල ආරණ්‍ය සේනාසනයට හෝ පිළියන්දල තලගල ආරණ්‍යය සේනාසනයට හෝ එසේ නැත්නම් මාතලේ වටගල වැනි ආරණ්‍යයකට හෝ ගොස් එම භාවනා මධ්‍යස්ථානවල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ අනුශාසනා ලබාගනිමින් භාවනා කළහ. විවිධ ධර්ම සාකච්ජා ද පැවැත්වූහ.

ධර්මය තරම් මේ ලෝකේ තවත් සුන්දර දෙයක් නැත. රසවත් දෙයක් නැත. ''නහි ධම්මා පරං අත්ථි'', ''ධම්මෝ මෙ රමතී මනො'' යනුවෙන් සඳහන් කළ අයුරින් ධර්මය හා සමාන වු උතුම් වු දෙයක් තවත් නැත. එබැවින් මගේ සිත ධර්මයේම ඇලෙයි. යන්න සීලානන්ද හිමියන්ගේ සිතට ද තදින්ම දැනුණි.

උන්වහන්සේ තුළ ඇතිවූ 'වනගත විය යුතුය' යන මෙම අදහස සිතට ආ මොහොතේ පටන් උන්වහන්සේට මේ ගැන නැවත නැවතත් සිතුණි. 1993 අග භාගයේ සිට මෙම අදහස වැඩිවන්නට විය. මේ අනුව අපේ හාමුදුරුවෝ මේ පිළිබඳව විවිධ අවස්ථාවල සිතන්නට වූහ. දිවා රෑ නැවත නැවතත් මේ ගැන සිතමින් සිටි අපේ හාමුදුරුවෝ අවසානයේදී උන්වහන්සේගේ ගුරු දේවයන් වහන්සේ වන ගරු මොන්නෑකුලමේ විමලානන්ද නාහිමිපාණන් වහන්සේට ද මෙම කරුණ දන්වමින් ලිපියක් ලියා අවසර ඉල්ලූහ. 1993.10.12

වැනි දින ලියන ලද එම ලිපිය මෙසේය.

පරම ධම්ම චේතිය පිරිවෙණ රත්මලාන

1993.10.12

පූජනීය මගේ ගුරුදේවෝත්තම නායක මාහිමිපාණන් වහන්සේ වෙත අත්‍යන්ත ගෞරවයෙන් පාදාභිවන්දනයෙන් කෙරෙන ආයාචනයයි.

පූජනීය නායක මාහිමිපාණන් වහන්ස,

මෙපමණ කලක් මා ඇති දැඩි කරමින් මගේ දුක සැප සොයා බලමින් මට අවශ්‍ය දැනුම ලබාදෙමින් දහම් මගට පිවිසෙන්නට අවශ්‍ය නැණ ගුණ වඩන්නට බුද්ධිය හා ප්‍රඥාව ලබාදුන්නේ ඔබ වහන්සේයි. ඔබ වහන්සේට බුදුබව ලැබේවා!

මා මගේ ජීවිතයේ දැන් 33 වැනි වියට පා තබා ඇත. මෙපමණ කලක් පැවිදි දිවියේ ගතකළ මට මේ ග්‍රාම වාසී පැවිදි දිවියේ ඇති අපහසුතාවයන් වැටහී ඇති අතර, අපි ධර්ම මාර්ගයෙන් පිටතට ගොස් සිටින බව පෙනේ. මේ ඉගැන්වීම් ඉගෙනගැනීම් ආදිය තාවකාලිකයි. භික්ෂුවක් කොතෙක් දුරට බී.ඒ, එම්.ඒ, පී.එච්ඩී, ඩී.ලිට්, ආදී වශයෙන් භෞතික දේ ඉගෙන ගත්තද එයින් ඔහුට සිදුවන්නේ අල්ප ප්‍රයෝජනයකි. එහෙත් මා සිතනවා පී.එච්ඩී එකට වඩා ප්‍රථම ධ්‍යානයට සමවැදීම මට උතුම් කියලා. මට හුදකලා වීම හා භාවනාව වැඩීම අවශ්‍යයි. මා උගත් දේ ප්‍රයෝජනයට ගත යුත්තේ ඒ අයුරිනි.

මා මේ සියල්ල අතහැර වනගත විය යුතුය. ඒ සඳහා අවශ්‍ය ස්ථානයක් සොයා ගතිමි. එසේ වනගත වුවද මා ඔබ වහන්සේ දැකීමට එනවා. ඔබ වහන්සේ මගේ ජීවිතයේ මට

ලොකුම ලොකු ධෛර්‍යයක් දුන්න පෙර ජාතිවල පවා මට අත හිත දුන්න ශ්‍රේෂ්ඨ උත්තමයෙකි. මමත් ඔබවහන්සේත් දෙදෙනාම තව සුළුකාලයයි ජීවත් වෙන්නේ. මගේ ජීවිතයේ ඉතිරි කාලය භාවනාවට කැප කොට හැකි පරිදි හිත දියුණු කරමින් සසරින් එතර වීමට මා උත්සාහවත් විය යුතුය.

මගේ මේ ගුරුවෘත්තිය ඇතුළු සියලු දේ අත හරිමි. මා මෙතෙක් ඉතිරි කරගෙන ඇති මුදල් වලින් ඔබ වහන්සේ වෙනුවෙන් රු: 10.000 ක්ද මගේ මව වෙනුවෙන් රු: 10.000 ක්ද මගේ ජීවිතයේ අවසන් කටයුතු කිරීම සඳහා රු: 10.000 ක්ද බැංකුවේ තැන්පත් කරමි.

මා අදහස් කළ පරිදි මට මෙසේ වනගතව හුදකලා පරිසරයක භාවනා කරන්නට අදහස ආවේ අද නොවේ. මගේ ජීවිතයේ විශාල පරිවර්තන රාශියක් සිදුවුයේ දවසින් දවසටය.

මා මේ දක්වා කිසියම් සීලයක් ආරක්‍ෂා කලේ සිලානන්ද කියන නමටත් අනුවයි. මට ඔබ වහන්සේ දැන් කළයුතු උපකාරය වී ඇත්තේ ඔය ඔබ වහන්සේගේ තියෙන පන්සල් සියල්ල හා වාහන ආදිය ලියා දීම නොව මට අරණ්‍යගතව භාවනා කිරිමට අවසරය ලබාදීමයි. එසේ අවසරය ලබාදිම ඔබවහන්සේ සතු සියලු පන්සල් හා වාහන ඇතුළු වටිනා සියලු චංචල නිශ්චල දේපොළ මට ලියා දිමටත් වඩා මට වටිනවා. මගේ තව ඉන්න සහෝදර හාමුදුරුවරුන්ට ඒ විහාරස්ථාන වල කටයුතු පවරනු මැනවි.

මගේ ජිවිතය මින් ඉදිරියට භාවනාවට යොමුකළ යුතු යැයි මම තරයේම සිතනවා. දවසකින් හෝ පරක්කුවීම මරණයට ළංවීමක් යැයි දහම් දෙසන්නෝ අපිමයි.

මගේ සොයුරු හිමිවරු සියලු දෙනාම ඔබ වහන්සේගේ කටයුතු බලාගනිවි. මම ද ලද අවස්ථාවක ඔබ වහන්සේට නමස්කාර කිරීම සඳහා පැමිණෙන්නෙමි. එතෙක් මට, මේ අනන්ත සසරේ යම් භවයකදී හෝ මේ භවයේදී හෝ මගෙන් ඔබ වහන්සේට සිත කය හා වචනය යන තිදොරින් සිදුවු යම් වරදක් වේ නම් සමාව ලැබේවා! දෙවනුවද තෙවනුවද මට සමාව ලැබේවා!

මෙයට,
කීකරු
සීලානන්ද

මේ අනුව 1994 මැයි මස 22 වෙනි දින එනම් තම පැවිද්දෙන් වසර 22 ක් සපිරෙන දින සියල්ලම අතහැර දමා වනගත වීමට අදහස් කරගෙන සිටියේය.

එහෙත් "අචින්තිතම්පි භවති චින්තිතම්පි විනස්සති" යන බුදුවදනම සනාථ කරමින් උන්වහන්සේ වැඩම කිරීමට සිතාගෙන සිටි අරණ්‍ය සේනාසනය තුළ විශාල විපර්යාසයක් ඇතිවිය. එය සඳුන් රැකට හෙන ගැසීමකි. උන්වහන්සේ ඉතා ගෞරවයෙන් සැලකූ එපමණක් ද නොව මුළු ලංකාවේම බොහෝ දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වූ එම ආරණ්‍යසේනාසනාධිපතිව වැඩ සිටි ස්වාමීන්ද්‍රයන් වහන්සේ නොසිතූ අවස්ථාවක කෙසේවත් ඇදහිය නොහැකි ආකාරයෙන් සිවුරු හැර දමා යන්නට ගියහ. මෙය කෙසේවත් ඇදහිය හැකි දෙයක් නොවුවද එය එසේ සිදුවිය. එහෙත් ඒ හිමියන් නැවතත් සිවුරු දමාගත්තේය. එහෙත් කළේ බිඳී අවසානයි.

කෙසේ වුවද මෙයටම සමාන්තරව එම ආරණ්‍යයේ සිටි හිමිවරු දෙදෙනෙක් අභ්‍යන්තරයේ ඇති කලකිරීම් වලින් එම

ස්ථානයෙන් පිටවී ගියහ. මේ සියල්ල සීලානන්ද හිමියන්ගේ ඉදිරිගමනට බාධාවන් බවට පත් වුණා. උන්වහන්සේ මුලින් සිතාගෙන සිටි තත්වයට වඩා එම ආරණ්‍යසේනාසනයේ අභ්‍යන්තරය වෙනත් එකක් විය. ඒ සියල්ල උන්වහන්සේට හඳුනාගැනීමට හැකිවුයේ පසුවය. ඒ හේතුවෙන්මත් උන්වහන්සේ තව තවත් දැනු වත් මෙන් ම මධ්‍යස්ථ වූ පුද්ගලයෙකු බවට ද පත්වූහ. උන්වහන්සේ මෙහිදීත් අපණ්ණක ප්‍රතිපදාව අනුගමනය කරමින් තමා වෙත එල්ල වූ මෙම විරෝධය නිරෝධයක් බවට පත් කරගත්හ.

මේ අනුව මේ පැති දෙකම (සිංගප්පූරුව සහ ආරණ්‍ය සේනාසනය) උන්වහන්සේට පෙනුණේ එදා අපගේ සම්මා සම්බුදුපියාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ අන්ත දෙක වූ කාමසුඛල්ලිකානු යෝගය සහ අත්තකිලමථානු යෝගය ලෙසටය. සීලානන්ද හිමියෝ මෙම අන්ත දෙකම අත්හැර දමා බුදුමග විවර කරගැනීමට උත්සුක වූහ. කොළඹ ජීවත් වුව ද උන්වහන්සේ සිය භාවනා පුහුණු කාලය වැඩි කරගත්හ. සෑම වාරාවසානයකම ලැබුණ නිවාඩු කාලය උන්වහන්සේ විවේක සේනාසනයකට ගොස් දින කීපයක් හෝ ගත කිරීමට අවස්ථාව සලසා ගත්හ.

වරක් උන්වහන්සේ ශ්‍රී ලංකාවේ සුපතල එක් ආරණ්‍ය සේනාසනයකට ගොස් එහි වැඩ සිටි භික්ෂුන් වහන්සේලාගෙන් අද කොපමණ වේලාවක් භාවනා කළේ දැයි විමසූහ. එවිට උන් වහන්සේලා පිළිතුරු දුන්නේ "අනේ ස්වාමීනි අද උදේ පාන්දර පැයක් පමණ භාවනා කළා එපමණයි" කියලයි. එහෙත් එදා දවසේම උන්වහන්සේ කොළඹ නගරයේ ජීවත් වෙමින් සිටියත් පැය තුනකට වැඩි කාලයක් භාවනාවට යොදාගෙන තිබුණි. මෙයින් ද උන්වහන්සේ තව තවත් ධෛර්යමත් වෙමින් අන්තවලට නොගොස් භාවනාව පුහුණු කරන්නට පටන් ගත්හ.

ඒ අනුව නාගරික සමාජය තුළ හෝ වේවා ග්‍රාමීය සමාජය තුළ හෝ වේවා සමාජය තුළ ඉඳගෙන සමාජයේ ජීවත්වෙමින් විවිධ හැල හැප්පිලි වලට, ප්‍රශ්න වලට, මුහුණ දෙමින් සමාජය තුළින්ම ධර්මය සොයාගත යුතු බව උන්වහන්සේ සිතූහ. ඒ අනුව තරහ ඇතිවෙන්නේ කැලේ සිටිද්දී නොව මිනිසුන් අතර සිටිද්දී බවත්, මෛත්‍රිය කළ යුත්තේ තරහ හෙවත් ක්‍රෝධයක් දැනගෙන බවත්, එසේම ආශාව, කාමය, රාගය, ඇතිවෙන්නේ කැලේදීට වඩා සමාජයේ දී බවත් ඒ ඒ අවස්ථාවලදී එම තත්වයන්ට අනුව සිත පාලනය කරගත යුතු බවත් උන්වහන්සේ ඉතා හොඳින් වටහා ගත්හ.

මේ කාලය වනවිට උන්වහන්සේට විවිධ අය සමග ඇති කරගත යුතු සන්නිවේදනයන් පිළිබඳව හෙවත් අන්තර් පුද්ගල සන්නිවේදන හා ජනසන්නිවේදනය පිළිබඳව හැදෑරීමේ ආශාවක් තිබුණි. ඒ අනුව උන්වහන්සේට ධර්මවේදී ජනසන්නිවේදන නමින් අලුතින් ආරම්භ කරනලද පාඨමාලාවකට සම්බන්ධ වී එය හැදෑරීමට අවස්ථාව සැලසුණි. මෙය ශ්‍රී ලංකාවේ ජනසන්නිවේදන මාධ්‍යයන්හි සිටින උගත් වියත් මෙන්ම සුප්‍රසිද්ධ දේශකයන් විසින් දේශන පවත්වන එසේම ප්‍රායෝගික පුහුණුවක් ද ලබාදෙන ජනසන්නිවේදන පාඨමාලාවක් විය. මෙම පාඨමාලාව සංවිධානය කළේ රාජාධර්මපාල මහතාය. විශේෂයෙන්ම මෙම පාඨමාලාව ආරම්භ කළේ භික්ෂූන් වහන්සේලා මුල්කරගෙන බැවින් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ද මෙම පාඨමාලාව හැදෑරීමට තීරණය කළහ.

මෙම පාඨමාලාව ඉතාම හොඳින් හදාරන අතර දී උන්වහන්සේට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ බෞද්ධ වැඩසටහන් කීපයක්ම පැවැත්වීමට අවස්ථාව සැලසුණි. ඒ අනුව උන්වහන්සේ බෞද්ධ කතා, ධම්ම චින්තා ආදිය පැවැත්වූ

අතර විශේෂයෙන් විදේශ රටවල සිදුවෙන විවිධ බෞද්ධ ප්‍රවෘත්ති සොයා ඒවා පරිවර්තනය කරමින් "විදේශීය බෞද්ධ ප්‍රවෘත්ති" නමින් ගුවන් විදුලිය මගින් බෞද්ධ ප්‍රවෘත්ති ද ඉදිරිපත් කළේය. අනතුරුව උන්වහන්සේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ බෞද්ධ වැඩසටහන් වලට සහභාගි වීම සඳහා වැඩම කරන භික්ෂූන් වහන්සේලාගේ පහසුව සඳහා "මිගදාය" නමින් කාමර දෙකක් වෙන් කරවා ගෙන රාජා ධර්මපාල මහතා ගේ මැදිහත් වීමෙන් ආරම්භ කරන ලද මිගදායේ ද ටික කලක් මාදුරුඔයේ ධම්මිස්සර හිමි, බෙලිගස්වේල්ලේ විජිත හිමි වැනි හිමිවරුන් සමග ද විශේෂ සේවාවක් සිදු කළහ.

ගුවන් විදුලියේ දීර්ඝ කාලයක් විශාල සේවයක් කළ රාජා ධර්මපාල මහතා ගුවන් විදුලියෙන් අස්විය. ඔහු ගුවන් විදුලියෙන් සමුගත් දින ද සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ගුවන් විදුලියේ මිගදායේ වැඩසිටියේ තවත් හිමිවරුන් කීපනමක් ද සමගිනි. මේ ඔහු ගත් තීරණය තවත් විශේෂ වැඩ පිළිවෙලක් ආරම්භ කිරීමේ ඉදිරි පියවර වශයෙන් දැනගත්තේ පසුවය. එදා ගුවන් විදුලියෙන් සමුගත් රාජා ධර්මවේදී ජනසන්නිවේදන අභ්‍යාස ආයතනය නමින් ආයතනයක් ආරම්භ කළේය. ඒ අනුව අපේ සීලානන්ද හාමුදුරුවෝ ද මෙම ජනසන්නිවේදන අභ්‍යාස ආයතනය ආරම්භ කිරීමේලා පුරෝගාමීව කටයුතු කළහ.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ 1986 වර්ෂයේ සිට "ධර්මවේදී ජනසන්නිවේදන හා සමාජ සංවර්ධන අභ්‍යාස ආයතනයේ" ලේකම් වශයෙන් කටයුතු කරන රාජා ධර්මපාල මහතා සමග සමීපව ඇසුරු කළහ. රාජා ධර්මපාල කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුවේ උපන් කෙනෙකි. ඔහු පන්සල ඇසුරේ සිටි කෙනෙකි. උගත් කමත් බුද්ධියත් ඇති ඔහු මහාචාර්ය සිරි සීවලී හිමියන්ගේ ශිෂ්‍යයෙකි. ඔහු විවිධ සමාජ

සුභ සාධන කටයුතු මෙන්ම බෞද්ධ පුනරුදය සඳහා ද කටයුතු කළ අතර අපේ සීලානන්ද හිමියන්ද එම කටයුතු වලට සහභාගී කරගෙන විවිධ අවස්ථාවල උන්වහන්සේගේ උපදෙස් මෙන්ම සහයෝගය ද ලබාගත්තේය. උන්වහන්සේ රාජා සමග මෙම හිතවත් කම ඇති කරගැනීමට විශේෂයෙන්ම හේතු වූයේ රාජා යාපහුවේ කෙනෙකු වීම සහ ගරු සිරි සීවලී මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පැවිදි ශිෂ්‍යයෙකු ද වීමත්ය. රාජා සමග වසර ගණනාවක් තිස්සේම උන්වහන්සේ ඇසුරු කළ අතර එම කාලය තුළ උන්වහන්සේට රාජාගේ රාජ්‍ය විරෝධී, ජාති විරෝධී හෝ ධර්ම විරෝධී වු කිසිදු දෙයක් දැන ගන්නට හෝ දැකගන්නට නොහැකි වුයේ රාජා බුදුදහමට අනුව කටයුතු කරන කෙනෙකු වීම නිසාය. ඔහුගේ අදහස් පැහැදිලිය. සමාජශීලි හා ධර්මප්‍රිය වු පුද්ගලයෙකි. ඔහු දැහැමි කෙනෙකි.

ධර්මවේදී ජනසන්නිවේදන අභ්‍යාස ආයතනයේ කටයුතු කරන කාලය තුළ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ "ධර්මවේදී" පුවත් පතට "අපේ හාමුදුරුවෝ" නමින් ධම්ම චින්තා ලිපි පෙළක් ද සැපයුහ. භික්ෂුණීන්ට පැවිදි උපසම්පදාව ලබා දීමේ ඇති වැදගත්කම, වටිනාකම පෙන්වා දෙමින් උන්වහන්සේ විසින් එකල එම පුවත් පතට ලිපි පෙළක් ද සැපයිණ. එම එක් ලිපියකට මාතෘකාව වුයේ "භික්ෂුණීහු බුදුමගට පහන් වැටකි" යන්නය. එසේම එම ආයතනයෙන් පළ කළ විවිධ පොත පත ලියා දීමට ද උන්වහන්සේ සහභාගී වූහ. ඒවා අතර:

1. බුදුරජාණෝ ද වැඩියහ යුදපිටියට
2. බෞද්ධ සාම මාර්ගය
3. විසිඑක් වැනි සියවසේ මානව සංවර්ධනය යන ග්‍රන්ථ ද විය.

මෙම ධර්මවේදී අභ්‍යාස ආයතනයේ අනුග්‍රහයෙන් 1995

සහ 1997 වර්ෂවල දී උන්වහන්සේ තායිලන්ත සංචාරවලට සහභාගී වු අතර එහිදී  උන්වහන්සේ භදන්ත බුද්ධදාස හිමියන්ගේ ස්වර්ණ මෝක්ෂය නැමති ආරණ්‍ය සේනාසනයට ද වැඩම කළහ. මෙම අවස්ථාවලදී උන්වහන්සේට ධර්මයේ සුවඳ නිසි ලෙස හඳුනා ගත් අය අතර සිටි මෙම බුද්ධදාස හිමියන්ගේ ශිෂ්‍ය හිමිනමක් වූ ඇමෙරිකානු ජාතික ශාන්තිකරෝ හිමියන් හමුවීම ද සමාජ ජීවිතයේ විවිධ පැති කඩ ඔස්සේ සිය අත්දැකීම් පුළුල් කරගැනීමට හෙවත් ලෝක දැක්ම පිළිබඳව නිම්වළලු පුළුල් කර ගැනීමටත් උපකාර විය. ශාන්තිකරෝ හිමියෝ උන්වහන්සේගේ ගුරුදේවයන් වහන්සේ වන භදන්ත බුද්ධදාස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ චින්තනය අනුව බුදුදහම මුල්කරගත් ධර්මානුකූල වූ සමාජවාදය පෙරටුකරගත් ජීවන ප්‍රතිපදාවක් අනුගමනය කරමින් එය රටටත් ලොවටත් කියා දෙමින් සිටි අරණ්‍යවාසී ස්වාමීන් වහන්සේ නමකි. එම ආරණ්‍යයේ සතියක් පමණ භාවනානුයෝගීව සිට අපේ සීලානන්ද හිමියෝ සිය ධර්ම මිත්‍රයකු වූ එම ශාන්තිකරෝ හිමියන්ගෙන් සමුගෙන ආපසු ලංකාවට වැඩම කළහ.

මෙම සංචාරයේ දී සීලානන්ද හිමියන් ඇතුළු ශ්‍රී ලංකාවෙන් සහභාගී වු පිරිස, රටවල් 125 ක නියෝජිතයන් හමුවේ විශේෂ යෝජනාවක්  ඉදිරිපත් කළහ. එනම් ශ්‍රී ලාංකික දස සිල් මෑණිවරුන්ට පුහුණු වැඩ පිළිවෙලකි. ඒ අනුව ලංකාවට පැමිණි එම පිරිස, භික්ෂුණී ශාසනය පිරිහීමෙන් පසු මෑත යුගයේ දස සිල්මෑණිවරුන් වෙනුවෙන් ආරම්භ කළ මුල්ම පුහුණු වැඩ පිළිවෙලක් වශයෙන්, දඹුල්ලේ කළුන්දෑවේ පිහිටි ආරණ්‍ය සේනාසනයක් මුල් කරගෙන දසසිල් මෑණිවරුන්ට පුහුණු වැඩ සටහනක් ආරම්භ කළහ. සීලානන්ද හිමියෝ මෙම සත් කායයීයට ද මුල් වු කෙනෙකි. (අද ලංකාවේ පවතින භික්ෂුණී ශාසනය නැවත ඇති කිරීම සිදුවුයේ මාපලගම

විපුලසාර හිමියන්ගේ මුලිකත්වයෙනි. ඒ සඳහා උපසම්පදාවට පෙර භික්ෂුණීන් පුහුණු කළේ ද අපේ සීලානන්ද හිමියන්ගේ ද ආචාර්යත්වයෙනි. 1996 දෙසැම්බර් මස 08 වැනි දින දඹදිව සාරානාථයේදී පැවති මෙම උපසම්පදාවේදී දඹුල්ලේ කළුන්දෑවේ පුහුණුව ලැබූ සිල්මෑණිවරු කීපනමක්ද උපසම්පදාව ලබාගත්හ. මේ වනවිට එම පිරිස රටේ හා ලෝකයේ විවිධ තැන්වල සිය දහම් සේවාවන්හි නිරතව ඇත.

1997 වර්ෂයේ ජනවාරි මාසයේ 27-28 දිනවල අපේ හාමුදුරුවෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් දර්ශනපති විභාගයට පෙනී සිටියහ. එසේම 1997 පෙබරවාරි මස 01-02 දිනවල පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා විභාගයට පෙනීසිටියහ. මෙම විභාගවලින් ද උන්වහන්සේ ඉතා හොඳින් උසස් ලෙස සාමාර්ථයන් ලබා සහතික පත් ද ලබා ගත්හ.

1997 පෙබරවාරි මස 03 වෙනි දින අපේ හාමුදුරුවන් වහන්සේගේ දින පොතේ මෙසේ සඳහන් කර ඇත. "හෙට නිදහස් දිනයයි. මා මෙලොවට නිදහස් කළ මා පැවිදි දිවියට නිදහස් කළ මගේ ජීවිතයේ පරම නිදහස සොයා දීමට වෙහෙසෙන මගේ ආදරණීය මෑණියන් දැක ගැනීමට හෙට උදේම පිටත්වෙමි".

මෙසේ කාලය ගෙවී ගියා. සීලානන්ද හිමියන්ගේ නොඇලීමේ ගති ගුණ තව තවත් වැඩි වුණා. විවිධ දේවල් වලට තියෙන දැඩි ආශාව තුරන් වුණා. ඒ අනුව තමන් වහන්සේගේ කාමරයේ තිබුණ රූපවාහිණිය සහ රේඩියෝව ද කාමරයෙන් ඉවත් වුණා. තව තවත් උන්වහන්සේ සරල ප්‍රතිපත්ති අනුගමනය කරන්නට පටන් ගත්තා. එකල උන්වහන්සේගේ කාමරයේ විශේෂ ඉංග්‍රීසි පාඨ කීපයක්ම දක්නට ලැබුණි. ඒවායින් එකක සඳහන් වූයේ " ඉප් අයි කැන් ඩු සම් සර්විස් ටු

මෑන් අයි ඩු සෝ රිගාඩ්ලස් ඔෆ් බ්ලේම් ඕ ප්‍රේස්" ( මිනිසා වෙනුවෙන් මට කිසියම් සේවයක් කළ හැකි නම් නින්දා ප්‍රශංසා කිසිවක් නොසලකා මම එම සේවය කරමි) යන්නය. තවත් පාඨයකින් කියවුණේ "අයි ලව් මී" (මම මට ආදරය කරමි) යන්නය. මෙයින් උන්වහන්සේ අදහස් කළේ යම් කෙනෙක් අන් අයට ආදරය කිරීමට ප්‍රථමයෙන් තමාට ආදරය කළයුතු බවය. අන් අයට ආදරය කරන්නේ තමාට ආදරය ඇති කෙනාය යන්නය.

ආදර්ශවත් ජීවිතයක් ගත කිරීමට නිතර වෙහෙස වූ අපේ සීලානන්ද හිමියෝ පිරිවෙන් විහාරස්ථානයේත් ඉන් පිටතත් සැම විටම තම ප්‍රතිපත්ති ගරුක බව ආරක්‍ෂා කරගනිමින් දැහැමි දිවිය අගය කරමින් ජීවත් වූහ. "ඔවාදෙනු පරහට තමා සම්මතෙහි පිහිටා සිට" යන ඉපැරණි කියමන අපේ සීලානන්ද හිමියෝ ඒ අයුරින්ම අනුගමනය කිරීමට උත්සුක වූහ. උන්වහන්සේගේ ජීවිතයේ විශේෂ දෙයක් වුයේ උන්වහන්සේ සැම විටම වෙලාවට වැඩ කිරීමට කැමති, වෙලාවට වැඩ කරන කෙනෙකු වීමය.

විශේෂයෙන් දහම් පාසලේ කටයුතු කිරීමේදී, පිරිවෙනේ ඉගැන්වීම් කටයුතු කිරීමේදී, මෙන්ම ධර්ම දේශනා පැවැත්වීමේදී ද උන්වහන්සේ වෙලාවට වැඩ කිරීම, එනම් වෙලාවට ආරම්භ කිරීම හා වෙලාවට අවසන් කිරීම විශේෂ දෙයකි.

උන්වහන්සේ නිතර ප්‍රකාශ කළේ වෙලාවට වැඩ කරන්නේ නම් විවිධ කටයුතු ආරම්භ කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී කිසිවෙකුටත් අමුතුවෙන් නැකත් සොයන්න අවශ්‍ය නැති බවයි. නැකත් අවශ්‍ය වෙන්නේ වෙලාවට වැඩ නොකරන අයටයි. බොහෝ අය නැකත් බලා වුව ද වෙලාවට වැඩ

කරන්නේ නැති බව උන්වහන්සේගේ අත්දැකීම් අනුවම පෙන්වා දෙයි.

දිනපතා භාවනාව උන්වහන්සේගේ ජීවිතයේ කොටසක් බවට පත්වුණා. රත්මලාණේ පරම ධම්ම චේතිය පිරිවෙනේ භාවනා මධ්‍යස්ථානයෙන් වැඩිපුරම ප්‍රයෝජන ගත්තේ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ යැයි කීවොත් එය අතිශයෝක්තියක් නොවෙයි.

සීලානන්ද හාමුදුරුවන් වහන්සේ පුරුද්දක් වශයෙන් වාර්ෂික වාර නිවාඩුවලට රටේ විවිධ භාවනා මධ්‍යස්ථානවලට ගොස් භාවනා කළ බව අපි ඉහත දීත් සඳහන් කළෙමු. මේ අයුරින් උන්වහන්සේ එසේ භාවනා කොට නැවත පිරිවෙණට වඩින හැම අවස්ථාවකම පාහේ උන්වහන්සේට විදේශීය සංචාරයකට ආරාධනවක් ලැබීම පුදුමයකට මෙන් සිදු වූ දෙයකි. උන්වහන්සේ එය හඳුන්වන්නේ දිටඨධම්ම වේදනීය කර්මයක් හෙවත් කළ පින් මේ භවයේ දී ම මේ අවස්ථාවේ දී ම පලදීමක් ලෙසටය. ඒ අනුව 1997 මාර්තු මාසයේ 25 වැනි දින අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට තායිලන්තයේ රජයෙන් සහ ඉනෙබ් නැමති බෞද්ධ සංවිධානයෙන් තායිලන්තයට වඩින ලෙස විශේෂ ආරාධනයක් ලැබුණි. මාර්තු 27 වැනි දින එහි වැඩම කළ උන්වහන්සේ විශේෂ දේශන කීපයකට සහ වැඩමුළු කීපයකට සහභාගී වී අප්‍රේල් මස 28 වැනි දින නැවත ලංකාවට වැඩම කළහ.

නැවත ජපානයේ කුමගයා හි පැවති විශේෂ වැඩ මුළුවකට 1997 මැයි මාසය වෙද්දී උන්වහන්සේට ආරාධනයක් ලැබුණි. ඒ අනුව මැයි මස 28 වැනි දින සිට ජුනි මස 10 වැනි දින දක්වා ජපානයේ ගත කළහ. එම ගමනේදී උන්වහන්සේ බානගල උපතිස්ස නාහිමියන්ගේ අනුග්‍රහ ලබාගනිමින් ජපානයේ සවරා

විහාරස්ථානයේ දින කීපයක්ම ගත කළහ. නැවතත් 1997 ඔක්තෝබර් 10 වැනි දින උන්වහන්සේට ඉන්දුනීසියාවෙන් ආරාධනයක් ලැබ ගරු රැකඩහේනේ කුසලඥාණ නාහිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා පිරිසක් සමග විශේෂ පිරිත් දේශනයක් සඳහා එහි වැඩම කළහ. උන්වහන්සේ මෙම සංචාරයට සහභාගී වුයේ ඉන්දුනීසියානු ජාතිකයන්ට ථෙරවාදී බුදුදහමෙහි පිරිත යනු කුමක්දැයි  පැහැදිලි කර දීමටය.

මේ අයුරින් නොසිතූ විලසින් 1997 වර්ෂය තුළ උන්වහන්සේට විදේශීය සංචාර කීපයකටම සහභාගී වීමට අවස්ථාව ලැබුණි. මෙම අවස්ථා එකකටවත් උන්වහන්සේට වියදම් කිරීමට මුදල් තිබුණේ නැත. සියලු පහසුකම් සහිතව මේ සියල්ලම නොමිලේ උන්වහන්සේට ලැබුණේ ධර්ම ශක්තිය හෙවත් භාවනා කිරීමේ සාන්දෘෂ්ටික ඵල (මෙලොව දීම ලැබෙන විපාක)  වශයෙන් යැයි උන්වහන්සේ සිතති.

ඉහත සඳහන් කළ අයුරින් 1988-89 වර්ෂ දෙකම රටේ කලබල කාරී වාතාවරණයක් තිබුණ යුගයක් විය. විශ්ව විද්‍යාල සිසුන් විශාල වශයෙන් ඝාතන වලට ලක් වුණා. අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ සමගම එකට සිටි තරුණ හිමිවරුන් කීපදෙනෙකුම ඝාතනය කොට ටයර් දමා පුළුස්සා ඇති බව සීලානන්ද හිමියන්ටත් දැනගන්නට ලැබුණා. ජීවිතය පිළිබඳව අනිත්‍ය ස්වභාවය තදින්ම වැටහෙන්නට පටන් ගත්තා. විශේෂයෙන්ම කෙනෙකුගේ මරණය සිදුවීමට වැඩි වෙලාවක් ගත නොවන බව පැහැදිලි වුණා. සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ

" න අන්තලික්ඛෙ න සමුද්ද මජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො නප්පසහෙථ මච්චු " (ධම්මපදය  128)

යන ගාථාවෙහි අදහස තවදුරටත් ඉතාම හොඳින් පැහැදිලි වුණා. එහි අදහස මෙයයි. යම් කෙනෙක් මරණයෙන් නිදහස් වීමට කියා අහසේ සැඟවුණ ද, මහමුහුදෙහි සැඟවුණ ද, පර්වත කුහරයක සැඟවුණ ද, මේ ලෝකයෙහි එසේ මරණයෙන් නිදහස් වීමට තැනක් නැත යන්නය. මේ කාලය රට පුරාම කලබල සහිත යුගයක් විය. දහම් නොදත් අනුවණ මිනිසුන් මැරෙන්නේ එකි නෙකා තම තමාම විනාශ කරගනිමිනි. විනාශයට ප්‍රධානම හේතුවක් වන්නේ බලයයි. බලතණ්හාව, බල අරගලය, මිනිසා විනාශ කරන්නේ දෙපැත්තෙන්ම දැවෙන ඉටිපන්දමක් මෙනි. ධර්මය නොදත් අනුවණයෝ බලය ලබාගැනීමටත් මිනිසුන් මරති. බලය රැකගැනීමටත් මිනිසුන් මරති. එහෙත් මිනිසෙක් මැරීම බලවත් පාපයක් බව නොදනිති.

ලෝකයේ කොපමණ බලවතුන් සිටියත් ඒ සියලු දෙනාම ජීවත් වන්නේ ඉතාම ටික කාලයයි. කොපමණ බලවත් අධිරාජ්‍ය තිබුණත් ඒ සියල්ලම විනාශයට පත්වෙන්නේ 'ඇතිවෙන සියල්ල නැතිවේ' යන ධර්මතාවයට අනුවය. සියල්ලම අනිත්‍යයි. යමක් ලොව ඇතිවේද එය නැතිවේ. ''යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං'' යනු ඒ පිළිබඳව තථාගත ලොවුතුරා බුදුරජාණන් වහන්සේගේ දේශනයයි.

# පහත රටින් උඩ රටට
# (රත්මලානෙන් කඩුගන්නාවට)

අංක නවය, නව වෙනිදා, අපේ හාමුදුරුවන් වහන්සේගේ උපන් දිනයයි. මෙම අංකය අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ජීවිතයේ වැදගත් අංකයක් විය. 1999 වර්ෂය ආරම්භයේ පටන්ම සීලානන්ද හිමියන්ගේ ජීවිතයේ විවිධ වෙනස් කම් කීපයක්ම සිදුවිය. නිතර නිතර තමන් වහන්සේගේ

සිත කියා සිටියේ මේ කරමින් සිටින ගුරු පත්වීම් ආදියත් මේ නගරබදව කායජීබහුලව ගෙවන ජීවිතයත් අතහැර දමා කොහේ හරි නිහඬව නිසංසලව නිදහස්ව ඉන්න පුළුවන් ආරණ්‍ය සේනාසනයක් වැනි තැනකට යන්න කියාය. ඒත් උන්වහන්සේගේ එම සිතුවිල්ල ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි සැලසුම් කරන හැම අවස්ථාවකම යම් යම් බාධක ඇතිවිය. කෙසේ හෝ 1999 වසරේ අගෝස්තු 9 වෙද්දී එම අදහස අනුව සුදුසු තැනක් ලැබෙන්නට අවස්ථාව සැලසුණි.

එයද මහා පුදුමයකි. දිනක් බෙල්ලන්විල රජමහා විහාරාධිපති ධම්මරතන නාහිමියෝ සවස 6.00 ට පමණ ටෙලිපෝනයෙන් කථාකොට සීලානන්ද හිමියන් හමුවීමට පැමිණෙන බව කීහ. ටික වේලාවකින් එනම් රාත්‍රී 7 ට පමණ පැමිණි උන්වහන්සේ "මම විශාල මුදලක් වියදම් කරලා භාවනා මධ්‍යස්ථානයක් හදලා තියෙනවා කඩුගන්නාවේ, නමුත් එතන තියන්න විශ්වාස වන්ත කෙනෙක්, සුදුසු හාමුදුරු නමක් තාම නැහැ. ඉතින් මම ඔබ වහන්සේ ගැන අහල තියෙනවා. කීපදෙනෙක්ම මට ඔබ වහන්සේ ගැන කීවා. ඒ නිසයි මේ ආවේ. ඔබ වහන්සේ එතෙන්ට ගිහින් බලලා ඒක භාරගෙන එහෙ ඉඳගෙන භාවනා කටයුතු කරගන්න" කියා අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට කීහ.

මේ අවස්ථාව වනතෙක් සීලානන්ද හිමියනුත් මෙම ධම්මරතන නාහිමියනුත් වචන දහයක් ක් වත් කතා කරලා තිබුණ අය නොවෙති. මෙසේ උන්වහන්සේ කෙරෙහි තිබූ විශ්වාසය කොතරම්දැයි සිතූ සීලානන්ද හිමියෝ එම මහා සත්පුරුෂයාණන් වහන්සේට තමා උපකාර කළයුතු යැයි සලකා පසුදිනම එම ස්ථානය බැලීමට යාමට තීරණය කළහ.

පසුදින උදේම ගරු බෙල්ලන්විල ධම්මරතන

නාහිමිපාණන් වහන්සේත් සීලානන්ද ස්වාමීන් වහන්සේත් කඩුගන්නාවේ ගලවිදපු තැන නමින් ප්‍රසිද්ධ ස්ථානයේ පිහිටි පාරමිතා ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය නැරඹීමට ගියහ. එම ස්ථානයට පැමිණි ගමන්ම එම ස්ථානය ජය භූමියක් ලෙස පුණ්‍ය භූමියක් ලෙස දුටු සීලානන්ද හිමියෝ එහි නතර වී තම භාවනා කටයුතු කරගන්නා ගමන් ලෝක ප්‍රජාවට ද කිසියම් සේවයක් කරන්නෙ මැයි අධිෂ්ඨාන කරගත්හ.

මෙම තීරණයෙන් පසු කාලය දින සති මාස ගණනින් වේගයෙන් ගෙවී ගියේය. නොවැම්බර් මාසය වෙද්දී සීලානන්ද හාමුදුරුවන් වහන්සේ සියල්ල තීරණය කර අවසානයි. දැන් සිය ගුරුපත්වීමෙන් ද අස්වී නිදහස්ව ජීවත්වීමේ අපේක්ෂාවෙන් අවශ්‍ය මූලික දේවල් ක්‍රියාත්මක කරමින් සිටින කාලයයි. නොවැම්බර් 24 සීලානන්ද හිමියන්ගේ මෑණියන්ගේ උපන් දිනයයි. එදිනට තමා සතු සියලු දේ පරිත්‍යාග කළ යුතු යැයි සිතා එදිනට විශේෂ දානමය පින්කමක් රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණේ දී සිදුකිරීමට තීරණය කළහ.

1999 නොවැම්බර් මස 24 වැනි දින පැවැත්වූ විශේෂ දානමය පින්කම සඳහා භික්ෂූන් වහන්සේලා 65 නමක් අපේක්ෂා කළත් 75 නමක් පමණ වූහ. මෙසේ භික්ෂූන් වහන්සේලා 65 නමකට දානය පිරිනැමීමට අදහස් කළේ එදිනට උන්වහන්සේගේ මෑණියන්ගේ 65 වැනි උපන් දිනය එළඹී තිබුණ නිසාය. උන්වහන්සේගේ කාමරයේ තිබුණ බොහෝ දේවල් එදින පිරිකර සඳහා මහා සංඝරත්නයට පූජා කළේය. එය උන්වහන්සේගේ ජිවිතයේ සිදුකර ගත් සුවිශේෂ පින්කමක් ලෙස උන්වහන්සේ සලකති. එදින පටන් උන්වහන්සේ තව තවත් සිය කාමරයේ තිබූ දේවල් පරිත්‍යාග කළහ. 1999 දෙසැම්බර් මස 01 වෙනි දිනට සීලානන්ද හිමියෝ රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණෙහි වසර දහයක් සේවය කොට

තිබුණි. එදින තමා ගුරුපත්වීමෙන් අස්වෙන බව දන්වා අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාට හා පරිවේණාධිපති හිමියන්ට ලිපියක් භාරදුන්හ. එහි සඳහන් වුයේ 2000 වර්ෂයේ ජනවාරි මස 01 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තමන් වහන්සේ රජයේ ගුරු සේවයෙන් ඉල්ලා අස්වෙන බව සහ තමන් මින් පසු කිසිම වැටුපක්, විශ්‍රාම වැටුපක්, වැන්දඹු හා අනත් දීමනා වැනි රජයෙන් ලබාදෙන කිසිම දීමනාවකට හිමි කරුවෙකු නොවන බවත්ය.

ගුරුපත්වීමෙන් ඉල්ලා අස්වීමේ ලිපිය භාරදී රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණෙන් සමුගෙන පසුදින එනම් 1999 දෙසැම්බර් 02 වැනි දින බෙල්ලන්විල පේමරතන, ඇලදුවේ පඤ්ඤාතිලක, අනුරාධපුරේ සුමනවංශ, සියඹලාගස්හේනේ ජිනරතන යන හිමිවරුන් සහ සිරිපාල කාරියවසම් මහතාත් සමග අපේ සීලානන්ද හිමියෝ කඩුගන්නාව පාරමිතා භාවනා මධ්‍යස්ථානයේ නතර වීම සඳහා වැඩම කළහ.

තමන් කරුණු තේරුම් ගත් දවසේ පටන් ජීවිතයේ කවමදාකවත් දෙවියන්ට යාඥා කිරීම් හෝ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් හෝ වෙනත් ග්‍රහ නක්ෂත්‍ර ආදී කිසිවක් විශ්වාස නොකළ අපේ සීලානන්ද හිමියන් තම ජීවිතයේ සිදුවන විවිධ උච්චාවචනයන් දැක්කේ තමා තුළ ඇති ධර්ම ශක්තිය ලෙසටය.

කඩුගන්නාවේ පිහිටි මෙම පාරමිතා ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ උන්වහන්සේ ගතකළ යුගය ද අපේ හාමුදුරුවන් වහන්සේගේ, සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ, ජීවිතයේ තවත් විශේෂ යුගයකි. මෙය විශේෂ යුගයක් වූයේ උන්වහන්සේ විවිධ දුෂ්කරතා මධ්‍යයේ කඩුගන්නාව කඳු පාමුල පිහිටි නිවෙස්වලට වැඩම කොට ඉතා දිළිඳු නිවෙස් වලින්

පිණ්ඩපාතය කරගනිමින් සිහිනුවණින් යුතුව, විශේෂයෙන්ම මරණානුස්සති භාවනාව පුහුණු කරමින් කඩුගන්නාව කන්ද නගිමින් බහිමින් ගත කළ ඒ ජීවිතය නිසාය. එදත් කඩුගන්නාව කන්ද නගින බහින වාහන අද වගේම වේගවත් විය.

කෙසේ හෝ අපේ හාමුදුරුවෝ අපේක්ෂාකළ දෙය ඒ ආකාරයෙන්ම සම්පුර්ණවිය. සියල්ල සිදුවන්නේ කිසියම් ධර්ම ශක්තියකට අනුවයි. මේ සියල්ලම සිදුවන්නේ තමා පසු පස තියෙන ධර්ම ශක්තියට අනුව යැයි උන්වහන්සේ නිතර සිතූ අතර ධර්මය හා සමාන වෙනත් ඖෂධයක්වත් ශක්තියක්වත් නැති බව උන්වහන්සේ තරයේම විශ්වාස කළහ. එය මැනවින් අත්දැකීම් තුළින්ම උන්වහන්සේ තේරුම් ගෙන සිටියේය.

# පාරමිතා ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ ජීවිතය

2000 වසර ලැබීම මුළු ලෝකයේම කිසියම් කලබැගෑනියක් ඇති කරන්නක් වූයේ, එය මිලියනයක් හෙවත් සහස්‍රකයක් සම්පූර්ණ කරන වසරක් බැවින් ලෝකයේ විවිධ වෙනස් කම් සිදුවේවි යන අදහසිනි, බියෙනි. විශේෂයෙන්ම මෙය කොම්පියුටර් ලෝකයට තදින්ම බලපාන්නේ යැයි ලංකාවේ විවිධ ක්ෂේත්‍රවල නිරත වූවන් කතා කරන්නට වූ අතර මේ වන විට එය මහා ආන්දෝලනයක් බවට පත්ව තිබුණි.

එහෙත් ඒ කිසිවක් ගැන නොසිතා නව ස්ථානයේ ද අලුතින් කිසිම කටයුත්තක් ද ආරම්භ නොකර අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ දෙසැම්බර් මාසය පුරාම උදේ සවස තෙරුවන් වැඳ පුදා ගනිමින් ඉතාම හොඳින් තම බණ භාවනා කටයුතු කරගත්හ. එසේම උන්වහන්සේටත් සෙයු භාවනා

යෝගීන්ටත් භාවනා කටයුතු හොඳින් කරගෙන යාම සඳහා අවශ්‍ය පරිසරය සකස් කරවා ගත්තේය. උන්වහන්සේගේ කුටිය අසලම පුංචි ගල්ලෙනක් සකස් කරවා ගත්තේය. දාන ශාලාව හා කුස්සියට සමීපව විශේෂ ධර්ම මණ්ඩපයක් කරවා ගත්තේය. මෙසේ භාවනාවට අවශ්‍ය පරිසරයක් මෙම ස්ථානයේ ප්‍රථම වරට ඇති කරන ලද්දේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ විසිනි. මෙම කාලය තුළ බෙල්ලන්විල පේමරතන පොඩිහාමුදුරුවන් වහන්සේ, විජේසූරිය මහතා, සුමල්, රොබට්, මංජුල, සිරිල්, ජයසිංහ, ඇතුළු භාවනා මධ්‍යස්ථානයේ සිටි හැම දෙනෙක්ම අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ අවශ්‍යතා නිතර නිතර සොයා බලමින් ඉමහත් සේ උදවු උපකාර කළ බව සීලානන්ද හිමියන් අද සඳහන් කරන්නේ  ඉමහත් සතුටින් මෙන්ම කෘතඥතාවෙන් හා පින් පෙරටුවය.

2000 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින උදාවත් ම එය ලෝකයේ සෑම දෙනෙකුටම වැදගත් දිනයක් නිසා මෙම පාරමිතා බෞද්ධ මධ්‍යස්ථානයේ ද කිසියම් අර්ථවත් වැඩසටහනක් කළ යුතු බව සීලානන්ද හිමියෝ තීරණය කළහ.

ඒ අනුව සීලානන්ද හිමියන් විසින් මෙම සහස්‍රකය බෞද්ධයාට බලපාන ආකාරය පැහැදිලි කරමින් "බුදුදහම හා නව සහස්‍රකය" නමින් විශේෂ ධර්ම පත්‍රිකාවක් සකස් කොට බෙදා දුන්නේය.  එදා, ජනවාරි පළමුවැනිදා, උදේම සීලානන්ද හිමියන් සහ උන්වහන්සේගේ පැවිදි සහෝදරයකු ලෙස සිටින ඩෙන්මාර්ක් ජාතික මෙත්තා විහාරි හාමුදුරුවෝත් මල් පහන් පුදා භාවනා කොට සිවුරු පාත්‍ර ගෙන බුදුන් දවස පටන් පැවත එන භික්ෂූන්ගේ පිණ්ඩපාත චාරිකාව නොසිඳ පවත්වන්නට පියවර තබන්නා සේ පිණ්ඩපාත චාරිකාවට වැඩම කළහ. (එදා ආරම්භ කළ පිණ්ඩපාත චාරිකාව අපේ සීලානන්ද හාමුදුරුවන්

වහන්සේ මෙම පාරමිතා භාවනා මධ්‍යස්ථානයේ සිටි කාලය පුරාම සෑම සතියකම දිසා හතරට පිණ්ඩපාතයේ වඩිමින් පවත්වාගෙන ගියේ ඉතාම සන්තෝෂයෙනි).

පිණ්ඩපාතය කිරීම සමහර අයට පෙනෙන්නේ හිඟාකෑමක් ලෙසය. එහෙත් එය ඊට වඩා හාත්පසින් වෙනස් දෙයකි. පිණ්ඩපාතයේ වැඩීමේ ඇති වැදගත්කම මෙන්ම එහි ආනිසංස අපට මුලින්ම පෙන්වා දෙන ලද්දේ අපගේ තථාගත ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසිනි. උන්වහන්සේ දිනපතාම පාහේ පිණ්ඩපාතයේ වැඩම කරමින් ආහාර වැළඳූ අතර උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට ද එය නියම කළහ. බුදුරජාණන් වහන්සේගේ සූත්‍රදේශනා රාශියකම පිණ්ඩපාතය ගැන විස්තර දක්නට ඇත.

පිණ්ඩපාතයේ වැඩීම භාවනාවකි. පිණ්ඩපාත චාරිකාව සෑම භික්ෂුවකටම උරුම දෙයකි. වරක් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ පිණ්ඩපාතයේ වඩින භික්ෂුව සතියෙන් හෙවත් සිහියෙන් වැඩම කළ යුතු අතර සිහියෙන්ම ආපසු සිය ආරාමයට වැඩම කළ යුතු බවය. මෙහිදී භික්ෂූන් වහන්සේලා හතර නමක් ගැන සඳහන් කරමින් දේශනා කොට ඇත්තේ එක් භික්ෂුවක් පිණ්ඩපාතයේ වඩිද්දී සිහියෙන් වඩියි. එහෙත් ආපසු වඩිද්දී සිහිය නැත. එක් භික්ෂුවක් පිණ්ඩපාතයේ වඩිද්දී සිහිය නැත ආපසු වඩිද්දී සිහිය ඇත. එක් භික්ෂුවක් පිණ්ඩපාතයේ වඩිද්දීත් සිහිය නැත. ආපසු වඩිද්දීත් සිහිය නැත. තවත් භික්ෂුවක් පිණ්ඩපාතයේ වඩිද්දීත් සිහිය ඇත. ආපසු වඩිද්දීත් සිහිය ඇත යනුවෙනි. මේ සිව්දෙනා අතරින් අවසන් කෙනා මෙන් පිණ්ඩපාතයේ වඩිද්දීත් ආපසු වඩිද්දීත් සිහියෙන් යුක්තවම පිණ්ඩපාතය කරගන්න යැයි බුදුහිමියෝ අපට දේශනා කළහ.

හොඳ සිහිනුවණින් යුක්තව දායක පින්වතුන්ට මෙත් සිත පතුරුවමින් එදා මෙසේ පිණ්ඩපාතය කරගෙන ආපසු පැමිණි උන්වහන්සේලා හීල් දානය වළඳා අනතුරුව භාවනා මධ්‍යස්ථානයේ සීලානන්ද හිමියන්ගේ කුටිය ඉදිරිපිටම තැඹිලි පැළයක් ද රෝපණය කළහ.

මෙදින දවස පුරා සාමණේර භික්ෂූන් වහන්සේලා පිරිසකටත් වැඩිහිටි පිරිසකටත් භාවනා වැඩසටහන් දෙකක් සංවිධානය කළේ සීලානන්ද හිමියන්ගේ අනුශාසනා පරිදිය. මෙම වැඩසටහන් මෙහෙයවීම සීලානන්ද හිමියන් විසින්ම කරන ලදී. මේ මෙම පාරමිතා බෞද්ධ මධ්‍යස්ථානයේ භාවනා වැඩසටහන්වල සමාරම්භක දිනයයි. එදා දවසේ සියලු කටයුතු ඉතාමත්ම හොඳින් සිදුවූ අතර සියලු දෙනාම ඉමහත් සේ සන්තෝෂ වූයේ පුණ්‍ය නිධානයක් පැදුණ නිසාය.

මේ අයුරින් මෙම ස්ථානයේ භාවනා වැඩසටහන් පවත්වමින් දේශීය හා විදේශීය භාවනා යෝගීන්ට ධර්මය සහ භාවනාව කියා දෙමින් සීලානන්ද හිමියෝ මෙහි වැඩ වසමින් සුවිශේෂ සේවාවක් සිදු කළහ. පසුකාලීනව මෙම භාවනා මධ්‍යස්ථානයේ උන්වහන්සේගේ භාවනා වැඩසටහන් වලට සිය ගණනින් පිරිස් රැස්වූයේ අපේ හාමුදුරුවන් ඔවුන්ට නිමල බුදුදහම පැහැදිලිව හා පිරිසිදුව කියා දෙමින් බුදුදහමේ හරයට හෙවත් භාවනාවට ඔවුන්ගේ සිත් සතන් යොමු කළ නිසාය.

මෙසේ වැඩ සිටින අතර 2000 වර්ෂයේ මාර්තු මස 08 වැනි දින සීලානන්ද හිමියන් සිංගප්පූරුවෙන් ලද ආරාධනයකට අනුව එහි වැඩමකොට සිංගප්පූරුවේ බෞද්ධ පුස්තකාලයේ දී විශේෂ දේශන කීපයක් පැවැත්වූහ. නැවතත් උන්වහන්සේට මෙම වසරේම සැප්තැම්බර් මස 17 වැනි දින තායිවානයේ ''යෙන් ක්වාන්'' බෞද්ධ කොලීජියෙන්

ආරාධනයක් ලැබුණි. ඒ එහි බුදුදහම සහ භාවනාව පිළිබඳව දේශනා කීපයක් හා භාවනාව පිළිබඳව විශේෂ පාඨමාලාවක් පැවැත්වීමටය. එම ආරාධනය පිළිගත් අපේ සීලානන්ද හිමියෝ සැප්තැම්බර් මස 12 වැනි දින සිංගප්පූරුවට ගොස් නැවත 17 වැනි දින තායිවානයට වැඩම කළහ. සැප්තැම්බර් 17 වැනි දින සිට ඔක්තෝබර් 31 වැනි දින දක්වා උන්වහන්සේ එහිදී දේශන 40 ක් පමණ පැවැත්වූ අතර එම දේශන ඉතා ඵලදායි වූයේ එහි වැඩසිටි භික්ෂූන් වහන්සේලා විශේෂයෙන්ම භාවනාව පුහුණු වෙමින් සිටි මහායාන භික්ෂූන් වහන්සේලා පිරිසක් වීම නිසාය.

උන්වහන්සේගේ මෙම සංචාරය තවත් පැත්තකින් ඉතා ඵලදායි එකක් වූයේ එම කොලීජිය සමග සුහද සම්බන්ධතාවයක් ද ගොඩ නගා ගැනීමට උන්වහන්සේට හැකිවීම නිසාය. ඒ අනුව පසුව රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණත් යෙන් ක්වාන් බෞද්ධ කොලීජියත් අතර සබඳතාවක් ගොඩ නගමින් ලංකාවෙන් භික්ෂූන් වහන්සේලා කීපනමක්ම එම කොලීජියට යවා නොමිලේ ඉගෙන ගැනීමට අවස්ථාව සලසා දීමට අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට හැකිවිය.

අපේ හාමුදුරුවෝ මෙසේ තායිවානයේ මෙම විද්‍යාස්ථානයේ ධර්ම විනය පිළිබඳව හා භාවනාව පිළිබඳව පාඨමාලාව පවත්වන අතර උන්වහන්සේගේ ජීවිතයේ තවත් ඉතා සංවේග ජනක සිද්ධියක් දැනගන්නට ලැබුණි. ඒ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ද ගුරුවරයෙකු ලෙසින් වැඩ සිටි අතිගරු පූජ්‍ය මාපලගම විපුලසාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අපවත් වීමය. සීලානන්ද හිමියන් තායිවානයට වැඩම කරන අවස්ථාව වනවිට අසනීප තත්ත්වයේ පසුවූ උන්වහන්සේ හදිසියේම සිංගප්පූරුවට

ගෙන ගිය අතර එහි එලිසබත් රෝහලේ ප්‍රතිකාර ගනිමින් සිටියහ. සීලානන්ද හිමියෝ ගරු නාකුළුගමුවේ සුමන හිමියන්ද සමග එම රෝහලට ගොස් උන්වහන්සේගේ අසනීප තත්ත්වය ගැන සොයා බලා උන්වහන්සේට නමස්කාර කොට තායිවානයට වැඩම කළේ උන්වහන්සේට නැවතත් මේ ගුරු පියා දැක ගැනීමට හෝ කතා කිරීමට අවස්ථාවක් නොලැබේය යන හැඟීම ද ඇතිවමය.

ඒ අනුව අපේ සීලානන්ද හිමියෝ තායිවානයේ තම දේශන කටයුතු අතරමග නතර කර සැප්තැම්බර් මස 31 වැනි දින ලංකාවට වැඩම කළේ තමාගේ ජීවිතයේ හමුවූ සුවිශේෂ ගුරුවරයෙකුට තමන්ගෙන් ඉටුවිය යුතුවූ අවසන් යුතුකම ද ඉටුකිරීමේ අදහසිනි. ලංකාවට පැමිණි උන්වහන්සේ මාපලගම විපුලසාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආදාහන කටයුතුවලට තම පූර්ණ සහාය ලබාදෙමින් සහභාගී වූහ. උන්වහන්සේගේ ආදාහන කටයුතු ද ඉතාම ලස්සනට සිදුවිය.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ ජීවන ගමනේදී විශේෂයෙන්ම රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙණ ඇසුරුකරමින් සිය අධ්‍යාපන කටයතු නිසි ලෙස කරගැනීමට සෙවන සැලසුවේත් තමාට අවශ්‍ය ආරක්‍ෂාව සැලසුවේත් මෙම මාපලගම විපුලසාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේය. මෙම අවසන් අවස්ථාවේ දී අවසන් ගෞරව දැක්වීමට ලංකාවට පැමිණීමට අවස්ථාව ලැබීම ගැන සීලානන්ද හිමියෝ තම යුතුකම ඉටුකළේ යැයි සිතා අදත් මහත්සේ සතුටු වෙති.

කඩුගන්නාවේ පාරමිතා ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ වැඩ සිටින කාලයේ දී සීලානන්ද හිමියන් විසින් විවිධ ධර්ම පත්‍රිකා සහ දහම් පොත පත ද සකස් කරන ලදී. එම පත්‍රිකා

අතර ''දහම් සිසිල'' සෑම පුරපසළොස්වක දිනකම නිකුත්විය. ''ධම්ම දායාද'' නමින් පොත් පිංචක් ද ''ප්‍රේග්‍රන්ස් ඔප් ද ධම්ම '' නමින් ඉංග්‍රීසියෙන් ලියන ලද ධර්ම පත්‍රිකාවක් ද නිකුත් කරන ලදී. මේ උන්වහන්සේගේ ධර්ම දානයයි. මේ සියල්ල සිදුකළේ කිසිදු මුල්‍යමය අපේක්‍ෂාවක් නැතිව නිසා උන්වහන්සේ අදත් මේ ගැන සිත සිතා සතුටුවෙති.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ මෙම පාරමිතා බෞද්ධ මධ්‍යස්ථානයේ ''ධර්මෝපදේශකයන් වහන්සේ'' වශයෙන් මෙසේ කටයුතු කරන අතර සිය ආධ්‍යාත්මික සුවය ගැන විශේෂ අවධානය යොමු කරමින් දිනපතාම භාවනාවට වැඩි කාලයක් යොදාගත්හ. නිතිපතා භාවනාව ප්‍රගුණ කරමින් සතියෙන් හෙවත් සිහියෙන්, අවදියෙන් දවස ගෙවීමට උත්සුහ වූහ. උන්වහන්සේ නිතර ප්‍රකාශ කළේ ''භාවනාවෙන් තොර සැනසුමක් නැහැ. භාවනාව කියන්නේ කෙනෙකුට කෑම ටික වතුර ටික වගෙයි'' කියලයි. මේ අනුව උන්වහන්සේ ජීවිතය ම භාවනාවක් කරගැනීමට උත්සාහවත් වූහ.

2000 වසර මේ ආකාරයෙන් ගෙවිණ. 2001 වසරේ ඔක්තෝබර් මාසය වනවිට නැවතත් සීලානන්ද හිමියන්ට ඉන්දියාවේ සහ නේපාලයේ පැවැත්වෙන විශේෂ උත්සව කීපයකට ආරාධනයක් ලැබුණේ ජපන් ජාතික භික්‍ෂූන් වහන්සේලාගෙනි. ඒ නේපාලයේ ලුම්බිණියේ ඉදිකොට නිමවී ඇති ජපන් සාම චෛත්‍යයේ (විශ්ව ශාන්ති) කොත නිරාවරණය කිරීමේ උත්සවයට සහ නේපාලයේ පොකරාහි සාම චෛත්‍යයේත් ඉන්දියාවේ රාජ්ගිර් හි සාම චෛත්‍යයේත් පැවැති උත්සව කීපයකට සහභාගී වීමටය.

මේ අනුව අපේ සීලානන්ද හිමියෝ 2001 ඔක්තෝබර් 20 වෙනි දින ඉන්දියාව බලා පිටත් වූහ. මෙම සංචාරයේදී උන්වහන්සේට නැවතත් දඹදිව පුණ්‍යභූමි වන්දනා කරගැනීමට

අවස්ථාව උදාවිය. මෙම සංචාරය අවසන් වූයේ නොවැම්බර් මස 10 වැනි දිනය. එදින උන්වහන්සේ දිල්ලියේ සිට මදුරාසියට වැඩම කළේ ජීවිතයේ තවත් අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු මහා පින්කමක් කිරීමටය. ඒ තමන් වහන්සේව මෙලොවට බිහිකළ ආදරණීය මෑණියන්ට බුදුමෑණියන්ගේ ජීවිතයේ සුවිශේෂ සංසිද්ධීන් සිදුවූ දඹදිව බුද්ධ භූමි වැඳ පුදාගැනීමට අවස්ථාව සලසා දීමටය.

මේ වනවිට සිය මෑණියෝ ගරු වැලිවිටියේ මේධානන්ද ස්වාමීන් වහන්සේත්, වැලිවිටියේ සුමන ස්වාමීන් වහන්සේත් තවත් කීපදෙනෙකුත් සමග මදුරාසියට පැමිණ සිටියහ. මව සමග දඹදිව පුණ්‍ය භූමිවලට වැඩම කොට සීලානන්ද හිමියෝ සිය මෑණියන්ට එම ස්ථාන සිත පුරා දැක බලා ගෙන වැඳ පුදාගන්නට අවස්ථාව සලසා දුන්හ. එම පුණ්‍ය භූමි වන්දනා කර අවසන් වෙන දවස වූයේ නොවැම්බර් මස 24 වෙනිදිනය. ඒ සීලානන්ද හිමියන්ගේ මවගේ උපන් දිනය දවසයි. හරියටම මෙම සංචාරය එදා නිමවූයේ ලොවුතුරා බුදුරජාණන් වහන්සේ සිය මෑණියන්ට දහම් දෙසා තවුතිසාවේ සිට මිනිස් ලොවට වැඩම කළ ස්ථානය සේ සැලකෙන සංකස්ස පුරයෙනි.

සංකස්ස පුරයට ළඟා වූ සීලානන්ද හිමියන් ඇතුළු පිරිස එදින එහිදී විශේෂ මල් පහන් පූජාවක් සිදුකළහ. ඒ සීලානන්ද හිමියන්ගේ මෑණියන්ගේ 67 වෙනි උපන් දිනයයි. පහන් 67 ක් පූජා කොට විශේෂ පූජාවක් පවත්වා පිරිත් සජ්ඣායනා කර මහා සංඝ රත්නය මෑණියන්ට සෙත් පැතූහ. ඒ අවස්ථාවේදී අපේ සීලානන්ද හිමියන්ගේ පින්බර මෑණියන්ගේ කටින් පිටවුයේ "දැන්නම් මට කොයි මොහොතේ මැරුණත් කමක් නෑ. මගේ ඇස් දෙක කොයි මොහොතේ පිය වුණත් ඔබවහන්සේට මා වෙනුවෙන් පවක් නෑ, ණයක් නෑ. ඔබ වහන්සේ බුදුවේවා!" කියලයි.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ කඩුගන්නාවේ පාරමිතා බෞද්ධ මධ්‍යස්ථානය මුල් කරගෙන ගත කළ ඒ පිවිතුරු ජීවිතයේ අමතක නොවන දෙදෙනෙක් වෙති. එම දෙදෙනා නම් ආචාර්ය සිරිසේන බූකොළදෙණිය මහත්මයා සහ ගුණපාල සමරසිංහ මහත්මයාත්ය. උන්වහන්සේ කඩුගන්නාවේ පාරමිතා භාවනා මධ්‍යස්ථානයට වැඩම කොට නොබෝ දිනකින්ම හමු වූ සුවිශේෂ පුද්ගලයා මෙම සිරිසේන මහත්මයාය. සසර පුරුද්දකට අනුව මෙසේ මෙම උදාර සත්පුරුෂයා හමු වූයේ යැයි සීලානන්ද හිමියෝ තදින් ම විශ්වාස කරති.  ඉන් ටික කළෙකට පසුව උන්වහන්සේට සමරසිංහ යුවලත් හමුවූයේ පෙර පිනකින් බව උන්වහන්සේ පවසති.

මෙම සිරිසේන මහත්මයාත් සමරසිංහ යුවලත් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට සැලකුවේත් සලකන්නේත් ඉතාමත්ම ආදරයෙනි, ගෞරවයෙනි. ඒ අන් කිසිවක් නිසා නොව උන්වහන්සේ තුළ ඇති කරගෙන තිබූ ගුණවත් බව නිසාමය. උන්වහන්සේ ළඟින්ම ඇසුරුකරමින් උන්වහන්සේ කවුද යන්න ඉතාම හොඳින් තේරුම් ගත් දෙපොළකි මේ.

2001 වසර ගෙවී 2002 වසර ලැබුවේ අපේ සීලානන්ද හිමියන්ගේ ජීවිතයේ තවත් පෙරළියක් සිදුවන වසරක් ලෙසිනි. වසර ආරම්භ වන දවසේ සීලානන්ද හිමියන් විසින් පාරමිතාවේ විශේෂ පින්කමක් යොදාගෙන තිබුණි. ඒ දෙසැම්බර් මස 31 දින සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයක් සහ 01 වෙනි දින සඟසතු මහ දනකි. එදින දානය සඳහා ස්වාමීන් වහන්සේලා 18 නමක් වැඩම කළහ. මෙසේ විවිධාකාරයෙන් පින්කම් සිදුකරමින් උන්වහන්සේ ප්‍රාර්ථනා කළේ " මේ සියලු පින් මා ඇසුරු කරන හා මට නොයෙක් ආකාරයෙන් උදව් උපකාර කරන මගේ ඥාති මිත්‍රාදී හැමටම

එක සේ ලැබේවා! ඒ හැමටම වහ වහාම සසර දුකින් නිදහස් වීමට හැකි වේවා! නිවණෙහි සැනසුම සැමටම ලැබේවා!" යනුවෙනි.

මෙම වසරේ පෙබරවාරි මාසය සීලානන්ද හිමියන්ගේ ජීවිතයේ ඉතාමත්ම සංවේග ජනක මාසය විය. ඒ උන්වහන්සේගේ ජීවිතයට ආලෝකය දුන් උන්වහන්සේගේ දෙමව්පියන්මෙන් දුක සැප සොයා බලමින් උන්වහන්සේගේ අභිවෘද්ධිය ඉත සිතින්ම ප්‍රාර්ථනා කරමින් උන්වහන්සේට ආරක්ෂාව සැලසු උන්වහන්සේගේ ගුරුදේවයන් වහන්සේ වූ අතිගරු මොන්නැකුලමේ ශ්‍රී විමලානන්ද නායක මාහිමිපාණන් වහන්සේ 2002 පෙබරවාරි 13 වැනි දින  අපවත් වීමය.

2001 වසරේ නොවැම්බර් මාසය වෙනවිට සීලානන්ද හාමුදුරුවන් වහන්සේ සිය මෑණියන් ද සමග දඹදිව වන්දනාවේ යෙදී සිටිද්දී බුද්ධගයාවට වැඩම කළ දා සීලානන්ද හාමුදුරුවන් වහන්සේට ලංකාවෙන් දුරකථන ඇමතුමක් ආවේය. ඒ උන්වහන්සේගේ ගුරු දේවයන් වහන්සේට ඉතාමත් අසාධ්‍ය බැව් දැන්වීමටය. හදිසියේම රොහල්ගත කොට අසාධ්‍ය තත්ත්වයේ සිටින නාහිමියන් ගැන තීරණ ගැනීමට නොහැකිව සීලානන්ද හිමියන්ගේ සහෝදර හිමිවරු මෙසේ කථා කළහ. ඒ අවස්ථාවේදී සීලානන්ද හිමියන් ප්‍රකාශ කළේ තමන්  සිය මෑණියන් සමග වන්දනාවේ යෙදෙමින් දැන් බුද්ධගයාවේ වැඩ සිටින බවත් තමන්ට මේ ගමන නතර කොට හදිසියේම  ආපසු පැමිණිය නොහැකි බවත් සහෝදර හිමිවරුන් එක්ව අවශ්‍ය පියවර ගනිමින් සුදුසු පරිදි කටයුතු කිරීම උචිත බවත්ය.

අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ එදා දඹදිව බුද්ධගයාවේ ජය ශ්‍රී මහා බෝධිය අභියසට වැඩම කොට

විශේෂ අධිෂ්ඨාන පූජාවක් සිදුකරමින් භාවනා කොට නාහිමිපාණන් වහන්සේට වහ වහාම නීරෝගී බව ලැබේවා දීර්ඝායුෂ ලැබේවායි ප්‍රාර්ථනා කළහ. ඒ අනුව තෙරුවන් බෙලෙන් ධර්ම ශක්තියෙන් නාහිමිපාණන් වහන්සේගේ අසනීප තත්වය සුවවිය. සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ලංකාවට වැඩම කළ දිනට පසුදිනම තම ගුරු දේවයන් වහන්සේ දැක බලා ගෙන වන්දනා කිරීමට පැමිණියේය. දැන් අසනීප තත්ත්වය හොඳටම සුව බව උන්වහන්සේ පැවසූහ. ඉන් අනතුරුව සීලානන්ද හාමුදුරුවන් වහන්සේ සති දෙකක් පමණ මාතලේ වටගල ආරණ්‍යයේ පර්වතයක් මුදුනේ පිහිටි ගල් ලෙනක හුදකලාව වැඩ සිටිමින් භාවනා කළහ. එසේ භාවනා කොට නැවතත් පාරමිතාවට වැඩම කිරීමෙන් දින කීපයකට පසුව එනම් පෙබරවාරි මස 12 වෙනි දින රාත්‍රී හදිසියේම සහෝදර හිමිනමක් දුරකථනයෙන් කතා කොට නායක මාහිමිපාණන් වහන්සේට නැවතත් අසනීප වී රෝහල් ගත කළේ යැයි දැන්වීය.

සීලානන්ද හිමියෝ "මම හෙට හවසට එන්නම්" යැයි පිළිතුරු දුන්නේය. එහෙත් ඒ සැණෙකින්ම සීලානන්ද හාමුදුරුවන් වහන්සේට දැනුනේ මේ තම ගුරුපියාගේ අවසන් අවස්ථාව බවයි. ඒ අනුව සීලානන්ද හිමියෝ පසු දින සවස නොව උදේම සිය ගුරු පියාණන්ගේ දෙපා වන්දනා කිරීමේ අදහසින් ආණමඩුව රෝහලට වැඩම කළහ. උදේ 9:00 පමණ වනවිට රෝහලට වැඩම කළ සීලානන්ද හිමියන්ට තම ගුරු දේවයන් වහන්සේ ඉතා හොඳ සිහියෙන් අවදියෙන් සිටින බව දැකගැනීමට හැකි විය. උදේ පටන් සවස 2:30 පමණ වනතෙක් උන්වන්සේ ළඟ සිටි සීලානන්ද හිමියෝ තම ජීවිතයේ තමන්ගේ ගුරුවරයාණන් වහන්සේට අවසන් වශයෙන් කළ යුතු ඇප උපසත්කාර ද සියල්ලම නොඅඩුව සිදු කළහ. උදේ තමන් පැමිණි අවස්ථාවේ සිට තම ගුරු පියා අවසන් හුස්ම හෙළන

තෙක්ම ඇඳ ළඟම සිටිමින් සිය ගුරුදේවයන් වහන්සේට අවශ්‍ය දේ සියල්ල සම්පාදනය කරමින් අතීසාරයක් වැලඳුණ කලක් මෙන් පහවූ මළ මුත්‍රාදිය තම අතින්ම මැදහත් සිතින් පිරිසිදු කරමින් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ තම ගුරුපියාට අවසන් අවස්ථාවෙත් සලකමින් මහා පිනක් සිදු කරගත්හ.

තම ගුරුදේවෝත්තම වූ නායක මාහිමිපාණන් වහන්සේගේ  ආදාහන කටයුතු සියල්ල තමන්ගේ අවවාද අනුශාසනා පරිදි ගුරුදේවයන් වහන්සේට අයත්ව තිබුණ විහාරස්ථාන දහයක දායක දායිකාවන්ගේ සහයෝගයෙන් හා සහභාගිත්වයෙන් ඉතාමත්ම ලස්සනට සිදුකළහ.

අනතුරුව අපවත් වීමෙන් සත්දිනක් ගතවන දා සිදු කළයුතු විශේෂ දානමය පිංකම ද අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ අනුශාසනා පරිදි ඉතාම ලස්සනට සංවිධානය කෙරිණ. එම පිංකම නායක මාහිමිපාණන් වහන්සේ ජීවිතයේ වැඩිම කාලයක් ගත කළ මෙන්ම උන්වහන්සේගේ අවසන් කටයුතු ද සිදුකළ එම ගල්කුලියේ ලිහිණිගිරි රජමහා විහාරස්ථානයේදීම ඉතාමත්ම ලස්සනට  නාහිමියන්ගේ සියලු විහාරස්ථානවල දායක දායිකාවන්ගේ සහ ප්‍රදේශවාසී මහා සංඝරත්නයේත් සහයෝගයෙන් සහභාගීත්වයෙන් සියලු ආශිර්වාද මධ්‍යයේ සිදුකරන ලදී.  නාහිමිපාණන් වහන්සේගේ අපවත් වීමෙන් සත් දිනක් ගත වන දා සිදුකළ මෙම පිංකම ඉතාම වැදගත් පිංකමක් වුයේ එය සීලානන්ද හිමියන්ගේ ජීවිතයේත් විශේෂ සංසිද්ධියක් වු දිනයක් වීම නිසාය.

එදා මෙම පිංකම අවසන් වෙන අවස්ථාව වනවිට ප්‍රදේශයේ මහා සංඝරත්නය සහ විහාරස්ථාන දහයෙහිම දායක දායිකා පිරිස් එහි වූහ. එදා එම පිරිස ඉදිරියේ කතා කරමින් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ මෙසේ ප්‍රකාශ

කළහ. ''අපගේ ගුරුදේවෝත්තම නායක මාහිමිපාණන් වහන්සේට අයත් විහාරස්ථාන දහයක් තියෙනවා. ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවේ හැටියට ඒවා අයිති වෙන්නේ වැඩිමහල් ශිෂ්‍යයාටයි. උන්වහන්සේගේ වැඩිමහල් ශිෂ්‍යයා මමයි. මීට අමතරව අපේ නායක හාමුදුරුවන් වහන්සේ මේ සියලුම පන්සල් මගේ නමට ලියලා අන්තිම කැමති පත්‍රයකින් මට පවරලා තියෙනවා. මේ තියෙන්නේ ඒ අන්තිම කැමති පත්‍රයයි. ඒ අනුව අද පටන් මේ සියලුම විහාරස්ථානවල චංචල නිශ්චල දේපල සියල්ල අයත් වෙන්නේ  මටයි... එහෙත් ඒ කිසිම විහාරස්ථානයක, කිසිම දෙයක්, අද පටන් මට අයිති නෑ. මම ගන්නේ නැහැ. ඒ කිසිවක් මට අවශ්‍ය නැහැ. මම යන ගමන වෙනස්. ඒ ඒ විහාරස්ථානවල දැනට වැඩ සිටින හාමුදුරුවන් වහන්සේලාම ඒ ඒ විහාරස්ථාන වල කටයුතු කරන්න. මේ විහාරස්ථානයට මේ පොඩි හාමුදුරුවෝ ඉන්නවා. උන්වහන්සේට එය පවරනවා.'' යනුවෙනි.

මෙසේ කියා එදා අපේ හාමුදුරුවෝ, සීලානන්ද හාමුදුරුවෝ  තමන්ගේ ගමන් මල්ලත් කුඩයත් පමණක් අතැතිව පාරට බැස්සේ නැවතත් කඩුගන්නාවේ පාරමිතා බෞද්ධ මධ්‍යස්ථානයට වැඩම කිරීමටය. සිය දිවියේ නිදහස භුක්ති විඳීමටය.  බුදුපියාණන් වහන්සේ විසින් දේශනා කළ '' නච කිඤ්චි ලෝකේ උපාදියති'' (ලෝකේ ඇලෙන්න කිසිම දෙයක් නැහැ) යන බුදුවදන සීලානන්ද හිමියන්ගේ සිත තුළ නිතර නිතර රැව්දීමේ  ප්‍රතිඵලයයි මේ. වරක් රට්ඨපාල මහරහතන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ.

'' මේ ලෝකේ ධනවත්  වූ මනුෂ්‍යයන් සිටින බව පේනවා. ඒ අය ධනය ලබාගෙන  මෝහයෙන් මුළාවී ඒ ධනය කිසිවෙකුටත් දෙන්නේ නැහැ. ලෝභකමින් තව තවත් ධනය රැස් කරනවා. තව තවත් කාමයන් ම ප්‍රාර්ථනා කරනවා.  රජවරු

තම බලයෙන් මහ සමුදුර දක්වා වු මුළු පොළොවම ජයගෙන තම අයිතියට අත්පත්කරගෙන අවසන් වු විට ද සාගරයෙන් මෙපිට ඇති මහපොළොව තමන්ට මදි නිසා, එයින් අතෘප්තිමත්ව, සාගරයෙන් එපිට ඇති මහ පොළොවත් තමන්ගේම අයිතියට පවරා ගන්නට සටන් කරනවා. එහෙත් රජවරුත්, අනිත් සියලුම මනුෂ්‍යයනුත් යන සියල්ලෝම තණ්හාවේ කෙළවරකට පත් නොවීම මරණයට පත්වෙනවා. මේ ලෝකයේ කාමයෙහි නම් තෘප්තිමත් බවක්, ඇති වීමක් නැත.'' යනුවෙනි.

විවිධ වස්තුවලට පුද්ගලයන්ට බැඳෙන්න බැඳෙන්න අපි හැම කෙනෙකුම බැඳෙන්නේ සසරටයි. සසරට බැඳීම නොව අවශ්‍ය වෙන්නේ සසරින් නිදහස් වීමයි. බුදුදහම තියෙන්නේ සසරට බැඳෙන්න නෙවෙයි සසරින් නිදහස් වීමටයි. ලොව සිටිය, සිටින මෙන්ම අනාගතේට පහළ වෙන සියලුම ශාස්තෘන් වහන්සේලා අතරින් මේ භයානක වූ සසරින් මිදෙන නිවැරදි ක්‍රමයක් පෙන්වා වදාළේ අපගේ තථාගත ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් පමණී.

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේලා සසරින් මිදී සසරින් මිදෙන හැටි ලෝකයාට පෙන්වා දෙති. තමන් වහන්සේලා නිවැරදි මග දැන ගනිමින් දැක ගනිමින් සෙසු අයට ඒ මග කියා දෙති. මේ නිසාම සෑම බුදුරජාණන් වහන්සේ නමක්ම අපට කරුණු තුනක් පෙරටු කරගෙන අනුශාසනා කරති. එම අනුශාසනය වන්නේ සියලු පව්වලින් දුරුවෙන්න. කුසල් සිත් ඇති කරගන්න. තම සිත දමනය කරගන්න. යනුවෙනි. මෙය "සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා සචිත්ත පරි යොදපනං එතං බුද්ධානුසාසනං" යන ගාථාවෙන් පෙන්වා දෙති.

# කඳුරටින් පිට රටට
## (මහනුවරින් ඇමෙරිකාවට)

2002 වසර ලබා මෙසේ දින සති මාස ගණනින් කාලය ගෙවී යද්දී සීලානන්ද හිමියන්ගේ සදහම් සුවඳ ලොව විවිධ රටවලටත් දැනුණි. ඒ අනුව ඒ සදහම් සුවඳ දැනුණ ඇමෙරිකාවේ වාසය කරන ශ්‍රී ලාංකික පිරිසක් උන්වහන්සේට ධර්ම දූත මෙහෙවරක් සඳහා ඇමෙරිකාවට වැඩම කරන මෙන් ආරාධනය කළේය.

වසර ලබා මෙසේ දින සති මාස ගණනින් කාලය ගෙවී යද්දී සීලානන්ද හිමියන්ගේ සදහම් සුවඳ ලොව විවිධ රටවලටත් දැනුණි. ඒ අනුව ඒ සදහම් සුවඳ දැනුණ ඇමෙරිකාවේ වාසය කරන ශ්‍රී ලාංකික පිරිසක් උන්වහන්සේට ධර්ම දූත මෙහෙවරක් සඳහා ඇමෙරිකාවට වැඩම කරන මෙන් ආරාධනය කළේය.

මෙම ආරාධනය කරන ලද්දේ විශේෂයෙන්ම අප ඉහත සඳහන් කළ උන්වහන්සේගේ කල්‍යාණ මිත්‍රයෙකු වන සිරිසේන බුකොළදෙණිය මහත්මාණන්ගේ කාරුණිකත්වයෙනි. අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ " සිරි අයියා " යනුවෙන් අමතන මෙම මහත්මයාත්, ගුණපාල සමරතුංග මහත්මයාත් යන දෙපොළම සීලානන්ද හිමියන්ට විශේෂයෙන්ම කඩුගන්නාව පාරමිතා භාවනා මධ්‍යස්ථානයේ වැඩ වාසය කරන කාලය තුළ අවශ්‍ය සිව්පසය, එනම් දානය, සිවුරු පිරිකර, නවාතැන් සහ බෙත් හේත් ගැන නිතර නිතර සොයා බලමින් සැලකූ පින් වත් අය වූහ. මෙම දෙපොළම මෙම කාලය තුළ මහා පිංකම් රාශියක් සිදුකරගත් පින්වතුන් දෙපොළකි.

ඇමෙරිකාවේ ධර්ම දූත සේවය සඳහා වඩින ලෙස

නිව්යෝර්ක් විහාරාධිපති ගරු කුරුණෑගොඩ පියතිස්ස නාහිමියන්ගෙන්ම අපේ සීලානන්ද හිමියන්ට නිල වශයෙන්ම ආරාධනයක් ලැබුණි. ඒ අනුව සිරිසේන බූකොළදෙණිය මහතාත් ඇමෙරිකාවේ වාසය කරන ශ්‍රී ලාංකික පිරිසකුත් සියලු වියදම් දරමින් සීලානන්ද හිමියන් 2002 වස්කාලයේ දී ඇමෙරිකාවේ නිව්යෝර්ක් බෞද්ධ විහාරයට වැඩම කරවා ගත්තේය.

යම් කෙනෙක් කළ පින් ඇති විට එහි විපාක අනිවාර්යයෙන්ම ලැබෙනවා. අපි කොතනැක හිටියත් මොන දෙයක් කළත් කළ පින්වල විපාක වළක්වන්න කිසිවෙකුටත් බැහැ. මේ පිළිබඳව අපගේ ශාස්තෘ වූ තථාගත ලොවුතුරා අමාමෑණී බුදුපියාණන් වහන්සේ ධම්මපදයෙහි පැහැදිලි කරදෙන්නේ මෙසේය.

''මාවමඤ්ඤේථ පුඤ්ඤස්ස
න මං තං ආගමිස්සති
උදබින්දු නිපාතෙන උදකුම්භොපි පූරති
පූරති ධීරෝ පුඤ්ඤස්ස ථොකථොකං පි ආචිනං''

( 'ඕක මොකක්ද ඔයින් මට ලැබෙන දෙයක් නැහැ' කියා පිනට අවමන් කරන්න එපා. පින නොසලකා හරින්න එපා. ජලය බිංදුව බිංදුව වැටුණත් ටික වෙලාවකින් භාජනයක් පිරෙන්නේ යම් සේ ද එසේම පිනත් ටික ටික එක්වුව ද පුණ්‍යවන්තයාගේ පින එයින් පිරිපුන් බවට පත්වේ. ) යනුවෙනි.

එහෙත් ඔය පින විතරක් නෙවෙයි පවත් මෙසේම බව සිතට ගනිමු. වරක් බුදුපියාණන් වහන්සේ පව පිළිබඳව දේශනා කළේ

" න අන්තලික්ඛෙ න සමුද්ද මජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසෝ
යත්‍රට්ඨිතො න මුඤ්චෙය්‍ය පාපකම්මා"

යනුවෙන් මේ ලෝකේ යම් කෙනෙකු විසින් පවක් කළ විට එහි විපාකයෙන් මිදීමට සිතා අහසෙහි සැඟවී සිටියත්, මහ මුහුද මැද සැඟවී සිටියත්, පර්වත කුහරයක වැනි තැනක සැඟවී සිටියත්, එයින් වැළැකිය නොහැකි බවය.

එදා, 2002 වර්ෂයේ ජූලි මස 13 වැනිදා, උදේම සිරිසේන බුකොළදෙණිය මහතා ද සමග සීලානන්ද හිමියෝ ශ්‍රී ලංකාවෙන් පිටත්ව එංගලන්තයට ගොස් එහි ලන්ඩන් බෞද්ධ විහාරයේ 18 වැනි දින දක්වා නතරවී සිට එකල ලන්ඩන් බෞද්ධ විහාරාධිපතිව වැඩ සිටි ගෞරවාර්හ මැදගම වජිරඥාන නාහිමිපාණන් වහන්සේ සහ බෝගොඩ සීලවිමල, විල්ඔයේ විමලජෝති, තවලම බන්දුල, බෙල්ලන්විල පේමරතන, යන හිමිවරුන්ගේ සත්කාර සම්මාන ලබා, මහ රැජිනගේ බකිංහැම් මාළිගාව, වින්සර් මාළිගාව, ලන්ඩන් බිග් බෙන් වැනි ස්ථාන ද දැක බලාගනිමින් වැඩ සිට ජූලි මස 18 වැනි දින එංගලන්තයෙන් පිටත් වී ඇමෙරිකාවට වැඩම කළහ.

ඇමෙරිකාවේ නිව්යෝර්ක් හි පිහිටි ජේ. එෆ්. කෙනඩි ගුවන් තොටුපළින් උන්වහන්සේත් සිරිසේන බුකොළදෙණිය මහතාත් එළියට එද්දී නිව්යෝර්ක් හි පදිංචි සරත් රණසිංහ මහතා ඇතුළු පිරිසක් විසින් පිළිගෙන නිව්යෝර්ක් බෞද්ධ විහාරය වෙත වැඩමවා ගෙන යන ලදහ. ඒ අපේ හාමුදුරුවන් වහන්සේ ධර්ම දූත මෙහෙයක් ඉටුකිරීම සඳහා ප්‍රථම වතාවට ඇමෙරිකාවට සැපත් වූ අවස්ථාවයි.

# ඇමෙරිකාවේ නිව්යෝර්ක් නගරය

1492 දී ක්‍රිස්ටෝපර් කොලොම්බස් ඇමෙරිකාව සොයා ගත් බව ඔබත් අහලා ඇති නේද? ඒත් නිව්යෝර්ක් නගරය නම් සොයාගත්තේ ඉතාලි ජාතිකයෙකු විසිනුයි. ඒ ඉතාලි ජාතික නාවිකයෙකු වූ ගියෝවන්නී ද වෙරෂානෝ නම් තැනැත්තායි. ඔහු එදා ප්‍රංශයට යන ගමනේ දී 1524 නිව්යෝර්ක් වරායට පැමිණීමත් සමගය. ඉන් අනතුරුව ලන්දේසීන් යටතේ සේවය කළ හෙන්ඩ්‍රි හඩ්සන් නම් වූ ඉංග්‍රීසි ජාතිකයා ලන්දේසීන්ගේ අවශ්‍යතාව මත 1609 දී මෙම වරායට ළඟා විය. ඔහු අද ඔහුගේ නමින්ම නම් කර ඇති හඩ්සන් ගග දිගේ ඉහළට පැමිණියේ ලන්දේසීන්ගේ වෙළඳ කටයුතු පවත්වාගෙන යාම සඳහා සුදුසු තැනක් සොයා ගැනීමටය. ඒ අනුව ලන්දේසීන් 1624 මෙහි පැමිණ "පෝට් ඔරෙන්ජ්" නම් ප්‍රදේශයේ, එනම් අද "ඕල්බනි" නමින් හදුන්වන ප්‍රදේශයේ ප්‍රථමයෙන්ම පදිංචි වුණා. 1664 දී ඉංග්‍රීසින් විසින් යටත් කරගන්නා තෙක්ම ඔවුන් විසින් නිව්යෝර්ක් හැඳින්වුයේ නව ඇම්ස්ටඩෑම් නගරය නමිනි.

අද ස්ටැටන් අයිලන්ඩ් හා නිව්යෝර්ක් නගරය සම්බන්ධකරන ලෝකයේ ඇති විශාලතම මෙන්ම මහා පුදුම එළවන සුළු එල්ලෙන පාලමක් වශයෙන් තනා ඇති වෙරෂානෝ පාලමත් නගරය වටාම දක්නට ඇති හඩ්සන් ගංගාවත් මේ දෙදෙනාගේ නම්වලින් 'වෙරෂානෝ බ්‍රිජ්' සහ 'හඩ්සන් රිව ' යනුවෙන් නම්කර ඇත්තේ මේ ගවේෂකයන් දෙදෙනාගේ මෙම ඓතිහාසික සොයාගැනීම්වලට කෘතගුණ සැලකීම් වශයෙනි.

වෙරෂානෝ පාලම තට්ටු දෙකකින් යුත් සැතපුම් දෙක හමාරක් පමණ දිග එල්ලෙන පාලමකි. නිව්යෝර්ක් නගරයට අයත් බරෝ දෙකක් වන ස්ටැටන් අයිලන්ඩ් සහ බෲක්ලින් යන බරෝ දෙක සම්බන්ධ කෙරෙන මෙම පාලම ඉතාම පටු

පාලමකි. මෙය හදා නිමවන කාලය වනවිට එනම් 1964 වනවිට ලෝකයේ තිබූ විශාලතම එල්ලෙන පාලම මෙය විය. එහෙත් ඒ 1981 එක්සත් රාජධානියේ "හම්බර්" නමැති පාලම හදන තෙක් පමණි. ලෝකයේ නිතරම කෙනෙකු දිනන්නේ තව කෙනෙකු පරාද කරමිනි. එකිනෙකා පරයන ස්වභාවය මිනිසාටත් සෙසු සත්වයන්ටත් මෙන්ම ලොව වස්තු වලටත් සාධාරණ දෙයකි.

වෙරෂානෝ පාලමේ මැද සිට අඩි 4260 දෙපැත්තට විහිදීයයි. මුලින්ම නිව්යෝර්ක් වරායට ඇතුළු වූ යුරෝපීය නාවිකයා වූ වෙරෂානෝ සිහිකිරීම පිණිස "වෙරෂානෝ පාලම" නමින් නම්කර ඇති මෙම පාලමෙහි දක්නට ඇති විශාල කනු නිව්යෝර්ක්හි බරෝස් පහටම පෙනෙන තරම් උසට සාදා ඇත. නිව්යෝර්ක් වරායට නැව් ඇතුළුවෙන ප්‍රධාන දොරටුව මෙයයි. විශේෂයෙන්ම නිව්යෝර්ක් නගරයට සහ නිව්ජර්සි නගරයට විනෝද සංචාරයන් සඳහා එන සියලුම නැව් සහ කන්ටේනර් මෙම පාලම යටින් පිවිසිය යුතු අතර ඒවායේ සියලුම පරීක්ෂාවන් සිදු කෙරෙන්නේ මෙම පාලම යටදීය.

මෙහි ඇති අඩි 693 උසැති විශාල කුළුණු දෙකට බෝල්ට් ඇණ දස ලක්ෂයක් සවි කර ඇති අතර රිවට් ඇණ තිස් ලක්ෂයක් යොදා ශක්තිමත් කර ඇත. පාලම එල්ලා ඇති මහා කම්බි අගල් 36 ක් මහතය. එම කම්බි ගොතා ඇත්තේ තවත් පුංචි කම්බි 26108 කින් වන අතර ඒවා දිග හැරියොත්, ඔබ දන්නවාද? සැතපුම් 143000 ක් දිග හැරිය හැකියි. මේ බව අපට මෙසේ පෙන්වා දෙන්නේ ඇමෙරිකාවේ ගමනා ගමන දෙපාර්තුමේන්තුවය. මෙසේ ඉදිකර ඇති මෙම පාලමෙන් දිනපතා එහා මෙහා යන වාහන ප්‍රමාණය ලක්ෂගණනකි. සෑම කාර් එකකින්ම ඩොලර් 11 ක්ද සෑම මෝටර් සයිකලයකින්ම ඩොලර් 5 ක් ද අය කරනු ලැබේ. මේ මෙම රටට අවශ්‍ය ආදායම් සොයන එක් ක්‍රමයක් පමණි.

ලෝකයේ ඇති විශාලතම නගරයක් වන නිව්යෝර්ක් ඇමෙරිකා එක්සත් ජනපදයට අයත් ජනපද පනහෙක් එකකි. මෙය හඳුන්වන්නේ "එම්පයර් ස්ටේට්" හෙවත් අධිරාජ්‍යයේ ජනපදය නමිනි. නිව්යෝර්ක් නගරය සෑදී ඇත්තේ කොටස් පහක එකතුවක් ලෙසටය. එම කොටස් පහ හඳුන්වන්නේ බරෝ නමිනි. මේ එක් එක් කොටසේ පරිපාලන කටයුතු කෙරෙන්නේ එයට ගැලපෙන නීති පද්ධතියකිනි. එහෙත් ඒ පහෙන්ම සමන්විතව මෙම නගරයේ සියලු කටයුතු ඉතාම සුහදශීලීව හා ක්‍රමවත්ව සිදුකෙරේ.

බරෝවක් සෑදී ඇත්තේ මෙසේය. ගම් කීපයක් එකතුවකින් සාමාන්‍ය නගර සෑදී, එම සාමාන්‍ය නගරවල එකතුවකින් විශාල නගර සෑදී, එම විශාල නගර වලින් කවුන්ටි නමින් හැඳින්වෙන තවත් විශාල ප්‍රදේශයක් සෑදීමෙන් අනතුරුවය. ඒ අනුව බරෝවක් යනු මේ සියල්ලේම එකතුවකි.

නිව්යෝර්ක් නගරය සාමාන්‍යයෙන් හඳුන්වන්නේ බරෝ පහ (ෆයු බරෝස්) යනුවෙනි. එම බරෝ පහ මෙසේය.

1. මැන්හැටන්
2. බෲක්ලින්
3. ක්වීන්ස්
4. බ්‍රොන්ක්ස් සහ
5 . ස්ටැටන් අයිලන්ඩ් ය.

මෙම බරෝ ඇති කරන ලද්දේ 1898 දී නගරයේ නව සීමාවන් පනවන අවස්ථාවේදීය. නිව්යෝර්ක් නගරය ඇමෙරිකාවේ නිෂ්පාදන කටයුතු, විදේශීය වෙළඳාම්, බැංකු කටයුතු, මුද්‍රණ හා ප්‍රකාශන කටයුතු, ආදීය සඳහා වන ප්‍රධානතම වාණිජ නගරයයි.

මෙහි පිහිටි ජෝන් එෆ්. කෙනඩි ජාත්‍යන්තර ගුවන් තොටුපළ ලෝකයේ ඇති කාර්‍යබහුලතම ගුවන් තොටුපළකි. පැයකට ගුවන් යානා 80-100 අතර ප්‍රමාණයක් මෙම ගුවන් තොටුපළෙන් අහසට එක්වෙයි.

මේ නිසාම වසරකට නිව්යෝර්ක් නගරය හරහා ගමන් කරන ගුවන් යාන ගණන දැන් මිලියන දෙකත් ඉක්මවා ඇතැයි ගණනය කර ඇත. මේ ඔබත් මමත් ජීවත් වෙන මේ සුන්දර පරිසරය මෙන්ම අපගේ ස්වභාවික වායුවත් දුෂණය වන අලුත්ම ක්‍රමයයි. මෙය දියුණුවක් යැයි කියන්නේ අධ්‍යාත්ම දියුණුවක් ගැන කිසිසේත්ම නොදන්නා අය පමණි. මෙපමණ ගුවන් යානා ප්‍රමාණයකින් වායුවට එක්වන විෂ වායුව කොපමණක් ද යන්න ඔබත් මොහොතකට සිතා බලන්න.

නිව්යෝර්ක් නගරය ඇමෙරිකාවේ ජනාකීර්ණම නගරයයි. 2008 වර්ෂයේ ජනසංගණනයට අනුව මෙහි මිලියන දහයක පමණ ජනගහනයක් වාසය කරයි. එහෙත් මෙහි භූමි ප්‍රමාණය ඇත්තේ වර්ග කිලෝමීටර් 790 ක් පමණි. නගරාසන්න ප්‍රදේශයේ ජනගහනය මිලියන 20 කට ආසන්නය. 1785 -1790 දක්වා ඇමෙරිකාවේ ප්‍රධාන නගරය වූයේ නිව්යෝර්ක්ය. 1790 සිට එය හඳුන්වනු ලබන්නේ ඇමෙරිකාවේ ප්‍රධාන නගරය ලෙස නොව ඇමෙරිකාවේ විශාලම නගරය ලෙසටය.

නිව්යෝර්ක් නගරයේ ඉතාමත්ම ප්‍රසිද්ධ ස්ථාන ලෙස සැලකෙන්නේ ලිබර්ටි ස්ටැචු හෙවත් නිදහසේ පිළිරුව, වර්ල්ඩ් ට්‍රේඩ් සෙන්ටර්, එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ල, රොකෆෙලර් සෙන්ටර්, මැන්හැටන්, ටයිම්ස් චතුරශ්‍රය, ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් වැනි ස්ථානයන්ය. ලෝකයේ දක්නට ඇති උසම ගොඩනැගිලි අතරින් කීපයක්ම නිව්යෝර්ක් නගරයේ දක්නට ඇත.

භාෂා 175 ක් පමණ කතා කරන ජනතාවක් මෙහි වාසය කරයි. නිව්යෝර්ක් නගරය ''කිසිදා නොනිදන නගරය'' නමින් ද හඳුන්වති. මෙම නගරය හඳුන්වන තවත් නම් අතර ''ගෝතම්'', ''බිග් ඇපල්'' , හා ''ලෝකයේ අග නගරය'', යන නම් ද ඇත.

## නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ වස් සමාදන් වීම

අපේ හාමුදුරුවෝ, සීලානන්ද හාමුදුරුවෝ, 2002 වර්ෂයේ ඇසළ පුරපසළොස්වක පොහෝ දිනයට වස් සමාදන් වීමේ අදහසින් නිව්යෝර්ක් බෞද්ධ විහාරයට වැඩම කළහ. උන්වහන්සේ ජුලි මස 20 වෙනි දිනට යෙදී තිබුණ ඇසළ පුර පසළොස්වක පොහෝ දින නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ වස් සමාදන් වූහ. වස්කාලය තුළ සිංහල භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් ද විවිධ ධර්මදේශනා හා භාවනා වැඩසටහන් රාශියක් මෙහෙය වූහ. ඒ අනුව උන්වහන්සේගේ භාවනා වැඩසටහන් හා ධර්මදේශනා වලට සහභාගි වූ දහම් රස හඳුනන පිරිස් උන්වහන්සේට විවිධාකාරයෙන් සැලකූහ. ගරු කළහ. උන්වහන්සේගේ එම සදුත්සාහයන් අගය කළහ.

විශේෂයෙන් මෙම වස්කාලය උන්වහන්සේ තම ජීවිතයේ ලද සුවිශේෂ අවස්ථාවක් ලෙස සලකා ඉතාමත් හොඳින් බණ භාවනා කටයුතු වලට හා පොත පත ලිවීමේ කටයුතුවලට යොදාගනිමින් ඉතා ප්‍රයෝජනවත් අයුරින් ගත කළහ.

මෙම වස් කාලය තුළම උන්වහන්සේ ඇමෙරිකාවට පමණක් නොව කැනඩාවට ද වැඩම කොට කැනඩාවේ මොන්ට්‍රියල් හා ඔට්ටාවා යන ප්‍රදේශවල ද භාෂා දෙකින්ම භාවනා වැඩසටහන් සහ ධර්ම දේශනා පැවැත්වූහ. උන්වහන්සේ මෙසේ මුල්ම වරට කැනඩාවට වැඩම කළේ 2002

සැප්තැම්බර් මස 4 වැනි දාය. විශේෂයෙන්ම මෙහි දී උන්වහන්සේ මොන්ට්‍රියල් හි ලවල් භාවනා මධ්‍යස්ථානය මුල් කරගෙන විශේෂ ධර්ම දේශනා හා භාවනා වැඩ සටහන් පැවැත්වූහ. එම දේශනා ඉතාමත් සාර්ථක වූ අතර ඒ දේශනා සඳහා ශ්‍රී ලාංකික පිරිස මෙන්ම  වියට්නාම් ජාතික හා කැනේඩියානු ජාතික පිරිස් ද යන කවුරුත් සහභාගී වූහ. ඒ සැම දෙනෙක්ම උන්වහන්සේගේ දේශනා හා භාවනා වැඩසටහන් අගය කළහ.

මෙසේ උන්වහන්සේගේ මෙම කැනඩා සංචාරයේ දී දැන හඳුනාගත් පිරිස් උන්වහන්සේට නැවතත් කැනඩාවට ඉක්මනින්ම වඩින ලෙස ආරාධනා කළෝය.

මේ නිසා සීලානන්ද හාමුදුරුවෝ වස් කාලය අවසන් වීමෙන් පසු නැවතත් කැනඩාවට වැඩම කිරීමට අදහස් කළහ. ඒ අනුව කැනඩාවේ මොන්ට්‍රියල්හි පඤ්ඤාරාම භාවනා මධ්‍යස්ථානයේ වැඩ වාසය කරන උන්වහන්සේගේම කර්මවාගාචාර්යත්වයෙන් ශ්‍රී ලංකාවේදී  උපසම්පදාව ලත් ඤාණෝභාසී නම් භික්ෂුණියගේ ප්‍රධානත්වයෙන් කළ ආරාධනයක් ද ඇතිව නොවැම්බර් මස 02 වෙනි දින නැවත කැනඩාවට වැඩම කොට මොන්ට්‍රියල් හි ලවල් නම් ප්‍රදේශයේ පිහිටි භාවනා මධ්‍යස්ථානයේ වැඩ සිටිමින්  ටික කලක් එහි සේවය කළහ.

මේ කාලය තුළ මොන්ට්‍රියල් නගරයේ වාසය කරන නිමල් ප්‍රනාන්දු, තිලානි ප්‍රනාන්දු,, සිරි ජයසිංහ, ආනන්ද, ප්‍රදීපා පෙරේරා, සුදේශිකා පෙරේරා, කෝකිලා, වැනි ලාංකික පිරිස ද වියට්නාම් ජාතික අග්ගසාමි හිමි සහ ඤාණෝභාසී භික්ෂුණිය මෙන්ම චිත්ත හා සුභා ඇතුළු පිරිස ද උන්වහන්සේ ගැන සොයා බලමින් ඉතා කරුණාවෙන් හා ගෞරවයෙන් යුතුව සිවුපසයෙන් උන්වහන්සේට උපස්ථාන කළහ.

මෙසේ මෙම භාවනා මධ්‍යස්ථානය මුල් කරගෙන සිය ධර්ම දූත මෙහෙවර දිගු කලක් ඉටු කිරීමට උන්වහන්සේ සැලසුම් කළද උන්වහන්සේට එය සාර්ථක කරගැනීමට විශේෂ බාධාවක් විය. එම බාධකය නම් මොන්ට්‍රියල් නගරයේ පැවති භාෂාමය ප්‍රශ්නයයි. කැනඩාවේ අනිත් සියලුම ප්‍රදේශවලට වඩා වෙනස් ප්‍රදේශයකි මොන්ට්‍රියල්. මෙහි වැඩි දෙනෙකු කතා කරන්නේ ප්‍රංශ භාෂාවෙනි. ප්‍රංශ භාෂාව නැතිව මෙහි කිසිවක් කිරීමට බැරි තරම්ය. ඒ නිසා අපේ හාමුදුරුවන්ටත් සිය ධර්ම දූත මෙහෙවර සාර්ථක කරගැනීමට නම් අනිවාර්යයෙන්ම ප්‍රංශ භාෂාව ඉගෙන ගත යුතු විය.

මේ අ නුව උන්වහන්සේ ප්‍රංශ භාෂාව ඉගෙන ගැනීමට ද කිසියම් උත්සාහයක් ගත්හ. එහෙත් මෙම ප්‍රදේශයේ වාසය කරන අයට ප්‍රංශ භාෂාවෙන් බුදුදහම කියා දීමට තරම් ප්‍රංශ භාෂාව පිළිබඳ හොඳ දැනුමක් ලබා ගැනීමට නම් අවම වශයෙන් උන්වහන්සේට වසර හතරක් පහක් වත් යන බව තේරුම් ගත් උන්වහන්සේ මෙම නගරයේ වාසය කිරීම ගැන මන්දෝත්සාහී වූහ. දිනෙන් දිනම උන්වහන්සේගේ සිත කියන්නට පටන්ගත්තේ නොදන්නා ප්‍රංශ භාෂාවක් ඉගෙන ගන්නට ගත කරන කාලයට වඩා දන්නා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමට සුදුසු තැනක් ඇමෙරිකාවෙන් සොයා ගැනීම උචිත බවය. එහෙත් මොන්ට්‍රියල් උන්වහන්සේගේ සිත ගත් කැනඩාවේ විශේෂ නගරයකි.

## කැනඩාවේ මොන්ට්‍රියල් නගරය

මොන්ට්‍රියල් නගරයක් බවට ප්‍රකාශයට පත්වූයේ 1802 දී ය. මෙය දියුණුවට පත්වූයේ ' ලචින් ' නමැති ඇළ මාගර්ය විවෘත වීමත් සමගය. මොන්ට්‍රියල් 1844 සිට 1847 දක්වා කැනඩාවේ එක්සත් මහ දිසාවේ ප්‍රධාන නගරය ලෙස පැවතිනි.

1860 වන විට බ්‍රිතාන්‍යයන් යටතේ පැවති මෙම උතුරු ඇමෙරිකාවේ, කැනඩාවේ පිහිටි කිසිම ආර්ථික හා සංස්කෘතික අරගලයකින් තොර එකම මධ්‍යස්ථානය බවට පත් වූයේ මෝනට්‍රියල්ය. 1883 හා 1918 අතර කාලය තුළ ගොඩ නැගුණ අවට නගර ද මොන්ට්‍රියල් නරගයට ඒකාබද්ධ වීම නිසා මොන්ට්‍රියල් නැවතත් බොහෝ දුරට ප්‍රංශ භාෂාව කතා කරන ජනතාවගෙන් යුත් නගරයක් බවට පත්විය.

1920 ත් 1930ත් අතර කාලය ඇමෙරිකාවේ ඇතිවූ මත්ද්‍රව්‍ය තහනම නිසා මොන්ට්‍රියල් නගරය ඇමෙරිකානුවන්ට සරණාගත ස්ථානයක් බවට පත්විය. ලෝකයේ අනිත් රටවල් සමග බලනවිට ලොකු අසහනකාරී බවක් තිබුණ ද 1930 වනවිට එය වියැකී ගොස් විවිධාකාරයෙන් අහස උසට ගොඩනැගිලි ආදිය සැදෙන්නට පටන් ගත්තේය. 1950 වනවිට මොන්ට්‍රියල්හි ජනගහන මිලියනය ඉක්මවිය.

මොන්ට්‍රියල් නගරය ද නිව්යෝර්ක් නගරය මෙන්ම විශේෂයෙන් ආරකෂාවෙන්නේ ගග නිසාය. ඒ ලෝරන්ස් ගංගාව නිසයි. මෙම ලෝරන්ස් ගංගාව නිසාම මොන්ට්‍රියල් දිවයිනක් මෙනි. මෙම මොන්ට්‍රියල් නගරය දිගින් කිලෝමීටර් 50 පමණ වන අතර පළලින් කිලෝමීටර් 16 පමණ වේ. මෙහි මධ්‍යම ප්‍රදේශයේ මීටර් 230 පමණ ප්‍රදේශයෙහි කඳු දක්නට ඇත. මෙහි මුල්ම පදිංචිකරුවන් ලෙස සැලකෙන්නේ වසර දහස් ගණනක් කිබෙක් ප්‍රදේශයේ ජිවත්වූ අයිරෝක්විස් ජාතිකයන්ය.

1535 දී මෙහි පැමිණි ජක්විස් කාටියර් නම් වු ප්‍රංශ ජාතික ගවේෂකයා මෙම භූමියට පැමිණි මුල්ම යුරෝපීයයා ලෙස සැලකේ. ඔහු සහ ඔහු සමග පැමිණි පිරිස කන්දට නැග කුරුසයක් තබා මෙම භූමිය ප්‍රංශ භාෂාවෙන් ''මොන්ට්රෝයල්'' නමින් නම් කළහ.

විශේෂයෙන්ම අද අපට දක්නට ඇති මොන්ට්‍රියල් නගරය එක්ස්පෝ 67 නිසාත්, 1976 ඔලිම්පික් නිසාත්, ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත්වූ දියුණුවට පත් වූ නගරයයි. අද මොන්ට්‍රියල් නගරයේ ජනගහනය (2006 සංගණනයට අනුව) 16 206 93 පමණ වන අතර නගරාසන්නයේ පදිංචි ජනගහනය 36 35 5 71 ක් පමණ වේ. මොන්ට්‍රියල් හෙවත් මොන්ට් රෝයල් නගරය අදත් විශේෂ නගරයක් බවට පත් ව ඇත්තේ කැනඩාවේ රාජ්‍ය භාෂා දෙකෙන් එකක් වන ප්‍රංශ භාෂාව කතාකරන කිබෙක් ජාතිකයන් බොහෝ සෙයින් ජීවත් වෙන සාම්ප්‍රදායික නගරයක් වන බැවිනි.

මෙම මොන්ට්‍රියල් නගරයේ මාස හතරක පමණ කාලයක් වැඩ සිට අපේ හාමුදුරුවෝ, තම ධර්ම දූත සේවය නිසි පරිදි එහි කරගෙන යාම සඳහා පැවති මෙම භාෂාමය බාධකය දැක ඇමෙරිකාවේ දහම් සේවය කිරීමේ ඇති පහසුවත් දැක, නැවතත් 2003 මාර්තු මස 06 වැනි දින ඇමෙරිකාවේ නිව්යෝර්ක් බෞද්ධ විහාරයටම ආපසු වැඩම කළහ.

## ඇමෙරිකාවේ චීන පන්සලේ සදහම් සේවය

"චොන්ග් යෙන් මොනස්ටරි" නමින් හඳුන්වන චීන පන්සල උතුරු ඇමෙරිකාවේ ඇති විශාලතම විහාරස්ථානයකි. මෙය අක්කර 225 ක් විශාල විහාරස්ථානයක් වන අතර එය මහායාන සම්ප්‍රදායට අයත් වූවකි.

මෙම විහාරස්ථානයට සිය දහස් ගණනින් පිරිස් රැස්වෙන්නේ එහි ඇති විශාල බුදුපිළිමය හා මහා විහාරය නැරඹීමටය. එසේ පැමිණෙන ඇමෙරිකානුවන්ට ථෙරවාදී

බුදුදහම ගැන කියා දීමටත් මුල් බුදුදහම අනුව භාවනාව යනු කුමක්දැයි හඳුන්වාදීමටත් ථේරවාදී භික්ෂූන් වහන්සේ නමක් අවශ්‍ය වී තිබුණි.

අපේ සීලානන්ද හාමුදුරුවෝ කැනඩාවේ සිට නැවතත් ඇමෙරිකාවට පැමිණිවිට මෙම විහාරස්ථානයේ අධිපති මාස්ටර් පිරු හිමියෝ නිව්යෝර්ක් විහාරයටම පැමිණ සීලානන්ද හිමියන්ට එහි වැඩම කොට එහි නතර වී සිටිමින් භාවනා වැඩසටහන් පවත්වන ලෙසත් විශේයෙන්ම සති අන්තයේ ඉංග්‍රීසියෙන් දේශනයක් දෙකක් පවත්වන ලෙසත් ආරාධනා කළහ.

එම ආරාධනය පිළිගත් සීලානන්ද හිමියෝ 2003 අප්‍රේල් මස 04 වෙනි දින චොන්ග් යෙන් මොනස්ටරියේ නතර වීමට ගියහ. උන්වහන්සේ එම විහාරස්ථානයේ නතර වී සිටියද නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ සිදු කෙරුන විවිධ පින්කම් වලට සහභාගී වූහ. එසේම සතියකට දෙකකට වරක්වත් නිව්යෝර්ක් බෞද්ධ විහාරයට වැඩම කළහ. මෙසේ මෙම විහාරස්ථාන දෙකෙහිම ආගමික සාමාජික හා සංස්කෘතික උත්සව අවස්ථාවලට සහභාගීවෙමින් සේවය කරමින් උන්වහන්සේ සුවිශේෂ සේවයක් සිදුකළහ. මිනිසාට සේවය කිරීම සඳහා කෙනෙකුට අවශ්‍ය වෙන්නේ මිනිස්කම හා හොඳ හිත පමණයි.

මෙම කාලය තුළ විශේෂයෙන්ම උන්වහන්සේ කාමෙල් නගරයේ පිහිටි සිරගෙදරට වැඩම කරමින් එහි සිටින තරුණ තරුණියන්ට බුදුදහම සහ භාවනාව කියා දෙමින් ඒ අය සුවපත් කිරීමට මානසික සැනසීම ලබාදීමට සමත් වූහ. මෙහිදී උන්වහන්සේට හමුවූ බ්‍රැන්ඩන් හා ෆැන්ක් යන ඇමෙරිකානු තරුණයින් දෙදෙනා උන්වහන්සේගෙන් ධර්මය අසා අතිශයින්ම පැහැදුණ අතර ඉන් පසුව එම දෙදෙනාම

සිරගෙදර දීත් අට සිල් සමාදන්ව කාලය ගත කළ බව උන්වහන්සේ පවසති.

මෙසේ මිනිමරුවන්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් වැනි සාපරාධීන් ලෙසින් සිටි මෙම තරුණ තරුණියන්ට බුදුදහමේ ආශ්වාදය ලැබීමත් සමග ඔවුන්ගේ ආකල්ප සම්පූර්ණයෙන්ම වෙනස් වී සුචරිතවත් වූ අතර ඔවුහු  දවසින් දවස යහපත් ගති ගුණ ප්‍රදර්ශනය කිරීම නිසාම සිරගෙයින් ද නිදහස් කරනු ලැබිය. අදත් මෙම දෙදෙනාම උන්වහන්සේට විටින් විට කතා කරමින් බුදුදහම ඉගෙන ගනිමින් භාවනාව ප්‍රගුණ කරති. බුදුදහම අනුව ජීවත් වීමට උත්සාහ කරති. බුදුදහම ලොව වසන සෑම කෙනෙකුටම අනුගමනය කිරීමට හැකි සුවිශේෂ දේශනයකි. එය හුදු ආගමක් හෝ දර්ශනයක් නොව ජීවන ප්‍රතිපදාවකි. මෙය දේශනා කොට ඇත්තේ මිනිසාගේ සිත අවදි කිරීමටය. මිනිස් සිත උපරිම තලයට දියුණු කළ හැක්කේ බුදු දහමට අනුව සිත ප්‍රගුණ කිරීමෙන් පමණි. සියලු දෙව් මිනිසුන් උදෙසා දේශනා කොට වදාළ බුදුදහම ලොව ඇති එකම සත්‍ය දර්ශනයයි. එදා අපේ හාමුදුරුවන් වහන්සේ මේ සිරගත ව සිටි තරුණ තරුණියන්ට කියා දුන්නේ මේ සත්‍ය දර්ශනයයි. මේ නිසාම ඔවුහු  බුදුදහමේ සිසිල ලබමින්  බුදුන් වදාළ භාවනාව ප්‍රගුණ කරගනිමින් සුවපත් වූහ.

තවද අපේ හාමුදුරුවන් වහන්සේ මෙම කාලය තුළම එම  කාමෙල් ප්‍රදේශයේත් කෙනක්ටිකට් නම් ප්‍රදේශයේත් වාසය කරන ශ්‍රී ලාංකික පින්වතුන්ට තම නිවෙස් වල වරින් වර විශේෂ භාවනා වැඩ සටහන් සංවිධානය කිරීමට අවස්ථාව සලසා දෙමින් උන්වහන්සේ ඒ ඒ නිවෙස් වලට වැඩම කොට භාවනාව සහ නිමල බුදුදහම කුමක්දැයි එම පින්වතුන්ට ද  කියා දෙමින් සුවිශේෂ ධර්ම සාකච්ජා සහ භාවනා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරමින් විශේෂ මෙහෙයක් ඉටුකළහ. මෙම භාවනා

වැඩ සටහන් ද විශේෂයෙන්ම එම ශ්‍රී ලාංකික පිරිස අතර ජනප්‍රිය වැඩසටහනක් බවට පත්විය.

උන්වහන්සේ 2006 වර්ෂයේ දී ඇමෙරිකාවට වඩා සාමයෙන් සැනසීමෙන් ජීවත්වීමේ අපේක්‍ෂාවෙන් යුත්තව ලෝකයේ ඇති සාමකාමී රට ලෙස සැලකෙන කැනඩාවේ එඩ්මන්ටන්හි පදිංචිය සඳහා වැඩම කරන තෙක්ම මෙම වැඩසටහන නිව්යෝර්ක්, කෙනක්ටිකට් සහ බොස්ටන් යන ජනපද මුල්කරගනිමින් ඒ ඒ නගරවල වරින් වර පවත්වමින් සිය සදහම් සේවය සිදු කළහ. මෙම සදහම් සේවාව සිදුකිරීම සඳහා විශේෂයෙන්ම උන්වහන්සේට පුබුදු රණසිංහ සහ දිලන්ති රණසිංහත්, ස්වර්ණ ශ්‍රී අධිකාරි සහ ලක්ෂි අධිකාරිත් මහත් සේ උපකාරීව සහයෝගීව සිටි බව උන්වහන්සේ පින් පෙරටුව සඳහන් කරති.

මෙසේ අපේ සීලානන්ද හාමුදුරුවෝ චීන පන්සල මුල්කර ගනිමින් එම ප්‍රදේශයේ දායක දායිකාවන්ගේ සිත් දිනාගෙන 2005 ජනවාරි මස 01 වැනි දින දක්වා එහි වාසය කරමින් බුදුපියාණන් වහන්සේගේ නිර්මල වූ සදහම් පණිවිඩය ඇමරිකානුවන්ටත් චීන ජාතිකයන්ටත් එහි පැමිණෙන ශ්‍රී ලාංකිකයන්ටත් කියා දුන්හ. මෙම කාලය තුළ මෙම චොන්ග් යෙන් මොනස්ටරිය හෙවත් චීන විහාරස්ථානයට සමීපයේ එනම් චෝපින්ජර් ප්‍රදේශයේ ජීවත්වෙන නිමල් හා විජිතා පලිහක්කාර යුවළත්, අබේසේකර යුවළත් විශේෂයෙන්ම අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ගැන සොයා බලමින් උපකාරී වූ බව උන්වහන්සේ පින් පෙරටුව සිහිපත් කරති.

## නැවතත් නිව්යෝර්ක් බෞද්ධ විහාරයට

නිව්යෝර්ක් බෞද්ධ විහාරාධිපති ගරු කුරුණෑගොඩ

පියතිස්ස නාහිමිපාණන් වහන්සේගේ අසනීප තත්ත්වයන් නිසාත් එම විහාරස්ථානයේ වැඩ සිටින ගරුතර සංඝරත්නයේ ඉල්ලීම නිසාත් නිව්යෝර්ක් හි වාසය කරන ශ්‍රී ලාංකික පින්වතුන් කීප දෙනෙකුගේම ඉල්ලීම නිසාත් සීලානන්ද හිමියන් චීන පන්සලේ සේවයෙන් සමුගෙන නැවතත් නිව්යෝර්ක් බෞද්ධ විහාරස්ථානයට වැඩම කළේ එහි සිටින ශ්‍රී ලාංකිකයන්ටත් ඇමෙරිකානුවන්ටත් බුදුදහම කියා දෙමින් භාවනාවට හුරු පුරුදු කිරීමටය. ඒ  අනුව සීලානන්ද හිමියෝ චීන පන්සලේ සිටින කාලය තුළ යමින් එමින් මෙම විහාරස්ථානයේ සිදු කළ සේවාවන් තව තවත් වැඩි කළහ.

විශේෂයෙන්ම සීලානන්ද හිමියෝ ඇමෙරිකාවට පැමිණි දවසේ සිට නිව්යෝර්ක් බෞද්ධ විහාරයෙන් නිකුත් කරන ''බෝසත්'' සඟරාවේ කතුවරයා වශයෙන් කටයුතු කළහ.  විවිධ සඟරා මෙන්ම ධර්ම  ලිපි ද ලියා පළ කළේය. සෑම සිකුරාදා දිනකම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ධර්ම සාකච්ඡාවක් පැවැත්වීම, සෙනසුරාදා දිනවල සිංහල මාධ්‍යයෙන් ධර්ම සාකච්ඡාවක් පැවැත්වීම, විවිධ අවස්ථාවල විහාරස්ථානයට පැමිණෙන විශේෂ කණ්ඩායම් වලට ඉංග්‍රීසියෙන් බුදුදහම කියා දීම, සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් පොත පත ලිවීම, ආදී කටයුතු උන්වහන්සේගෙන් සිදුවිය. විශේෂයෙන්ම''නිව් වර්ල්ඩ්'' නමින් හඳුන්වනු ලබන  මෙම ඇමෙරිකාවටම ගැලපෙන පරිදි උන්වහන්සේ විසින්  ''ඒන්ෂන්ට් විෂ්ඩම් ටු ද නිව් වර්ල්ඩ් සිස්ටම්'' නමින් විශේෂ ධර්ම පත්‍රිකාවක් මාසිකව මුද්‍රණය කරවා නොමිලේ බෙදා දෙන ලදී. අදත් එම ධර්ම පත්‍රිකා නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ වෙබ් අඩවියෙන් ඔබටත් දැකගත හැකිය, කියවිය හැකිය.

තවද සීලානන්ද හිමියන් විසින් ඇමෙරිකාවේ සිටින කාලය තුළම ''බුදුරජාණන් වහන්සේගේ ඒකායන මාර්ගය''

නමින් සිංහලෙන් භාවනාව සම්බන්ධව පොතක් ලියා ලංකාවේ දයාවංශ ජයකොඩි සමාගමෙන් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කර ඇති අතර නැවත ඉංග්‍රීසි මාධ්‍යයෙන් "ද බුද්ධාස් යුනීක් පාත් " නමින් භාවනාව සම්බන්ධයෙන් පොතක් සහ " ඇටෑච්මන්ට් ඇන් ඩිටෑච්මන්ට්" නමින්  ඇලීම සහ නොඇලීම පිළිබඳව ද පොතක් මුද්‍රණය කරවා නොමිලේ බෙදා දී ඇත. අපේ සීලානන්ද හිමියන් විසින් ලියන ලද මෙම පොත් එකකටවත් උන්වහන්සේ කිසිම කෙනෙකුගෙන් සතයක් වත් ලබා නොගැනීම උන්වහන්සේගේ විශේෂත්වයකි. උන්වහන්සේ එක පොතකට එක ඩොලරය බැගින් ලබාගත්තේ නම් එයම උන්වහන්සේට විශාල මුදලකි. තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් සුදේශිත ඒ "අමිල බුදුවදන කිසිදිනකත් මිළට නොදෙමි" යනු උන්වහන්සේගේ උතුම් චින්තනයයි.

නිව්යෝර්ක් බෞද්ධ විහාරස්ථානයේ වැඩ සිටින ගරු පාරඹේ සිරිනිවාස, අලුත්ගම ධම්මජෝති, අක්මීමන නාගිත, කොට්ටාවේ නන්ද, හැව්ඕවිට ගුණානන්ද, ඇරැගම සිරිසුමන යන ස්වාමීන් වහන්සේලා සීලානන්ද හිමියන්ගේ මෙම ශාසනික හා ආධ්‍යාත්මික සියලු කටයුතු වලට සහාය වු බව උන්වහන්සේ අදත් කෘතඥතා පුර්වකව සිහිකරති. තවද උන්වහන්සේ නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ වැඩ සිටි කාලය තුළ උන්වහන්සේ ගැන සොයා බලමින් සිව් පසයෙන් විවිධාකාරයෙන් උදව් උපකාර  කළ ලොකු කුඩා සියලුම දායක දායිකා පින්වතුන්ට   උන්වහන්සේ විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන අතර සිය කෘතඥතා පෙරටුව  පුණ්‍යානුමෝදනය කරති.

විශේෂයෙන්ම විහාරාධිපති කුරුණෑගොඩ පියතිස්ස නාහිමියන් වහන්සේ සීලානන්ද හිමියන්ට ධර්ම කරුණු සොයා ගැනීමේදී අතිශයින්ම උපකාරවත් වූ අතර උන්වහන්සේ සීලානන්ද හිමියන්ට බුදුරජාණන් වහන්සේගේ දේශනයට අනුව

පුතු සෙනෙහසින් සැලකූ බව සීලානන්ද හිමියෝ පින් පෙරටුව සඳහන් කරයි.

විනය පිටකයේ මහාවග්ගයේ උපජ්ඣාය වත පෙන්වා දෙමින් තථාගත ලොවුතුරා බුදුපියාණන් වහන්සේ අපට දේශනා කළේ " උපජ්ඣායෝ භික්ඛවෙ සද්ධිවිහාරිකංහි පුත්ත චිත්තං උපට්ඨපෙස්සති. සද්ධිවිහාරිකො උපජ්ඣායංහි පිතුචිත්තං උපට්ඨපෙස්සති." යනුවෙන් මෙසේ එකිනෙකාට පුතු හා පිය සෙනෙහසින් යුක්තව එකම විහාරයේ වාසය කරන උපාධ්‍යාය අන්තේවාසික යන භික්ෂූන් විසින් පිළිපැදිය යුතු බවය. නිව්යෝර්ක් බෞද්ධ විහාරාධිපති නාහිමියෝ අපේ සීලානන්ද හිමියන් ඇතුළු විහාරවාසී භික්ෂූන් වහන්සේලාට පුතු සෙනෙහසින් සැලකූ අතර අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ඇතුළු සෙසු භික්ෂූන් වහන්සේලාද උන්වහන්සේට එම ගෞරවය නොඅඩුව ලබා දෙමින් පිය කෙනෙකුට මෙන් සැලකූහ.

නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ ජීවත් වූ කාලය තුළ අපේ සීලානන්ද හාමුදුරුවෝ පුරුද්දක් වශයෙන්ම දිනපතාම භාවනාව ප්‍රගුණ කළ අතර දිනපතා සවස 7:00 ට ගිලන්පස බුද්ධ පූජාව තැන්පත් කිරීමත් අවම වශයෙන් පැයක් වත් භාවනා කිරීමත් දෛනික කාලසටහනේ කොටසක් බවට පත්කරගෙන සිටියහ. උන්වහන්සේ නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ වැඩසිටින කාලය තුළ බොහෝ දෙනාට ආදර්ශයක් ලබාදෙමින් බුදුදහම හා භාවනාව දෛනිකව ප්‍රගුණ කරන ආකාරය කියාදුන්හ. විශේෂයෙන්ම උන්වහන්සේ භාවනාව පුහුණු කරවන ගුරුවරයෙකු වශයෙන් අවවාද රාශියක් දෙනවාට වඩා එක් ආදර්ශයක්වත් දීම උතුම් බව ශ්‍රේෂ්ඨබව තේරුම් ගෙන කටයුතු කළහ. එබැවින් උන්වහන්සේ විවිධ අයට අවවාද කිරීමට වඩා ආදර්ශ දීමටම උත්සුක වූහ.

මෙසේ සීලානන්ද හාමුදුරුවෝ නිව්යෝර්ක් බෞද්ධ විහාරය මුල්කරගෙන උන්වහන්සේගේ ධර්මදූත සේවාවන් කළද උන්වහන්සේ නිව්යෝර්ක් බෞද්ධ විහාරයට සම්බන්ධ, නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ ශාඛා වශයෙන් පවත්වාගෙන යන ස්ටැටන් අයිලන්ඩ් බෞද්ධ විහාරය සහ නිව්ජර්සි බෞද්ධ විහාරයේ ද විවිධ භාවනා වැඩසටහන් මෙන්ම ධර්ම දේශනා ධර්ම සාකච්ජා පවත්වමින් එම විහාරස්ථාන වල ද දායක දායිකාවන්ගේ සිත් සතන් සනසා ලමින් සුවිශේෂ සේවයක් සිදුකළහ.

තවද උන්වහන්සේ නිව්යෝර්ක් නගරයෙන් ඈත පිහිටි බොස්ටන්, කනෙක්ටිකට්, චිකාගෝ, ටෙක්සාස්, මිසොරි, ඔරිගන්, ප්ලොරිඩා, මිනෙසොටා වැනි ප්‍රාන්තවලටද වැඩම කරමින් ශ්‍රී ලාංකිකයන්ටත් ඇමෙරිකානු වැසියන්ටත් මෙන්ම චීන හා වියට්නාම් ජාතික ඇමෙරිකානුවන්ටත් බුදු දහම සහ භාවනාව කියාදෙමින් ඉමහත් සේවයක් සිදුකොට කළහ.

විශේෂයෙන්ම උන්වහන්සේ විසින් එදා ආරම්භ කරමින් පවත්වාගෙන ආ එම විශේෂ භාවනා පංති ධර්ම දේශනා සහ ධර්ම සාකච්ජා වැඩ සටහන් අදත් වර්ෂයකට වරක් ටෙක්ෂස් මිසොරි නිව්යෝර්ක් බොස්ටන් වැනි ජනපදවලට වැඩම කරමින් පවත්වති. එදා එම ජනපදවල පැවැත්වූ භාවනා පංති නිසා අද වන විට විශාල පිරිසක් නිවැරදි බුදුදහම හෙවත් නිමල බුදුදහම කුමක්දැයි තේරුම්ගෙන සිටිති. එයම අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට ඉමහත් පිනකි.

ටෙක්ෂස් ප්‍රදේශයේ එදා පුංචි තැනක පැවැත්වූ භාවනාව හා ධර්මදේශනාදිය අද පවත්වන්නේ අක්කර පන්සියයක් විශාල 'බෝධි මධ්‍යස්ථානය' නම් වූ චීන ජාතිකයන්ගේ බෞද්ධ මධ්‍යස්ථානයකය. චීන ජාතිකයන්

මහායාන බෞද්ධයන් වුව ද දැන් බොහෝ දෙනෙකුට ථෙරවාද බුදුදහමේ නිවැරදි බව තේරුම් ගොස් ඇත.මේ නිසාම බොහෝ මහායාන විහාරස්ථාන වල දැන් ථෙරවාද සූත්‍රදේශනා භාවිත කරන අතර ථෙරවාදී බුදු දහම සහ භාවනාව උගන්වති. දැන් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ වැනි ධර්මධර විනයධර මෙන්ම ශික්ෂාකාමී ප්‍රායෝගික ස්වාමීන් වහන්සේලා විශාල වශයෙන් ඔවුන්ට ද අවශ්‍ය වී ඇත.

සීලානන්ද හාමුදුරුවෝ නිව්යෝර්ක් නගරයේ ජීවත් වූ කාලය උන්වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ යුගයක් ලෙස සැලකෙන්නේ මෙම ලෝකයේ ඉතාමත්ම කලබලකාරී නගරයේ සිටිමින් ජීවත් වුව ද ධර්මානුකූලව ජීවත්වීමට කළ උත්සාහය නිසාය. විවිධ වැරදි කරන අය දකිමින් ඒ වැරදිවලට හසු නොවී සිටීමට තමා වෙහෙස දැරූ අතර එම උත්සාහය සාර්ථක වීම නිසාම උන්වහන්සේ අදත් සතුටු වෙති.

නිව්යෝර්ක් නගරයේ ජීවත්වන සමහර උදවිය ධර්මයෙන් පිට පැන ජීවත්වෙන බව නොරහසකි. විවිධාකාරයෙන් අදැහැමි වෙළඳාම් ආදියට පෙළඹෙති. එයට හේතු රාශියකි. කෙසේ හෝ අදැහැමින් වර්ෂ සියයක් ජීවත්වෙනවාට වඩා දැහැමින් එක් දිනක් ජීවත්වීම උතුම් බව සීලානන්ද හිමියෝ තේරුම් ගෙන ජීවත් වූහ. විශේෂයෙන්ම මුදල් උපයා ගැනීම සඳහා දැහැමි මාර්ග අනුගමනය කරන්නෝ සමාජයේ ටික දෙනෙකි. මේ රටවලට ඇවිත් සිටින්නේ කෙසේ හෝ මිළ මුදල් හම්බ කරගැනීමට බව පෙනීයන දෙයකි. ටික දෙනෙක් හෝ ධර්මානුකූලව දිවිගෙවීමට උත්සාහවත් වීම දකින්නට ලැබීම ද අප සැමටම මහත් සතුටකි.

උන්වහන්සේ "වෛරයෙන් ජීවත්වෙන මිනිසුන් අතර මම වෛරයෙන් තොරව ජීවත්වෙමි, රාගයෙන් රත්වී ආතුර

බවට, ලෙඩුන්බවට පත්ව ඇති මිනිසුන් අතර මම ලෙඩෙක් නොවී ජීවත්වෙමි. කාමය පසුපස්සේ හඹාගෙන යන මිනිසුන් අතර මම කාමය පසුපස හඹා නොයමින් ජීවත්වෙමි.'' යන බුදුවදන් නිතර නිතර සිහි කරමින් ජීවත් වූහ.

මෙම කාලය තුළ උන්වහන්සේ ලැබූ අත්දැකීම් රාශිය ශ්‍රී ලංකාව වැනි රටකදී නම් වර්ෂ ගණනාවකින්වත් ලැබිය නොහැකිය. ගිහි සමාජයෙන් මෙන්ම පැවිදි සමාජයෙන් ද බොහෝ කරුණු ඉගෙන ගත් උන්වහන්සේ දිනෙන් දින ඇමෙරිකාවෙන් සමුගත යුතු යැයි සිතුවේ ය. එහෙත් ඊළගට යන්නේ කොතැනකට ද කවුරු ළඟට ද මොන විදියේ පරිසරයකට ද යනාදිය ගැන උන්වහන්සේට සිතන්නට සිදුවිය. මෙසේ කල් ගත වෙද්දී උන්වහන්සේ අපේක්ෂා කළ ආකාරයටම තමන්ගේ සිතුවිලිවලට ගැළපෙන පරිදි තමාට කැමති සේ ජීවත්විය හැකි නිදහස් සාමකාමී පරිසරයක ජීවත්වීමට අවශ්‍ය පසුබිමක් සැකසෙන අයුරු දැනුණි. ඒ කැනඩාවේ සීතලම සීතල ප්‍රදේශයක් වන ඇල්බටා හි පිහිටි එඩ්මන්ටන් නගරයේය.

කැනඩාව ලෝකයේ දෙවෙනි විශාලම රටය. කැනඩා යන්නෙහි තේරුම 'වාසස්ථානය' හෙවත් 'ගම' යන්නය. මෙය මුලින්ම භාවිතයට ගෙන ඇත්තේ 1535 දීය. නැගෙනහිරින් අත්ලන්තික් සාගරයට ද බටහිරින් පැසිෆික් සාගරයටද උතුරින් ආර්ක්ටික් සාගරයට ද දකුණින් ඇමරිකාවට ද මායිම්ව පිහිටා ඇති මෙය පෙඩරල් රාජ්‍යයකි. වර්ග කිලෝමීටර් මිලියන දහයක් පමණ විශාලය. එහෙත් එහි ජනගහනය ඇත්තේ මිලියන 31 පමණි. රාජ්‍ය භාෂා දෙකකි. එනම් ඉංග්‍රීසි භාෂාව සහ ප්‍රංශ භාෂාවය. මුළු රටම පළාත් 10 ක් සහ දේශ තුනකට බෙදා ඇත. ඒ ඒ පළාත්වලට සහ දේශවලට අයත් ප්‍රධාන නරගයක් ඇත. තවද මුළු රටම නැවතත් අත්ලන්තික් ප්‍රදේශය, මධ්‍යම කැනඩාව, ප්‍රෙයරි

ප්‍රදේශ, බටහිර වෙරළ, සහ උතුර යනුවෙන් කොටස් පහකට බෙදා ඇත. මේවා අතුරින් ප්‍රෙයරි ප්‍රදේශයට අයත් පළාත් තුනකි. ඒ මැනිටෝබා පළාත සස්කෙචුවාන් පළාත, සහ ඇල්බටා පළාත යනුවෙනි. එඩ්මන්ටන් යනු ලෝක ගෝලයේ ඉහළම ඉහළ උතුරුකරයේ ඇති මෙම ඇල්බටා ප්‍රාන්තයේ අගනගරයයි.

ඇල්බටා යන ජර්මන් වචනයේ තේරුම 'උතුම්' හෝ 'දීප්තිමත්' යන්නය. මේ වික්ටෝරියා මහරැජිනියගේ හතරවැනි දුවණියගේ නමයි. ඇය 'ලුසී කැරලයින් ඇල්බටා'ය. ඇය **1878-1883** දක්වා කැනඩාවේ ගවනර් ජෙනරාල් ලෙස සිටි 'ලෝන් මාර්ක්විස්'ගේ බිරිඳ වූවාය. **1881**දි මේ යුවල කැනඩාවේ වයඹදිග ප්‍රදේශයට පැමිණියහ. **1882** දී මෙම වයඹදිග ප්‍රදේශය දිස්ත්‍රික්ක හතරට බෙදුණි. එනම් 'ඇසිනිබෝව' 'ඇතැබැස්කා' 'සස්කෙචුවාන්' සහ 'ඇල්බටා' යනුවෙනි. මෙසේ දිස්ත්‍රික්ක වලට නම් කරද්දී ගවනර් ජේනරාල් විසින් සිය බිරිඳට උපහාරයක් ලෙස ඇගේ නමින් 'ඇල්බටා' ව නම් කරන ලදි.

එඩ්මන්ටන් නගරය හෙවත් ඇල්බටා ප්‍රාන්තයේ අගනගරය සස්කෙචුවාන් ගංගාව අසබඩ පිහිටා ඇති ඉතාම සිත්කලු දර්ශනීය නගරයකි. සාරභූමිවලින් යුත් මෙහි ගොවිපළවල් රාශියක් දක්නට ඇත. **2008** වර්ෂය වනවිට මෙහි ජනගහනය **1034945** කි. මෙහි විශාලත්වය වර්ග කිලෝමීටර් **6 8437** කි.

භූමි ප්‍රදේශය අනුව මෙය කැනඩාවේ ටොරොන්ටෝ සහ මොන්ට්‍රියල්, යන නගරවලට වඩා විශාලය. වෙස්ට් එඩ්මන්ටන් මෝල් නමින් ප්‍රසිද්ධ වී ඇති ලෝකයේ විශාලම සාප්පු සංකීර්ණය පිහිටා ඇත්තේ මෙම නගරයේය. මෙහි තෙල්වැලි, දියමන්ති, වැනි ඛනිජ ද්‍රව්‍ය ඇත. මෙම එඩ්මන්ටන් නගරය

''ජයග්‍රාහකයින්ගේ නගරය'', ''උතුරු දොරටුව'', ''උත්සව නගරය'', ''ඊ-නගරය'', ''ගංගා නගරය'', ''කැනඩාවේ තෙල් නගරය'', ''තෙල් රට'', යන අපර නම් වලින් ද හඳුන්වනු ලැබේ.

මෙහි ජීවත්වීම ඉතාම අපහසු වන්නේ වර්ෂයේ මාස හයක්ම අධික සීතල සහිත හිමවලින් යුක්ත වන බැවිනි. කෙසේ වුවද මෙම ප්‍රදේශය ඉතා සාමකාමී ප්‍රදේශයක් බව කවුරුත් පිළිගනිති. අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේගේ සිත ඇද බැඳ ගත්තේ මේ ප්‍රදේශයයි. එයට විශේෂයෙන්ම හේතු වුයේ මෙම ප්‍රදේශයේ වාසය කරන ජනතාවගේ ආචාරශීලීබව සහ සුහදශීලී බවය. මෙහි වාසයට තෝරාගැනීම ද අහම්බෙන් සිදුවුවක් නොවේ.

දිනක් අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට කැනඩාවේ එඩ්මන්ටන් නගරයේ පිහිටි ඇල්බටා බෞද්ධ විහාර සංගමයේ එවකට සභාපති ලෙස සිටි මහේන්ද්‍ර විජයසිංහ නම් මහත්මයෙකුගෙන් විද්‍යුත් තැපෑලෙන් ආරාධනාත්මක ලිපියක් ලැබුණි. එම ලිපියේ සඳහන් වූයේ උතුරු ඇමෙරිකාවේ ජීවත්වෙන සුප්‍රසිද්ධ වු මහ තෙරුන් වහන්සේලා හතර නමක්ම එනම් ගෞරවාර්හ හේනේපොල ගුණරතන, මඩවල පුණ්‍ණජී, මඩවල සීලවිමල සහ දේදුනුපිටියේ උපනන්ද යන ස්වාමීන් වහන්සේලා විසින් සීලානන්ද ස්වාමීන් වහන්සේ එඩ්මන්ටන් ප්‍රදේශයේ ආරම්භ කිරීමට අපේක්ෂිත ශ්‍රී ලංකා විහාරස්ථානයට වැඩමකරවා ගැනීම සුදුසු යැයි සම්මත කොට ඇති බැවින් උන්වහන්සේට එම ආරාධනය පිළිගන්නා ලෙසටය. මේ අනුව අපේ හාමුදුරුවන් වහන්සේ මුලින්ම කළේ නිව්යෝර්ක් බෞද්ධ විහාරාධිපති ගරු කුරුණෑගොඩ පියතිස්ස නාහිමිපාණන් වහන්සේ සමග මේ පිළිබඳව සාකච්ඡා කිරීමයි. මේ බව අසා ගරු නාහිමිපාණෝ ඉතාමත්ම සතුටට පත්වූහ. උතුරු ඇමෙරිකාවේ අපේ විහාරස්ථාන වැඩි වැඩියෙන් ආරම්භ කළ

යුතු බව උන්වහන්සේගේ අදහස විය.

මෙසේ අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේ ඇල්බටා බෞද්ධ විහාර සංගමයේ සභාපති මහේන්ද්‍ර විජයසිංහ මහතා විසින් කරන ලද එම ආරාධනය එක් සැණින් පිළිනොගෙන ඊළඟට එම මහතාට දන්වා සිටියේ සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික පන්සලකට නම් තමා නොපැමිණෙන බවය. එහෙත් භාවනා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කැමති නම් තමාට එම ආරාධනය පිළිගත හැකි බවය.

ඒ අනුව ඇල්බටා බෞද්ධ විහාර සංගමයේ නිලධාරී පිරිස සාකච්ජා කොට භාවනා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ වටිනාකම තේරුම් ගෙන ඒ සඳහා සුදුසු ස්ථානයක් සොයා ගැනීමටත් ඒ සමගම භාවනා මධ්‍යස්ථානයට වැඩම කරන හාමුදුරුවන් වහන්සේගේ මූලික අවශ්‍යතා සම්පාදනයටත් අවශ්‍ය මූලික පදනම සකස් කරමින් අදාළ තීරණගෙන නැවත අපේ සීලානන්ද හාමුදුරුවන් වහන්සේට ආරාධනා කළහ. එවිට එම ආරාධනය පිළිගත් උන්වහන්සේ එම පිරිසට සාම්ප්‍රදායික පන්සලකත් භාවනා මධ්‍යස්ථානයකත් ඇති වෙනස පෙන්වා දුන් අතර ගිහි පැවිදි සම්බන්ධතා සහ ගිහි පැවිදි යුතුකම් ද පෙන්වා දී එතැන් සිට කැනඩාවට පැමිණීම සඳහා අවශ්‍ය නීතිමය පසුබිම සකසා ගැනීම සඳහා කටයුතු වල නිරත වූහ.

මේ අනුව උන්වහන්සේ විශේෂ දක්ෂතා ඇති කෙනෙක් හෙවත් ස්කිල් කැටගරි යටතේ භාෂා පරිචය පිළිබඳ අවශ්‍ය විභාග ආදිය ද සම්පූර්ණ කරගනිමින් එහෙත් අපහසුවකින් තොරව ස්ථිර පදිංචිය සඳහා අවශ්‍ය වීසා බලපත්‍රය ලබාගත්හ.

දැන් අපේ හාමුදුරුවෝ ලංකාවේ අර ඈත පුත්තලම්

දිස්ත්‍රික්කයේ ආණමඩුවේ සිට පිම්මෙන් පිම්ම පරමාකන්දට, ගල්කුලියට, සඳලංකාවට, කොළඹට, මහ නුවරට, ඇමෙරිකාවට, පැන්න ලෙසින්ම තවත් පිම්මක් ලෝකයේ උත්තරධ්‍රැවය අසලටම පනිමින් ජීවිතයේ තවත් නව පරිච්ඡේදයක් ආරම්භ කිරීමට සූදානම් වෙන අවස්ථාවයි.


මෙසේ අපේ හාමුදුරුවන් වහන්සේ එදා ශ්‍රී ලංකාවේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණමඩුවෙන් ආරම්භ කොට ක්‍රමයෙන් ක්‍රමයෙන් භූගෝලීය වශයෙනුත් ආධ්‍යාත්මික වශයෙනුත් ආ ඒ ගමන් මග සැම තැනම සැම විටම ප්‍රශංසනීය වන්නේ එය ඉතා දිළිඳු පුංචි පැල්පතකින් ආරම්භව ආ ගමනක් වන බැවිනි.

මෙම ගමන් මග සුදෝ සුදු වැලි අතුරා හෝ පිච්ච මල් සමන් මල් ආදිය අතුරා පිවිතුරුව සුසිනිඳුව සැකසුණ එකක් නොවී ය. විවිධ කරදර බාධක කම්කටොලු වලින් සපිරි මගක්ම විය. විවිධ බාධක ජයගනිමින් ආත්ම ශක්තියෙන් ආත්ම විශ්වාසයෙන් මෙන්ම තිර අදිටනින් නොසැලී ඉදිරියට ගිය මෙම ගමනට උන් වහන්සේට අත හිත දුන් අය අපමණයි.

ඒ සැමටම උන් වහන්සේ සිය කෘතඥතාව පළ කරන අතර මෙම ගමන සඳහා සහයෝගය දැක්වූ අත හිත දුන් සැම දෙනම නිතර සිහිකොට අදත් පින් අනුමෝදන් කරවීම උන්වහන්සේගේ සුවිශේෂත්වයකි. අපේ හාමුදුරුවන් වහන්සේගේ ඒ උදාර වූ ගමන් මග මේ අයුරින් දැන් දැකගනිමු ලෝක සිතුවමකින්.

## තල්ගස්වැවෙන් කැනඩාවට.

**අපේ හාමුදුරුවන් වහන්සේගේ භූගෝලීය ගමන් මග**



ශ්‍රී ලංකාවේ ආණමඩුවේ සිට එංගලන්තයේ ලන්ඩන් සහ ඇමෙරිකාවේ නිව්යෝර්ක් හරහා කැනඩාවේ ඇල්බටාවට (උත්තර ධ්‍රැවය අසලටම )ගිය ගමන් මග ලෝක සිතියමේ මෙසේ සටහන් කරමු.

2006 වර්ෂය ලැබූ දවසේ පටන් අධිෂ්ඨාන පෙරටුව තමන් වහන්සේගේ භාවනා කටයුතු මෙන්ම සෙසු ධර්ම කටයුතු ද සාර්ථකව කරගෙන යන අතර සීලානන්ද හාමුදුරුවන් වහන්සේ විවිධ ස්ථානවලට වැඩම කොට විවිධ මාතෘකා

ඔස්සේ දේශන පැවැත්වීම ද සිදු කළහ. ඒ අනුව උන්වහන්සේ නිව්යෝර්ක් නගරයේ පිහිටි පරම විඥානාර්ථ බෞද්ධ සංගමයේ සහ කොලොම්බියා විශ්ව විද්‍යාලයේත් බොස්ටන් විශ්ව විද්‍යාලයේත් විවිධ දේශන පැවැත්වූහ. විශේෂයෙන් උන්වහන්සේ 2006 වර්ෂයේ අප්‍රේල් මාසයේ දී ඉන්දියාවේ දිළිඳු ජනතාවගේ උතුම්ම මිනිසා ලෙස සලකන බබාසහෙබ් අම්බෙඩ්කාර් මහතාගේ 115 වෙනි ජන්ම සංවත්සරය නිමිත්තෙන් කොලොම්බියා විශ්ව විද්‍යාලයේ දී අම්බෙඩ්කාර් ගුණානුස්මරණ දේශනය ද පැවැත්වූහ. එය ද උන්වහන්සේගේ ඇමෙරිකාවේ නිව්යෝර්ක් ජීවිතයේ විශේෂ අත්දැකීමකි.

මෙසේ තමන් වහන්සේගේ සේවය අවශ්‍ය හැම තැනටම ලබා දෙමින් උන්වහන්සේ නිව්යෝර්ක් බෞද්ධ විහාරය මුල්කර ගනිමින් සිදුකළ සුවිශේෂ සේවය ටිකෙන් ටික දිනෙන් දින සම්පූර්ණ කරමින් උන්වහන්සේ නිව්යෝර්ක් නගරයෙන් සමුගන්නට සැරසුණේ කිසිවෙකුගේ අමනාපයකින් තොරවය.

සමහර උදවිය නිතරම පාහේ උත්සාහවත් වන්නේ තමන්ගේ ඇස පිනවීමටය, කන පිනවීමටය, නාසය පිනවීමටය, දිව පිනවීමටය, ශරීරය පිනවීමටය, මනස පිනවීමටය, පංචේන්ද්‍රියයන්ම පිනවීමටය. එහෙත් අපගේ තථාගත ලොවුතුරා බුදුරජාණන් වහන්සේ අපට දේශනා කොට වදාළේ ඉන්ද්‍රියයන් ප්‍රීනනය කිරීමේ හෝ ඉන්ද්‍රියයන් පීඩනයට පත්කිරීමේ හෝ දහමක් නොව කරුණු මැනවින් තේරුම් ගනිමින් ඉන්ද්‍රියයන්ගේ සහ මෙම පඤ්චස්කන්ධයේ ස්වභාවය මැනවින් අවබෝධ කරගනිමින් සැනසීමෙන් යුතුව ජීවත්වීමේ ජීවන ප්‍රතිපදාවකි. ඒ බුදුදහමයි. බුදුදහම සැමතැනකදීමත් සැමදාමත් සැනසීමටයි. දහමින් තොර සැනසීමක් කොහින්ද?

කිසිම දිනක කාම ගවේෂීන්ට සැනසීම සෙවිය නොහැක.

අපට අවශ්‍ය සැනසීම තම තමා විසින්ම සොයා ගත යුතු දෙයකි. නිව්යෝර්ක් නගරයෙන් සමු ගැනීමේ දී අපේ සීලානන්ද හිමියන් මේ සඳහා එකම නිර්ණායකය හෙවත් මිනුම් දණ්ඩ ලෙස යොදා ගත්තේ ඉන්ද්‍රිය පීණනය හෝ ඉන්ද්‍රිය පීඩනයට ලක්කිරීමට තැනක් නොව සාමකාමීව ජීවත් වෙමින් ධර්මය ප්‍රගුණ කිරීමට සුදුසු තැනක් සොයා ගැනීමය. උන්වහන්සේට මෙහිදී විශේෂයෙන්ම අවශ්‍ය වූයේ නිදහස් බවය. සැනසිලිදායක බවය.

යම් කෙනෙකුට ජීවිතයේ අත්‍යවශ්‍යම දෙයක් වන්නේ සුහදශීලි පිරිසක් ඇති සාමකාමී පරිසරයයි. ධර්මය ප්‍රගුණ කිරීමට සුදුසුම තැනක් වන්නේ එතැනයි. තථාගත බුදුරජාණන් වහන්සේ ද මංගල සුත්‍රයේ මෙය පැහැදිලි කර ඇත්තේ "පතිරූප දේස වාසෝ ච එතං මංගල මුත්තමං " යනුවෙන් සුදුසු දේශයක වාසය කිරීමට ලැබීම උතුම් මංගල්‍යයක් වන බවය.

මේ වනවිට එඩ්මන්ටන් නගරයේ වාසය කරන ශ්‍රී ලාංකික බෞද්ධ පිරිසට ද එහි පන්සලක් හදාගැනීමේ අවශ්‍යතාව බලවත්ව තිබුණි. එහෙත් ඉහත සඳහන් කළ පරිදි සීලානන්ද හිමියන් සමග එම පිරිස සම්බන්ධව කතා කළ අවස්ථාවේ උන්වහන්සේ ඒ අයට දුන් උපදේශය වූයේ පන්සලක් නොව භාවනා මධ්‍යස්ථානයක් හදාගන්නා ලෙසටය. ඒ අනුව භාවනා මධ්‍යස්ථානයක් හදන්නේ නම් තමන් වහන්සේ එහි පැමිණෙන බව පැහැදිලිවම එම පිරිසට උන්වහන්සේ දැන්වූහ.

මේ අනුව එම පිරිස සාකච්ජා කර නැටුම් ගැයුම් වැයුම් වලින් මෙන්ම විවිධ අභිචාර හා පුදපූජා විධිවලින් සපිරි සංස්කෘතික කෝලාහල ඇති සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික පන්සලක් වශයෙන් නොව හැමටම පැමිණ සහභාගී වෙමින්

සම්බුදුපියාණන් වහන්සේ විසින් සුදේශිත නිමල බුදුදහම හා භාවනාව හැදෑරීමටත් එය දෛනික ජීවිතයේ දී ප්‍රායෝගික කිරීමටත් සුදුසු ස්ථානයක් ලෙස එඩ්මන්ටන් හි මිල්වුඩ් නගරයේ මිල්බෝන් මාවතේ අංක 2329 දරණ ස්ථානය 2006 මාර්තු මාසයේ දී මිලදී ගෙන භාවනා මධ්‍යස්ථානයකට ගැළපෙන ආකාරයෙන් ප්‍රතිසංස්කරණය කළේය.

මේ අතර අපේ හාමුදුරුවන් වහන්සේ විටින් විට මෙම පිරිස සමග අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධ වෙමින් සාකච්ඡා කරමින් භාවනා මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමේ දී අනුගමනය කළ යුතු වැඩ පිළිවෙල සහ වෙනත් විවිධ උපදෙස් මෙන්ම දහම් කරුණු ද කියා දුන් අතර විශේෂයෙන් ම පුරපසළොස්වක පොහෝදින වල පවත්වන සීලසමාදාන හා භාවනා වැඩසටහන් ද අන්තර්ජාලය ඔස්සේම සිදුකළහ.

මාස කීපයක් තිස්සේ එඩ්මන්ටන් වැසි අපගේ දායක දායිකා පිරිස් කවුරුත් එක් රැස්වී එම ස්ථානය ප්‍රතිසංස්කරණය කළහ. අනතුරුව ඇමෙරිකාවේ වෙස්ට් වර්ජිනියාවේ භාවනා මධ්‍යස්ථානාධිපති අතිගරු හේනේපොල ගුණරතන නායක මාහිමිපාණන් වහන්සේ සහ අතිගරු මඩවල පුණ්ණජී නායක මාහිමිපාණන් වහන්සේ ද වැඩමවා ගෙන සෙත් පිරිත් දේශනා මධ්‍යයේ මෙම මධ්‍යස්ථානය නිල වශයෙන් විවෘත කළ අතර සීලානන්ද හිමියන්ගේ හිතවත් ගරු කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ වැඩමවා විශේෂ භාවනා වැඩසටහනක් පවත්වා මෙම මධ්‍යස්ථානයේ භාවනා වැඩසටහන් ආරම්භ කරවීම ද සීලානන්ද හාමුදුරුවන් වහන්සේ විසින්ම ඇමෙරිකාවේ සිට අන්තර්ජාලය ඔස්සේම අවශ්‍ය උපදෙස් ලබාදෙමින් සිදුකරන ලදී.

මේ ආකාරයෙන් ධර්මානුකූලවම පැවිදි ගිහි සබඳතාව

තව තවත් වැඩිවීමත් දැඩිවීමත් සමගම අපගේ මෙම භාවනා මධ්‍යස්ථානයේ සියලුම ප්‍රතිසංස්කරණ කටයුතු ද අවසන් විය. දැන් භාවනා මධ්‍යස්ථානයේ භික්ෂූන් වහන්සේලාට වැඩ සිටීම සඳහා අවශ්‍ය සියලු කටයුතු සූදානම්.

කාලය දින සති මාස ගණනින් ගෙවී ගියා. හැමදෙනාම දැන් ලොකු අපේක්ෂාවකින් සිටින්නේ භාවනා මධ්‍යස්ථානයේ ස්ථිර පදිංචිය සඳහා හාමුදුරුවන් වහන්සේ වැඩම කරන්නේ කවදාද? යන්නයි. වසර ගණනාවක් තිස්සේ සැම දෙනාගේම සිතේ තිබුණ 'අපේ පන්සල' යන සංකල්පය දැන් මල්ඵල ගැන්වෙන කාලයයි. අපේ පන්සල 'අපේ භාවනා මධ්‍යස්ථානය' බවට පත්වීම කාගෙත් සිතේ තවත් අමන්දානන්දයට හේතුවක් වෙලා. අපටත් බුදුදහම හා භාවනාව ඉගෙන ගන්නට අවස්ථාවක් සැලසුණා කියන අදහසින් සැම දෙනාගෙම සිත් සතන් පිබිදිලා. අදහස්, පැතුම්, මල්ඵල ගැන්විලා.

අගෝස්තු මාසය අපේ හාමුදුරුවෝ උපන් මාසයයි. අගෝස්තු මාසේ පළවෙනිදින වෙද්දී කැනඩාවට පැමිණීමට සියල්ල සූදානම් වුණා. ඒ වනවිට 2006 වර්ෂයේ නිලවරණයෙන් ඇල්බටා බෞද්ධ විහාර සංගමයේ සභාපතිත්වය ද වෙනස් වෙලා. සභාපති පදවියට පත්වුයේ බන්දුල සමරතුංග මහතාය. අපේ හාමුදුරුවෝ අගෝස්තු මස පළවැනි දින එඩ්මන්ටන්හි භාවනා මධ්‍යස්ථානයේ පදිංචිය සඳහා වැඩම කරන බවට මහේන්ද්‍ර විජයසිංහ මහතා ඇතුළු පිරිසට දන්වා එවා තිබුණි. ඒ අනුව අපේ හාමුදුරුවන් වහන්සේ 2006 අගෝස්තු මස 01 වෙනිදින උදේ නිව්යෝර්ක් නගරයේ තම හිතවතුන්ගෙන් හා විහාරාධිපති නාහිමිපාණන් වහන්සේ ගෙනුත් විහාරවාසී ගරු කටයුතු මහාසංඝරත්නයෙනුත් සමුගෙන පිටත්වී එදින රාත්‍රී 10.00 ට පමණ කැනඩාවේ එඩ්මන්ටන් හි ජාත්‍යන්තර ගුවන් තොටුපොළට ළඟාවූහ. එදා

අපේ හාමුදුරුවෝ, එඩ්මන්ටන් ගුවන් තොටු පළ පර්යන්තයේ දොරටුවෙන් එළියට  වැඩම කරද්දී එවකට ඇල්බටා බෞද්ධ විහාර සංගමයේ සභාපතිව සිටි බන්දුල සමරතුංග මහතා සහ එම බිරිඳ ශිරානි සමරසිංහ මහත්මිය, හිටපු සභාපති මහේන්ද්‍ර විජයසිංහ මහතා සහ එම බිරිඳ චන්ද්‍රානි විජයසිංහ මහත්මිය, රන්ජන් කුඹුරුතැන්න මහතා සහ එම බිරිඳ සිරිමා කුඹුරුතැන්න මහත්මිය, ඇතුළු දායක දායිකා පිරිසක් විසින් උන්වහන්සේ සාදරයෙන් හා ඉමහත් ගෞරවයෙන් යුතුව පිළිගෙන භාවනා මධ්‍යස්ථානයට වැඩමවාගෙන එන ලදහ.

රාත්‍රී 11:00 පමණ වනවිට සියලු දෙනාම භාවනා මධ්‍යස්ථානයට පැමිණියහ. තම නව නිවහනට, මෙම භාවනා මධ්‍යස්ථානයට වැඩම කළ අපේ හාමුදුරුවන් වහන්සේ මුලින්ම ඒ මධ්‍යම රාත්‍රියේ බුදුරජාණන් වහන්සේට නමස්කාර කොට, පැමිණ සිටි පිරිස පඤ්ච සීලයේ පිහිටුවා, මල් පහන් පුජාපවත්වා, සෙත් පිරිත් දේශනා කොට කෙටි අනුශාසනාවක් ද පැවැත්වූහ. අනතුරුව සභාපති බන්දුල සමරතුංග මහතා උන්වහන්සේ කැඳවාගෙන ගොස් උන්වහන්සේගේ කුටියට ඇරලුවේය.

එම කුටිය අලුත් කුටියකි. එය උන්වහන්සේගේම උපදෙස් මත ඉතාම සරල ලෙස සකස් වු කුටියකි. අඟලක් උස මෙට්ටයක් සහිත අඟල් 2 ක් උස ඇඳක්, පොත් රාක්කයක්, අඩි 2 ක් පමණ උස පුංචි මේසයක්, සහ එම  මේසය මත වු පුංචි මේස ලාම්පුවක් ද  විදුලි පංකාවක් ද  එහි විය. අපේ හාමුදුරුවෝ බොහෝ කාලයක සිටම පුරුදු වී සිටියේ බිම වාඩිවීමට නිසා මෙහි බංකු පුටු ආදී කිසිවක් නොවීය. ලෝකයේ මොන රටකට මොන තැනකට ගියත් බිම වාඩිවී ධර්ම දේශනා කිරීමට හා ධර්ම සාකච්ජා පැවැත්වීමට අපේ හාමුදුරුවන් වහන්සේ හුරු පුරුදු වී සිටියහ. බිම ඉඳගෙන බණ

කීම සුදුසු නැතැයි සමහර අය ප්‍රශ්න කරන විට උන්වහන්සේ ප්‍රශ්න කරන්නේ "බුදුරජාණන් වහන්සේ එකම තැනකවත් පුටුවක වාඩිවී ධර්ම දේශනා කරලා තියෙනවාද?" කියලයි. කෙසේ හෝ බිම වාඩි වීමේ බොහෝ ආනිසංස ඇති බව නුවණින් කල්පනා කරතොත් තේරුම් ගැනීම අපහසු නොවේ.

මෙසේ කැනඩාවේ එඩ්මන්ටන්හි ඇල්බටා බෞද්ධ විහාර සංගමයේ සිහිනය සැබෑ කරමින් අපේ හාමුදුරුවන් වහන්සේගේ අනුශාසනා පරිදි කැනඩාවේ එඩ්මන්ටන්හි සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ ආධ්‍යාත්මික වැඩ කටයුතු 2006 අගෝස්තු මස පළවෙනිදින සිට ආරම්භ විය.

මෙම "සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානය" යන නම ද අපේ හාමුදුරුවන් වහන්සේ විසින්ම ගරු හේනේපොල ගුණරතන නාහිමිපාණන් වහන්සේගේ ද අනුශාසනා පරිදි තෝරා ගන්නා ලදී. සමහර අයගේ අදහස වුයේ මෙය විපස්සනා භාවනා මධ්‍යස්ථානය නමින් නම් කිරීම උචිත බවය. එහෙත් මෙම භාවනා මධ්‍යස්ථානයේ විපස්සනා භාවනාව පමණක් නොව සමථ භාවනාවත් ප්‍රගුණ කරන බැවින් ඒ සඳහාද උපදෙස් ලබාදෙන බැවින් මෙය විපස්සනා භාවනා මධ්‍යස්ථානය යන නමින් පමණක් නොව සමථ-විපස්සනා යන භාවනා දෙකම අයත්වන සේ "සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානය" යනුවෙන් නම් කරන ලදී. මෙය උතුරු ඇමෙරිකාවේ පිහිටි එකම සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානයයි.

# සමථ-විපස්සනා භාවනා මධ්‍යස්ථානය, කැනඩාව

කැනඩාවේ එඩ්මන්ටන්හි ඇල්බටා බෞද්ධ විහාර

සංගමය නමින් මෙයට වසර 25 කට පමණ පෙර ආරම්භ කරන ලද සංවිධානයක් තිබුණි. මෙම සංවිධානයේ සිටින වැඩි දෙනෙක් ශ්‍රී ලාංකික බෞද්ධයෝය. එම සියලු දෙනාටම පාහේ ඇල්බටා ප්‍රාන්තයේ ශ්‍රී ලාංකික බෞද්ධ විහාරස්ථානයක් ඇති කිරීමේ බලාපොරොත්තුව තදින්ම තිබුණි. එහෙත් විශේෂයෙන් මුලපමය සාධකය මුල්වීම නිසා එය ටිකෙන් ටිකම දිනෙන් දිනම කල් ගියේය.

මෙම ප්‍රදේශයේ ටිකෙන් ටික පිරිස වැඩිවෙද්දී දායක දායිකාවන්ගේ ආධාර මත ස්ථානයක් මිළදී ගැනීමට හැකි බව තේරුම් ගත් පිරිස මේ සඳහා ඇප කැපවෙමින් සිටියහ. උත්සාහය අත නොහරිමින් නිතර නිතර එක්වෙමින් විවිධ පැති ගැන සාකච්ජා කළහ.

මේ අතරම 2005 වර්ෂයේ සංගමයේ සභාපතිවරයා වශයෙන් තේරී පත්වූ මහේන්ද්‍ර විජයසිංහ මහතා විසින් ස්ථානයක් ගොඩනැගීම මෙන්ම එම ස්ථානයේ කටයුතු මැනවින් කරගෙන යාමට සුදුසුකම් ඇති භික්ෂුවක් සොයාගැනීමේ කාර්‍යයෙහි ද නිරත විය. ඒ සඳහා අවශ්‍ය භික්ෂුන් වහන්සේගේ සුදුසු කම් මොනවාදැයි පිරිස සාකච්ජා කොට එම සුදුසු කම් ලැයිස්තුවක් ද සකස් කළේය.

ඒ සියලු සුදුසුකම් ඇති භික්ෂුවක සොයා ගැනීම ඉතාමත් අපහසු විය. කෙසේ හෝ අප ඉහත සඳහන් කළ ස්වාමීන් වහන්සේලාගේ ද අනුමැතියෙන් යුතුව ඒ සියලු සුදුසුකම් ඇති ස්වාමීන් වහන්සේ නමක් මෙසේ මෙම ස්ථානයට වැඩම කරවා ගැනීමට ලැබීම හැමදෙනාගේ ම සතුටට හේතුවිය.

අපේ හාමුදුරුවෝ මෙම සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ වැඩ කටයුතු ආරම්භ කළ දිනයේ පටන්ම

විශේෂයෙන්ම, උන්වහන්සේ පැවිදි වූ දවසේ පටන් මෙපමණ කාලයක් තිස්සේ උන්වහන්සේට මොනම ආකාරයේ හෝ දෙයක් පූජා කරමින් සිව්පසයෙන් සැලකූ, උපස්ථාන කළ, හැම දෙනාටම, හැම කෙනාටම, පින් අනුමෝදන් කරවීම උන්වහන්සේගේ සිරිතකි. උන්වහන්සේ පුරුද්දක් ලෙසින් දිනපතාම මෙම භාවනා මධ්‍යස්ථානයේ සියලු දායක දායිකාවන්ට මෙත් වඩා පින් අනුමෝදන් කරවති. මේ නිසාම උන්වහන්සේට කිසිම සතුරෙක් නැත.

උන්වහන්සේ නිතර ප්‍රකාශ කරන්නේ "මේ ලෝකේ මම කිසිම කෙනෙක් එක්ක තරහක් වෛරයක් නැහැ. මට සතුරෝ නැහැ." කියලයි. උන්වහන්සේගේ ආදරණීය මෑණියන් උන්වහන්සේට නිතරම ප්‍රාර්ථනා කරන්නේත් "ඔබ වහන්සේට යන යන තැන කල්‍යාණ මිත්‍රයෝම ලැබේවා! හතුරෝත් මිතුරෝ වේවා!" කියලයි. එය ඒ ආකාරයෙන්ම සිදුවීම උන්වහන්සේගේ භාග්‍යයයි. උන්වහන්සේ නිතරම මෑණියන්ගේ ආශිර්වාද ලබති. එඩ්මන්ටන්හි දායක දායිකාවෝ සියලු දෙනාම උන්වහන්සේට ඉතාමත්ම ගෞරවයෙන් ආදරයෙන් සලකති. උන්වහන්සේ ගැන නිතර නිතර සොයා බලමින් සිව්පසයෙන් සංග්‍රහ කරති.

අපේ හාමුදුරුවන් වහන්සේ එදා 2006 අගෝස්තු මස පළවැනි දින මෙම භාවනා මධ්‍යස්ථානයට වැඩම කිරීමෙන් අනතුරුව මුලින්ම අවධානය යොමු කළේ මෙම එඩ්මන්ටන් ප්‍රදේශයේ ජීවත්වෙන ශ්‍රී ලාංකිකයන්ගේ දරුවන් වෙතටය. මෙහි ජීවත්වෙන දරුවන් හදා වඩා ගැනීමේ දී දෙමාපියන් විශේෂ වෙහෙසක් දැරිය යුත්තේ ශ්‍රී ලාංකික සංස්කෘතියත් මෙම කැනඩාවේ සංස්කෘතියත් දෙක අතර දරුවන් අන්ද මන්ද වෙන බැවිනි. දරුවන් මෙසේ වෙනත් සංස්කෘතියක් වැලඳ ගැනීමේ දී තම පාරම්පරික සංස්කෘතිය කඩා බිඳ දමන්නේ නම් එය පිරිහීමට හේතුවක් බව පෙන්වා දීමට සුදුසුම තැන දහම් පාසලයි.

බෞද්ධ රටක බෞද්ධ මාපියන්ගේ දරුවන් වශයෙන් හැදුණ වැඩුන බොහෝ දෙනාගේ දරුවෝ අද මේ රටේ වාසයට පැමිණ මෙහි සිටිති. එසේම මේ රටේමත් උපත ලබා එහෙත් අපේ වසර දෙදහසකටත් වැඩි ඉතිහාසයක් ඇති බෞද්ධ ඉතිහාසයේ වටිනාකම දැන ගැනීමේ ආශාවෙන් සිටින දරුවෝ ද මෙහි සිටිති. ඒ සමගම දෙමව්පියෝ ද තම දරුවාට අපේ සාරධර්ම ගුණ ධර්ම සමාජ ධර්ම උගැන්වීමේ අපේක්ෂාවෙන් සිටිති.

මේ කරුණු සියල්ල තේරුම් ගත් අපේ හාමුදුරුවන් වහන්සේ මේ සියල්ලටමත් වඩා මේ දරුවන්ට මුලිකම වශයෙන් අවශ්‍ය වන්නේ තථාගත ලොවුතුරා බුදුපියාණන් වහන්සේ විසින් දේශිත නිමල බුදුදහම දැනගැනීම බව තේරුම් ගෙන නිමල බුදුදහම දැනගත් කල්හි එම දරුවන් පූර්ණ පෞරුෂයකට හිමිකම් කියන නිර්භීතව සමාජයටත් සත්‍යයටත් මුහුණ දෙන පිරිසක් වන බව තේරුම් ගෙන ඔවුන්ට නිමල බුදුදහම උගැන්වීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බව තීරණය කළහ.

ඒ අනුව උන්වහන්සේ මුලින්ම කළේ මෙම  දරුවන් වෙනුවෙන් මෙතෙක් පැවති සාම්ප්‍රදායික වූ දහම් පාසල ප්‍රතිව්‍යුහගත කරමින් බුදුදහමේ මුල් සූත්‍ර දේශනා හැදෑරීමට හැකි වෙන පරිදි දහම් පාසලට අවශ්‍ය විෂය නිර්දේශයක් ද සකස් කොට දහම් පාසල නව දර්ශනයක් යටතේ පවත්වාගෙන යාමට කටයුතු කිරීමය. එසේ හෙයින් දහම් පාසලට අවශ්‍ය සුදුසු ආචාර්ය මණ්ඩලයක් පත් කරගැනීම සිදු කළේය. මෙහි දී කාන්තා පක්ෂය හා පිරිමි පක්ෂය නියෝජනය වන පරිදි ආචාර්යවරුන් තිදෙනා බැගින්  සුදුසුකම් හා පළපුරුද්ද ඇති ගුණවත් ආචාර්යවරු හය දෙනෙකු  ආචාර්ය මණ්ඩලයට පත් කරගත්හ.

"සමථ විපස්සනා දහම් පාසල" නමින් එම දහම් පාසල භාවනා මධ්‍යස්ථානාධිපති හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ආචාර්ය මණ්ඩලයේ හය දෙනාගේ පූර්ණ අධීක්ෂණයෙන් යුතුව පවත්වාගෙන යාමට කටයුතු සැලසීය. විෂය මාලාව හැදෑරීම ආචාර්ය මණ්ඩලයටත් ශිෂ්‍යයන්ටත් යන දෙපිරිසටම අවශ්‍යතාවයක් බව උන්වහන්සේ පෙන්වා දුන්හ. ඒ අනුව ආචාර්ය මණ්ඩලය ද විෂය මාලාව මැනවින් හදාරා මුල් සූත්‍රදේශනා මූලික කරගනිමින් දහම් දැනුම ලබාදෙති.

දහම් පාසලේ සහ දරුවන්ගේ අවශ්‍යතා සොයා බලා ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට ද, පූර්ණ සහයෝගය ලබාදීමට සුදුසු වන සේ මාපියන්ගේ සංවිධානයක් ද අපේ හාමුදුරුවන් වහන්සේ විසින් ආරම්භ කරන ලදී. මෙම මාපියන්ගේ සංවිධානය, විශේෂයෙන් දහම් පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය හා සෑම වසරකම ජනවාරි මාසයේ මුල් සති අන්තයේ පැවැත්වෙන වාර්ෂික පරිත්‍රාණ ධර්මදේශනය ද සංඝගත දක්ෂිණාව ද සහිත විශේෂ පුණ්‍යෝත්සවය සංවිධානය කරන අතර දහම් පාසලේත් භාවනා මධ්‍යස්ථානයේත් සිදු කරනු ලබන සියලු කටයුතුවලදී මවු සංගමය වන ඇල්බටා බෞද්ධ විහාර සංගමය සමග අත්වැල් බැඳගෙන හැම අතින්ම සහයෝගීව කටයුතු කරයි.

මෙම දහම් පාසලේ සියලුම විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනු ලබයි. බුදුදහම, බෞද්ධ ඉතිහාසය සහ බෞද්ධ ආචාර ධර්ම යන විෂයයන් තුනක් ඉගැන්වේ. දහම් පාසලේ පංති තුනකි. සීල, සමාධි, පඤ්ඤා, යනු එම පංති තුනයි. මෙම පංති තුනෙන් සමත් වෙන සියලුම ශිෂ්‍යයන්ට තම ජීවිතයේ අවසන් මොහොත දක්වාම වුවද දහම් ඉගෙන ගැනීමට හැකිවෙන පරිදි "ධම්ම" නමින් තවත් විශේෂ පංතියක් පැවැත්වේ. අපේ හාමුදුරුවන් වහන්සේගේ අනුශාසනා පරිදි

පැවැත්වෙන මෙම දහම් පාසල උතුරු ඇමෙරිකාවේ ඇති ඉතාමත් සාර්ථක දහම් පාසලකි. මෙහි දැනට ශිෂ්‍යයන් 80 දෙනෙක් පමණ දහම් අධ්‍යාපනය ලබමින් ගුණවත් දරුවන් ලෙසින් මෙන්ම ශික්ෂිත පුරවැසියන් ලෙසින් ද සමාජයට එක්වෙමින් සිටිති.

දෙවනුව අපේ හාමුදුරුවන් වහන්සේගේ විශේෂ අවධානය යොමු වුයේ වැඩිහිටි පිරිසටය. මෙම පිරිස මෙහි පැමිණ සිටින්නේ තම දු දරුවන්ගේ දු දරුවන් බලා හදා ගැනීමට සහ ජීවිතයේ අවසන් කාලය සුවසේ ගත කිරීමේ අදහසිනි. මෙහි පැමිණ සෙන්ටිග්‍රේට් ඍණ අංශක 40-45 වැනි ඉතාමත්ම තද සීතලේ ගැහෙමින් වර්ෂයේ මාස හයක් පමණ කාලයක් මුළුල්ලේ සීත ඍතුවේ ජීවත්වෙමින් සිටින අතර විවිධාකාරයෙන් පින් දහම් කරගැනීමට අවස්ථාවන් සොයන්නේ ශ්‍රී ලංකාව වැනි පින්බර රටක උපත ලබා ඒ පින්බර රටේ විවිධ වු පින් දහම් සිදුකරමින් අත හිත හුරු කර ගත් බැවිනි. මේ මව්පියන් ගැන විශේෂයෙන්ම සිතා බැලිය යුතුය. මේ මව්පියන්ට පින් දහම් කරගැනීමට සිත සතුටින් කල්ගෙවීමට අවස්ථාවක් සලසා දියයුතුමය.

අපේ හාමුදුරුවෝ මෙම කරුණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට සෑම පොහෝ දිනකම විශේෂ භාවනා වැඩසටහනක් උදේ 8:00 සිට සවස 6 :00 දක්වා පැවැත්වීමට කටයුතු යොදා ඇත. එසේම සෑම දෙනාටම සෑම කෙනාටම සහභාගී විය හැකි ආකාරයෙන් මෙම භාවනා මධ්‍යස්ථානයේ උදේ 7:00ට දහවල 11:00ට සහ සවස 7:00ට විශේෂ සම්බුද්ධ පුජා පැවැවේ. දිනපතාම උදේ 8:00-9:00 දක්වා සමුහ භාවනා පංතිය, සවස 5:00-6 :00 දක්වා සමූහ භාවනා පංතිය, පැවැත්වෙන අතර සෑම ඉරුදිනකම සවස 7:00-9:00 දක්වා විශේෂ ධර්ම සාකච්ජාවක් ද පැවැත්වේ. තවද සෑම

සෙනසුරාදා දිනකම උදේ 8:00 සිට 9:30 දක්වා විශේෂ භාවනා වැඩසටහනක් ද පැවැත්වේ. මෙම සෑම වැඩ සටහනක්ම පැමිණ සිටින පිරිසට අනුව සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙහෙයවනු ලබන්නේ අපේ හාමුදුරුවන් වහන්සේ විසින්මය.

තවද අපේ හාමුදුරුවන් වහන්සේගේ සේවය ලොව විවිධ රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයන්ටත් ලබා දීමේ අදහසින් සෑම සිකුරාදා දිනකම සවස 7:00 ට අන්තර්ජාලය ඔස්සේ "අකාලික සද්ධර්ම දේශනා" නමින් විශේෂ ධර්ම දේශනයක් හා ධර්ම සාකච්ඡාවක් පැවැත්වීය. මෙම ධර්ම දේශනාව සහ ධර්ම සාකච්ඡාව බොහෝ දෙනාගේ ප්‍රශංසාවට ලක්වූත් ඉතා සාර්ථකවූත් එකක් විය. එසේම එම සේවය ඉංග්‍රීසි ජාතිකයන්ට හෙවත් ඉංග්‍රීසි විතරක් කථා කරන අයටත් ලබා දීමේ අරමුණෙන් අපේ හාමුදුරුවන් වහන්සේ අන්තර්ජාලය ඔස්සේම "වොයිස් ඔප් ධම්ම" නමින් ද වැඩසටහනක් ආරම්භ කොට පවත්වාගෙන ගියහ.

අපේ හාමුදුරුවෝ මෙම සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානය මුල්කරගනිමින් වෙබ් අඩවියක් ද ආරම්භ කොට එහි උන්වහන්සේගේ ධර්ම දේශනා සහ ලිපි රාශියක් තැන්පත් කොට ඇති අතර ඒවා ලෝකයේ ඕනෑම රටක සිටින කෙනෙකුට දැක ගත හැකි පරිදි හා ශ්‍රවණය කළ හැකිවන පරිදි ප්‍රදර්ශනය කර ඇත.

තවද උන්වහන්සේ මෙම ස්ථානයට වැඩම කළ දවසේ පටන්ම ලෝකයේ විවිධ රටවල ජීවත් වෙන ශ්‍රී ලාංකිකයන්ට මෙන්ම ශ්‍රී ලාංකික නොවන අයටත් විද්‍යුත් තැපැල මගින් දහම් කරුණු කියා දෙති. ඒ අනුව සෑම මසකම 10-15 දින අතර ඉංග්‍රීසි මාධ්‍යයෙන් " ධම්ම" නමින් දහම් පුවත් පතක් ද, සෑම මසකම 22 වෙනි දිනට (උන්වහන්සේ පැවිදි වූ දින) " සදහම්

සුවඳ" නමින් සිංහල මාධ්‍යයෙන් පුවත් පතක් ද, සෑම අඟහරුවාදා දිනකම ඉංග්‍රීසි මාධ්‍යයෙන් "ෆ්‍රේග්‍රන්ස් ඔෆ් ද සේක්‍රඩ් ධම්ම" නමින් දහම් පිටුවක් ද සෑම බ්‍රහස්පතින්දා දිනකම ඉංග්‍රීසි මාධ්‍යයෙන් " ෆුඩ් පො තින්කින් පීපල්" නමින් දහම් පිටුවක් ද, සෑම සෙනසුරාදා දිනකම සිංහල මාධ්‍යයෙන් " සම්බුද්ධ දේශනා" නමින් දහම් පිටුවක් ද සෑම මසකම පළවෙනි දින "ධර්ම බිංදු" නමින් දහම් පත්‍රිකාවක් ද නිකුත් කරති.

මෙසේ මෙම සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානය ආරම්භ වීමෙන් පසු මෙම ප්‍රදේශයේ ශ්‍රී ලාංකික නොවන පිරිස බොහෝ දෙනෙකුටම නිමල බුදුදහම පිළිබඳව වැටහීමක් ලබාගැනීමට අපේ හාමුදුරුවන් වහන්සේගේ අවවාද අනුශාසනා බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇත. උන්වහන්සේ විසින් ඉංග්‍රීසියෙන් සහ සිංහලෙන් පවත්වනු ලබන දේශනා ශ්‍රවණය කිරීමට කැමති බොහෝ දෙනා මෙම සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානයට පැමිණෙති.

විශේෂයෙන්ම ඇල්බටා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැන් දැන් බොහෝ දෙනෙක් තුලනාත්මකව ආගම් හැදෑරීමට පටන් ගෙන ඇත. ඒ අනුව බොහෝ දෙනෙක් මේ සඳහා බුදුදහම තෝරාගනිති. ඒ ශිෂ්‍යශිෂ්‍යාවන්ට අපේ හාමුදුරුවන් වහන්සේගෙන් ලැබෙන උපදෙස් ඉතාමත් අගනේය. මේ නිසාම බොහෝ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ දැන් මෙම සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානයට පැමිණ උන්වහන්සේගෙන් බුදුදහම සහ භාවනාව පිළිබඳව බොහෝ කරුණු දැනගන්නා අතර භාවනාවෙහි නිරතව අත්දැකීම් ද ලබාගනිති. මෙසේ විශාල පිරිසකට අද දහම් සිසිල බෙදා දෙන මෙම භාවනා මධ්‍යස්ථානය තවත් ශ්‍රී ලාංකික පන්සලක් වුයේ නම් මෙවැනි සේවයක් සිදුනොවන බව පැහැදිලිය. පන්සලට පැමිණෙන්නේ බොහෝවිට ශ්‍රී ලාංකිකයන්

පමණි. අවශ්‍ය වන්නේ පන්සල් නොව පන්සිල් සුරකින පිරිසකි, පන්සිල් සුරකින දැහැමි සමාජයකි.

කෙටියෙන් පවසතොත් මෙය ශ්‍රී ලාංකික සාම්ප්‍රදායික පංසලක් නොව භාවනා මධ්‍යස්ථානයක් වන බැවින් කොයි කාටත් පැමිණ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ නිර්මල වු ශ්‍රී සද්ධර්මය තේරුම් ගැනීමටත් භාවනා කිරීමටත් අවස්ථාව සැලසී ඇත. අපේ හාමුදුරුවන් වහන්සේ විසින් මෙම භාවනා මධ්‍යස්ථානය ගොඩනැගීමේදී විශේෂයෙන්ම මෙහි වාසය කරන භික්ෂුන් වහන්සේලාටත් පැමිණෙන ගිහි පිරිසටත් කිසියම් ප්‍රතිපත්ති සමුහයක් මත කටයුතු කළ යුතු යැයි ප්‍රතිපත්ති සමුහයක් ද  සම්පාදනය කර ඇත. ඒ අනුව යම්තාක් කල් මෙහි වාසය කරන භික්ෂුන් වහන්සේලා එම භික්ෂු ප්‍රතිපත්ති අනුගමනය කරන්නේ ද පැමිණෙන ගිහි පින්වතුන් එම අදාළ ගිහි ප්‍රතිපත්ති අනුගමනය කරන්නේ ද ඒ තාක් කල් මෙම භාවනා මධ්‍යස්ථානය කිසිදු අපහසුවකින් තොරව ඉතා මැනවින් පවත්වා ගෙන යාමට බාධාවක් නැති බව අපේ හාමුදුරුවන් වහන්සේගේ දැකීමයි, අදහසයි.

මෙම ඇල්බටා බෞද්ධ විහාර සංගමය මගින් සෑම වර්ෂයකම ජනවාරි මස මුල් සති අන්තයේදී විශේෂ පරිත්‍රාණ ධර්ම දේශනයක් පවත්වා මහා සංඝරත්නය විෂයෙහි සාංඝික දානයක් පිරිනැමීම දැනට වර්ෂ 25 පමණ කාලයක සිට සිදු කරනු ලබන විශේෂ කාර්‍යයකි. අපේ හාමුදුරුවන් වහන්සේගේ වැඩම වීමෙන් පසු එම කටයුත්ත ද ඉතාමත් ලස්සනට ක්‍රමවත්ව සිදුකෙරෙන බව කවුරුත් පිළිගනිති. අපේ හාමුදුරුවන් වහන්සේ මෙම උතුම් පින්කමටම තවත් පින්කමක් සම්බන්ධ කර ඇත. ඒ දහම්පාසලේ දරුවන්ට ත්‍යාග සහ සහතික පත් බෙදාදීමය. මෙය ද දැන් සෑම වසරකම මෙම වාර්ෂික පිරිත් පින්කම් මාලාවේ දී දහවල් පවත්වනු ලබන මහා

සඟසතු දානයෙන් අනතුරුව සිදුකෙරේ. උන්වහන්සේට මේ කටයුතු සඳහා දායක දායිකා හැම දෙනාගේම මෙන්ම මාපියන්ගේ සංගමයේ ද පූර්ණ සහයෝගය ලැබේ.

එසේම වෙසක් පුර පසළොස්වක දින සිදු කරනු ලබන සීල සමාදාන වැඩ සටහන ද භාවනාවට හෙවත් ප්‍රතිපත්තියට මුල් තැන දෙමින් සෑම වර්ෂයකම ඉතාමත් හොඳින් ප්‍රතිපත්ති පූජාවෙන් බුදුරජාණන් වහන්සේ පිදීම් වස් ගෞරවාන්විතව සිදුකෙරේ.

තවද වාර්ෂික කඨින මහා පිංකම ද අපේ හාමුදුරුවන් වහන්සේගේ අනුශාසනා පරිදි ඉතාමත් අර්ථවත් අයුරින් සම්ප්‍රදායත් චාම් බවත් සුරකිමින් ගෞරවාන්විතව සිදුකරනු ලබන්නේ සියලු දෙනොගේම සහයෝගයෙන් හා සුහදශීලී සහභාගිත්වයෙනි.

මේ ආකාරයෙන් අපගේ භාවනා මධ්‍යස්ථානය මුල් කරගනිමින් අද බොහෝ දෙනෙක් තම ජීවන ප්‍රතිපදාව සැහැල්ලුව ගත කිරීමට අවශ්‍ය මානසික පසුබිම සකසා ගෙන ඇති බව සතුටින් සඳහන් කරමු. විශේෂයෙන්ම සෑම දෙනාම සහෝදරත්වයෙන් සමගියෙන් යුක්තව කටයුතු කිරීමට එක්රැස්වීම මෙම සියලුම කටයුතු සාර්ථක කරගැනීමට ප්‍රධානතම හේතුවවී ඇත.

අපේ හාමුදුරුවන් වහන්සේ මෙම භාවනා මධ්‍යස්ථානයට වැඩම කළ දවසේ පටන් විවිධාකාරයෙන් පොත පත ලියමින් ජනතාව දැනුම්වත් කිරීමේ කටයුතු ද කරති. මෙම භාවනා මධ්‍යස්ථානයට වැඩම කළ දවසේ පටන් මේ දක්වා ලියන ලද පොත පත අතර විශේෂයෙන්ම බුරුම ජාතික ඌ සීලානන්ද නාහිමිපාණන් වහන්සේ විසින් ලියන ලද "ෆෝ පෞවුන්ඩේෂන්ස් ඔප් මයින්ඩ්පුල්නස්" නම් වූ ග්‍රන්ථය "සතර සතිපට්ඨානය" නමින් පරිවර්තනය කර මුද්‍රණය කරවා

නොමිලේ බෙදාදුන්හ. ''ඒජ්ලස් ධම්ම'' නමින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පොත් පෙළක් ආරම්භ කර ''හු ක්‍රියේටඩ් දිස් මෑන්'', ''ගුඩ් ප්‍රෙන්ඩ්ස්'', ''වයි ෂුඩ් වී රෙස්පෙක්ට් ඇන්ඩ් සපෝට් අවර් පේරන්ට්ස්'' වැනි කුඩා පොත් කීපයක්ම ලියා පළ කළේය. තවද ''සම්බුද්ධ දේශනා'' නමින් සිංහල භාෂාවෙන් ද විශේෂ දහම් පොත් පෙළක් ලියා පළ කොට නොමිලේ බෙදා දෙති. උන්වහන්සේ විසින් මෑත දී ලියන ලද විශේෂ දහම් පුස්තකය වුයේ භාවනා අත් පොතයි. ඉංග්‍රීසි භාෂාවෙන් ලියන ලද එම අත්පොත නම් කොට ඇත්තේ ''භාවනා- අ මැනුවල් ඔප් බුඩිස්ට් මෙඩිටේෂන් '' යනුවෙනි.

අපේ හාමුදුරුවන් වහන්සේ දිනපතාම උදේ 4:00 ට අවදි වෙන අතර රාත්‍රී 11:30 දක්වා තම සේවාවන් සිදුකරන්නේ මහත් සතුටිනි, සැහැල්ලුවෙනි. අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් ධම්ම පදයේ අත්ත වර්ගයේ දහවෙනි (10) ගාථාවෙන් දේශනා කොට වදාළ පරිදි ''යම් කෙනෙක් අනුන්ට සේවය කිරීමේ දී එය මොන තරම්ම වටිනා දෙයක්, උතුම් දෙයක්, වුවද තමන්ගේ සේවය, තමන්ගේ යහපත, තමන්ගේ අභිවෘද්ධිය, අමතක නොකළ යුතුය. තමන්ගේ අභිවෘධිය අනුන්ගේ අභිවෘධිය බවට පත්වේ. එබැවින් අන් අය වෙනුවෙන් කරන දේ මොන තරම් උසස් වුවද තමා ගැන සිත සිතා තමාගේ සැනසීම, තම විමුක්තිය තමා විසින්ම ඇතිකර ගත යුතුය'' යන දේශනය අපේ හාමුදුරුවන් වහන්සේ විසින් අමතක කර නැත. තමන් කොතනක හිටියත් කොහේ ගියත් උන්වහන්සේ ජීවිතයේ ප්‍රධාන තැන දුන්නේ භාවනාවටයි.

තමන් වහන්සේ ඇමෙරිකාවේ නිව්යෝර්ක් නගරයේ වාසය කරන කාලයේදී තමන්වහන්සේගෙන් භාවනාව හා බුදුදහම හදාළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තව දුරටත් එම භාවනාව සහ බුදුදහම පිළිබඳව හැදෑරීමට අවශ්‍ය පොත පත පරිහරණයට

හා අන්තර්ජාලය ඔස්සේ විවිධ වෙබ් අඩවි පරිහරණයට උන්වහන්සේ උපදෙස් ලබා දෙන අතර ඒ සැම දෙනාටම බුදුදහම හා භාවනාව පිළිබඳව එන ඕනෑම ගැටලුවක් පැය කීපයක් ඇතුළත අසා දැනගැනීමට හැකිවෙන පරිදි අපේ හාමුදුරුවෝ mybuddhistqforyou@gmail.com නමින් විශේෂ විද්‍යුත් ලිපිනයක් ලබා දෙමින් පහසුකම් සලසා ඇත. ඒ අනුව අපේ හාමුදුරුවන් වහන්සේ තමන් වහන්සේගෙන් ධර්මය ඉගෙන ගත්, භාවනාව ඉගෙනගත් යම් කෙනෙක් සිටිත් ද ඒ කිසිවෙක් අමතක කර හෝ අතරමං කර නැත. ඕනෑම කෙනෙකුට ඕනෑම අවස්ථාවක උන්වහන්සේ සමග සම්බන්ධ වීමට අවස්ථාව සලසා ඇත. ඒ සැමටම තව තවත් ධර්මය හැදෑරීම සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්‍යය නොඅඩුව ලබා දෙමින් උන්වහන්සේ බුදුමග හඳුනාගෙන තමන් ද බුදුමගෙහි ගමන් කරමින්ම සෙසු අයට ද ඒ බුදුමග කියාදෙමින් වැඩ වසති.

අපේ හාමුදුරුවන් වහන්සේ මේ වන විටත් වර්ෂයකට දෙවරක් වත් දහම් චාරිකාවක් සඳහා ඇමෙරිකාවට වැඩම කරවන අතර ඒ දහම් චාරිකාවේ දී ඇමෙරිකාවේ විවිධ ජනපද වලට වැඩම කොට භාවනා පංති හා ධර්ම දේශනා පවත්වති. උන්වහන්සේගේ ධර්ම දේශනාවලට සවන් යොමුකිරීමට බොහෝ ඇමෙරිකානුවන් මෙන්ම තර්කානුකූලව සිතන්නන්ද කැමති වන්නේ උන්වහන්සේ මුල් බුදුසමයේ එන සූත්‍ර දේශනාම පාදක කරගනිමින් මූලික කරගනිමින් සිය දහම් දේශනා පවත්වන බැවිනි. උන්වහන්සේ නිතරම දේශනා කරන්නේ බුදුරජාණන් වහන්සේ විසින් මුල් සූත්‍ර දේශනාවල දක්වා ඇති කරුණුය. එබැවින් කිසිවෙකුටත් ඒ දහම් කරුණු පිළිබඳව අවිශ්වසනීයත්වයක් ඇතිවන්නේ නැත.

අපේ හාමුදුරුවන් වහන්සේ පෙන්වා දෙන්නේ තථාගත ලොවුතුරා සම්මා සම්බුදුපියාණන් වහන්සේ විසින් දේශනා

කොට වදාළ චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මය, පටිච්ච සමුප්පාද ධර්මය, ත්‍රිලක්‍ෂණ ධර්මය, වැනි දහම් කරුණු මුල් කරගත් දේශනාමය. එබැවින් ඒ බුදුපියාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය කෙනෙකුට ප්‍රතික්‍ෂේප කළ නොහැක. බුදුදහම යනු ලොව සදාකාලයෙන් සදාකාලයට පවතින සත්‍යයයි. ඒ සත්‍යය සැමටම සත්‍යයයි. යම් දිනෙක ජය ගන්නේ සත්‍යයයි. අවබෝධ කළයුත්තේ සත්‍යයයි. ඒ අන් කිසිවක් නොව ලොව ඇති එකම සත්‍යය වූ ආකාර හතරකින් යුක්තවු චතුරාර්‍ය්‍ය සත්‍යයයි.

අපේ හාමුදුරුවන් වහන්සේ ඇමෙරිකාවේ විවිධ ප්‍රාන්ත හෙවත් ජනපද වල කරන මෙම දහම් චාරිකාවේ දී සෑම වසරකම පාහේ විශේෂයෙන්ම මිසෝරි, ටෙක්ෂස් මිනසොටා නිව්යෝර්ක් බොස්ටන් හා චිකාගෝ ජනපද ඇතුළත් වේ. මෙම දහම් චාරිකාවේ දී උන්වහන්සේ දින 3, දින 4, දින 7, දින 10, දින 15 වශයෙන් සමථ විපස්සනා භාවනා පංති පවත්වති. ධර්ම දේශනා පවත්වති.

2006 වර්ෂයේ දී සමථ විපස්සනා භාවනා මධ්‍යස්ථානය ආරම්භ කිරීමෙන් අනතුරුව 2007 වර්ෂයේ දී ම ඇමෙරිකාවේ ටෙක්ෂස් ප්‍රදේශයේ දී විශේෂ භාවනා පංතියකට උන්වහන්සේ වැඩම කළහ. එහි දී සමථ විපස්සනා භාවනාව කියා දෙමින් බුදුදහමේ සුවිශේෂත්වය පැහැදිලි කර දුන් අතර එහි සිටි පිරිස අතරින් කීප දෙනෙක්ම ඉතාම හොඳින් භාවනාව පුරුදු කර ගනිමින් විදර්ශනයට යොමුවූ බව උන්වහන්සේ කියති.

උන්වහන්සේ ප්‍රකාශ කරන පරිදි භාවනාව සඳහා පැමිණ සහභාගී වූ මුල් දවසේම භාවනාවේ ඇති අපහසු බව තේරුම් ගෙන ආපසු ගෙදර යෑමට සූදානම් වූ දෙදෙනෙකුම පසුව ඉතාම හොඳින් භාවනා කර මෙහිදී සාර්ථක ප්‍රතිඵල ලබාගෙන

ඉමහත් සතුටට සන්තෝෂයට පත්වී ඇත. මෙහි දී උන්වහන්සේ පිරිසිදු විපස්සනාව පුහුණු කරවා ඇත්තේ මජ්ඣිම නිකායේ ඡ ජක්ක සූත්‍රය හා සංයුත්ත නිකායේ ආනාපාන සති සූත්‍රයත් මහා සතිපට්ඨාන සූත්‍රයත් පාදක කරගනිමින් මූලික කරගනිමින්ය.

2008 වර්ෂයේ අප්‍රේල් මාසයේ දී අපේ හාමුදුරුවන් වහන්සේගේ සදහම් චාරිකාවට අයත් වූයේ ඇමෙරිකාවේ විශ්ව විද්‍යාල කීපයකි. ඒ අනුව උන්වහන්සේ ඇමෙරිකාවේ මිනසෝටාහි පිහිටි සෙන්ට් ක්ලවුඩ් විශ්ව විද්‍යාලයේ ද නෝර්ත් ඩකොටා විශ්ව විද්‍යාලයේ ද අයෝවා විශ්ව විද්‍යාලයේ ද දේශන කීපයක් ම පැවැත්වූහ.

මෙම සියලු දේශනා ඉතාම සාර්ථක දේශන බවට පත්වූයේ එම දේශන සඳහා මාතෘකා වශයෙන් උන්වහන්සේ " හු ක්‍රියේටඩ් දිස් වර්ල්ඩ්- බුඩිස්ට් පර්ස්පෙක්ටිව්" " හව් ටු සී දිස් වර්ල්ඩ් සො දැට් ද මාර වුඩ් නොට් සී යූ" ' ඔබ්ජෙක්ටිව් ඔබ්සර්වේෂන් ඉන් බුඩිසම්" ආදී සිත්ගන්නාසුලු මාතෘකා තෝරා ගනිමින් එම දේශනා පැවැත් වූ බැවිනි. මෙම දේශන පැවැත්වීම සඳහා සියලු සංවිධාන කටයුතු මෙහෙයවන ලද්දේ සහ අපේ හාමුදුරුවන් වහන්සේගේ ගමන් පහසුව සලසන ලද්දේත් අපේ හාමුදුරුවන් වහන්සේගේ සොයුරු හිමි නමක් වන ඇමෙරිකාවේ මිනසෝටා බෞද්ධ විහාරාධිපති ගරු විටියල සීවලී ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

2009 වසරේදී ද උන්වහන්සේ ඇමෙරිකාවේ මිසෝරි ටෙක්ෂස් නිව්යෝර්ක් හා චිකාගෝ යන ජනපදවල සාර්ථක සදහම් චාරිකාවක නිරත වූහ. මෙහි දී විශේෂයෙන්ම උන්වහන්සේ මිසෝරි ජනපදයේ පිහිටි මාබා නමින් හඳුන්වන මිඩ් ඇමෙරිකා බුඩිස්ට් ඇසෝසියේෂන් නමැති මැලේසියානු

චීන විහාරස්ථානය මුල් කරගනිමින් පුරා දින හතරක් මෛත්‍රී භාවනාවම පුහුණු කරවමින් මෛත්‍රිය පිළිබඳව හා මෛත්‍රී චින්තාවේ විවිධ පැති පිළිබඳව පැහැදිලි කරමින් විශේෂ දේශන හතරක් පැවැත්වූහ.

අනතුරුව ටෙක්ෂස් ජනපදයට වැඩම කොට එහි පිහිටි අක්කර පන්සියයක් විශාල බෝධි මධ්‍යස්ථානයේ දී පුරා දින හතක් තිස්සේ සමථ විපස්සනා භාවනාව පිළිබඳව පුහුණුව ලබා දෙමින් විශේෂ දේශන හයක් පැවැත්වූහ. උන්වහන්සේ ඊළඟට වැඩම කළේ නිව්යෝර්ක් නගරයටයි. නිව්යෝර්ක් නගරයේදී ද විශේෂ දේශන කීපයක්ම පැවැත්වූ අතර උඳුවප් පුරපසළොස්වක පොහෝ දින නිමිත්තෙන් නිව්යෝර්ක් බෞද්ධ විහාරාධිපති ගරු කුරුණෑගොඩ පියතිස්ස නාහිමිපාණන් වහන්සේගේ අනුශාසනා පරිදි නිව්යෝර්ක් බෞද්ධ විහාරයේ දී ද විශේෂ දේශනයක් හා භාවනා පුහුණු වැඩ සටහනක් මෙහෙයවන ලදහ.

තදනන්තරව චිකාගෝ ජනපදයට වැඩම කොට එහි දී චිකාගෝ විහාරස්ථානයේ දී දේශනයක් හා භාවනා වැඩසටහනක් පැවැත්වූ අතර එහි සිටින ශ්‍රී ලාංකික පිරිසට ද විශේෂ භාවනා වැඩසටහනක් හා ධර්මදේශනා කීපයක් ද පැවැත්වූ බව අපේ හාමුදුරුවෝ ප්‍රකාශ කරති. මේ උන්වහන්සේගේ ධර්ම ප්‍රචාරයයි. අපගේ තථාගත ලොවුතුරා බුදුපියාණෝ එදා '' චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය අත්ථාය හිතාය සුඛාය දෙව මනුස්සානං'' යනාදී වශයෙන් ''පින්වත් මහණෙනි බොහෝ දෙනාගේ හිත සුව පිණිස යහපත පිණිස චාරිකාවෙහි හැසිරෙන්න'' යනුවෙන් දේශනා කළාහු මෙය නොවෙයි ද?

2007 වර්ෂයේදී අපේ හාමුදුරුවන් වහන්සේ සුවිශේෂ

පින්කමක් කිරීමට අදහස් කළහ. එය සුවිශේෂ පින්කමක් වන්නේ අපේ රටේ, ශ්‍රී ලංකාවේ, ඈත දුෂ්කර ගම්මාන වල ජීවත්වෙන අසරණ, දුප්පත් එහෙත් සහජ දක්ෂතා, කුසලතා වලින් යුක්ත වු දරුවන් වෙනුවෙන් කළ විශේෂ පරිත්‍යාගයක්, කැපවීමක් නිසයි.

අපේ හාමුදුරුවන් වහන්සේ මෙසේ ශ්‍රී ලංකාවේ ඈත ගම්මානවල ජීවත්වෙන දක්ෂතා ඇති දරුවන් වෙනුවෙන් කිසියම් උපකාරයක්, සත්කාරයක් කළ යුතු යැයි විවිධ අවස්ථාවල සිතූහ. ඒ අනුව උන්වහන්සේ තමන් වහන්සේගේ දායක දායිකාවන් විසින් තමන් වහන්සේගේ මූලික අවශ්‍යතාවන් සම්පූර්ණ කරගැනීම සඳහාත් ගමන් බිමන් සඳහාත් මෙන්ම බෙහෙත් හේත් ආදිය සඳහාත් උන්වහන්සේට පූජාකරන මුදල් ඩොලර් පහ දහය එකතු කරමින් ඩොලර් දහසක් එකතු කර ගත්හ. එම මුදල මුල් කරගෙන තවත් තමන්වහන්සේගේ හිතවත් දායක දායිකාවන්ටත් සහභාගී වීමට හැකි වෙන පරිදි මෙම දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව වැඩ පිළිවෙලක් ආරම්භ කිරීමට අදහස් කළහ.

ඒ අනුව උන්වහන්සේ 2007 වර්ෂයේ මැයි මාසේ 7 වැනි දින ශ්‍රී ලංකාවට වැඩම කොට මෙම ශිෂ්‍යත්ව වැඩපිළිවෙල ආරම්භ කළහ. ඒ තමන් වහන්සේ පුංචි දවස් වල අධ්‍යාපනය ලබාගත් තල්ගස්වැව රජයේ විද්‍යාලයෙනි. මෙම විද්‍යාලය අද හඳුන්වනු ලබන්නේ විමලරත්න කුමාරගම විද්‍යාලයය නමිනි. එදා 2007 වර්ෂයේ මැයි මස 7 වැනි දින උන්වහන්සේ එම විද්‍යාලයට වැඩම කොට විද්‍යාලයේ සියලුම දරුවන් වෙනුවෙන් විශේෂ භාවනාමය වැඩ සටහනක් පවත්වා, විශේෂ දේශනයක් ද පවත්වා අනතුරුව එම විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් කලින් තෝරාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 10 දෙනෙකුට ශිෂ්‍යත්ව ප්‍රදානය කළහ.

එසේ එදා ආරම්භ කළ එම ශිෂ්‍යත්ව වැඩ පිළිවෙල නිසා අද වනවිට මෙම විද්‍යාලයේම ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 30 දෙනෙකුට එම ශිෂ්‍යත්ව ලැබෙන බවත් එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එය මහත් උපකාරයක් වී ඇති බවත් අපේ හාමුදුරුවන් වහන්සේට එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් එවා ඇති අපගේ භාවනා මධ්‍යස්ථානයේ දැනට ප්‍රදර්ශනය කර ඇති පුණ්‍යානුමෝදනා ලිපිවලින්ම පැහැදිලි වෙන අතර අපේ හාමුදුරුවන් වහන්සේ ද ඒ බව සනාථ කරති. අපේ හාමුදුරුවන් වහන්සේ මේ පිළිබඳව විවිධාකාරයෙන් සිතමින් ඉමහත් සන්තෝෂයට පත්වෙති.

විශේෂයෙන්ම මේ අවස්ථාවේ දී උන්වහන්සේ තමන් වහන්සේට මෙම ශිෂ්‍යත්ව වැඩ පිළිවෙල ආරම්භ කිරීම සඳහා උපකාර කළ හා දැනටත් වරින් වර මේ ගැන විමසමින් සොයා බලමින් උපකාර කරන සියලු දෙනාම මේ අවස්ථාවේ දී සිහිපත් කරති. උන්වහන්සේ සඳහන් කරන පරිදි මෙම විශේෂ පිංකම මේ ආකාරයෙන් උන්වහන්සේටත් සෙසු සැමටත් සිදුකර ගැනීමට හැකියාව ලැබී ඇත්තේ විශේෂයෙන්ම කැනඩාවේ එඩ්මන්ටන්හි පදිංචි අපේ පින්වතුන්ගේ ශ්‍රද්ධාවන්ත බවත් පරිත්‍යාගශීලී බවත් නිසාය. අපේ හාමුදුරුවන් වහන්සේ ඒ උන්වහන්සේට උපකාර කරන සැම දෙනාටම මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම පින් පෙරටුව ස්තුතිය පළ කරති.

මේ 2010 වර්ෂයයි. අපේ හාමුදුරුවෝ මේ වර්ෂයේ දී විශේෂ පින්කම් රාශියක්ම සිදුකිරීමට අදහස් කළහ. ඒ විශේෂයෙන්ම උන්වහන්සේට මෙම වර්ෂයේ අගෝස්තු මාසයේ නව වැනි දිනට වසර පනහක් (50) සම්පූර්ණ වන බැවිනි. උන්වහන්සේ මේ අනුව මේ වර්ෂයේ පළමුවැනි මාසේ එනම් ජනවාරි මාසේ තමන් උපන් බිමට හෙවත් ශ්‍රී ලංකාවට වැඩම කොට උන්වහන්සේගේ ආදරණීය මෑණියන් ද අප වාසය කරන

මෙම කැනඩාවේ එඩ්මන්ටන් ප්‍රදේශයේ ජීවත් වෙන උන්වහන්සේට නිබඳවම සිව්පසයෙන් උපස්ථාන කරන ශ්‍රී ලාංකික පින්වත් දායක දායිකා පිරිසක් හා උන්වහන්සේගෙන් ධර්මය අසා භාවනාව පුරුදු පුහුණු කරන කැනේඩියානු ජාතික උපාසක උපාසිකාවන් පිරිසක් ද සමග අපගේ ශාන්තිදායකයාණන් වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාදස්පර්ශයෙන් පිවිතුරු වූ දඹදිව පුණ්‍යභූමි වන්දනා කරගැනීමට අදහස් කළහ.

ඒ අනුව උන්වහන්සේ විශේෂයෙන්ම මෙම දඹදිව පුණ්‍යභූමි පිළිබඳව ඉතාම ලස්සනට තොරතුරු රාශියක් එකතු කර ''බුද්ධාස් ෆුට් ප්‍රින්ට්ස්'' නමින් පොත් පිංචක් ද ලියා මුද්‍රණය කළහ. එම පොත් පිංච මෙම පුණ්‍යභූමි වන්දනාව සඳහා සහභාගී වු සැම දෙනාටම නොමිලේ බෙදා දුන් අතර උන්වහන්සේ එම වන්දනාවේ දි සියලුම බැතිමතුන්ට එම පොත් පිංච ආශ්‍රයෙන් තථාගත ලොවුතුරා බුදුසම්ඳුන්ගේ ශ්‍රී පාදස්පර්ශයෙන් පිවිතුරු වු ඒ ඒ පුණ්‍යභූමි පිළිබඳව පැහැදිලි මෙන්ම නිරවුල් වුත් නිවැරදි වුත් විස්තරයක් ද කියාදෙමින් බොහෝ පිරිසකට ශ්‍රද්ධාවත් ප්‍රඥාවත් අවදිකරවමින් සුවිශේෂ වු මහා පිංකමක් මෙම වර්ෂයේදී සිදුකර ගත්හ.

මෙම වර්ෂයේ ජනවාරි මාසයේ ලංකාවට පැමිණ දාන සීල භාවනා වශයෙන් විවිධ පිංකම් රාශියක් සිදුකරගත් අපේ හාමුදුරුවන් වහන්සේ නැවතත් ජුලි මස 20 වැනි දින ලංකාවට වැඩම කර ජුලි මස 26 වැනි දින සිට අගෝස්තු මස 5 වැනි දින දක්වා පුරා දින 10 ක් භාවනා මධ්‍යස්ථානයක භාවනානුයෝගීව වැඩ සිට අගෝස්තු මස 9 වැනි දිනට යෙදෙන උන්වහන්සේගේ පනස් වැනි ජන්ම දිනය නිමිත්තෙන් විශේෂයෙන්ම තමන් වහන්සේගේ ජීවිතයට සෙවණ සැලසු ආරක්‍ෂාව සැලසු තමන් වහන්සේ වසර විස්සක් තිස්සේ ජීවත් වු රත්මලානේ පරම

ධම්ම චේතිය පිරිවෙන් විහාරස්ථානය මුල් කරගනිමින් වත්මන් විහාරාධිපති අතිගරු අපේ මඩපාත ධම්මසාර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා පරිදි රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන් විහාරාධිපතිව වැඩ සිට අපවත් වී වදාළ ගරු මාපලගම විපුලසාර ලොකු හාමුදුරුවන් වහන්සේ, අපේ හාමුදුරුවන් වහන්සේගේ ගුරුදේවයන් වහන්සේ වු ගරු මොන්නැකුලමේ විමලානන්දාභිධාන නායක මාහිමිපාණන් වහන්සේ සහ අපේ හාමුදුරුවන් වහන්සේගේ පියාණන් ද ප්‍රමුඛ පරලෝ සැපත් දායක දායිකා හා ඥාති මිත්‍ර සියලු දෙනා සිහි කොට ඒ සැමට පුණ්‍යානුමෝදනා කිරීමටත්, සුජීවත්ව වාසය කරන උන්වහන්සේගේ මෑණියන් ප්‍රමුඛ ඥාති මිත්‍ර හා උන්වහන්සේට සිවු පසයෙන් උපස්ථාන කළ හා කරන දායක දායිකා සියලු දෙනාටම නීරෝගී බව හා දීඝායුෂ ප්‍රාර්ථනා කිරීමටත්, අගෝස්තු 07 වැනි දින සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයක් පවත්වා 08 වෙනි දින ශතාධික මහා සංඝ රත්නය මුල් කරගනිමින් විශේෂ සංඝගත දක්ෂිණාවක් පවත්වා, උත්කෘෂ්ට වු මහා පිනක් සිදුකරගත්හ.

උන්වහන්සේ 2010 අගෝස්තු මස 09 වැනි දින වනවිට එනම් තමන් වහන්සේට වසර 50 පිරෙන දින, සියල්ල අතහැර වනගත වීමට අදහස් කර සිටියද ආරණ්‍යවාසී හා ග්‍රාම වාසී වැඩිහිටි ධර්මධර විනයධර මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේලා දෙනමක් සමග කළ සාකච්ජාවන්ගේ ප්‍රතිඵල අනුවත් උන්වහන්සේම මධ්‍යස්ථව සිතාබලා දඹදිව විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෙවණේදී භාවනානුයෝගීව වැඩ සිට, බොහෝ දෙනාගේ යහපත සලකා එම අදහස තව ටික කලෙකට කල් දමා ඇත. එම පියවර දෙවනුවට තබා එහි පළමු පියවර වශයෙන් භාවනා මධ්‍යස්ථාන ඇසුරු කරමින් හා තමන් වහන්සේ වැඩ සිටින භාවනා මධ්‍යස්ථානයේ දී ම තවතවත් භාවනාව පුහුණු කර ගනිමින් තවතවත් සිහි නුවණ වැඩිකර

ගැනීමටත් ප්‍රඥාව දියුණු කර ගැනීමටත් නිශ්කාමී වු අනුපලිප්ත ජීවිතයක් ගත කිරීමටත් අදිටන් කරගෙන ඇත.

මෙසේ විවිධ වූ පුණ්‍යකර්ම සිදුකරමින්, කුසල් සිත වඩමින්, අනුපලිප්ත වූ ජීවිතයක් ගත කරමින් නිමල බුදුදහම ලොවට කියාදෙමින් පුංචි දවසේ පටන් බුදුගුණ සොය සොයා බුදුමග සොයා සොයා නිමල බුදුදහම සිය සිතින් දැන දැක සදහම් සුවඳ ලොවට බෙදා දෙන භාවනාවෙන්ම සැනසුම සොයන භාවනාව ජීවිතයේ මූලිකම අංගයක් බවට පත් කරගත් අපේ හාමුදුරුවන් වහන්සේට නීරෝගී බව ලැබේවා! දීර්ඝායුෂ ලැබේවා! සසර ගමන කෙටි වේවා! උපදින උපදින හැම භවයකදිම බුදුගුණ සිහිකර කර සිල් රැකගන්නට ලැබේවා! උපදින උපදින හැම භවයකදිම බුදුබණ සිහි කර කර භාවනා කරගන්නට ලැබේවා! උපදින උපදින හැම භවයකදීම තෙරුවන් ගුණ සිහි කර කර දන් දෙන්නට ලැබේවා! පස් පව් දස අකුසල් කරන නරක මිතුරන්ගේ ඇසුරක් සසර වසන තුරු නොම වේවා! දස අකුසල් දුරුවේවා! දස කුසල් වැඩේවා! රාග දෝස මෝහ කියන අකුසල් දුරු වී සත් තිස් බෝධිපාක්‍ෂික ධර්ම වැඩේවා! වහ වහාම චතුරාර්‍ය සත්‍යය ධර්මය අවබෝධවීමෙන් උතුම් වු නිර්වාණ ධර්මය අවබෝධ වේවා! උන්වහන්සේට දිනපතා සිවුපසයෙන් උපස්ථාන කළ, උපස්ථාන කරන, සැම දෙනාටමත් වහ වහාම චතුරාර්‍ය සත්‍ය ධර්මය අවබෝධ වේවා! නිවන් සුවයෙන් සැනසීම ලැබේවා!

උපන් උපන් හැම භවයෙම දහමට යොමු වේවා
රාග දෝස මෝහ කියන අකුසල් දුරුවේවා
හැම භවයෙම හැම තැනදිම සුදනන් හමුවේවා
සාධු සාධු මෙපින් බලෙන් නිවනම හිමිවේවා!

සැමටම තෙරුවන් සරණයි!

# අපේ හාමුදුරුවන් වහන්සේ විසින් දිනපතා සම්බුද්ධ පූජාව සඳහා රචනා කරන ලද බුදුගුණ වන්දනා කවි පෙළක්

නමස්කාර වේවා බුදුරුවනට සැමදා බුදුහිමි සරණ යමි
නමස්කාර වේවා දම් රුවනට සැමදා සදහම් සරණ යමි
නමස්කාර වේවා සඟ රුවනට සැමදා මහසඟ සරණ යමි
නමස්කාර වේවා තුනුරුවනට සැමදා තෙරුවන් සරණයමි

බුද්ධං බුද්ධං බුද්ධං වන්දේ
ධම්මං ධම්මං ධම්මං වන්දේ
සංඝං සංඝං සංඝං වන්දේ
බුද්ධං ධම්මං සංඝං වන්දේ

බුදුගුණ දම්ගුණ සඟ ගුණ නමදිමු
බුදුබණ අදහන හැමදෙන එක්වෙමු
අද දින බුදුගුණ ගැන ගැන සැනසෙමු
හැමදෙන වැඳගෙන බුදුගුණ පවසමු

මොහඳුර දුරුකොට බුදුරැස් විදූ
තිලොවම අමමෙත් ජලයෙන් සේදූ
බුදුහිමියනි නිවණට මග පෑදූ
පුදදෙමි මෙපහන් බැතියෙන් සාදූ

නිබඳ අමා දම් රස සිහි කරමි
නැමද සමිඳ ඔබෙ සිරිපද සිඹිමි
මහද සිසිල් බුදුකුටියක් කරමි
සුවඳ දුමින් මගෙ බුදුහිමි පුදමි

කුසල් දහම් ගැන හොඳ හැටි දැන ගම්
අසල් වැසියනුත් ගෙන බුදුමග එම්
සුසිල් බවින් මම හදවත සනසම්
සිසිල් පැනින් මගෙ බුදුහිමි පුදදෙම්

මෙම කවිය ආහාර පුජාකරන විට පමණක් කියන්න

(කිරිපිඬු ආහර ලෙස ගෙන මුනිඳා
වෙරවැඩු සම්බුදු පදවිය ලැබුදා
සිහිකොට එම ගුණ සිරිපද නැමදා
පුදදෙම් ආහර වැඳ වැඳ සැමදා )

අලංකාරයට මල් සරසන්නේ
බලන්න ලස්සන පහන් දිලෙන්නේ
සුළං රැලත් බුදුගුණ පවසන්නේ
ගිලන් පසින් මම මුනිඳු පුදන්නේ

ලොවුතුරු ගුණ අපමණ බව දනිම්
විසිතුරු ලෝකෙන් මම සමු ගනිම්
නිරතුරු මම බුදුගුණ සිහි කරම්
පළතුරු යුෂයෙන් බුදුහිමි පුදම්

රහත් බවින් අග තැන්පත් වන්නේ
පහත් වැඩක් කිසි දින නොකරන්නේ
බෙහෙත් වලින් මම මුනිඳු පුදන්නේ
දොහොත් මුදුන් බැඳ සාධු කියන්නේ

මගෙ බුදුහිමියන් මට දෙසු විලසා
මම බුදුමග එම් හැම දින මෙලෙසා
පුදමින් මෙම මල් බුදුගුණ පවසා
වඳිනෙම් දෙපතුලෙ තබමින් සිරසා

සම්මා සම්බුදු ගුණ සිහිවේවා
නිම්මා නැති සසරින් ගොඩ ඒවා
පෙම්මාදර සිත සුවපත් වේවා
අම්මා මතු නිවනින් සැනසේවා

සොයා අහර දී දිව රෑ බෝවා
දයා දියෙන් නිබඳව මා නාවා
කියා දෙමින් ගුණ සෙනෙහස පෑවා
පියා මගේ නිවනින් සැනසේවා

මවුගුණ පියගුණ නිති සිහිකරමි
මම මගෙ ගුරුවරු නිරතුරු පුදමි
වැඩි හිටි හැම දෙන හට ගරු කරමි
මම බුදුහිමි දෙසු ලෙස දිවි ගෙවමි

සාදු සාදු මේ කළ පින් පැදි පැදි දිලේවා
ආදි ආදි අප කළ පව් සේදි සේදි ගෙවේවා
ජාති ජාති කිසිම දිනෙක අපා දුකක් නොවේවා
සාදු සාදු මෙපින් බලෙන් නිවන් සුවයම ලැබේවා!

# අපේ හාමුදුරුවන් වහන්සේ විසින්
# අම්මා ගැන රචිත කවි පෙළක්

--------------

හබුන් කටයි බත් දෙකටයි කිය කිය මට කැව්වේ
චූටි දුවේ පුංචි පුතේ කිය කිය අපි හෙව්වේ
මට මතකයි පුංචි කාලෙ අම්ම ළඟට දිව්වේ
කිරි බොන්නයි අම්මා මට ලේ කිරි කර පෙව්වේ

හැරි හැරි බලන විට සතුටකි ගෙන දෙන්නේ
බැරි බැරි වුවද කළ පින්මයි පල දෙන්නේ
ඇරි ඇරි දොරටු නිවනටමයි ළං වෙන්නේ
මැරි මැරි මොකද මේ සසරෙහි උපදින්නේ

නිම්මා නැතිව බුදුගුණ කිව් හැමදාම
පෙම්මා දර සිතින් සැනසීමෙන් බෝම
සම්මා සම්බුදුන් වාගෙයි ගුණ බෝම
අම්මා නැති නිවස පාළුයි හැමදාම

මුදු හදවතින් මා හැදූ වැඩූ මලක් වගේ
සඳු පරයන සොම් ගුණ නැත නිමක් ඇගේ
නිදුකින් සැරදෙන්න උල්පත මිනිස් ගගේ
බුදු ගුණ දැනෙයි මට අම්මා ලඟින් මගේ

කුසෙහි හොවා දස මසක්ම මා රැකගත් අම්මා
කරුණාවේ අමාදහර මගෙ පින්බර අම්මා
ජීවිතයේ පරම සතුට ගෙනත් දුන්නෙ අම්මා
සතර අපා දුකක් නොවිඳ නිවන් දකින් අම්මා

---------------

## අපේ හාමුදුරුවන් වහන්සේ විසින් ලියනලද පොත් වලින් සමහරක්

**(නිර්මල බුද්ධ වචනය පැහැදිලි කරමින් ලියන ලද මෙම පොත් එකක් වත් අලෙවි කර මුදල් ලබාගෙන නැත.)**

---------

1. බුදුරජාණන් වහන්සේගේ ඒකායන මාර්ගය
2. සතර සතිපට්ඨානය (භාවනා කරන හැටි) පරිවර්තනයකි.
3. The Buddha's Unique Path (Published in USA - 2005)
4. Attachment and Detachment (Published in USA-2006)

**කුඩා දහම් පුස්තක**

-------------------

**සිංහල:**

5. පටිච්ච සමුප්පාදය
6. කර්මය
7. මව්පියෝ සහ දූ දරුවෝ
8. මව්පිය දූදරු සෙනෙහස
9. අපේ අම්මයි තාත්තයි
10. පිය සෙනෙහස
11. අම්මා
12. වගකිව යුත්තා ඔබයි (පරිවර්තනයකි)
13. දහම් දෙසීම සහ දහම් ඇසීම
14. යහපත් සැමියා සහ යහපත් බිරිඳ
15. ප්‍රායෝගික බුදුදහම
16. කර්මය හා පුනර්භවය
17. ජීවිත සිරගෙය (පරිවර්තනයකි)
18. කායානුපස්සනා භාවනාව
19. රට්ඨපාල සූත්‍රයෙන් දහම් කරුණු හතරක්
20. වෙසක් දා සිදුවූ මහා අසිරිය

21. මේ ගැනත් සිතන්න
22. සිල් අරගන්නයි බුදුන් වඳින්නයි
23. ආසව ධම්ම
24. කුමක්ද මරණය?
25. යහපත් බිරිඳ
26. යහපත් සැමියා
27. බුදුහාමුදුරුවෝ
28. තණ්හාව නිසා
29. භාවනා කරන්නේ කොහොමද?
30. ධම්මචක්කප්පවත්තන සුත්තං
31. කරණීය මෙත්ත සූත්‍රය
32. බුදුන් වදාළ කර්මය (පරිවර්තනයකි)
33. දහම් පද ( දහම් විවරණ පදාවලියකි)

**English:**

34. Buddhism for Beginners
35. The words of the Buddha
36. Who created this man?
37. Rains Retreat and Kathina
38. The Cycle of Life
39. The Buddha and His First Sermon
40. Parents' Love
41. Source of Conflict
42. Good Friends
43. Why should We Respect and Support Our Parents
44. Bhavana – A Manual of Buddhist Meditation
45. Footprints of the Buddha



ශ්‍රී ලංකාවේ ඉතා නොදියුණු ප්‍රදේශයක් ලෙස සැලකෙන පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණමඩුවේ තල්ගස්වැව ගමෙහි ජීවත්වූ කාරුණික ගොවි මහතෙකුට දාව, පුරාකෘත පින් මහිමයෙන් ම හදවත සිසිල්වත් වු ගුණවත් මවකගේ කුසින් බිහිවී වයස අවුරුදු 11 වෙද්දී ගමේ පන්සලේ දී පැවිද්ද ලබා කෙමෙන් කෙමෙන් නගරය දෙසට ගොස් කොළඹ නගරයේ දී ලෞකික වශයෙන් ලැබිය යුතු අධ්‍යාපනයේ ඉහළට ම ගියත් ආධ්‍යාත්මික සුවය සොයමින් සියලු දේ අතහැර දමා නැවත මහනුවරට (රටේ ඉහළම ස්ථානයකට) ගොස් භාවනා මධ්‍යස්ථානයක නිශ්කාමී ජීවිතයක් ගත කොට ලෝකයේ ඉහළම ධනවත් රට යැයි සැලකෙන ඇමෙරිකාවෙන් ලද ආරාධනයකට අනුව එහි වැඩම කොට ඇමෙරිකාව හා කැනඩාව යන උතුරු ඇමෙරිකාවේ වාසය කරමින් අද ලෝක ගෝලයේ උත්තර ධ්‍රැවය සමීපයේ ම පිහිටි කැනඩාවේ ඇල්බටා ප්‍රාන්තයේ එඩ්මන්ටන් නගරය මුල්කර ගනිමින් උතුරු ඇමෙරිකාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ටත් ඇමෙරිකානු හා කැනේඩියානුවන්ටත් බුදුපියාණන් වහන්සේගේ නිර්මල වූ ශ්‍රී සද්ධර්මය මුල් සූත්‍ර දේශනා ඇසුරින් ම කියා දෙමින් වැඩ වසන මෙම ස්වාමීන් වහන්සේ සම්බුද්ධ ශාසනය සුරකින, සදහම් මග කියාදෙන, තවත් සුවිශේෂ ස්වාමීන් වහන්සේ නමකි,

තල්ගස්වැවේ සීලානන්ද ස්වාමීන් වහන්සේගේ ජීවිතයේ පනස් විය සපිරෙන 2010 අගෝස්තු මස 09 වැනි දින ඔබ අතට පත් කෙරෙන මෙම ග්‍රන්ථය උන්වහන්සේගේ ස්වයංලිඛිත චරිතාපදානයයි. මෙය විශේෂයෙන්, අපේ හැදෙන වැඩෙන දරුවන්ට දෛනික ජීවිතයේ විවිධ ප්‍රශ්නවලට ගැටළු වලට මුහුණ දෙමින් ජීවිතය ජයගන්නා ආකාරය කියා දෙන ආදර්ශවත් ග්‍රන්ථයකි.

උත්සාහයෙන් සහ දැහැමිව දිවි ගෙවන්නෝ
දෙලොවම දිනන්නෝය.
තෙරුවන් සරණයි !